I වැනි තීරුව		*II වැනි තීරුව*	*III වැනි තීරුව*		
සම්මත අතුරු ව්‍යවස්ථාව	*අනු. අංකය*	*බලය දෙනු ලබන කාර්යය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම (රු.)*		
			රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
			රු. ශත	*රු. ශත*	*රු. ශත*
අන්තරාදායක ව්‍යාපාර	82	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
	83	ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
	84	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
	85	හිරිගල් හෝ හුණු ගල් කැනීම	500 0	750 0	1,000 0
	86	යන්ත්‍රානුසාරයෙන් පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
	87	හිස් ගෝනි හෝ හිස් බෝතල් තබා ගැනීම	500 0	750 0	1,000 0
	88	පාපැදි හෝ යතුරු පැදි අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
	89	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබාගැනීම	500 0	750 0	1,000 0
	90	විසිරි පින්තාරු කිරීම	500 0	750 0	1,000 0
	91	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
	92	ලෝහ සංස්කාර්ය කර්මාන්ත ආයුධ (යන්ත්‍රෝපකරණ, ආයුධ, උපකරණ නිපදවීම)	500 0	750 0	1,000 0
අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර	93	තලාතු මිනිරන් සුද්ද කිරීම	500 0	750 0	1,000 0
	94	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරඳමුංගු, එනසාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම	500 0	750 0	1,000 0
	95	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
	96	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම හෝ බතික් කිරීම	500 0	750 0	1,000 0
	97	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම	500 0	750 0	1,000 0
	98	තෙල් හෝ සත්ව මේද නිපදවීම	500 0	750 0	1,000 0
	99	හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම	500 0	750 0	1,000 0
	100	ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤු නිපදවීම	500 0	750 0	1,000 0
	101	මෝරතෙල් සකස් කිරීම	500 0	750 0	1,000 0
	102	බෝට්ටු තැනීම	500 0	750 0	1,000 0
	103	බැටරි විද්‍යුත් ආරෝපනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
	104	ලෝහ වර්ග පෑස්සවීම	500 0	750 0	1,000 0
	105	මෝටර් වාහන අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
	106	මෝටර් වාහන සේවා කිරීම	500 0	750 0	1,000 0
	107	යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම	500 0	750 0	1,000 0
	108	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
	109	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
	110	මෝටර් වාහන බොඩි තැබීම	500 0	750 0	1,000 0
	111	කෘමි නාශක, දිලීර නාශක, පැළෑටි නාශක හෝ පළිබෝධ නාශක නිපදවීම හෝ නැවත පිරවීම	500 0	750 0	1,000 0
	112	විෂබීජ නාශක නිපදවීම	500 0	750 0	1,000 0
	113	මදුරු දඟර නිපදවීම	500 0	750 0	1,000 0

වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ නොවැම්බර් මස 15 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 05.1-vi යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවට වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. එම්. සමන්ත මුණසිංහ,
සභාපති,
වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව.

2021 වර්ෂයේ නොවැම්බර් මස 15 වැනි දින,
වනාතවිල්ලුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර වනාතවිල්ලුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්; හෝ
(ආ) එම ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක; හෝ
(ඇ) එම ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යට වී ඇති බිම් ප්‍රමාණය සහ එම ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය සියයට විසිපහට (1/4ට) වඩා අඩුවන්නේ නම්,

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2022 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට දශම දෙකයි පහක (0.25%) වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම මත බද්ද 2022 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට විධාන කළ යුතු යැයි වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12 - 71/6

වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා වාහන හා සත්ත්ව බද්ද

වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ නොවැම්බර් මස 15 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 05.1-vii යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව වනාතවිල්ලුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත් වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකුම, විසින් එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2022 වර්ෂය සඳහා වන මෙම බද්ද වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. එම්. සමන්ත මුණසිංහ,
සභාපති,
වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව.

2021 වර්ෂයේ නොවැම්බර් මස 15 වැනි දින,
වනාතවිල්ලුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර වනාතවිල්ලුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2022 වර්ෂයේ දී පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකුම එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමට වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

	1 වැනි තීරුව	*11 වැනි තීරුව* රු. ශත
(1) (i)	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජීන් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
(ii)	සෑම බයිසිකලයක්, ට්‍රයිසිකලයක්, බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා -	
	(අ) වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
	(ආ) වෙළෙඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
(iii)	සෑම කරත්තයක් සඳහා	20 0
(iv)	සෑම අත්කරත්තයක් සඳහා	10 0
(v)	සෑම රික්ෂෝවක් සඳහා	7 50
(vi)	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවකු සඳහා	15 0
(vii)	සෑම ඇතෙක් සඳහා	50 0

(2) විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත්කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

12 - 71/7

වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයේ ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු අය කිරීම

වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ නොවැම්බර් මස 15 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 05.1-viii යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ වනාතවිල්ලුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් වීදියකට, පාරකට, ඇළකට, මාවතකට, කළපුවකට, මුහුදකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීම් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් 2022 ජනවාරි මස 01 වැනි දින සිට ගාස්තුවක් අය කරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. එම්. සමන්ත මුණසිංහ,
සභාපති,
වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව.

2021 වර්ෂයේ නොවැම්බර් මස 15 වැනි දින,
වනාතවිල්ලුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) වැනි උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, 1988.08.23 වැනි දින අංක 520/7 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළාත් පාලන නිවාස හා ඉදි කිරීම් කටයුතු ගරු අමාත්‍යතුමන් විසින්, අනුමත කර ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව අංක 586 හා 1989.11.24 දිනැති ගැසට් පත්‍රය පිළිගෙන ක්‍රියාත්මක කළ යුතු බවටත්, වනාතවිල්ලුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇළකට, මාවතකට, කළපුවකට, මුහුදට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීම් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් 2022 ජනවාරි මස 01 වැනි දින සිට ගාස්තුවක් ගෙවිය යුතු බවට වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය."

උපලේඛනය

		රු. ශත
01.	බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා වර්ග අඩියකට (වර්ෂයකට)	60 0
02.	බැනරයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමක් මාස 01 කට අඩු කාලයක් ප්‍රදර්ශනය කිරීම සඳහා වර්ග අඩියකට	20 0
03.	බැනරයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමක් මාස 01 කට නොඅඩු සහ මාස 03කට නොවැඩි කාලයක් ප්‍රදර්ශනය කිරීම සඳහා වර්ග අඩියකට	30 0
04.	බැනරයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමක් මාස 03 කට නොඅඩු සහ මාස 06කට නොවැඩි කාලයක් ප්‍රදර්ශනය කිරීම සඳහා වර්ග අඩියකට	40 0
05.	බැනරයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමක් මාස 06 කට නොඅඩු සහ වර්ෂයකට නොවැඩි කාලයක් සඳහා වර්ග අඩියකට	50 0

12 - 71/8

වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා වත්කම් කුලියට දීම

වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ නොවැම්බර් මස 15 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 05.1-ix යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව, 2022 වර්ෂය සඳහා පනවන ලද වත්කම් කුලියට දීමේ ගාස්තු ඒ වර්ෂයේ ජනවාරි මස 01 වැනි දින සිට ගාස්තුවක් අය කරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. එම්. සමන්ත මුණසිංහ,
සභාපති,
වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව.

2021 වර්ෂයේ නොවැම්බර් මස 15 වැනි දින,
වනාතවිල්ලුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව සතු වත්කම් කුලියට දීමේදී 2022 වර්ෂයේ ජනවාරි 01 වැනි දින සිට නැවත සංශෝධනය කරනතුරු ගාස්තු අය කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

පහත සඳහන් ගාස්තුවලට අමතරව රජය විසින් පනවා ඇති බදු හෝ පැනවිය හැකි බදුවලට යටත් විය යුතුය.

I උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*	*III වැනි තීරුව*	*IV වැනි තීරුව* *රු. ශත*
1.	කියුබ් 03 ටිපර් රථයක්	පළමු කි. මී. රු. 600 0 (ඉන්ධන සමග)	වැඩිවන කි. මී. 160 0
2.	කියුබ් 02 ටිපර් රථය	පළමු කි. මී. රු. 500 0 (ඉන්ධන සමග)	වැඩිවන කි. මී. 75 0
3.	ටොන් 8 මාර්ග තලනය	මීටර් පැය 01ක් සඳහා (ඉන්ධන සමග)	2,300 0
4.	බැකෝලෝඩරය (JCB)	මීටර් පැය 01ක් සඳහා (ඉන්ධන සමග)	3,000 0
5.	මෝටර් ග්‍රේඩරය	මීටර් පැය 01ක් සඳහා (ඉන්ධන සමග)	4,000 0

II උපලේඛනය

ජල බවුසර් ප්‍රවාහනය කිරීම

	1 වැනි තීරුව	*11 වැනි තීරුව* *රු. ශත*
1.	එළුවන්කුලම	1,500 0
2.	රාල්මඩුව	1,650 0
3.	ගඟේවාඩිය	1,600 0
4.	කරතිව්	1,500 0
5.	සේරක්කුලිය	1,600 0
6.	සින්නනාගවිල්ලුව	1,400 0
7.	මංගලපුර	1,400 0
8.	13 කණුව	1,300 0
9.	වනාතවිල්ලුව	1,150 0
10.	මොරපතාව	1,500 0
11.	තුත්තනේරිය	2,150 0
12.	විජයපුර	1,400 0
13.	කරඩිපුවල්	1,400 0
14.	මයිලන්කුලම	1,600 0
15.	ස්මයිල්පුරම්	1,500 0

ජලය පිරවීම සඳහා එක් වරකට රු. 250 0ක මුදලක් අය කෙරේ.

III උපලේඛනය

1. සභාව සතු රංග ශාලාව පුද්ගලික ආයතනයකට හෝ පුද්ගලයෙකු හට දිනකට (පැය දොළහක් සඳහා) කුලියට දීමේ ගාස්තුව රුපියල් දොලොස්දාහයි (රු. 12,000.00) මීට අමතරව රුපියල් දෙදහස් පන්සියයක මුදලක් (රු. 2,500 0) ආපසු ගෙවන ආරක්ෂිත ඇප තැන්පතුවක් ලෙස වෙන්කර ගනු ලබන අවස්ථාවේ දී වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව වෙත තැබිය යුතු වේ.

12 - 71/9

වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා සංචාරක වෙළෙඳාම පිළිබඳ ගාස්තු පැනවීම

වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ නොවැම්බර් මස 15 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 05.1-x යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව, කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ වනාතවිල්ලුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංචාරක වෙළෙඳාම් කටයුතු සිදු කිරීම පිළිබඳ පනවන ලද ගාස්තු ඒ වර්ෂයේ ජනවාරි මස 1 වැනි දින සිට අයකරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. එම්. සමන්ත මුණසිංහ,
සභාපති,
වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව.

2021 වර්ෂයේ නොවැම්බර් මස 15 වැනි දින,
වනාතවිල්ලුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල අනුව වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් පනවනු ලදුව 2010.07.16 වැනි දින අංක 1662 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළ කරන ලද 2011.01.18 වැනි දින වයඹ පළාත් සභා රැස්වීමේ දී ස්ථිර කරන ලද 2011.04.28 වැනි දිනැති අංක 1703/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* V (අ) කොටසේ ප්‍රකාශයට පත් කරන සංචාරක වෙළෙඳාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව පහත සඳහන් උපලේඛනයේ සඳහන් ගාස්තු 2022 වර්ෂයට පනවා අය කළ යුතු බවට වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

I උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව*		
අනු. අංකය	*සංචාරක වෙළෙඳාමේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම (රු.)*		
		750 නොඉක්මවන අවස්ථාවක	*750 ට වැඩි එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක*	*1,500 ඉක්මවන අවස්ථාවක*
		රු.ශත	*රු. ශත*	*රු. ශත*
1.	තැඹිලි කුරුම්බා වෙළෙඳම	500 0	750 0	1,000 0
2.	කඩල, වඩේ, මුරුක්කු බයිට් පැකට් විකිණීම	500 0	750 0	1,000 0
3.	රෙදි අලෙවිය	500 0	750 0	1,000 0
4.	පාවහන් අලෙවිය	500 0	750 0	1,000 0
5.	සාප්පු බඩු අලෙවිය	500 0	750 0	1,000 0
6.	මල් පැළ, එළවළු පැළ හා පළතුරු පැළ අලෙවිය	500 0	750 0	1,000 0
7.	පොත්, පත්තර ද්‍රව්‍ය සැපයීම	500 0	750 0	1,000 0
8.	ධාන්‍ය වර්ග පැකට් කර විකිණීම	500 0	750 0	1,000 0
9	එළවළු හා පළතුරු වෙළෙඳාම	500 0	750 0	1,000 0
10.	කෘත්‍රිම මල් අලෙවිය	500 0	750 0	1,000 0
11.	ජංගම බැංකු සේවා	500 0	750 0	1,000 0
12.	පහන්තිර, හඳුන්කූරු ඇතුළු පූජා භාණ්ඩ අලෙවිය	500 0	750 0	1,000 0
13.	ඔරලෝසු වෙළෙඳාම	500 0	750 0	1,000 0
14.	පාන්, බනිස් වෙළෙඳාම	500 0	750 0	1,000 0
15.	පාපැදි හා යතුරු පැදි මගින් මාළු වෙළෙඳාම	500 0	750 0	1,000 0

දමන ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම

දමන ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද වරිපනම් ගාස්තු, මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 වැනි දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවද වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2022 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක්ද, එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට පෙරාතුව ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක්ද ගෙවනු ලැබේ.

ජේ. ඒ. මංගල මහින්ද ගුණවර්ධන,
සභාපති,
දමන ප්‍රාදේශීය සභාව.

2021 වර්ෂයේ නොවැම්බර් මස 12 වැනි දින,
දමන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දියුණු කල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට දමන ප්‍රාදේශීය සභාව විසින් ගනු ලැබූ සභා සම්මුතියට අම්පාර දිස්ත්‍රික්කයේ, ප්‍රාදේශීය පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් ලද අනුමැතිය අනුව සහ එකී පනතේ 146 වන වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි දියුණු ගම් ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශය තුළ පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2007 වර්ෂයේ වාර්ෂික වටිනාකම් 2022 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත දමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය දියුණු ගම් ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශ ඇතුළත පිහිටි සෑම නිශ්චල දේපළක වාර්ෂික වටිනාකමින් සියයට හතක (7%) ක වරිපනමක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, සහ

ඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) උප වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික 04 කින් ගෙවීමට විධාන කිරීමටත් දමන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය."

12 - 245/1

දමන ප්‍රාදේශීය සභාව

දමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ 2022 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

දමන ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ දමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2022 වර්ෂයේදී දමන ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් මත ගාස්තුවක් අය කරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. මංගල මහින්ද ගුණවර්ධන,
සභාපති,
දමන ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 12 වැනි දින,
දමන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ දමන ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ දමන ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමඟ කියවිය යුතු 149 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ 1 වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ ii වන තීරුවේ අනුරූපිත සටහනෙහි මෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්තය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තාවූ ද වන අවස්ථාවක, ඉහත 2 වන කොටසේ කුමක් සඳහන් ව තිබුණ ද ඒ හෝටලය හෝ ආපනශාලාව හෝ නවාතැන්පොළ හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා සභාපතිවරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගෙවිය යුතු ගාස්තුව ඒ හෝටලයේ හෝ ආපනශාලාවේ හෝ නවාතැන්පළෙහි හෝ 2021 වර්ෂය තුළ ලැබීම්වලින් සියයට එකක් (1%) විය යුතු බව දමන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය."

උපලේඛනය

I වැනි තීරය *බලය දෙනු ලබන කාර්යය*	*II වැනි තීරය* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	රු. 750 0 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1,500 0 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 0 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
බත් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
තේ කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
භෝජනාගාරයක් (රෙස්ටුරන්ට්) පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
තේ, කෝපි කඩ හා භෝජන ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
ලැගුම්හලක් (නවාතැන්පලක්) පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
ආහාර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
එළවළු වෙළඳසලක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
පළතුරු වෙළඳසලක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
අයිස්ක්‍රීම්, යෝගට් නිෂ්පාදනය හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
කිරි එකතු කිරීමේ හා කිරි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
කෑම වර්ග නිෂ්පාදනය කර පැකට් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
බීම වර්ග, රස කැවිලි විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
මී කිරි, පස්ගෝරස නිෂ්පාදන හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
කැසට් පටි, වීඩියෝ පටි, වීඩියෝ තැටිගත කරන හා අලෙවි කරන ස්ථානයක් හෝ කුළියට දෙන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
දන්ත චිකිත්සාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
දත් බැඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0

I වැනි තීරය *බලය දෙනු ලබන කාර්යය*	*II වැනි තීරය* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	රු. 750 0 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1,500 0 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 0 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
ඔරලෝසු අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
සිසිල් බීම වෙළඳසලක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
බිත්තර විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
මෝටර් හෝ කොම්පියුටර් ප්‍රින්ටින්, ස්ක්‍රීන් ප්‍රින්ටින් ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
පොල් ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
සිල්ලර වෙළඳසලක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
කුළු බඩු වෙළඳසලක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
ඡායාරූප වර්ණ රසායනාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
බුලත්, පුවක්, දුම්කොළ, සුරුට්ටු ආදිය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
තේ කුඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
කුළු බඩු එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
මනාලියන් හැඩ ගැන්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
සුරතල් සතුන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
විකිණීම සඳහා මල් පැළ හෝ පැළ තවාන් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
ගෘහ භාණ්ඩ ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
ප්ලාස්ටික්, ෆයිබර් ආශ්‍රිත වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
ලොන්ඩ්‍රියක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
අන්තරායදායක හා අප්‍රසන්න ව්‍යාපාර :			
කබොක්, බොරළු ගල්, ගඩොල් හෝ කළුගල් කැණීම, ගබඩා කිරීම හා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
සිසිල් බීම නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
ග්‍රොස් එකකට වැඩි සිසිල් බීම ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
ගැලන් 50ට වැඩි ප්‍රමාණයක් පොල්තෙල් ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක් ගැලන් 12ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
ග්‍රොස් 10ට වැඩි ප්‍රමාණයක් ගිනිපෙට්ටි ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
ඇසිඩ් වර්ග හා ස්ප්‍රීතු වර්ග ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
ධාන්‍ය හෝ මාංශ භෝග හොන්ඩර 5ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
දැව විකිණීම හා දැව ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
දර විකිණීම හා දර ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0

I වැනි තීරය *බලය දෙනු ලබන කාර්යය*	*II වැනි තීරය* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	රු. 750 0 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1,500 0 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 0 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
තොග වශයෙන් විකිණීම සඳහා සීනි, පිටි හෝ ලුණු හොන්ඩර් 15ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීමේ ස්ථානය පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
හිස් බෝතල් හෝ හිස් ගෝනි විකිණීම හා ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
පාවිච්චි කරන ලද කඩදාසි ගබඩා කර තැබීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
විසිරි පින්තාරු කිරීම හා (ස්ප්‍රේ පේන්ටින්) සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
ඇඳුම් මසන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
පාපැදි අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
වාහන සේවා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
පොහොර හෝ රසායනික පොහොර නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
කුකුළන් හා කිකිළියන් 100ට වැඩි ගණනක් සඳහා කුකුල් කොටුවක් ගබඩා පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
බැටළුවන්, ඌරන්, එළුවන් හා එළ ගවයින් 25ට වැඩි ගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
තොග වශයෙන් විකිණීම සඳහා නරක්වනසුළු කෑම හා ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
කරවල, ලුණු මාළු, හොන්ඩර 30ට වඩා වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
දුම්කොළ සකස් කිරීම, ගබඩා කර තබා ගැනීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
සත්ව ආහාර ගබඩාවක් පවත්වාගෙන යාමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය එකතු කිරීම හා ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
වඩු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
සිරප් හෝ පළතුරු බීම වර්ග නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
රස කැවිලි වර්ග නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය වර්ග, කෝපි, මාංශ භෝග, කුළුබඩු ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
ඉටිපන්දම් නිපදවීම හා විකිණීම හා ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
ටයර් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
කළුගල් අඹරන (මෙටල් ක්‍රෂර්) වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
පොල්තෙල් මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
ශීත කළ මස් හෝ මාළු ගබඩා කර තබා ගැනීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
උම්බලකඩ නිෂ්පාදනය හා ගබඩා කර තබා ගැනීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
ගිනි කෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කර තබා ගැනීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
බැටරි චාජ් කිරීම හෝ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0

I වැනි තීරය *බලය දෙනු ලබන කාර්යය*	*II වැනි තීරය* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	රු. 750 0 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1,500 0 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 0 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
වැල්ඩින් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
සහල් ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
වී මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
මෝටර් වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
වාත්තු වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
වායු සමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ සර්විස් කිරීමේ හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
කැසට් රේඩියෝ, රූපවාහිනී අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
යන්ත්‍ර සූත්‍ර භාවිතා කරමින් වඩු වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0

12 - 245/2

දමන ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

දමන ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. මංගල මහින්ද ගුණවර්ධන,
සභාපති,
දමන ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 12 වැනි දින,
දමන ප්‍රාදේශීය සභාව.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් දමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2022 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එකී II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2022 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර දමන ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් දමන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය."

I වැනි තීරය *බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය*	*II වැනි තීරය* *ගෙවිය යුතු බද්ද* *රු. ශත*
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	රු. 90 0
රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	රු. 180 0
රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	රු. 300 0
රු. 75,000 ඉක්මවන නමුත් රු. 150,000 නොඉක්මවන අවස්ථාවක	රු. 1,200 0
රු. 150,000 ඉක්මවන අවස්ථාවක	රු. 3,000 0

බලය දෙනු ලබන කාර්යය :

1 වෙන්දේසිකරුවන්
2 බ්‍රෝකර්වරුන්
3 රක්ෂණ ආයතනයන්
4 බැංකු කටයුතු හා මූල්‍ය ආයතන
5 කොන්ත්‍රාත්කරුවන්
6 විදේශ රැකියා ආයතන
7 අපනයන හා ආනයන ඒජන්තවරු
8 සැපයුම්කරුවන්
9 ෆිනෑන්ස් ආයතන
10 ප්‍රවාහන නියෝජිතයින්
11 දෘෂ්ටි පරීක්ෂකයින් හා ඇස් කණ්නාඩි අලෙවිය
12 බලයලත් උකස් ආයතන
13 මෝටර් රථවාහන වෙළෙඳාම් කරන්නෝ
14 රියැදුරු පුහුණු කරන ආයතන
15 යතුරු පැදි හා අත් ට්‍රැක්ටර්, ත්‍රිරෝද රථ වෙළෙඳාම් කරන්නන්
16 පෞද්ගලික අධ්‍යාපන ආයතන හා ළදරු පාසල් පවත්වාගෙන යන්නන්
17 ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ඇඟළුම් කර්මාන්තශාලා හිමියන්
18 වාහන දුම් පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථාන
19 වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යන්නන්
20 විදුලි උපකරණ, ගුවන් විදුලි යන්ත්‍ර, කැසට්, රූපවාහිනී යන්ත්‍ර හා ඉලෙක්ට්‍රොනික් යන්ත්‍ර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යන්නන්
21 පා පැදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යන්නන්
22 මහන මැෂින් විකුණන ස්ථානයක් පවත්වාගෙන යන්නන්
23 පරිගණක යන්ත්‍ර හා ඒ ආශ්‍රිත උපකරණ විකුණන ස්ථානයක් පවත්වාගෙන යන්නන්
24 ශබ්ද විකාශන යන්ත්‍ර කුළියට දීම හෝ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යන්නන්
25 විසිතුරු බඩු හා සාප්පු බඩු වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යන්නන්
26 රෙදිපිළි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යන්නන්
27 ඡායා පිටපත් ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යන්නන්
28 නාන කාමර කට්ටල් හෝ සෙරමික් නිෂ්පාදන භාණ්ඩ හා උළු විකුණන ස්ථානයක් පවත්වාගෙන යන්නන්
29 පුවත්පත්, ලිපිද්‍රව්‍ය, පාසල් උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යන්නන්
30 වතුර පොම්ප විකුණන ස්ථානයක් පවත්වාගෙන යන්නන්
31 පොත් සාප්පුවක් පවත්වාගෙන යන්නන්
32 පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යන්නන්
33 පොලිතීන්, ප්ලාස්ටික්, රබර් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යන්නන්
34 සැලසුම් නිර්මාණය කරන ස්ථානයක් පවත්වාගෙන යන්නන්
35 වාහන බැටරි අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යන්නන්
36 කුෂන් වැඩපළක් පවත්වාගෙන යන්නන්
37 පරිගණක හෝ යතුරුලියන පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යන්නන්
38 ගෑස් අලෙවි නියෝජිත හෝ ගෑස් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යන්නන්
39 එළවළු බීජ වර්ග විකුණන ස්ථානයක් පවත්වාගෙන යන්නන්

40 මැටි වළං දේශීය නිෂ්පාදන විකුණන ස්ථානයක් පවත්වාගෙන යන්නන්
41 පිඟන් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යන්නන්
42 ජ්‍යෝතිෂ්‍ය කටයුතු සඳහා ස්ථානයක් පවත්වාගෙන යන්නන්
43 සනීපාරක්ෂක උපකරණ කට්ටල විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යන්නන්
44 ප්ලාස්ටික් ගෘහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යන්නන්
45 වානේ ගෘහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යන්නන්
46 රජය පිළිගත් ලොතරැයි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යන්නන්
47 පරිගණක හා ඒ ආශ්‍රිත සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යන්නන්
48 දුරකතන සේවා, ෆැක්ස් සේවා, අන්තර්ජාල පහසුකම් සපයන ස්ථානයක් පවත්වාගෙන යන්නන්
49 කායවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන්නන්
50 වේවැල් භාණ්ඩ නිෂ්පාදනය හෝ එම භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යන්නන්
51 පාවහන් හා බෑග් වර්ග වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
52 මිනී පෙට්ටි විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
53 බටහිර ඖෂධ වෙළෙඳසලක් පවත්වාගෙන යාම
54 ආයුර්වේද ඖෂධ වෙළෙඳසලක් පවත්වාගෙන යාම
55 ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
56 ක්‍රීඩා භාණ්ඩ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
57 යතුරු පැදි අමතර කොටස් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
58 පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ තීන්ත ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
59 ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම
60 මෝටර් වාහන කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
61 වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම
62 මංගල ශාලාවක් හෝ උත්සව ශාලාවක් පවත්වාගෙන යාම
63 අවමංගල භාණ්ඩ, උත්සව භාණ්ඩ කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
64 කඩදාසි බෑග් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
65 උළු විකිණීම හා ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
66 අලුත් හෝ පාවිච්චි කරන ලද රබර් ටයර් හෝ ටියුබ් විකිණීම හා ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම
67 ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
68 කෘෂි රසායන ද්‍රව්‍ය ගබඩා කර තැබීම සහ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
69 වායු රයිෆල් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
70 පා පැදි අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
71 කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් සාදන ලද භාණ්ඩ ගබඩා කර තැබීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
72 මත්පැන් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
73 සීනි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
74 සීනි ගබඩාවක් පවත්වාගෙන යාම

12 - 245/3

දමන ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

දමන ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද ඒ කර්මාන්ත බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. මංගල මහින්ද ගුණවර්ධන,
සභාපති,
දමන ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 12 වැනි දින,
දමන ප්‍රාදේශීය සභාව.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, දමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II වැනි තීරුවේ, ඒ එක් එක් කර්මාන්ත පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2022 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර දමන ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් දමන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය."

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරය* *කර්මාන්තයේ ස්වභාවය*	*II වැනි තීරය* *ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 0 නොඉක්මන අවස්ථාවක	*රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1,500 0 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 0 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01	මැටි ගඩොල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02	සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03	ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04	දේශීය ආයුර්වේද බෙහෙත් ද්‍රව්‍ය මිශ්‍ර කිරීමේ හා සැකසීමේ නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	ලොරි බොඩි සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	බිම් මල් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	වානේ ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	වේවැල් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	මහා පරිමාණ සහල් සැකසීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	පාවහන් හා බෑග් වර්ග නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	කොහු ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	කඩදාසි ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	ෆයිබර් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	කුඩා පරිමාණයේ උක් හකුරු නිෂ්පාදනාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	පිත්තල භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	පොල්තෙල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංකය	I වැනි තීරය කර්මාන්තයේ ස්වභාවය	II වැනි තීරය ස්ථානයේ වාර්ෂික වටිනාකම		
		රු. 750 0 නොඉක්මන අවස්ථාවක	රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1,500 0 නොඉක්මවන අවස්ථාවක	රු. 1,500 0 ඉක්මවන අවස්ථාවක
		රු. ශත	රු. ශත	රු. ශත
19.	රත්‍රං, රිදී, තඹ ආශ්‍රිත නිෂ්පාදන කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	රබර් ආශ්‍රිත නිෂ්පාදන කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	පැණි බීම වර්ග නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	අයිස් ක්‍රීම් සහ යෝගට් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12 - 245/4

දමන ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බද්ද පැනවීම

දමන ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද ඒ වාහන හා සතුන් පිළිබඳ බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. මංගල මහින්ද ගුණවර්ධන,
සභාපති,
දමන ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 12 වැනි දින,
දමන ප්‍රාදේශීය සභාව.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු 148 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයෙහි තබා ගන්නා සෑම තැනැත්තෙකුගෙන් ම, එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි මෙහි නිරූපිත ප්‍රමාණයක බද්දක් පනවා අය කිරීමටත්, එකී වාහන හා සතුන් පිළිබඳ බද්දට යටත් තැනැත්තෙකු 2022 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර දමන ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් දමන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය."

උපලේඛනය

I වැනි තීරුව	II වැනි තීරුව රු. ශත.
මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0

I වැනි තීරුව	*II වැනි තීරුව*
	රු. ශත.
සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා,	
(අ) වෙළෙඳ කාර්ය සඳහා යොදවන්නේ නම්,	18 0
(ආ) වෙළෙඳ කාර්ය නොවන කාර්ය සඳහා යොදවන්නේ නම්,	4 0
සෑම කරත්තයක් සඳහා	20 0
සෑම අත් කරත්තයක් සඳහා	10 0
සෑම රික්ෂෝවක් සඳහා	7 50
සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
සෑම ඇතෙකු සඳහා	50 0

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයෙහි වෙළෙඳ කාර්යයන්ට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළෙඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත *නැතහොත්* මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12 - 245/5

දමන ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා ගාස්තු පැනවීම

දමන ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. මංගල මහින්ද ගුණවර්ධන,
සභාපති,
දමන ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 12 වැනි දින,
දමන ප්‍රාදේශීය සභාව.

යෝජනාව

''දමන ප්‍රාදේශීය සභාව සෑම ස්ථිර හා තාවකාලික ප්‍රචාරක දැන්වීම් පුවරුවක් සඳහාම පහත පරිදි ගාස්තු අය කිරීමට යෝජනා කරන්නීය''.

1. සෑම ස්ථිර ප්‍රචාරක දැන්වීම් පුවරුවක් සඳහා වර්ග අඩියකට වර්ෂයකට රුපියල් 125/-.

2. තාවකාලික ප්‍රචාරක දැන්වීම් පුවරුවක් සඳහා සතියකට වර්ග අඩියකට රුපියල් 10 බැගින් අය කිරීමටත්,

12 - 245/6

දමන ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ආදාහනාගාරයට ගාස්තු අයකිරීම

දමන ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. මංගල මහින්ද ගුණවර්ධන,
සභාපති,
දමන ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 12 වැනි දින,
දමන ප්‍රාදේශීය සභාව.

යෝජනාව

"දමන ප්‍රාදේශීය සභාව ආදාහනාගාරය සඳහා 2022 වර්ෂය සඳහා පහත සඳහන් ගාස්තු අයකිරීමට යෝජනා කරන්නීය."

(1)	ආදාහනය කිරීමේ ගාස්තු (ගෑස් මිල සංශෝධනය වූ සෑම අවස්ථාවකදීම මෙම ගාස්තු වෙනස්විය හැකිය.)	රු. 10,500/=
(2)	සුසාන භූමිය තුළ අලුතැන්පත් කොට සොහොන් කොතක් ඉදිකිරීම සඳහා (අඩි 2x2 ප්‍රමාණය පමණක් වේ.)	රු. 200/=

12 - 245/7

දමන ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට සභාව විසින් සපයන සේවාවන් සඳහා ගාස්තු අයකිරීම

දමන ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. මංගල මහින්ද ගුණවර්ධන,
සභාපති,
දමන ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 12 වැනි දින,
දමන ප්‍රාදේශීය සභාව.

යෝජනාව

"දමන ප්‍රාදේශීය සභාව විසින් සපයන සේවාවන් සඳහා 2022 වර්ෂය සඳහා පහත සඳහන් ගාස්තු අයකිරීමට යෝජනා කරන්නීය"

අනු. අංකය		*කාර්යය*	*ගාස්තුව රු.ශත*
01.		වරිපනම් නාම සංශෝධන ඉල්ලුම්පත් ගාස්තු	100 0
02.	I.	වීථි රේඛා ආකෘතිපත් ගාස්තු	100 0
	II.	වීථි රේඛා නොපවරා ගැනීමේ සහතිකපත් නිකුත් කිරීමේ ගාස්තු	1,500 0
	III.	මානක සැලසුම් අනුමත කිරීමේ ගාස්තු	1,500 0

අනු. අංකය		කාර්යය	ගාස්තුව රු. ශත
03.	I.	ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධ ආකෘතිපත් ගාස්තු	200 0
	II.	ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා පරීක්ෂා කිරීමේ ගාස්තු	1,500 0
	III.	ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ගාස්තු (වර්ග අඩි ප්‍රමාණයට අනුව අය කෙරේ.)	

ගෙබිමේ විශාලත්වය	පදිංචිය සඳහා රු. ශ.	වානිජ හෝ වෙනත් භාවිත රු. ශ.
45 අඩු	500 0	1,000 0
45-90	1,500 0	2,000 0
91-180	2,500 0	3,000 0
181-270	3,500 0	4,000 0
271-450	4,500 0	6,000 0
451-675	5.500 0	8,000 0
676-900	6,500 0	10,000 0
901-1,225	7,500 0	12,000 0
1,225 ට වැඩි	ව.මී. 1226 ඉක්මවීමෙන් පසු සෑම ව.මී. 90ක් සඳහාම රු. 1,000 බැගින් අයකරනු ලැබේ.	ව.මී. 1226 ඉක්මවීමෙන් පසු සෑම ව.මී. 90ක් සඳහාම රු. 1,250ක් අයකරනු ලැබේ.

04.	I.	පරිසර බලපත්‍ර ආකෘතිපත් ගාස්තු	200 0
	II.	පරිසර බලපත්‍ර ගාස්තු	3,000 0
	III.	1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වැනි වගන්තියට අනුව පරීක්ෂා කිරීමේ ගාස්තු අයකිරීම පහත පරිදි වේ.	

ආයෝජනය	*පරීක්ෂා කිරීමේ ගාස්තුව*	*මුළු මුදල*
01. 1,000,000 වැඩි	*8,000 0*	*8,000 0*
02. 500,001 සිට 1,000,000 දක්වා	*4,000 0*	*4,000 0*
03. 250,001 සිට 500,000 දක්වා	*3,000 0*	*3,000 0*
04. 100,000 සිට 250,000 දක්වා	*750 0*	*750 0*
05. 100,000 අඩු400 0	*400 0*	*400 0*

05.	I.	අන්තරාදායක ගස් කපා බිම හෙළීම සඳහා ආකෘතිපත් ගාස්තු	100 0
	II.	අන්තරාදායක ගස් කපා බිම හෙළීමට අනුමත කිරීමේ ගාස්තු :	
		කොහොඹ ගසකට	1,300 0
		කොස් ගසකට	1,300 0
		තේක්ක ගසකට	1,300 0
		වෙනත් ගසකට	1,300 0
06.		පුස්තකාල සාමාජික ගාස්තු	
	I.	වැඩිහිටියෙකුගෙන් සාමාජික ගාස්තු	50 0
		පෝරම ගාස්තු	5 0
		ඇප ගාස්තු	75 0
	II.	පාසල් ළමුන් සඳහා සාමාජික ගාස්තු	10 0
		පෝරම ගාස්තු	5 0
		ඇප ගාස්තු	30 0
	III.	සාමාජිකත්වය අළුත් කිරීම	30 0

අනු. අංකය		කාර්යය	ගාස්තුව රු. ශත
07.		සුනඛ එන්නත් කිරීමේ ගාස්තු	100 0
08.		පාපැදි බලපත්‍ර හා සේවා ගාස්තු	20 0
09.	I.	වෙළෙඳ ප්‍රවර්ධන කටයුතු සඳහා පොළ භූමිය පමණක් ලබාදීම.	5,000 0
	II.	ළමා අධ්‍යාපන කටයුතු සඳහා නොවන වැඩ සටහන්වලට පොළ භූමිය සමග ගොඩනැගිල්ල ලබාදීම.	12,000 0
	III.	ළමා අධ්‍යාපන කටයුතු සඳහා නොවන වැඩ සටහන්වලට පොළ ගොඩනැගිල්ල ලබාදීම.	7,000 0
	IV.	ළමා අධ්‍යාපන කටයුතු සඳහා පොළ භූමිය හා ගොඩනැගිල්ල ලබාදීම (සම්මන්ත්‍රණ/උත්සව).	3,000 0
	V.	ලීසිං ආයතන සහ සංදර්ශන ජංගම රථයක් තුළ වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා පොළ භූමිය ලබාදීම.	3,000 0
	VI.	අනෙකුත් වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා පොළ භූමියෙන් කොටසක් ලබාදීම.	1,500 0
	VII.	පල්ලන්ඔය, 6 පාලම, මාන්තොට්ටම, සතිපොළ භූමිය විවිධ ඉල්ලීම් සඳහා කුලියට දීම	1,500 0
	VIII.	දමන ප්‍රාදේශීය සභාවේ බෝට්ටුව කුලියට දීම	1,500 0
		(09) I - VIII දක්වා එක් දිනක් සඳහා පමණක් අයකරනු ලබන ගාස්තු මෙහි සඳහන් කර ඇත.	
10.	*	එක් දිනක් සඳහා ප්ලාස්ටික් පුටුවක් කුලියට ලබාදීමේ ගාස්තු	5 0
	*	ඒ සඳහා ඇප තැන්පත් ගාස්තු	1,000 0
	*	එක් දිනක් සඳහා තහඩු 20 ක් කුලියට ලබාදීමේ ගාස්තු	500 0
	*	ඒ සඳහා ඇප තැන්පත් ගාස්තු	1,000 0
	*	එක් දිනක් සඳහා සාස්පාන් 2ක් හා තාච්චි 01 ක් කුලියට දීමේ ගාස්තු	500 0
	*	ඒ සඳහා ඇප තැන්පත් ගාස්තු	1,000 0
	*	එක් දිනක් සඳහා ගෑස් ලිප කුලියට දීමේ ගාස්තු	500 0
	*	ඒ සඳහා ඇප තැන්පත් ගාස්තු	1,000 0
	*	එක් දිනක් සඳහා ශබ්ද විකාශන යන්ත්‍රය කුලියට දීමේ ගාස්තු	500 0
	*	ඒ සඳහා ඇප තැන්පත් ගාස්තු	1,000 0
	VI.	බවුසරය කුලියට දීමේ ගාස්තු (කිලෝමීටර් 10 ක් ඇතුළත) වැඩිවන සෑම කිලෝමීටරයක් සඳහාම රු. 25/= ක මුදලක් අයකරනු ලැබේ. ඉන්ධන මිල වෙනස් වීමේදී ගාස්තු වෙනස් වීමට ඉඩ ඇත.	1,000 0
	VII.	ටේලරය කුලියට දීම	1,500 0
	VIII.	ට්‍රැක්ටරය කුලියට දීම ධාවනය කරන දුර කි.මී. 05 දක්වා දිනක ගාස්තුව අයකරන අතර, වැඩිවන සෑම කි.මී. 1 ක් සඳහා දිනක ගාස්තුවට අමතරව රු. 75/=ක් අයකරනු ලැබේ.	4,000 0

අනු. අංකය	කාර්යය	ගාස්තුව රු. ශත
IX.	ටේලරය සමග ට්‍රැක්ටරය කුළියට දීම ධාවනය කරන දුර කි.මී. 05 දක්වා දිනක ගාස්තුව අයකරන අතර, වැඩිවන සෑම කි.මී. 1ක් සඳහා දිනක ගාස්තුවට අමතරව රු. 100/=ක් අයකරනු ලැබේ.	5,000 0
X.	පස්තලන යන්ත්‍රය කුළියට දීම	3,000 0
XI.	ගල් රෝල කුළියට දීම	5,000 0
XII.	කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍ර කුළියට දීම	3,000 0
XIII.	ටිපර් රථය කුළියට ලබා දීම ධාවනය කරන දුර කි.මී. 40 දක්වා දිනක ගාස්තුව අයකරන අතර, වැඩිවන සෑම කි.මී.1 ක් සඳහා දිනක ගාස්තුවට අමතරව රු. 120/=ක් අයකරනු ලැබේ. (10) VI -XIII දක්වා ඉන්ධන සමග එක් දිනක් සඳහා පමණක් අයකරනු ලබන ගාස්තු මෙහි සඳහන් කර ඇත.	5,000 0
XIV.	මෝටර් ග්‍රේඩරය කුළියට ලබාදීම	4,000 0
XV.	බැකෝ ලෝඩරය (J.C.B) කුළියට ලබාදීම. 10 XIV -XV දක්වා ඉන්ධන සමග මීටර් පැයක් සඳහා පමණක් අයකරනු ලබන ගාස්තු මෙහි සඳහන් කර ඇත. කාර්යාල භූමියේ සිට අදාළ වැඩ බිම දක්වා මීටර් පැය ගණන, ගණනය කරනු ලැබේ. අංක 10 යටතේ සඳහන් කුළියට ලබාදෙන සියලු උපකරණ සහ වාහන සඳහා 1% ක් මුද්දර බදු ලෙස අයකරනු ලැබේ.	3,500 0

11. බල ප්‍රදේශය තුළ ජංගම වෙළෙඳාම සඳහා එක් දිනක් වෙනුවෙන් අයකරනු ලබන ගාස්තු පහත පරිදි වේ.

මෝටර් බයිසිකල් මගින් වෙළඳාම් කිරීම	200 0
ත්‍රී වීල් මගින් වෙළඳාම් කිරීම	300 0
ලොරි රථ මගින් වෙළඳාම් කිරීම	500 0
ජංගම රථවලින් පිසූ ආහාර වෙළඳාම් කිරීම	300 0

12 - 245/8

දමන ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ඉදිකිරීම් වෙනුවෙන් නේවාසික හා වාණිජ ඉඩම් සඳහා ගාස්තු පැනවීම

දමන ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. මංගල මහින්ද ගුණවර්ධන,
සභාපති,
දමන ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 12 වැනි දින,
දමන ප්‍රාදේශීය සභාව.

යෝජනාව

"දමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඉදිකිරීම් වෙනුවෙන් නේවාසික හා වාණිජ ඉඩම් සඳහා පහත පරිදි ගාස්තු අයකිරීමට යෝජනා කරනු ලැබේ".

ඉදිකිරීම් අදියර	*නේවාසික (ව. මී. 1)*	*වාණිජ (ව. මී. 1)*
අත්තිවාරම් වැඩ පමණක්	රු. 100 0	රු. 250 0
වහල මට්ටම දක්වා (වහල රහිතව)	රු. 150 0	රු. 500 0
වහලය ඇතුළු ඉදිකර ඇත	රු. 200 0	රු. 750 0
සම්පූර්ණයෙන් ඉදිකර ඇත	රු. 250 0	රු. 1,000 0

12 - 245/9

දමන ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා දුරකථන සන්නිවේදන කුළුණු, විදුලි සංදේශ කුළුණු සඳහා ගාස්තු පැනවීම

දමන ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. මංගල මහින්ද ගුණවර්ධන,
සභාපති,
දමන ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 12 වැනි දින,
දමන ප්‍රාදේශීය සභාව.

යෝජනාව

"දමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඉදිකරන සියලුම දුරකථන සන්නිවේදන කුළුණු, විදුලි සංදේශ කුළුණු සඳහා සැලසුම් අනුමත කිරීම සඳහා 2022 වර්ෂය සඳහා පහත පරිදි ගාස්තු අයකිරීමට යෝජනා කරනු ලැබේ."

01. උස මීටර් 05 සිට 20 දක්වා - රු. 20,000 0
02. උස මීටර් 20ට වැඩි සෑම මීටර් 01 කට - රු. 100 0

12 - 245/10

දමන ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා දුරකථන සන්නිවේදන කුළුණු, විදුලි සංදේශ කුළුණු සඳහා ගාස්තු පැනවීම

දමන ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. මංගල මහින්ද ගුණවර්ධන,
සභාපති,
දමන ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 12 වැනි දින,
දමන ප්‍රාදේශීය සභාව.

යෝජනාව

"දමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඉදිකරන සියලුම දුරකථන සන්නිවේදන කුළුණු, විදුලි සංදේශ කුළුණු නිසි සංවර්ධන බලපත්‍රයක් ලබා නොගෙන ඉදිකිරීම වෙනුවෙන් උස සෑම මීටර් 05කටම රු. 10,000 බැගින් යෝජනා කරනු ලැබේ.

12 - 245/11

දමන ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා විශේෂ සංවර්ධන ව්‍යාපෘති සඳහා ගාස්තු පැනවීම

දමන ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. මංගල මහින්ද ගුණවර්ධන,
සභාපති,
දමන ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 12 වැනි දින,
දමන ප්‍රාදේශීය සභාව.

යෝජනාව

"දමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කරනු ලබන විශේෂ සංවර්ධන ව්‍යාපෘති සඳහා පහත පරිදි ගාස්තු අයකිරීමට යෝජනා කරනු ලැබේ."

01. රුපියල් 100,000 සිට මිලියන පහ දක්වා ලක්ෂයකට රුපියල් 200 බැගින්
02. සෑම මිලියන 05 කටම රුපියල් 10,000 බැගින් අය කිරීමට

12 - 245/12

දමන ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා අනුකූලතා සහතික සඳහා ගාස්තු පැනවීම

දමන ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. මංගල මහින්ද ගුණවර්ධන,
සභාපති,
දමන ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 12 වැනි දින,
දමන ප්‍රාදේශීය සභාව.

යෝජනාව

"දමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අනුකූලතා සහතිකයක් නොමැතිව ගොඩනැගිල්ලක පදිංචි වීමේ දී මාසයක් සඳහා රුපියල් 100 බැගින් අයකිරීමට යෝජනා කරනු ලැබේ."

12 - 245/13

දමන ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා මානක සැලසුම් සඳහා ගාස්තු පැනවීම

දමන ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. මංගල මහින්ද ගුණවර්ධන,
සභාපති,
දමන ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 12 වැනි දින,
දමන ප්‍රාදේශීය සභාව.

යෝජනාව

"දමන ප්‍රාදේශීය සභාව මානක සැලසුම් පිටපතක් සහතික කිරීම සඳහා රුපියල් 1000 ක ගාස්තුවක් අයකිරීමට යෝජනා කරනු ලැබේ."

12 -245/14

දමන ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ඉඩම් අනු කොටස්වලට බෙදීම සඳහා ගාස්තු අයකිරීම

දමන ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. මංගල මහින්ද ගුණවර්ධන,
සභාපති,
දමන ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 12 වැනි දින,
දමන ප්‍රාදේශීය සභාව.

යෝජනාව

"දමන ප්‍රාදේශීය සභාව සතු ඉඩම් අනු කොටස්වල බෙදීම් කිරීමේදී ගාස්තු අයකළ යුතු ආකාරය පහත පරිදි යෝජනා කරනු ලැබේ.''

බිම් කට්ටි ප්‍රමාණය	*මුදල*
වි. මී. 150 - 300	රු. 500 0
වි. මී. 301 - 600	රු. 400 0
වි. මී. 601 - 900	රු. 300 0
වි. මී. 900 වැඩි	රු. 200 0

12 - 245/15

දමන ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා මායිම් තාප්ප ආරක්ෂක බැමි සඳහා ගාස්තු අයකිරීම

දමන ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. මංගල මහින්ද ගුණවර්ධන,
සභාපති,
දමන ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 12 වැනි දින,
දමන ප්‍රාදේශීය සභාව.

යෝජනාව

"දමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සතු ඉඩම්වල මායිම් තාප්ප, ආරක්ෂක බැමි ඉදිකිරීම සඳහා ගාස්තු අයකිරීමට පහත පරිදි යෝජනා කරනු ලැබේ."

	නේවාසික	*වාණිජ*
ගොඩනැගිලි සීමාවෙන් පිටත - දිග මීටර් 01	රු. 150	රු. 200
ගොඩනැගිලි සීමාව තුළ - දිග මීටර් 01	රු. 250	රු. 300

12- 245/16

දමන ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ඉඩම් කුඹුරු ගොඩකිරීම සඳහා ගාස්තු අයකිරීම

දමන ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. මංගල මහින්ද ගුණවර්ධන,
සභාපති,
දමන ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 12 වැනි දින,
දමන ප්‍රාදේශීය සභාව.

යෝජනාව

"දමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඉඩම් කුඹුරු ගොඩකිරීම සඳහා පහත පරිදි ගාස්තු අයකිරීමට යෝජනා කරනු ලැබේ."

01. වර්ග මීටර් 150 ට අඩු රුපියල් 1,500 ක්
02. වැඩි වන සෑම මීටර් 01 කටම රුපියල් 100 බැගින්
(ඉඩම් ගොඩ කිරීමට අදාළ අනුමැතිය ලබා තිබිය යුතුය.)

12 - 245/17

දමන ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ත්‍රිරෝද රථ ගාලක සිට මගීන් ප්‍රවාහන කටයුතු කිරීම සඳහා ගාස්තු අයකිරීම

දමන ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. මංගල මහින්ද ගුණවර්ධන,
සභාපති,
දමන ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 12 වැනි දින,
දමන ප්‍රාදේශීය සභාව.

යෝජනාව

"දමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ත්‍රිරෝද රථ ගාලක සිට මගීන් ප්‍රවාහන කටයුතු කිරීම සඳහා වාර්ෂික අවසර පත්‍රයක් නිකුත් කිරීමට රු. 500ක ගාස්තුවක් 2022 වර්ෂය සඳහා අයකිරීමට යෝජනා කරනු ලැබේ."

"දමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ත්‍රිරෝද රථ ගාලට අළුතින් ත්‍රිරෝද රථයක් ඇතුළත් කිරීම සඳහා රු. 2,000ක ගාස්තුවක් 2022 වර්ෂය සඳහා අයකිරීමට යෝජනා කරනු ලැබේ."

12 - 245/18

දමන ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා සතිපොළ කුළී අයකිරීම සඳහා ගාස්තු අයකිරීම

දමන ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. මංගල මහින්ද ගුණවර්ධන,
සභාපති,
දමන ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 12 වැනි දින,
දමන ප්‍රාදේශීය සභාව.

යෝජනාව

"දමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සතු සතිපොළ කුළී අයකිරීම සඳහා බිම් ප්‍රමාණය අනුව පහත පරිදි ගාස්තු අයකිරීමට යෝජනා කරනු ලැබේ".

වර්ග අඩි	*පාදාගොඩ (මුදල)*	*මාන්නොට්ටම (මුදල)*	*පල්ලංඔය (මුදල)*	*හිඟුරාණ (මුදල)*
වර්ග අඩි 50	රු. 50	රු. 50	රු. 50	රු. 80
වර්ග අඩි 50 - 100	රු. 80	රු. 80	රු. 80	රු. 150
වර්ග අඩි 100 - 200	රු. 150	රු. 150	රු. 150	රු. 300
වර්ග අඩි 50ට නොවැඩි මස්, මාළු හැර (වෙළඳ තට්ටුවක් සඳහා)	රු. 100	රු. 100	රු. 100	රු. 200
වර්ග අඩි 50ට නොවැඩි මාළු, කුකුළු මස් (වෙළඳ තට්ටුවක් සඳහා)	රු. 100	රු.100	රු. 100	රු. 250
ලොරි රථයක් තබාගෙන වෙළඳාම් කිරීම සඳහා	රු. 200	රු. 200	රු. 200	රු. 300

* හිඟුරාණ සතිපොළ ගොඩනැගිල්ලේ වෙළඳ කොටස් සඳහා
  ප්‍රමාණයෙන් විශාල එක් කොටසක් සඳහා රු. 150 බැගින් 144
  ප්‍රමාණයෙන් කුඩා එක් කොටසක් සඳහා රු. 100 බැගින් 120

* වේදිකාව මත තිබෙන එක් හිස් කොටසක් සඳහා රු. 100 බැගින් 13

12 - 245/19

දමන ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා මාර්ග හරහා ජල නල එලීමේ දී මාර්ග පළුදු කර නැවත සකස් කිරීම සඳහා ගාස්තු අයකිරීම

දමන ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. මංගල මහින්ද ගුණවර්ධන,
සභාපති,
දමන ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 12 වැනි දින,
දමන ප්‍රාදේශීය සභාව.

යෝජනාව

"දමන ප්‍රාදේශීය සභාව විසින් මාර්ග හරහා ජල නල එලීමේ දී මාර්ග පළුදු කර නැවත සකස් කිරීම සඳහා 2022 වර්ෂය සඳහා පහත සඳහන් ගාස්තු අය කිරීමට යෝජනා කරන්නීය.

මාර්ග හරහා ජල නල එලීමේදී මාර්ග පළුදු කර නැවත සකස් කිරීම වෙනුවෙන් පහත පරිදි තැන්පත් මුදල් ලබා ගැනීමටත්, එම මුදලින් 25%ක් පරීක්ෂණ ගාස්තු ලෙස රඳවා ගැනීමටත් 75%ක් වැඩ නිමකළ පසු කාර්මික නිලධාරි මහතාගේ නිර්දේශය මත නිදහස් කිරීමටත් සභා සම්මත විය.

		රු. ශ.
I.	කොන්ක්‍රීට් මාර්ග	3,500 0
II.	තාර මාර්ග	4,000 0
III.	කාපට් මාර්ග	5,000 0
IV.	මාර්ග උරහිස පළුදු කිරීම	1,500 0

12 - 245/20

දමන ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා කසල බැහැර කිරීම සඳහා ගාස්තු අයකිරීම

දමන ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ නොවැම්බර් මස 12 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ. ඒ. මංගල මහින්ද ගුණවර්ධන,
සභාපති,
දමන ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 12 වැනි දින,
දමන ප්‍රාදේශීය සභාව.

යෝජනාව

"කසල බැහැර කිරීම සඳහා 2022 වර්ෂය සඳහා පහත සඳහන් ගාස්තු අයකිරීමට යෝජනා කරන්නීය."

බල ප්‍රදේශයේ තුළ සභාව විසින් කසල ඉවත් කරනු ලබන ආයතන, කර්මාන්ත. වෙළඳ ස්ථානවලින් ජනනය වන කසල බැහැර කිරීම සඳහා මාසිකව ගාස්තු අය කිරීම පහත පරිදි වේ.

සාමාන්‍ය ව්‍යාපාර ආයතනයක් සඳහා	රු. 100 0 ක්ද,
රාජ්‍ය ආයතනයක් සඳහා	රු. 200 0 ක්ද,
කර්මාන්තශ ශාලා සඳහා	රු. 500 0 ක්ද,
නිවාඩු නිකේතන (ගෙස්ට් හවුස් හා රෙස්ට් හවුස්) වලින්	රු. 500 0 ක්ද,

12 - 245/21

දමන ප්‍රාදේශීය සභාව

හම්බන්තොට මහා නගර සභාව.

2021 සැප්තැම්බර් මස 16 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"හම්බන්තොට මහා නගර සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 1811 දරන 2013 මැයි මස 17 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල V, VI, VII, VIII, IX, X, XII, XIII, XIV, XV, XVI, XVII, XVIII, XXI යන අතුරු ව්‍යවස්ථා ද අංක 541/17 දරන 1989 ජනවාරි 20 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල XIV, XXVII, XXVIII යන අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අනුව මෙහි පහත උපලේඛනයේ I වැනි කොටසේ සඳහන් කිසියම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් 2022 වර්ෂයේ දී කරගෙන යනු ලබන අවස්ථාවක, එකී කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා හම්බන්තොට මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා ගෙන් බලපත්‍රයක් ලබාගත යුතු බවත් එසේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් වෙනුවෙන් ම, එකී කර්මාන්තය කරගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම පහත සඳහන් උපලේඛනයේ 2 වැනි කොටසේ 1 වැනි තීරයේ ඇතුළත් ප්‍රමාණයන් අතර පවත්නා අවස්ථාවක, එහි II වැනි තීරයේ අනුරූප සටහනෙහි නිරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ බලපත්‍ර ගාස්තුවක් 252 වන අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 247 (අ) වන වගන්තියෙන් මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, 2022 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර හම්බන්තොට මහා නගර සභාවට ගෙවිය යුතු බවටත් හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නී ය."

උපලේඛනය

1 වැනි කොටස

1. මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
2. මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
3. සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
4. කොණ්ඩා සැකසීම, බාබර් සාප්පු, සැලූන් හා රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
5. බේකරියක් පවත්වාගෙන යාම
6. කිරිපට්ටියක් පවත්වාගෙන යාම
7. අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
8. බත් කඩ, ආපන ශාලා, තේ හෝ කෝපි කඩ පවත්වාගෙන යාම
9. හෝටලයක් පවත්වාගෙන යාම
10. නවාතැන් පොලක් පවත්වාගෙන යාම
11. ලොන්ඩරියක් පවත්වාගෙන යාම
12. කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
13. අවමංගල්‍ය සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
14. ඌරන් ආදී සතුන් ඇති කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

මෙහි පහත දැක්වෙන කර්මාන්ත හෝ ව්‍යාපාර (252 වැනි අධිකාරය වන) මහා නගර සභා ආඥාපනතේ 147 වැනි වගන්තියේ කාර්ය සඳහා පීඩාකාරී කර්මාන්ත හෝ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1. මිනිරන් වර්ග කිරීම හා සකස් කිරීම.
2. මිනිරන් ගබඩාකර තැබීම.
3. පොහොර නිෂ්පාදනය.
4. පොහොර ගබඩාකර තබා ගැනීම
5. හම් ගබඩා කර තැබීම.
6. උම්බලකඩ හොන්ඩර 5කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම
7. කුකුළු වෙළෙඳපොළක් පවත්වාගෙන යාම.
8. කළුගල් කැඩීම සහ කබොක් කැපීම.
9. බොරලු හෑරීම.
10. අශ්වයන් හෝ ගවයන් සඳහා ඉස්තාලයක්, වෙළෙඳපොළක්, ගාලක් හෝ ලැයිමක් තබා ගැනීම.
11. පශු ගිලන් හලක් පවත්වාගෙන යාම.
12. රබර් සකස් කිරීම
13. පොහොර, ලුණු හෝ මිනිරන් දමා තිබූ ගෝනි ගබඩා කිරීම, ශුද්ධ කිරීම, අලුත්වැඩියා කිරීම හෝ ඒවායේ දූලි ඉවත් කිරීම
14. පුවක් සකස් කිරීම.
15. තලාතු මිනිරන් සකස් කිරීම.
16. බැටළුවන් හෝ එළුවන් හෝ දෙවර්ගයම හෝ 10 දෙනෙකුට වඩා ගාල්කොට තැබීම සඳහා වූ මඩුවක් හෝ ගාලක් තබා ගැනීම
17. උළු කොන්ක්‍රීට් පයිප්ප හෝ වෙනත් කොන්ක්‍රීට් ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
18. හුණු ගබඩා කොට තැබීම.
19. බොම්බයි ලූණු හොණ්ඩර 05කට වඩා ගබඩා කොට තැබීම
20. අර්තාපල් හොණ්ඩර 05කට වඩා ගබඩාකොට තැබීම.
21. පොල්කටු අඟුරු හොණ්ඩරයකට වඩා ගබඩා කොට තැබීම.
22. කුරුඳු, කරදමුංගු හෝ කෙඳි, ගෙන්දගම් දුම් ගස්සා සකස් කිරීම.
23. පරණ ලෝහ ගබඩා කර තැබීම.
24. සිමෙන්ති හොණ්ඩර 25කට වඩා ගබඩාකර තැබීම.
25. කරවල හොණ්ඩර 10කට වඩා ගබඩාකර තැබීම.
26. ලුණු දැමූ මාළු හොණ්ඩර 10කට වඩා ගබඩාකර තැබීම.
27. රබර් ඔට්ටපාලු සුන්බුන් ඇඹරීම හෝ වේලීම.
28. ට්‍රංක පෙට්ටි නිෂ්පාදනය.
29. මරා සකස් කරන ලද කුකුළු ආදී සතුන් විකිණීම සඳහා කඩයක් පවත්වාගෙන යාම.
30. ගම් වර්ග නිෂ්පාදනය.
31. විෂබීජ නාශක ද්‍රව්‍ය නිෂ්පාදනය.
32. බැටරි පුරවනු ලබන්නාවූ හෝ බැටරි ගබඩා කොට තබනු ලබන්නා වූ ආයතනයක් පවත්වාගෙන යාම.
33. ටයර් ප්‍රතිසංස්කරණය කරනු ලබන්නා වූ හෝ කට්ට කැපීම කරන්නාවූ ආයතනයක් පවත්වාගෙන යාම.
34. ටයර් හෝ ටියුබ් වෝල්කනයිස් කරන ආයතනයක් පවත්වාගෙන යාම.
35. හිස් බෝතල් 100 කට වඩා වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
36. කුරුඳු පොතු හොණ්ඩරයකට වඩා වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
37. කොකෝවා හොණ්ඩර 10කට වඩා වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම
38. මිනී පෙට්ටි සෑදීම හෝ ගබඩා කොට තැබීම
39. ගෘහ භාණ්ඩ සෑදීම හෝ ගබඩා කොට තැබීම
40. මැණික් වෙළෙන්දන් විසින් මැණික් කැපීම හා ඔපදැමීම.
41. බලපත්‍ර ලත් වෙළෙන්දන් විසින් රබර් ගබඩා කොට තැබීම.
42. වේවැල් බඩු සෑදීම හෝ ගබඩා කොට තැබීම
43. කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කොට තැබීම.
44. යාන්ත්‍රික බලය යොදාගෙන රෙදි වියන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
45. පිටි හෝ කුළු බඩු ඇඹරීම.
46. පුන්නක්කු හැර සත්ව ආහාර හොණ්ඩර 20කට වඩා ගබඩාකර තැබීම.

47. සත්ව ආහාර හැර වෙනත් කාර්යයන් සඳහා ධාන්‍ය ටොන් එකකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම, එහෙත් සමුපකාර සමිතියක් විසින් ගබඩා කොට තබා ගන්නා එවැනි ධාන්‍ය මෙම නියමයට යටත් නොවේ.
48. රබර් භාණ්ඩ නිෂ්පාදනය.
49. මෝර වරල් සකස් කිරීම හා ගබඩා කොට තැබීම.
50. යන්ත්‍රානුසාරයෙන් ඇටකටු ඇඹරීම.
51. පුන්නක්කු ටොන් එකකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
52. පොලිතින් සෙලියුලොයිඩ් හෝ පර්ස්පෙක්ස් නිෂ්පාදනය නිපදවීම සහ ගබඩා කර තැබීම.
53. ඇසිඩ් ගැළුම් 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තැබීම.
54. කපුරු නිෂ්පාදනය.
55. බූට් සපත්තු සහ පාවහන් නිෂ්පාදනය.
56. ඉටිපන්දම් නිෂ්පාදනය.

මෙහි පහත දැක්වෙන කර්මාන්ත හෝ ව්‍යාපාර (252 වැනි අධිකාරය) මහා නගර සභා ආඥාපනතේ 147 වැනි වගන්තියේ කාර්යය සඳහා අන්තරාදායක කර්මාන්ත හෝ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1. වාෂ්ප, ජලය හෝ වෙනත් යාන්ත්‍රික බලයක් යොදාගෙන දූව හෝ ලී ඉරීම.
2. සිසිල් බීම නිෂ්පාදනය.
3. කොප්පරා ගබඩාවක් පවත්වාගෙන යාම.
4. යන්ත්‍රානුසාරයෙන් පොල් තෙල් නිෂ්පාදනය.
5. යන්ත්‍රානුසාරයෙන් තල තෙල් නිෂ්පාදනය.
6. තෙල් හිඳීම සඳහා සෙක්කුවක් හෝ අත් මෝලක් තබා ගැනීම.
7. කෙඳි නිෂ්පාදනය හෝ ගබඩා කොට තැබීම
8. ගිනි පෙට්ටි නිෂ්පාදනය.
9. ඉඹුල් පුළුන් ගබඩා කොට තැබීම.
10. පොල් තෙල් ගැලුම් 50කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
11. මැතිලේටඩ් ස්ප්‍රිතු ගබඩා කොට තැබීම.
12. ඇසිටලීන් නිෂ්පාදනය.
13. උළු 500කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම.
14. ගඩොල් 250 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම.
15. කබොක් ගල් 250 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම.
16. සිගරට් නිෂ්පාදනය.
17. බීඩි නිෂ්පාදනය.
18. තීන්ත හෝ වාර්නිෂ් හොන්ඩර 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
19. ලී පෙට්ටි හොණ්ඩර 5 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකොට තැබීම.
20. කොහු නිෂ්පාදනය.
21. පොහොර, හුණු හෝ මිනිරන් දමා තිබූ ගෝනි හැර වෙනත් ගෝනි 100කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
22. පාවිච්චි කළ රබර් ටයර් හෝ ටියුබ් 150කට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
23. රසකැවිලි නිෂ්පාදනය.
24. පොල් කටු අඟුරු හැර වෙනත් අඟුරු හොණ්ඩරයකට වැඩි ප්‍රමාණයක් ගබඩා කොට තැබීම.
25. බෝට්ටු හෝ බත්තල් සෑදීම.
26. ලී පෙට්ටි සෑදීම.
27. ඔක්සිජන් හා වෑල්ඩිං වැඩ කරනු ලබන්නා වූ ද මෝටර් වාහන අලුත්වැඩියා කරන්නා වූ ද ගරාජයක් නොවන්නා වූ ද වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම.
28. මෝටර් වාහන අලුත්වැඩියා කරන්නා වූ ද යකඩ සහ ලෝහ වැඩ කරනු ලබන්නා වූ ද ගරාජයක් නොවන්නා වූ ද වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම.
29. මෝටර් වාහන අලුත්වැඩියා කරන ආයතනයක් පවත්වාගෙන යාම.
30. මෝටර් වාහන සර්විස් කරන ආයතනයක් පවත්වාගෙන යාම.
31. යාන්ත්‍රික බලය යොදා ගනු ලබන්නා වූ මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
32. අතින් හෝ පා පොලුවලින් ක්‍රියා කරවන යන්ත්‍රයක් පාවිච්චි කෙරෙන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
33. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තැබීම.

34. පොල්තෙල් හැර වෙනත් කවර හෝ වර්ගයක තෙල් ලීටර් 54.5 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම.
35. ගෙන්දගම් හෝ ගෙන්දගම් කුඩු කිලෝග්‍රෑම් 50කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තැබීම.
36. තීන්ත හෝ වාර්නිෂ් නිෂ්පාදනය.
37. 100කට අධික ප්‍රමාණයක් පතොරම් ගබඩාකර තැබීම.
38. කොහු හෝ පුළුන් මෙට්ට හෝ කොට්ට හෝ කුෂන් නිෂ්පාදනය සහ/හෝ ගබඩාකර තැබීම.
39. අලුත් ටයර් හෝ ටියුබ් 150කට අධික ප්‍රමාණයක් ගබඩාකර තැබීම.
40. පාවිච්චි කළ කඩදාසි කිලෝග්‍රෑම් 250කට අධික ප්‍රමාණයක් ගබඩාකර තැබීම.
41. ස්ප්‍රේ පේන්ටිං වැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
42. යාන්ත්‍රික ශීතකරණය සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
43. යාන්ත්‍රික බලය පාවිච්චි කරනු ලබන්නා වූ ඇඳුම් මැසීම කරනු ලබන්නා වූ ද ආයතනයක් පවත්වාගෙන යාම.
44. කමිස කොලර් සහ කමිස අත් රැළි දමන ආයතනයක් පවත්වාගෙන යාම.

මෙහි පහත දැක්වෙන කර්මාන්ත හෝ ව්‍යාපාර (252 වැනි අධිකාරය වන) මහා නගර සභා ආඥාපනතේ 147 වැනි වගන්තියේ කාර්ය සඳහා අන්තරාදායක සහ පීඩාකාරී කර්මාන්ත හෝ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1. ඩ්‍රයික්ලීන් වැඩ කරන ආයතනයක් පවත්වාගෙන යාම.
2. යාන්ත්‍රික බලය පාවිච්චි නොකරන, ඉලෙක්ට්‍රෝ ප්ලේටිං වැඩ, ක්‍රෝමියම් ආලේප කිරීම, රන් ආලේප කිරීම, රිදී ආලේප කිරීම හෝ තඹ ආලේප කිරීම කරනු ලබන ආයතනයක් පවත්වාගෙන යාම.
3. යාන්ත්‍රික බලය පාවිච්චි කරන්නා වූ ද, ඉලෙක්ට්‍රෝ ප්ලේටිං වැඩ කරනු ලබන්නා වූ ද ගරාජයක් නොවන්නා වූ ද ආයතනයක් පවත්වාගෙන යාම.
4. ගල් අඟුරු ගෑස් නිෂ්පාදනය සහ ගබඩා කිරීම.
5. කාබන්ඩයොක්සයිඩ් නිෂ්පාදනය.
6. අශුද්ධ ලෝහ උණු කිරීම.
7. ගිණිකෙළි භාණ්ඩ ගබඩා කිරීම.
8. කිලෝග්‍රෑම් 2කට අධික ප්‍රමාණයකින් වෙඩි බෙහෙත් සහ පුපුරන ද්‍රව්‍ය ගබඩා කිරීම.
9. ගම්, ඉටි හෝ දුම්මල (රෙසින්) ගබඩා කිරීම.
10. බිම ඔප දමන පොලිෂ් නිෂ්පාදනය.
11. තාර පෙරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
12. ශීතකරණ අලුත්වැඩියා කිරීම, රීකන්ඩිෂන් කිරීම හෝ පරීක්ෂා කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
13. මෝටර් කාර් එකලස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
14. ස්කූටර් හෝ මෝටර් සයිකල් එකලස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
15. පුපුරන ද්‍රව්‍ය, රසායන ද්‍රව්‍ය සහ පොහොර විකිණීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
16. ගල් කොරියක් පවත්වාගෙන යාම.
17. ගල් මෝලක් පවත්වාගෙන යාම.
18. ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම.

උපලේඛනය

2 වැනි කොටස

	I වැනි තීරුව *වාර්ෂික වටිනාකම*	*II වැනි තීරුව* *බලපත්‍ර ගාස්තුව* *රු. ශත*
1.	රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	2,000 0
2.	රු. 1,500 ඉක්මවන නමුත් රු. 2,500 නොඉක්මවන විට	3,000 0
3.	රු. 2,500 ඉක්මවන විට	5,000 0

ඉහත 1 වැනි කොටසේ සඳහන් කර්මාන්ත අතරින් කිසියම් හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන් පොළක් 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තා වූ ද වන අවස්ථාවක, ඉහත 2 වැනි කොටසේ කුමක් සඳහන්ව තිබුණ ද ඒ හෝටලය හෝ ආපන ශාලාව හෝ නවාතැන් පොළ හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගෙවිය යුතු ගාස්තුව ඒ හෝටලයේ හෝ ආපන ශාලාවේ හෝ නවාතැන්පොළෙහි හෝ 2021 වර්ෂය තුළ ලැබීම්වලින් සියයට එකක් (1%) විය යුතු ය.

12-272/2

හම්බන්තොට මහා නගර සභාව

2022 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2022 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දු,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2021 සැප්තැම්බර් මස 16 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

''252 වන අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 247 ආ වැනි වගන්තියෙන් මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය නොවන්නා වූ මෙහි පහත උපලේඛනයේ 1 වැනි කොටසේ සඳහන් කිසියම් කර්මාන්තයක් හම්බන්තොට මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2022 වර්ෂයේ දී කරගෙන යනු ලබන අවස්ථාවක, එකී කර්මාන්තය කරගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම මෙහි පහත උපලේඛනයේ 2 වැනි කොටසේ I වැනි තීරයේ ඇතුළත් ප්‍රමාණයන් අතර පවත්නා අවස්ථාවක එහි II වැනි තීරයේ අනුරූප සටහනෙහි නිරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ කර්මාන්ත බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එකී කර්මාන්ත බද්දට යටත් සෑම තැනැත්තෙක්ම, එකී කර්මාන්ත බද්ද 2022 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර හම්බන්තොට මහා නගර සභාවට ගෙවිය යුතු බවටත් විධාන කිරීමට හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නී ය.''.

උපලේඛනය

1 වැනි කොටස

1. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
2. පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
3. වාස්තු වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
4. ලී කැටයම් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
5. වානේ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය හා අළුත්වැඩියාව.
6. කොසු, ඉදල්, බුරුසු ආදී නිෂ්පාදනය.
7. පැන්ට්‍රි කබඩ් හා ඇලුමිනියම් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
8. වීදුරු ආශ්‍රිත නිෂ්පාදන කටයුතු සිදු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
9. විදුලි උපකරණ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.

10. ජංගම දුරකථන අලුත්වැඩියාව කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
11. පරිගණක යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
12. ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
13. ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
14. මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
15. රෙදි විවීමේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
16. රූපවාහිනී යන්ත්‍ර හා ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
17. පාපැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
18. රෙදි පින්තාරු කිරීමේ හෝ බතික් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
19. බ්‍රේක් ලයිනර් ඇලවීමේ හා සවිකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
20. ඡායාරූප, දළ සේයාපට සේදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
21. විකිණීම සඳහා බිම්මල් වගා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
22. විදුලි කර්මාන්ත වැඩපලක් පවත්වාගෙන යාම.
23. සබන් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
24. කුෂන් කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම.
25. බ්ලොක් ගල් නිෂ්පාදනය සහ විකිණීම
26. ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම.
27. කොන්ක්‍රීට් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය හා විකිණීම
28. වාහන සඳහා ටින්කරින්, ටින්ටඩ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

උපලේඛනය

2 වැනි කොටස

	I වැනි තීරුව *වාර්ෂික වටිනාකම*	*II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශත*
1.	රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	2,000 0
2.	රු. 1,500 ඉක්මවන නමුත් රු. 2,500 නොඉක්මවන විට	3,000 0
3.	රු. 2,500 ඉක්මවන විට	5,000 0

12-272/3

හම්බන්තොට මහා නගර සභාව

2022 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2022 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දු,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2021 සැප්තැම්බර් මස 16 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

''252 වන අධිකාරය වැනි මහා නගර සභා ආඥාපනතේ 247 (ඇ) වැනි වගන්තියෙන් මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී අඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එකී ආඥාපනතේ 247 (ආ) වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ ද හා වෘත්තියක් නොවන්නා වූ ද මෙහි පහත උපලේඛනයේ 1 වැනි කොටසේ සඳහන් කිසියම් ව්‍යාපාරයක් හම්බන්තොට මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2022 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ 2 වැනි කොටසේ I වැනි තීරයේ ඇතුළත් ප්‍රමාණයන් අතර පවත්නා අවස්ථාවක, එහි II වැනි තීරයේ අනුරූප සටහනෙහි නිරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එකී ව්‍යාපාර බද්දට යටත් සෑම තැනැත්තෙක්ම, එකී ව්‍යාපාර බද්ද 2022 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර හම්බන්තොට මහා නගර සභාවට ගෙවිය යුතු බවටත් විධාන කිරීමට හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නී ය.''

උපලේඛනය

1 වැනි කොටස

1. කිරි පිටි, බිස්කට් වර්ග, රස කැවිලි හා ආහාරයට ගන්නා ද්‍රව්‍ය ගබඩාකර තැබීම, විකිණීම, බෙදාහැරීම හා අලෙවි නියෝජිත කටයුතු සිදු කරනු ලබන ආයතන.
2. සබන් හා එදිනෙදා භාවිතයට ගන්නා සනීපාරක්ෂක ද්‍රව්‍ය ගබඩා කර තැබීම, විකිණීම, බෙදාහැරීම හා අලෙවි නියෝජිත කටයුතු සිදු කරන ආයතන.
3. කෘෂි රසායන හා කෘෂිකාර්මික උපකරණ ගබඩාකර තැබීම, විකිණීම, බෙදාහැරීම හා අලෙවි නියෝජිත කටයුතු සිදු කරන ආයතන.
4. වෙළෙඳ ප්‍රචාරණ හා පුවත්පත් දැන්වීම් පළ කිරීම සිදුකරන ආයතනයක් පවත්වාගෙන යාම.
5. මෝටර් රථ කුලියට ලබාදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
6. විදුලි උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
7. දුරකථන ඇමතුම් ලබාදීම, දුරකථන කාඩ්පත් අලෙවිය, ජංගම දුරකතන අලෙවිය හා සන්නිවේදන සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
8. දුරකථන සමාගම්වල ශාඛා හා නියෝජිත ආයතන පවත්වාගෙන යාම.
9. කර්මාන්ත සඳහා අවශ්‍ය උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
10. රියැදුරු පුහුණු පාසලක් පවත්වාගෙන යාම.
11. උත්සව භාණ්ඩ බදුදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
12. දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
13. උපස්ථායක සේවා ලබාදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
14. කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
15. ක්‍රීඩා උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
16. උත්සව ශාලා බදු දීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
17. පෞද්ගලික ආරක්ෂණ සේවා සැපයීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
18. ගණකාධිකාරී සේවා සැපයීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
19. විදේශ මුදල් හුවමාරු කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
20. බැංකු සේවා හා උකස් සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම.
21. ලීසිං හා ෆිනෑන්ස් සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම, කොටස් වෙළෙඳපොළ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම.
22. ඉඩම් හා ගොඩනැගිලි විකිණීමේ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම.
23. විදේශ ගුවන් ප්‍රවේශපත් අලෙවි කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
24. නිවාස සැළසුම් හා ගොඩනැගිලි ඉදිකිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
25. ගුවන් හෝ නැව් භාණ්ඩ නිෂ්කාශන සේවා සපයනු ලබන ආයතනයක් පවත්වාගෙන යාම.

26. රථවාහන තත්ත්ව සහතික ලබාදීමේ ආයතනයක් පවත්වාගෙන යාම.
27. ලුණු පැකට් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
28. ස්වර්ණාභරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
29. ගෘහ භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
30. විදුලි උපකරණ හා ඉලෙක්ට්‍රොනික උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
31. නිමි ඇඳුම් හා රෙදිපිළි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
32. සිල්ලර හා තොග වෙළෙඳාම සිදුකරන ස්ථානයක් පවත්වාගෙන යාම.
33. ෆාමසියක් පවත්වාගෙන යාම.
34. තෑගි භාණ්ඩ, විසිතුරු භාණ්ඩ, ළදරු භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
35. ගොඩනැගිලි ඉදිකිරීමේ අමුද්‍රව්‍ය හා උපකරණ ගබඩා කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
36. පුවත්පත් හා සඟරා අලෙවි නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
37. පොත් පත් හා ලිපි ද්‍රව්‍ය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
38. පාවහන් හා සම්භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
39. ලියාපදිංචි කළ හා නොකළ වාහන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
40. කෘෂිකාර්මික උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
41. ලිහිසි තෙල් හා ග්‍රීස් ගබඩා කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
42. ගෑස් ගබඩා කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
43. කෘෂි රසායන ගබඩා කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
44. දේශීය බෙහෙත් බඩු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
45. යකඩ, ඇළුමිනියම්, පීවීසී, තීන්ත යනාදිය ගබඩා කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
46. දේශීය හා විදේශීය මත් පැන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
47. ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හා නීතිඥවරයෙකු වශයෙන් කටයුතු කිරීම
48. මුදල් අය කරන පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
49. පෞද්ගලික බටහිර වෛද්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම
50. පෞද්ගලික ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
51. විශේෂඥ වෛද්‍ය සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
52. දුරකථන හා රූපවාහිනී සේවා සම්ප්‍රේෂණාගාර කුළුණු පවත්වාගෙන යාම
53. සාප්පු බඩු වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
54. ස්වර්ණාභරණ අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
55. ආයුර්වේද බෙහෙත් බඩු වෙළෙඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
56. ලිපිද්‍රව්‍ය, පොත්පත් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
57. ඇස් කණ්ණාඩි අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
58. මෝටර් සයිකල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
59. ඔරලෝසු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
60. වාහන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
61. තුරඟ තරග ක්‍රීඩා පැවැත්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
62. ධීවර ආම්පන්න අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
63. ෆ්ලෝටයිල්, වෝල් ටයිල් හා විවිධ සෙරමික් භාණ්ඩ අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
64. සුරතල් මසුන් ඇති කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
65. පරිගණක යන්ත්‍ර හා අමතර කොටස් අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
66. කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
67. විවිධ භාණ්ඩ බෙදා හැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (කුරියර් සර්විස්)
68. යතුරු කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
69. අත් යන්ත්‍ර මගින් රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
70. මිනිස් ශ්‍රමය සැපයීමේ ආයතනයක් පවත්වාගෙන යාම

71. පානය සඳහා ජලය පිරිසිදු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

උපලේඛනය

2 වැනි කොටස

	I වැනි තීරුව *බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ දී ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය*	*II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශත*
(1)	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	නැත
(2)	රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට	90 0
(3)	රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
(4)	රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
(5)	රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
(6)	රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

12-272/4

හම්බන්තොට මහා නගර සභාව

2022 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් පුවරු හා බැනර් ප්‍රදර්ශනය කිරීමේ ගාස්තු අයකිරීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2022 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් පුවරු හා බැනර් ප්‍රදර්ශනය කිරීමේ ගාස්තු අයකිරීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දු,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2021 සැප්තැම්බර් මස 16 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"252 වැනි අධිකාරය වන මහා නගර සභා ආඥා පනතේ 267(27) වැනි වගන්තිය ප්‍රකාරව මහා නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හම්බන්තොට මහා නගර සභාව විසින් වැළඳගෙන ඇති අංක 541/17 හා 1989 ජනවාරි 20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ ''ප්‍රචාරක දැන්වීම්'' අතුරු ව්‍යවස්ථාව යටතේ හම්බන්තොට මහා නගර සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, මාවතකට, ඇළකට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර දැන්වීම් පුවරු, බැනර්, කටවුට් හා බිත්තිවල පින්තාරු කර ඇති දැන්වීම් වෙනුවෙන් පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් වර්ගයේ ප්‍රදර්ශනයන් වෙනුවෙන්, එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක ගාස්තු පනවා අයකිරීමටත්, හම්බන්තොට මහා නගර සභාව විසින් යෝජනා කරන්නී ය.".

I තීරුව	*II තීරුව*		
දැන්වීම් වර්ගය	*වර්ග අඩියක් සඳහා අයකිරීම*		
	සතියක්	*මාසයක්*	*වර්ෂයක්*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
බැනර් (රාමු නොකරන ලද රෙදි දැන්වීම් ලද)	15 0	20 0	80 0
කටවුට් (රාමු කරන ලද රෙදි දැන්වීම් ලද)	15 0	20 0	80 0
ස්ථිර දැන්වීම් පුවරු		20 0	200 0
බිත්ති පින්තාරු		20 0	200 0
ආලෝක විමෝචක දියෝඩ නාම පුවරු			1,600 0

නගර සභාව මගින් ඉවත් කරනු ලබන දැන්වීම් පුවරුවක් නැවත ලබා දීම සඳහා පහත ගාස්තු අය කරනු ලැබේ :

	රු. ශත
එක් බැනරයක් හෝ කටවුටයක් සඳහා	50 0
එක් ස්ථාවර දැන්වීම් පුවරුවක් සඳහා	5,000 0

12-272/5

හම්බන්තොට මහා නගර සභාව

ප්‍රසිද්ධ විනෝද ප්‍රසංග හා රඟ දැක්වීම් පිළිබඳ ගාස්තු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2022 වර්ෂය සඳහා ප්‍රසිද්ධ විනෝද ප්‍රසංග හා රඟ දැක්වීම් පිළිබඳ ගාස්තු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දු,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2021 සැප්තැම්බර් මස 16 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"හම්බන්තොට මහා නගර සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 541/17 දරන 1989 ජනවාරි 20 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ XXXI වන කොටසේ ''ප්‍රසිද්ධ විනෝද ප්‍රසංග සහ රඟ දැක්වීම්'' පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 3 වැනි වගන්තිය යටතේ හම්බන්තොට මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව පහත උපලේඛනයේ නිරූපිත ප්‍රමාණයක ගාස්තු පනවා අයකිරීමටත්, හම්බන්තොට මහා නගර සභාව විසින් යෝජනා කරන්නීය".

	බලපත්‍රය ලබා ගැනීමට අපේක්ෂිත ස්ථානයේ වර්ග ප්‍රමාණය	*එක් එක් දිනයක් සඳහා රු. ශත*
(අ)	වර්ග මීටර් 93 ක් නොඉක්මවන්නේ නම්	1,000 0
(ආ)	වර්ග මීටර් 93 ක් ඉක්මවන එහෙත් වර්ග මීටර් 186 ක් නොඉක්මවන විට	1,250 0
(ඇ)	වර්ග මීටර් 186 ක් ඉක්මවන එහෙත් වර්ග මීටර් 279 ක් නොඉක්මවන විට	1,500 0
(ඈ)	වර්ග මීටර් 279 ක් ඉක්මවන එහෙත් වර්ග මීටර් 465 ක් නොඉක්මවන විට	1,750 0
(ඉ)	වර්ග මීටර් 465 ක් ඉක්මවන විට	2,000 0

12-272/6

හම්බන්තොට මහා නගර සභාව

2022 වර්ෂය සඳහා විනෝද බදු ආඥාපනත යටතේ බදු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2022 වර්ෂය සඳහා විනෝද බදු ආඥාපනත යටතේ බදු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දු,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2021 වර්ෂයේ සැප්තැම්බර් මස 16 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"267 වන අධිකාරය වැනි විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව හම්බන්තොට මහා නගර සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන, එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට (චිත්‍රපට සංදර්ශනයක්, සර්කස් සංදර්ශනයක්, මැජික් සංදර්ශනයක්, ගායනයක්, සංගීත සංදර්ශනයක්, විවිධ ප්‍රසංගයක් හෝ මුදල් අයකරමින් පවත්වාගෙන යන ක්‍රීඩා කටයුත්තක්) වෙනුවෙන්, ඒ වෙනුවෙන් නිකුත් කරනු ලබන ටිකට් පත්වල වටිනාකමෙන් 5% ක විනෝද බද්දක් වශයෙන් පනවා අය කළයුතු යැයි ද, මෙම යෝජනාව 2022 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක විය යුතු යැයි ද යෝජනා කරන්නීය. එසේම ඉහත පවරන ලද විනෝද බද්ද එකී විනෝද කාර්ය පැවැත්වීමට පෙර අදාල සංවිධායක හෝ සංවිධායකවරුන් විසින් නිසි ලෙස හම්බන්තොට මහා නගර සභාවට ගෙවිය යුතු බවටත් හම්බන්තොට මහා නගර සභාව වැඩිදුරටත් යෝජනා කරන්නී ය.".

උපලේඛනය

මීට අමතරව චිත්‍රපට සංදර්ශනයක් (චිත්‍රපට ශාලා අයත් නොවේ) සර්කස් සංදර්ශනයක්, මැජික් සංදර්ශනයක්, ගායනයක්, සංගීත සංදර්ශනයක්, විවිධ ප්‍රසංගයක් වේදිකා නාට්‍යයක් හෝ මුදල් අයකරමින් පවත්වාගෙන යන ක්‍රීඩා කටයුත්තක් වෙනුවෙන් පහත පරිදි සංදර්ශන බලපත්‍ර ගාස්තු අයවිය යුතු අතර, වැඩිවන සෑම දිනක් සඳහාම රු. 100 ක අමතර ගාස්තුවක් අයකරනු ලැබේ.

		ගාස්තුව රු. ශත
01.	චිත්‍රපට සංදර්ශනයක් (චිත්‍රපට ශාලා අයත් නොවේ), සර්කස් සංදර්ශනයක්, මැජික් සංදර්ශනයක්, වේදිකා නාට්‍ය කටයුත්තක්	1,500 0
02.	සංගීත සංදර්ශනයක්, විවිධ ප්‍රසංගයක්, මුදල් අයකරමින් පවත්වාගෙන යන ක්‍රීඩා කටයුත්තක්.	2,000 0

12-272/7

හම්බන්තොට මහා නගර සභාව

2022 වර්ෂය සඳහා හම්බන්තොට මහා නගර සභාව සතු බිම් තාවකාලික වෙළෙඳ කටයුත්තක් සඳහා බදු දීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2022 වර්ෂය සඳහා මහා නගර සභාව සතු බිම් තාවකාලිකව වෙළෙඳ කටයුතු වෙනුවෙන් බදු දීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දු,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2021 සැප්තැම්බර් මස 16 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

''252 අධිකාරය දරන මහා නගර සභා ආඥා පනතෙන් මහා නගර සභාව වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව, හම්බන්තොට මහා නගර සභා සීමාව තුළ පහත උපලේඛනයේ ඇති පරිදි මහා නගර සභාව සතු භූමි තාවකාලිකව බදු දීමේ ගාස්තු පනවා අයකිරීමටත්, හම්බන්තොට මහා නගර සභාව විසින් යෝජනා කරන්නී ය''.

උපලේඛනය

	රු. ශත
වර්ග අඩි 01ක්	10 0

12-272/8

හම්බන්තොට මහා නගර සභාව

2022 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2022 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දු,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2021 සැප්තැම්බර් මස 16 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

''252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 247 ඉ (1) හා (2) වගන්තිවලින් මහා නගර සභාව වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව, හම්බන්තොට මහා නගර සභා සීමාව තුළ යම් ඉඩමක් හිමිකරු විසින්, තැරැව්කරුවෙකු විසින්, වෙන්දේසිකරුවෙකු විසින්, ඔවුන්ගේ නියෝජිතයෙකු හෝ සේවකයෙකු විසින් විකුණනු ලබන අවස්ථාවක එම ඉඩම විකුණනු ලබන මුදලින් 1% ක මුදලක් ඉඩම විකුණනු ලබන පාර්ශ්වය විසින් හම්බන්තොට මහා නගර සභාව වෙත ගෙවිය යුතු බව හම්බන්තොට මහා නගර සභාව විසින් යෝජනා කරන්නී ය.''

12 - 272/9

හම්බන්තොට මහා නගර සභාව

2022 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2022 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දු,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2021 සැප්තැම්බර් මස 16 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

''252 වන අධිකාරය වූ මහා නගර සභා ආඥාපනතේ 247ඈ වන වගන්තියේ (1) වන උපවගන්තිය අනුව මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, හම්බන්තොට මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි කිසියම් ඉඩමක් ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු වන විටක හෝ යුක්ති සහගත වියදමකින් ඒ ඉඩම එකී යම් කාර්යයක් සඳහා සංවර්ධනය කළ හැකි වන විටක, එවැනි යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්, හෝ
(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක ; හෝ

එකී ඉඩම, සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමටත් සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2022 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ ප්‍රාග්ධන අගයෙන් සියයට දශම පහක (0.5%) ක වාර්ෂික බද්දක් පැනවීමටත් එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2022 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර හම්බන්තොට මහා නගර සභාවට ගෙවිය යුතු යයි විධාන කිරීමටත් හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නී ය.''

12-272/10

හම්බන්තොට මහා නගර සභාව

2022 වර්ෂය සඳහා පුස්තකාල ගාස්තු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2022 වර්ෂය සඳහා පුස්තකාල ගාස්තු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දු,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2019 සැප්තැම්බර් මස 16 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

''හම්බන්තොට මහා නගර සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 541/17 දරන 1989 ජනවාරි 20 දිනැති අති විශෙෂ *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 'පුස්තකාල' පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 7 වන සහ 12 වන වගන්තිවලට අනුව හම්බන්තොට මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී 7 වන අතුරු ව්‍යවස්ථාවේ (1) (ඈ) වන ඡේදයේ සඳහන් තැන්පත් මුදල.

බැහැර දෙන අංශයේ ගාස්තු :

	රු. ශත
සාමාජික ඉල්ලුම්පත් ගාස්තු	50 0
සාමාජිකත්වය ලබා ගැනීම	100 0
සාමාජිකත්වය අළුත් කිරීමේ ඉල්ලුම්පත් ගාස්තුව	නොමිලේ
සාමාජිකත්වය අළුත් කිරීම	50 0
සාමාජික අනු පිටපත් ලබා ගැනීමේ ඉල්ලුම්පත් ගාස්තු	20 0
සාමාජික අනු පිටපත් ලබා ගැනීම	50 0
එක් දිනක් වෙනුවෙන් දඩ මුදල (එක් පොතක් සඳහා)	1 0

	රු. ශත
ළමා පුස්තකාල ගාස්තු :	
ළමා පුස්තකාල සාමාජික ඉල්ලුම්පත් ගාස්තුව	20 0
ළමා සාමාජිකත්වය ලබා ගැනීම	නොමිලේ
ළමා සාමාජිකත්වය අලුත් කිරීම ඉල්ලුම්පත් ගාස්තුව	10 0
ළමා සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තුව	30 0
ළමා අනුපිටපත් ලබා ගැනීමේ ඉල්ලුම්පත් ගාස්තුව	10 0
ළමා අනුපිටපත් ලබා ගැනීමේ ගාස්තුව	30 0
එක් දිනක් වෙනුවෙන් දඩ මුදල (එක් පොතක් සඳහා)	1 0
වෙනත් සේවාවන් :	
අන්තර්ජාලය මගින් තොරතුරු ගවේෂණය (පැය 1ක් සඳහා)	50 0
(වැඩිවන පැයක් සඳහා)	30 0
අන්තර්ජාල තොරතුරු වර්ණ මුද්‍රිත පිටපත් ලබා ගැනීම (එක් පිටපතක් සඳහා)	30 0
අන්තර්ජාල තොරතුරු සාමාන්‍ය මුද්‍රිත පිටපත් ලබා ගැනීම (එක් පිටපතක් සඳහා)	20 0
ඡායා පිටපත් ලබා ගැනීම (තනි පැත්ත)	2 0
(දෙපැත්ත)	4 0

විය යුතුය යන්න සහ මෙම තීරණය 2022 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක විය යුතු යැයි ද හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නී ය.''

12 - 272/11

හම්බන්තොට මහා නගර සභාව

2022 වර්ෂය සඳහා විවිධ ගාස්තු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2022 වර්ෂය සඳහා විවිධ ගාස්තු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දු,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2021 සැප්තැම්බර් මස 16 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

''හම්බන්තොට මහා නගර සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඉටු කරන පහත සඳහන් සේවා සහ වෙනත් අනුෂංගික කාර්යයන් ඉටු කිරීමේ දී මහා නගර සභා අරමුදලට අයකර ගත යුතු ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවත්, මෙම සේවා ගාස්තු අය කිරීම 2022 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවත් හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නී ය.''

උපලේඛනය

අනු. අංකය	සේවාව	ගාස්තුව රු. ශත
01.	ඔප්පු සාරංශ අයදුම්පත්	300 0
02.	ඔප්පු සාරාංශයක් ලියාපදිංචි කිරීම	200 0
03.	අතිරේක තක්සේරු දැන්වීමක් නිකුත් කිරීම	300 0
04.	වරිපනම් සහතිකයක් නිකුත් කිරීම	500 0
05.	මෘත දේහයක් භූමදානය සඳහා	100 0
06.	භස්මාවශේෂ තැන්පත් කිරීම	100 0
07.	රජයේ ශල්‍යාගාරවලින් ඉවත් කරන මෘතදේහ කොටස් මිහිදන් කිරීම	500 0
08.	ආදාහනාගාරයක් රහිත සුසාන භූමියක සිහිවටන ඵලකයක් සඳහා	3100 0
09.	නගරය තුළ හා පොදු ස්ථානවල ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතය (දිනකට)	500 0
10.	ගුවන් යානයක් මහා නගර සභාව සතු ක්‍රීඩා භූමියකට ගොඩබැස්සවීම සඳහා	5,000 0
11.	මහජන පුස්තකාලයේ ඉහල මහලේ ශාලාව බදු දීම (දිනකට)	3,000 0
12.	පරිපාලන සංකීර්ණය අසල පුස්තකාල ගොඩනැගිල්ලෙහි	
	රැස්වීම් ශාලාව බදු දීම - දිනකට ගාස්තු වායු සමීකරණ පහසුකම් සහිතව	10,000 0
	පැයක් සඳහා	2,500 0
13.	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත් ගාස්තු	500 0
14.	කොම්පෝස්ට් පොහොර (කි.ග්‍රෑ.1)	12 0

12 - 272/12

හම්බන්තොට මහා නගර සභාව

2022 වර්ෂය සඳහා සේවා ගාස්තු හා වෙනත් ආදායම් ගාස්තු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2022 වර්ෂය සඳහා සේවා ගාස්තු හා වෙනත් ආදායම් ගාස්තු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දු,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2021 සැප්තැම්බර් මස 16 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"හම්බන්තොට මහා නගර සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේදී ඉටු කරන පහත සඳහන් සේවා සහ වෙනත් අනුෂංගික කාර්යයන් ඉටු කිරීමේදී මහා නගර සභා අරමුදලට අයකර ගත යුතු ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවත්, මෙම සේවා ගාස්තු අය කිරීම 2022 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවත් හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නී ය."

සේවා සඳහා අය කරන ගාස්තු හා වෙනත් ආදායම් :

	වාහනය	විස්තරය	ගාස්තුව රු. ශත
01	බස් රථය	දිනකට කි.මී. 300 දක්වා (සහාවෙන් ඉන්ධන සපයා)	19,500 0
		වැඩිවන කි.මී. 01 ක් සඳහා	60 0
		කි.මී. 300 දක්වා (ඉල්ලුම්කරු ඉන්ධන සපයා)	7,800 0
		වැඩිවන කි.මී. 01 ක් සඳහා	30 0
		කි.මී. 100 සඳහා කෙටිදුර ධාවනය	7,000 0
		කි.මී. 50 සඳහා කෙටිදුර ධාවනය	3,500 0
02	ගලි රථය	ලීටර් 1800	3,800 0
		අමතර බවුසර් 1ක් සඳහා	1,800 0
		ධාවන දුර කි.මී. 01	85 0
		ලීටර් 2800	4,600 0
		අමතර බවුසර් 1ක් සඳහා	3,000 0
		ධාවන දුර මීටර් පැය 01ක් සඳහා	1,200 0
03	බැක්හෝ යන්ත්‍රය	මීටර් පැය 01 ක් සඳහා (යාමට හා ඒමට මීටර් පැය ගණනය කරනු ලැබේ)	2,800 0
04	මෝටර් ග්‍රේඩරය	මීටර් පැය 01 ක් සඳහා (යාමට හා ඒමට මීටර් පැය ගණනය කරනු ලැබේ)	3,600 0
05	ටිපර් රථය	අවම ගාස්තු (උපරිම දුර කි.මී. 10) වැඩිවන කි.මී. 01 ක් සඳහා	1,350 0 99 0
06	වතුර බවුසරය	ලීටර් 6000 බවුසරය	6,500 0
		මී. 30ක් දක්වා වැඩිවන සෑම කි.මී. 01 කටම	99 0
		ලීටර් 4000 බවුසරය (එක් ගමන් වාරයක් සඳහා මීටර් පැය 03 කි) (රඳවා ගැනීමේ කාලය පැය 08කි)	4,500 0
07	ට්‍රැක්ටර් රථ	කම්කරුවන් රහිතව ගමන් වාර 01 කට (උපරිම මීටර් පැය 01ක් වාහනය රඳවා ගතහැකි උපරිම කාලය පැය 02 කි.)	800 0

(ඉහත සඳහන් ගාස්තුවලට අමතරව එකතු කළ අගය මත බදු හා ජා.ගො. බදු එකතු විය යුතුය.)

	විස්තරය	*ගාස්තුව රු. ශත*
01	ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු	700 0
02	අනුබෙදුම් අයදුම්පත්‍ර ගාස්තුව	300 0
03	අනතුරුදායක ගස් සම්බන්ධව ක්‍රියාකිරීම	500 0
04	වීදි රේඛා සහ නොපවරවා ගැනීමේ සහතිකය නිකුත් කිරීම	500 0

පෙරසැරි ගාස්තු :

සංවර්ධන කාර්යයේ ස්වභාවය	*පෙරසැරි ගාස්තුව*	
ඉඩම් අනුබෙදුම් කිරීම	ඉඩමේ ප්‍රමාණය	ගාස්තුව
	ව.මී. 150 - 300	කැබලි 1 ක් සඳහා රු. 1000 0
	ව.මී. 301 - 600	කැබලි 1 ක් සඳහා රු. 800 0
	ව.මී. 601 - 900	කැබලි 1 ක් සඳහා රු. 600 0
	ව.මී. 900ට වැඩි	කැබලි 1 ක් සඳහා රු. 500 0
මායිම් තාප්ප/රැදවුම් බැමි ඉදිකිරීම (ගොඩනැගිලි සීමාවෙන් පිටත)	දික් මීටර් 01 ක් සඳහා	රු. 100 0
(ගොඩනැගිලි සීමාව තුළ)		
සංනිවේදන කුළුණු/ ඇන්ටනා කුළුණු සම්ප්‍රේෂණ කුළුණු සඳහා	රු. 40,000/-	

ගොඩනැගිලි ඉදිකිරීම/ පවත්නා ගොඩනැගිලිවලට අළුතින් කොටසක් එකතු කිරීම/ නැවත ඉදිකිරීම :

පෙරසැරි ගාස්තුව			
ගෙබිමේ විශාලත්වය (ව.මී)	*නේවාසිකව (ව.මී. 01 කට)*		*නේවාසික නොවන (ව.මී 01 කට)*
	තනි පුද්ගල	*මහල් නිවාස*	
400 දක්වා	රු. 20 0	රු. 25 0	රු. 25 0
401 - 1000	රු. 22 0	රු. 27 0	රු. 27 0
1001 - 1500	රු. 25 0	රු. 30 0	රු. 30 0
1501 - 2000	රු. 25 0	රු. 32 0	රු. 32 0
2000ට වැඩි	වැඩිවන සෑම ව.මී. 90 ක් සඳහාම රු. 2,000.00 බැගින්	වැඩිවන සෑම ව.මී. 90 ක් සඳහාම රු. 2,000.00 බැගින්	වැඩිවන සෑම ව.මී. 90 ක් සඳහාම රු. 2,000.00 බැගින්

ආවරණ අනුමැතිය ලබා දීම :

සංවර්ධන කාර්යයේ ස්වභාවය	*නව පෙරසැරි ගාස්තුව*	
01. නිසි බලපත්‍රයක් නොමැතිව ඉඩම් අනුබෙදුම් කිරීම	ඉඩම් කැබලි 01 ක් සඳහා රු. 3000 0	
02. අනුමැතියකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම/ එකතු කිරීම/ නැවත ඉදිකිරීම	නේවාසික (ව.මී. 01 කට)	නේවාසික නොවන (ව. මී. 01 කට)
i. අත්තිවාරම වැඩ පමණක් සම්පූර්ණ කර ඇති විට (කයිරු මට්ටම සඳහා)	රු. 200 0	රු. 500 0
ii. වහල මට්ටම දක්වා (වහල හැර) ඉදිකොට ඇති විට	රු. 300 0	රු. 1,000 0

සංවර්ධන කාර්යයේ ස්වභාවය	*නව පෙරසැරි ගාස්තුව*	
iii. වහල ඇතුළුව ඉදිකොට ඇති විට	රු. 400 0	රු. 1,500 0
සම්පූර්ණයෙන් ඉදිකොට ඇති විට	රු. 500 0	රු. 2000 0
iv. මායිම් තාප්ප / ආරක්ෂක බැමි ඉදිකොට ඇති විට	රු. 200 0 (දික් මීටර් 01 ක් සඳහා)	රු. 500 0 (දික් මීටර් 01 ක් සඳහා)
දුරකථන/විදුලි සංදේශ කුළුණු	බිම් පාදම ඉදිකිරීම රු. 150,000 0 වහල මුදුන ඉදිකිරීම රු. 100,000 0	
v. අනුකූලතා සහතිකය නොමැතිව පදිංචි වීම/ භාවිතා කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම.	එක් දිනකට රු. 100.00 බැගින්	

සංවර්ධන කාර්යයේ ස්වභාවය	*නව පෙරසැරි ගාස්තුව*		
01. ඉඩම අනුබෙදුම් කිරීම	එක් කැබැල්ලකට රු. 1000 0		
02. නේවාසික ගොඩනැගිලි ඉදි කිරීම	ගෙබිම ප්‍රමාණය (ව.මී.)	තනි පුද්ගල	මහල් නිවාස
	ව.මී 400 දක්වා	රු. 4000 0	රු.5000 0
	ව.මී. 400ට වැඩි	රු. 4000 0 + ව.මී 400 ට වැඩි වන සෑම ව.මී. 01 කට හෝ කොටසකට රු.15 0 බැගින්	රු. 5000.00 + ව.මී. 400ට වැඩි වන සෑම ව.මී. 01 කට හෝ කොටසකට රු. 20 0 බැගින්
03. නේවාසික නොවන ගොඩනැගිලි ඉදිකිරීම	ව.මී. 400 දක්වා	රු. 5000 0	
	ව.මී. 400 ට වැඩි	රු. 5000 0 + ව.මී. 400ට වැඩි වන සෑම ව.මී. 01 කට හෝ කොටසකට රු. 25 0 බැගින්	
04. මායිම් තාප්ප හා රැදවුම් බැමි	දික් මීටර් 01 කට රු. 25 0 බැගින්		
05. දුරකථන/විදුලි සංදේශ කුළුණු	රු. 5000 0		
			පෙරසැරි ගාස්තුව
ස්ථානීය පරීක්ෂාව සඳහා ප්‍රවාහන ගාස්තු			කි.මී. 01 ක් සඳහා රු.50 0

12-272/13

හම්බන්තොට මහා නගර සභාව

2022 වර්ෂය සඳහා ක්‍රීඩාපිටිය සහ ක්‍රීඩාමණ්ඩපය වෙන් කිරීමේ ගාස්තු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2022 වර්ෂය සඳහා ක්‍රීඩාපිටි සහ ක්‍රීඩාමණ්ඩපය වෙන් කිරීමේ ගාස්තු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දු,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2021 වර්ෂයේ සැප්තැම්බර් මස 16 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

''හම්බන්තොට මහා නගර සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී හම්බන්තොට මහා නගර සභාව සතු ක්‍රීඩාපිටි හා ක්‍රීඩාංගණ වෙන් කිරීමේ ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවත්, මෙම වෙන්කිරීමේ ගාස්තු අයකිරීම 2022 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවත් හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නී ය.''

උපලේඛනය

ප්‍රධාන ක්‍රීඩාංගණය :

අංකය	*විස්තරය*	*ආරක්ෂිත ඇප* රු. ශත	*ගාස්තු* රු. ශත	*වැඩිවන එක් දිනක් සඳහා අයකිරීම* රු. ශත
01.	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාංගණය මුදල් අයකරනු ලබන සංදර්ශනයකට භාවිතා කරනු ලබන්නේ නම් - එක් දිනකට	5,000 0	5,000 0	2,500 0
02.	ක්‍රීඩාපිටිය හා ක්‍රීඩාංගණය නොමිලේ පවත්වනු ලබන සංදර්ශනයකට භාවිතා කරනු ලබන්නේ නම් - එක් දිනකට	1,000 0	500 0	250 0
03.	ක්‍රීඩාගාරය නොමිලේ පවත්වනු ලබන සංදර්ශනයක් වෙළඳ ප්‍රචාරණය සඳහා යොදවාගනු ලබන්නේ නම් එක් දිනකට	2,000 0	2,500 0	1,000 0
04.	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාගාරය ප්‍රදේශය පෞද්ගලික ආයතනයක් හෝ රාජ්‍ය නොවන ආයතනයක් මගින් ක්‍රීඩා තරග/ තරගාවලියක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් - එක් දිනකට	1,000 0	500 0	1,000 0
05.	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාගාරය ප්‍රදේශයේ ක්‍රීඩා සමාජයක් ක්‍රීඩා තරගයක්/තරගාවලියක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් - එක් දිනකට		300 0	
06.	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාගාරය මෙම බල ප්‍රදේශයෙන් බැහැර ක්‍රීඩා සමාජයක් ක්‍රීඩා තරගයක් /තරගාවලියක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් - එක් දිනකට	2,000 0	1,000 0	1,000 0
07.	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාගාරය සැණකෙළියක් (කානිවල්) හෝ මුදල් අය කරනු ලබන වෙනත් කාර්යයක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් මුල් දින 05 සඳහා	20,000 0	10,000 0	2,500 0
08.	ඉහත ගාස්තුවලට අමතරව විදුලි හා ජල ගාස්තු ගෙවීම		500 0	
අනෙකුත් ක්‍රීඩාංගණ සඳහා :				
01.	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාංගණය මුදල් අයකරනු ලබන සංදර්ශනයකට භාවිතා කරනු ලබන්නේ නම් - එක් දිනකට	2,500 0	2,500 0	1,000 0
02.	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාංගණය නොමිලේ පවත්වනු ලබන සංදර්ශනයකට භාවිතා කරනු ලබන්නේ නම් - එක් දිනකට	500 0	200 0	100 0

අනෙකුත් ක්‍රීඩාංගණ සඳහා :		රු. ශත	රු. ශත	රු. ශත
03.	ක්‍රීඩා ගාරය නොමිලේ පවත්වනු ලබන සංදර්ශනයක් වෙළඳ ප්‍රචාරණය සඳහා යොදවාගනු ලබන්නේ නම් - එක් දිනකට	2,000 0	2,000 0	1,000 0
04.	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාගාරය ප්‍රදේශයේ පෞද්ගලික ආයතනයක් හෝ රාජ්‍ය නොවන ආයතනයක් මගින් ක්‍රීඩා තරග/තරගාවලියක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් එක් දිනකට	500 0	200 0	100 0
05.	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාගාරය ප්‍රදේශයේ ක්‍රීඩා සමාජයක් ක්‍රීඩා තරගයක්/තරගාවලියක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් - එක් දිනකට		200 0	
06.	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාගාරය මෙම බල ප්‍රදේශයෙන් බැහැර ක්‍රීඩා සමාජයක් ක්‍රීඩා තරගයක්/ තරගාවලියක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් - එක් දිනකට	1,000 0	500 0	300 0
07.	ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාගාරය සැණකෙළියක් (කානිවල්) හෝ මුදල් අය කරනු ලබන වෙනත් කාර්යයක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් මුල් දින 05 සඳහා	5,000 0	5,000 0	2,500 0
08.	ඉහත ගාස්තුවලට අමතරව විදුලි හා ජල ගාස්තු ගෙවීම		500 0	

12 - 272/14

හම්බන්තොට මහා නගර සභාව

2022 වර්ෂය සඳහා කසළ ඉවත් කිරීම වෙනුවෙන් ගාස්තු පැනවීම

හම්බන්තොට මහා නගර සභාව විසින් 2022 වර්ෂය සඳහා කසළ බදු පැනවීමේ යෝජනාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එරාජ් රවීන්ද්‍ර ප්‍රනාන්දු,
නගරාධිපති,
හම්බන්තොට මහා නගර සභාව.

2021 සැප්තැම්බර් මස 16 වැනි දින,
හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

හම්බන්තොට මහා නගර සභාව විසින් වැළඳගෙන ඇති 1989 ජනවාරි මස 20 දිනැති අති විශෙෂ *ගැසට්* පත්‍රයේ පළකර ඇති අතුරු ව්‍යවස්ථා මාලාවේ XI වැනි අතුරු ව්‍යවස්ථාවේ 4 වැනි වගන්තිය අනුව හම්බන්තොට මහා නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව හම්බන්තොට මහා නගර සභා සීමා තුළ ඉවත් කරනු ලබන කසළ වෙනුවෙන් පහත ගාස්තු උපලේඛනයේ සඳහන් ආකාරයට අයවිය යුතු බවත්, මෙම ගාස්තු අයකිරීම 2022 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවත් හම්බන්තොට මහා නගර සභාව යෝජනා කරන්නී ය.

කසළ වර්ගය :

දිරන කසළ	රු. 1.00 (කිලෝ ග්‍රෑම් 1ක් සඳහා අය කිරීම දිනකට)
නොදිරන කසළ	රු 3.00 (කිලෝ ග්‍රෑම් 1ක් සඳහා අය කිරීම දිනකට)
කර්මාන්ත ශාලා අපද්‍රව්‍ය	රු. 10.00 (කිලෝ ග්‍රෑම් 1ක් සඳහා අය කිරීම දිනකට)
කඩා ඉවත් කරන ලද ගොඩනැගිලි සුන්බුන් (උළු කැබලි, ගඩොල් කැබලි, බදාම කැබලි)	රු. 500.00 (කියුබ් 1 ක් සඳහා)
වෙනත් අපද්‍රව්‍ය	රු. 15 0 (කිලෝ ග්‍රෑම් 1ක් සඳහා අය කිරීම දිනකට)

* වෙනත් අපද්‍රව්‍ය - මහා නගර සභාව විසින් කළින් කල තීරණය කරන පරිදි :

තව ද මහා නගර සභා බල ප්‍රදේශය තුළ දෛනිකව කසළ බැහැර කරනු ලබන ව්‍යාපාරික ආයතනවලින් කසළ ගාස්තු අය කිරීමේදී මසකට ලබා දෙනු ලබන කසළ ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 50ට අඩු නම් මාසික ගාස්තුව ලෙස රු. 100 ක මුදලක් ද, කසළ ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 50-200 අතර නම්, මාසික ගාස්තුව ලෙස රු. 200 ක මුදලක් ද, කසළ ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 200 ට වැඩි නම් ඉහත වගුවේ සඳහන් පරිදි කිලෝ ග්‍රෑම් ප්‍රමාණය අනුව ගාස්තු අය කරනු ලැබේ.

12-272/15

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 09 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 01-i යටතේ පහත දැක්වෙන යෝජනා සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම් සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත්, වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් මුදල 2022 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනයන්ගෙන් අවසන් වන එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක් (05%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

එච්. ඒ. ලක්ෂ්මන් ප්‍රේමරත්න,
සභාපති,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 15 වැනි දින,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු ගම් වශයෙන් ප්‍රකාශිත ප්‍රදේශය තුළ පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2021 වර්ෂයේ වාර්ෂික තක්සේරු වටිනාකම 2022 වර්ෂය සඳහා පිළිගැනීමටත්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමෙන්,

(1) පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල බල ප්‍රදේශයේ දියුණු ගම් වශයෙන් ප්‍රකාශිත ප්‍රදේශවල පිහිටි සෑම නිශ්චල දේපලක් මත සියයට හයක (6%) වරිපනමක් ද,

(2) පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මාරපන උපකාර්යාල ප්‍රදේශයේ දියුණු ගම් වශයෙන් ප්‍රකාශිත ප්‍රදේශවල පිහිටි සෑම නිශ්චල දේපළක් මත සියයට හතරක (4%) වරිපනමක් ද, 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්,

ඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වන උප වගන්තියෙන් විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනයන්ගෙන් අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12-369/1

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 09 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 01-ii යටතේ පහත දැක්වෙන යෝජනා සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත්, වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2022 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනයන්ගෙන් අවසන් වන එක් එක් කාර්තුවකට අදාළ අක්කර බදු ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක් (05%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

එච්. ඒ. ලක්ෂ්මන් ප්‍රේමරත්න,
සභාපති,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 15 වැනි දින,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

2022 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද, ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථිර හෝ දිනපතා ගොවිතැනක් යටතේ වූ,

(අ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් ම මත 2022 වර්ෂය සඳහා රු. 10.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ආ) ඉහත කී පනතේ 134 වැනි වගන්තියේ (3) උපවගන්තියේ අතුරු විධාන යටතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (ආ) වන කොටසේ 1989.02.03 වැනි දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කර ඇති හෙයින්, හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත 2022 වර්ෂය සඳහා රු. 50 0 බැගින් නව වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට, සහ

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (06) වන උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කළ යුතු යැයි ද යෝජනා කරන්නී ය.

12-369/2

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ සැප්තැම්බර් මස 09 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 01-iii යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද ඒ කර්මාන්ත බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත්, වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. ඒ. ලක්ෂ්මන් ප්‍රේමරත්න,
සභාපති,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 15 වැනි දින,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

2022 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2022 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත්, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව*		
අනු. අංකය	*කර්මාන්ත බදු*	*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම රුපියල්*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	ස්වර්ණාභරණ නිපදවීම හෝ විකිණීම	500 0	750 0	1,000 0
02.	වාස්තු කර්මාන්තය	500 0	750 0	1,000 0
03.	විසිතුරු භාණ්ඩ නිපදවීම හා විකිණීම	500 0	750 0	1,000 0
04.	කුළු බඩු / කසායබඩු / බෙහෙත් ද්‍රව්‍ය පැකට් කිරීම	500 0	750 0	1,000 0
05.	පිංතුර රාමු කිරීම	500 0	750 0	1,000 0

අනු අංකය	කර්මාන්ත බදු	I වැනි තීරුව	II වැනි තීරුව	
		පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම රුපියල්		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	රු. 1,500 ඉක්මවන අවස්ථාවක
06.	මැටි භාණ්ඩ නිපදවීම හා අලෙවිය	500 0	750 0	1,000 0
07.	කෘතිම මල් නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
08.	රූපවාහිනී ඇන්ටනා නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
09.	ධාන්‍ය ඇට පැකට් කිරීම	500 0	750 0	1,000 0
10.	තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
11.	ලියුම් කවර හෝ වෙනත් කවර නිෂ්පාදනය	500 0	750 0	1,000 0
12.	මෙට්ට නිෂ්පාදනය	500 0	750 0	1,000 0
13.	හඳුන්කුරු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
14.	බෑග් වර්ග මැසීම හා විකිණීම	500 0	750 0	1,000 0
15.	ඔරලෝසු අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
16.	පිත්තල භාණ්ඩ නිපදවීම හා අලෙවිය	500 0	750 0	1,000 0
17.	ඇඳුම් මැසීම	500 0	750 0	1,000 0
18.	ස්ටිකර් කැපීම / දැන්වීම් / නාමපුවරු සැකසීම	500 0	750 0	1,000 0
19.	යතුරු කැපීම / සීල් කැපීම	500 0	750 0	1,000 0

12-369/3

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 09 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 01-iv යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත්, වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. ඒ. ලක්ෂ්මන් ප්‍රේමරත්න,
සභාපති,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 15 වැනි දින,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

2022 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම්

ව්‍යාපාරයක් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2022 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක, එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකුම එකී ව්‍යාපාර බද්ද 2022 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරමි.

උපලේඛනය

	I වැනි තීරුව බද්ද අදාළවන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයේ ලත් ලැබීම් ප්‍රමාණය	II වැනි තීරුව ගෙවිය යුතු බද්ද රු. ශත
01.	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	නැත
02.	රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට	90 0
03.	රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
04.	රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
05.	රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
06.	රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

12-369/4

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථාව යටතේ 2022 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 09 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 01-v යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව, කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2022 වර්ෂයේ දී පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම මත ම ගාස්තු අය කරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. ඒ. ලක්ෂ්මන් ප්‍රේමරත්න,
සභාපති,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 15 වැනි දින,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථාව යටතේ 2022 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

යෝජනාව

ප්‍රාදේශීය සභාව විසින් සාදන අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂය තුළ දී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 149 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති

බලතල ප්‍රකාර, පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන් පොලක් වන විට දී, ඊට අදාළ බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2021 වර්ෂයේ ලැබීම්වලින් 1% ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2022 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් සභාව යෝජනා කරන්නී ය.

අංක 01 උපලේඛනය - අන්තරාදායක ව්‍යාපාර

I වැනි තීරුව		*II වැනි තීරුව*		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්		
අනු. අංකය	*කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	වඩු කර්මාන්තය	500 0	750 0	1,000 0
02.	ගෘහ භාණ්ඩ නිපදවීම හෝ විකිණීම	500 0	750 0	1,000 0
03.	ගඩොල් හෝ උළු නිපදවීම හෝ විකිණීම	500 0	750 0	1,000 0
04.	පාවහන් අළුත්වැඩියාව හා නිෂ්පාදනය	500 0	750 0	1,000 0
05.	බ්ලොක්ගල් නිපදවීම හා විකිණීම	500 0	750 0	1,000 0
06.	ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	ග්‍රිල් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	සිමෙන්ති භාණ්ඩ නිපදවීම / විකිණීම	500 0	750 0	1,000 0
09.	පත්තර රැස්කිරීම හා අලෙවිය	500 0	750 0	1,000 0
10.	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	තේ කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
12.	ගල් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	ගල් මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අංක 02 උපලේඛනය - අප්‍රසන්න ව්‍යාපාර

01.	සත්ත්ව ආහාර අලෙවිය	500 0	750 0	1,000 0
02.	ආයුර්වේද බෙහෙත් ද්‍රව්‍ය විකිණීම	500 0	750 0	1,000 0
03.	කෘතිම පොහොර අලෙවිය	500 0	750 0	1,000 0
04.	පැණි, හකුරු නිපදවීම හා විකිණීම	500 0	750 0	1,000 0
05.	අයිස්ක්‍රීම් / අයිස්පැකට් / යෝගට් විකිණීම	500 0	750 0	1,000 0

අනු අංකය	කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය	I වැනි තීරුව	II වැනි තීරුව	
		ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක රු. ශත	රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන රු. ශත	රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශත
06.	රබර් මිලට ගැනීම හා විකිණීම	500 0	750 0	1,000 0
07.	රා එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
54.	බලවේග රෙදි විවීමේ කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
55.	පාවහන් නිෂ්පාදන ස්ථානයත් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
56.	දේශීය බෙහෙත් වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
57.	පැල තවානක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
58.	බීඩි කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
59.	ඔරලෝසු අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
60.	ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12 - 373/4

අකුරණ ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

අකුරණ ප්‍රාදේශීය සභාව විසින් 2021 නොවැම්බර් මස 24 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක ඉ.1.5 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

අයි. එම්. ඉස්තිහාර්,
සභාපති,
අකුරණ ප්‍රාදේශීය සභාව,
අලවතුගොඩ.

2021 නොවැම්බර් මස 25 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2022 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ අංක 1 හි I තීරුවේ නිරූපිත යම් විෂයාංකයක යම් සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව උපලේඛන අංක II හි සඳහන් ව්‍යාපාර සඳහා වූ ව්‍යාපාර බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අයකිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තකු එකී ව්‍යාපාර බද්ද 2022 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර අකුරණ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් අකුරණ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය 1

1 වැනි තීරුව	*11 වැනි තීරුව*
බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය	*ගෙවිය යුතු බද්ද*
	රු. ශත
1. රු. 6,000.00 නොඉක්මවන අවස්ථාවක ගෙවිය යුතු බද්ද	නැත
2. රු. 6,000.00 ඉක්මවන එහෙත් රු.12,000.00 නොඉක්මවන විට	90 0
3. රු. 12,000.00 ඉක්මවන එහෙත් රු.18,750.00 නොඉක්මවන විට	180 0
4. රු. 18,750.00 ඉක්මවන එහෙත් රු.75,000.00 නොඉක්මවන විට	360 0
5. රු. 75,000.00 ඉක්මවන එහෙත් රු.1,50,000.00 නොඉක්මවන විට	1,200 0
6. රු. 1,50,000.00 ඉක්මවන විට	3,000 0

උපලේඛනය *II*

01. කොමිස් ඒජන්තවරු
02. වෙන්දේසිකරුවන්
03. බ්‍රෝකර්වරුන්
04. මුදල් ආයෝජකයින් (මෙරට)
05. මුදල් ආයෝජකයින් (අපනයන ව්‍යාපාරිකයින්)
06. කොන්ත්‍රාත්කරුවන්
07. සැපයුම්කරුවන් (ගොඩනැගිලි, නිමි ඇඟලුම්, ලිපි ද්‍රව්‍ය, සුඛෝපභෝගී භාණ්ඩ සහ වෙනත්)
08. රියදුරු පුහුණු ආයතන
09. පෞද්ගලික පංති පවත්වන්නන්.
10. හජ්ජි/දඹදිව/යාත්‍රා යන ආගමිකයින් හා විදේශ සංචාර ගෙනයාමේ නියෝජිත කාර්යාලයක් පවත්වාගෙන යාම
11. විදේශ රැකියා ඒජන්සියක් පවත්වාගෙන යාම
12. ලොතරැයි නියෝජිතයින්
13. රේස් ඔට්ටු පොලවල්
14. රක්ෂණ නියෝජිත කාර්යාල
15. මෝටර් රථ වාහන වෙළෙඳාම් කරන්නන්
16. ඒජන්සි තැපැල්හල්/ඒජන්සි වෙළෙඳසැල්
17. රන් ආභරණ වෙළෙඳසැල්
18. වෙළෙඳ කටයුතු සඳහා වූ ප්‍රවාහන කුලියට දීමේ බඳු
19. පෞද්ගලික/රජයේ බැංකු සේවා ස්ථාන
20. කළුගල් විකිණීම
21. ලී මෝලක් සහ දැව සැපයුම්කරු ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
22. සුඛෝපභෝගී ගොඩනැගිලි උපකරණ ආනයනය කිරීම/විකිණීම

23. ආගන්තුක නිවාස පවත්වාගෙන යාම
24. ශාලා කුළියට දීම (උත්සව ශාලා)
25. රා/රටබීම/අරක්කු/බීමහල් (තැබෑරුම්)
26. රූපවාහිනී සම්ප්‍රේෂණ කුළුනක් පවත්වාගෙන යාම
27. දුරකථන සේවා මධ්‍යස්ථාන (කොමියුනිකේෂන්)
28. පාසල් වෑන් රථ
29. යන්ත්‍රෝපකරණ අලෙවිය
30. අලෙවි නියෝජිත ආයතන
31. දේශීය/බටහිර වෛද්‍ය මධ්‍යස්ථාන
32. යාන්ත්‍රික තහඩු නැවීමේ වැඩපලවල්
33. ඉන්ධන පිරවුම්හල්
34. ලී වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
35. ගෑස් අලෙවිය
36. කොන්ක්‍රීට් පෙර සවි භාණ්ඩ නිෂ්පාදන හා අලෙවිය
37. ඇඟළුම් ව්‍යාපාරය
38. ගෘහ භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
39. උළු, ගල්, වැලි, ගඩොල් සැපයීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
40. මෙඩි ලැබ් (ලේ හා මුත්‍රා පරීක්ෂා කිරීමේ) ඒකකයක් පවත්වාගෙන යාම
41. දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම
42. සමාජ ශාලාවක් පවත්වාගෙන යාම
43. බටහිර ඖෂධ අලෙවිය
44. ජලය බෝතල් කර විකිණීම
45. රෙදිපිළි වෙළෙඳාම
46. නිමි ඇඳුම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
47. රථවාහන අංගනයක් පවත්වාගෙන යාම
48. සැලසුම් ශිල්පී ආයතනයක් පවත්වාගෙන යාම
49. විදුලි හා ගෘහ උපකරණ
50. පරිගණක පන්තියක් පවත්වාගෙන යාම
51. සුළු අපනයන භෝග එකතු කිරීම
52. කේටරින් සේවා සැපයීම
53. විදේශ චෙක්පත්/මුදල් මාරු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
54. නිවාඩු නිකේතනය
55. පැස්ටල් හා ලිපිද්‍රව්‍ය නිෂ්පාදනය
56. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
57. හෙද සේවා ආයතනයක් පවත්වාගෙන යාම
58. අන්තර්ජාල පහසුකම් සැපයීම
59. පොත් ප්‍රකාශන ආයතනයක් පවත්වාගෙන යාම
60. පෞද්ගලික (ජාත්‍යන්තර) පාසල්
61. සංචාරක සේවා සැපයීම
62. ප්‍රවාහන සේවා ආයතනයක් පවත්වාගෙන යාම (කැබ් සර්විස්)
63. ලිහිසි තෙල් වෙළෙඳාම
64. පෞද්ගලික ආරක්ෂක සේවා
65. මධ්‍යසාර ගබඩාව
66. සාප්පු බඩු වෙළෙඳාම
67. වැඩසටහන් නිෂ්පාදනය සහ ප්‍රචාරණය
68. සිමෙන්ති අලෙවිය
69. හුණු තොග වශයෙන් ගබඩාකර විකිණීම
70. තීන්ත වර්ග ගබඩාකර විකිණීම
71. ඇස්බැස්ටෝස් සෙවිලි තහඩු ගබඩාකර විකිණීම

72. ක්‍රීඩා සමාජයක් පවත්වාගෙන යාම
73. විසිතුරු මසුන් අලෙවිය
74. රෙදි කැබලි ගබඩා කර විකිණීම
75. විදුලි රැහන් ඇදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
76. ශබ්ද විකාශන යන්ත්‍ර කුළියට දීම
77. ගෘහ භාණ්ඩ වෙළෙඳසැලක් පවත්වාගෙන යාම
78. ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (කුඩා)
79. හිස් බෝතල්/ගෝනි/යකඩ බඩු ගඩබා කර විකිණීම
80. යකඩ බඩු කඩයක් පවත්වාගෙන යාම
81. පරිගණක උපාංග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
82. රථවාහන අමතර කොටස් අලෙවිය
83. අටපිරිකර ජූජා භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
84. ජංගම ලොතරැයි කුටි
85. ප්ලාස්ටික් බඩු අලෙවිය
86. පාවහන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
87. අවමංගල්‍ය උත්සව භාණ්ඩ සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
88. මංගල උත්සව භාණ්ඩ සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
89. උද්‍යාන සැලසුම් ස්ථානයක් පවත්වාගෙන යාම
90. වේවැල් භාණ්ඩ අලෙවි කිරීම
91. සම් භාණ්ඩ විකිණීම
92. ලෝහ අත්කම් භාණ්ඩ අලෙවිය
93. පොල් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
94. ඇස් කණ්නාඩි අලෙවි කිරීම
95. මැටි භාණ්ඩ අලෙවිය
96. පැළ වර්ග අලෙවිය
97. විදුලි මෝටර් එතීම
98. සනීපාරක්ෂක භාණ්ඩ අලෙවිය
99. සයිලන්සර් වැඩපල
100. වාහන බැටරි විකිණීම
101. ජ්‍යෝතිෂ්‍ය කටයුතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
102. ස්ථාවර හා ජංගම දුරකතන සම්බන්ධතා නිකුත් කිරීමේ තාවකාලික වෙළෙඳ කුටියක් පවත්වාගෙන යාම (දිනකට)
103. සෙලියුලර් දුරකතන හා දුරකතන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
104. දේශීය ආයුර්වේද ඖෂධ අලෙවිය
105. සත්ව ආහාර නිෂ්පාදනය හා අලෙවිය
106. රතිඤ්ඤා වෙළෙඳාම
107. කැබලි රෙදි අලෙවිය
108. ළදරු සනීපාරක්ෂක භාණ්ඩ වෙළෙඳාම
109. ආහාර ද්‍රව්‍ය ඇසුරුම් කිරීම (සෝයා සහ ධාන්‍ය වර්ග)
110. මඩපුවක් වළක් පවත්වාගෙන යාම
111. පාසල් උපකරණ හා ලිපිද්‍රව්‍ය අලෙවිය
112. ග්‍රොසරි වෙළෙඳසැලක් පවත්වාගෙන යාම
113. සුපිරි වෙළෙඳසැලක් පවත්වාගෙන යාම
114. එළවළු/සහල්/සිල්ලර බඩු/පොල්තෙල්/සීනි/පිටි එක් එක් භාණ්ඩ මිලට යටත්ව අලෙවි කිරීම
115. සහල් තොග හෝ සිල්ලරට විකිණීමේ වෙළෙඳසැලක් පවත්වාගෙන යාම
116. බුලත්, පුවක්, කොහු, ඉඳල්, කෙසෙල් කැන්, පලා වර්ග, තැඹිලි විකිණීම (සාමාන්‍ය වෙළෙඳාම)
117. වායු තුවක්කු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
118. වාහන සේවා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

119. මැණික් ඔපදැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
120. රන් භාණ්ඩ නිෂ්පාදනාගාරයක් පවත්වාගෙන යාම
121. දේශීය/බටහිර පෞද්ගලික රෝහලක් පවත්වාගෙන යාම
122. රථ වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
123. පිරිසිදු කිරීම් සේවා ස්ථානයක් පවත්වාගෙන යාම
124. මුල් ඇඳුම් කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
125. රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
126. මෝටර් රථ ධාවන පථයක් පවත්වාගෙන යාම
127. වාහන කැසට් අලෙවිය
128. උකස් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම

* 2022 බලපත්‍ර හා බදු පැනවීම අනුව බලපත්‍රයකට හෝ කර්මාන්ත බද්දකට යටත් නොවන ව්‍යාපාර වේ නම් එම සියලුම ව්‍යාපාර, ව්‍යාපාර බදුවලට යටත් වේ.

12 - 373/5

අකුරණ ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ගෝ ඝාතක ආඥාපනත

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අකුරණ ප්‍රාදේශීය සභාව විසින් 2021 නොවැම්බර් මස 24 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක ඉ.1.6 යටතේ පහත දැක්වෙන යෝජනාව තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් තැනැත්තන් විසින් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දැක්වෙන ගවමස්, එළු මස් වෙළෙඳසැලක් පවත්වාගෙන යාමට ගෝ ඝාතක ආඥාපනතේ 07(1) වැනි වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කරන ලෙස අකුරණ ප්‍රාදේශීය සභාවේ නිසි බලධාරියා වන මා වෙතින් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබේ.

පහත උපලේඛනයේ සඳහන් ස්ථානයන්හි ගවමස් වෙළෙඳසැලක් පවත්වාගෙන යාම වෙනුවෙන් බලපත්‍රයක් නිකුත් කිරීමට විරුද්ධත්වයක් දක්වන්නන් වෙතොත් එසේ විරුද්ධත්වය දැක්වීමට හේතු සඳහන් කරමින් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවූ දිනයේ සිට සති 04ක් ගෙවීමට මත්තෙන් පිටපත් දෙකකින් යුක්තව ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දෙන ලෙස අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන් වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

අයි. එම්. ඉස්තිහාර්,
සභාපති,
අකුරණ ප්‍රාදේශීය සභාව,
අලවතුගොඩ.

2021 නොවැම්බර් මස 25 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

අනු. අංකය	*ඉල්ලුම්කරුගේ නම*	*ගවමස් වෙළෙඳසැල පවත්වාගෙන යාමට අපේක්ෂිත ස්ථානය*
01.	එම්. නිෆ්රාස් මයා	අංක 276, කුරුඳුගහඇළ, මාතලේ පාර, අකුරණ
02.	හනීෆා සරිනා බේගම් මිය	අංක 203, මාතලේ පාර, 7 කණුව, අකුරණ
03.	එස්. එම්. සියාම් මොහොමඩ් මයා	අංක 17/ඒ, දුනුවිල පාර, අකුරණ
04.	එස්. එම්. සියාම් මොහොමඩ් මයා	අංක 233/2, මාතලේ පාර, කුරුගොඩ හන්දිය

අනු අංකය	ඉල්ලුම්කරුගේ නම	ගවමස් වෙළෙඳසැල පවත්වාගෙන යාමට අපේක්ෂිත ස්ථානය
05.	ඒ. එච්. ටී. එම්. අස්කර් මයා	අංක 372, රඹුකේඇළ. විලානගම
06.	ඩබ්. එච්. එම්. එම්. සත්තාර් මයා	අංක 469/5, කසාවත්ත, බටුගොඩ
07.	එම්. අයි. එම්. රිස්වාන් මයා	අංක 225/1, තෙළඹුගහවත්ත, අකුරණ
08.	එම්. එම්. රිස්වාන් මයා	අංක 247, කුරුඳුගහඇළ, අකුරණ
09.	කේ. එම්. ජී. ඒ. සී. මොහොමඩ් මුන්සීන් මයා	අංක 274, කුරුඳුගහඇළ, මාතලේ පාර, අකුරණ
10.	එස්. එච්. බී. සමාන් මයා	අංක 462, මාතලේ පාර, අකුරණ
11.	ජේ. එම්. පයාස් මයා	අංක 242, මාතලේ පාර, අකුරණ
12.	මොහොමඩ් ෆාසි මයා / මොහොමඩ් ෆාසීන් මයා	අංක 145/ජී, මාතලේ පාර, අකුරණ
13.	එම්. ඒ. එම්. අනාස් මයා	අංක 444, මාතලේ පාර, අකුරණ
14.	එම්. වයි. එම්. අස්වර් මයා	අංක 193/2, බුළුගොහාතැන්න, අකුරණ
15.	ඒ. ඒ. එම්. ෆාරිස් මයා	අංක 216/ඊ, 7 කණුව, මාතලේ පාර, අකුරණ
16.	එම්. ඒ. එම්. සම්රි මයා	අංක 32/1, දුනුවිල පාර, අකුරණ
17.	ඔස්. එස්. ඉබ්‍රාහිම් මයා	අංක 84/4/D, පල්ලේවැලිකැටිය, අකුරණ
18.	එස්. එම්. සියාම් මොහොමඩ් මයා	අංක 150, මාතලේ පාර, අකුරණ
19.	ඕ. එම්. රිස්වාන් මයා	අංක 65, උඩවැලිකැටිය, බුළුගොහොතැන්න, අකුරණ
20.	එම්. බී. සිත්ති වසීලා මිය	අංක 190/188, පල්ලේවැලිකැටිය, බුළුගොහොතැන්න
21.	එම්. ජේ. එම්. ෆයිසාල් මයා	අංක 253/3, පන්ගොල්ලාමඩ, අකුරණ
22.	එච්. එම්. නයීම් මයා	අංක 566, නීරැල්ල, මේල්චේන, අකුරණ

අනු. අංකය		අපේක්ෂිත ස්ථානය
01.	එස්. එම්. සියාම් මොහොමඩ් මයා	අංක 17/ඒ, දුනුවිල පාර, අකුරණ
02.	එස්. එම්. සියාම් මොහොමඩ් මයා	අංක 150, මාතලේ පාර, අකුරණ
03.	එස්. එච්. බී. සමාන් මයා	අංක 462, මාතලේ පාර, අකුරණ

12 - 373/6

අකුරණ ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා වෙනත් ආදායම් අය කිරීම

අකුරණ ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ නොවැම්බර් මස 24 වැනි දින පවත්වන ලද මහා සභාවේ තීරණ අංක ඉ.1.7 යටතේ පහත දැක්වෙන යෝජනාව තීරණය කළ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

අයි. එම්. ඉස්තිහාර්,
සභාපති,
අකුරණ ප්‍රාදේශීය සභාව,
අලවතුගොඩ.

2021 නොවැම්බර් මස 25 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

''1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 වර්ෂයේදී වෙනත් ආදායම් අය කිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් සපයනු ලබන සේවාවන් වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තු පනවා අය කිරීමට අකුරණ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.''

උපලේඛනය

	සේවාව	*ගාස්තුව රු. ශත*
01.	ජල බවුසරය කුලියට දීම (ප්‍රාදේශීය සභා සීමාව තුළ) :	
	ආගමික ස්ථානයක් සඳහා - දිනකට	1,000 0
	අවමංගල්‍ය ස්ථාන සඳහා - දිනකට	1,000 0
	අනෙකුත් - දිනකට	3,000 0
	බල ප්‍රදේශයේ නියං කාලවලදී නොමිලයේ ලබාදීම	
	බල ප්‍රදේශයෙන් පිටත කි.මී. 1ක් සඳහා ප්‍රවාහන ගාස්තුව	150 0
	ජල බවුසරය රඳවා ගැනීමේ ගාස්තු :	
	පළමු පැය 2 සඳහා නොමිලේ ලබාදීම	
	වැඩිවන පළමු පැය සඳහා	100 0
	දෙවන පැය සඳහා	200 0
	ඉන්පසු වැඩිවන සෑම පැයකටම	300 0
02.	බැකෝ යන්ත්‍රය කුලියට දීම (මීටර් පැයට)	3,000 0
	පැය 5ට වඩා වැඩි නම්	2,500 0
03.	මෝටර් ග්‍රේඩරය කුලියට දීම (මීටර් පැයට)	6,000 0
04.	ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව කුලියට දීම (දිනකට)	8,000 0
05.	පුටු කුලියට දීම - එක් පුටුවක් සඳහා (දිනකට)	10 0
	පුටු කුලියට දීම - තැන්පත් මුදල	1,000 0
06.	කොඩි කණු කුලියට දීම - එක් කොඩි කණුවක් සඳහා (දිනකට)	50 0
	කොඩි කණු කුලියට දීම - තැන්පත් මුදල	1,000 0
07.	කුඩාරම කුලියට දීම - දිනකට	1,500 0
	කුඩාරම කුලියට දීම - තැන්පත් මුදල	2,000 0
08.	කොම්පෝස්ට් පොහොර කි.ග්‍රෑ. 01	10 0
09.	කොම්පෝස්ට් බඳුන් 01 ක් (කොන්ක්‍රීට්)	3,900 0
10.	අකුරණ / අලවතුගොඩ සිකුරාදා සති පොළ ගාස්තු අය කිරීම :	
	1. ලොරි රථ / වෑන් රථ	1,500 0
	පොඩි ලොරි රථ/ වෑන් රථ	1,000 0
	2, ත්‍රිරෝද රථ	300 0
	3. හිස් බිම් වර්ග අඩියක් සඳහා	10 0

	සේවාව	*ගාස්තුව රු. ශත*
11.	අකුරණ නගරයේ පොදු වැසිකිලිය සඳහා ගාස්තු අය කිරීම (එක් අයකුට)	10 0
12.	වීථි රේඛා නිකුත් කිරීම	2,000 0
	නිකුත් කරන ලද වීථි රේඛා සහතිකයක් මාස හයක් ඇතුළත සංශෝධන කර සහතිකයක් ලබා ගැනීමට ඒ සඳහා අය කළ යුතු අතිරේක ගාස්තුව	250 0
13.	මස් ප්‍රවාහන බලපත්‍ර නැවත සංශෝධනය කිරීමේ ගාස්තු	1,000 0
	එළ ගව මස් ප්‍රවාහනය සඳහා මස් කි. ග්‍රෑම් 500 දක්වා ගාස්තුව	3,000 0
	එළ ගව මස් ප්‍රවාහනය සඳහා මස් කි. ග්‍රෑම් 500 සිට 1,500 දක්වා ගාස්තුව	5,500 0
	එළ ගව මස් ප්‍රවාහනය සඳහා මස් කි. ග්‍රෑම් 1500 වැඩි ගාස්තුව	12,000 0
	එළු මස් ප්‍රවාහනය සඳහා මස් කි. ග්‍රෑම් 500 දක්වා ගාස්තුව	2,000 0
	එළු මස් ප්‍රවාහනය සඳහා මස් කි. ග්‍රෑම් 1,500 ට වැඩි ගාස්තුව	5,000 0
14.	වෙළෙඳ බලපත්‍ර පෝරම නිකුත් කිරීම	150 0
15.	වෙළෙඳ බලපත්‍රයක හා ව්‍යාපාර බදු ලිපියක පිටපතක් ලබා දීම	100 0
16.	ඉඩම් අනුබෙදුම් පෝරම ගාස්තු	500 0
17.	වරිපනම් ලේඛනයේ නම වෙනස් කිරීමේ පෝරම ගාස්තු :	500 0
18	නම සංශෝධනයේ ලියාපදිංචි ගාස්තුව	300 0
19.	ගලි රථ සේවා සඳහා අවසර ලිපි නිකුත් කිරීම	250 0
20.	ව්‍යාපාර ප්‍රවර්ධන වැඩසටහන් සඳහා අයකරන ගාස්තු :	
	1. කුඩා ලොරි රථය - දිනකට	4,000 0
	2. ලොකු ලොරි රථය - දිනකට	6,000 0
	3. කුඩයක් හෝ ආවරණයක් සඳහා - දිනකට	2,500 0
21.	ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු	2,500 0
22.	සැලසුම් ශිල්පීය ගාස්තු (වාර්ෂික)	2,500 0
23.	ගිවිසුම්පත්‍ර ගාස්තු	1,000 0
24.	ජල නළ එලීම සඳහා මාර්ග පළුදු කිරීමේ ගාස්තු	
	1. පස් පාරක් සඳහා	2,500 0
	පරිපාලන ගාස්තු	1,000 0
	2. කොන්ක්‍රීට් / කැටගල් පාර (වර්ග අඩි 1)	10,000 0
	පරිපාලන ගාස්තු	1,000 0
	3. තාර පාර (වර්ග අඩියකට 1)	10,000 0
	පාරිපාලන ගාස්තු	1,000 0
25.	දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා බලපත්‍ර ගාස්තු	
	1. ස්ථිර දැන්වීම් ලිත් වර්ෂයකට වර්ග අඩියකට - තහඩුවලින්	200 0
	2. ස්ථිර දැන්වීම් ලිත් වර්ෂයකට වර්ග අඩියකට - ෆ්ලෙක්ස්	150 0
	3. ස්ථිර දැන්වීම් ලිත් වර්ෂයකට වර්ග අඩියකට - රෙදි වලින්	200 0
	4. තාවකාලික දැන්වීම් මාස 06 සඳහා වර්ග අඩියකට	200 0

සේවාව	*ගාස්තුව රු. ශත*

26. විනෝද බදු :

26.1 විනෝද බදු ආඥාපනතේ 02 වන වගන්තියේ 1 වන උප වගන්තිය යටතේ මුද්‍රිත ප්‍රවේශපත්‍රවල සඳහන් වටිනාකමින් සියයට දහයක (10%) ක මුදලක් විනෝද බදු වශයෙන් සභාවට ගෙවිය යුතු වන්නේය.

26.2 ප්‍රසිද්ධ රැගුම් ආඥාපනත යටතේ සංගීත සංදර්ශනයක්, නාට්‍යයක්, සර්කස් සංදර්ශනයක් චිත්‍රපටියක් ප්‍රදර්ශනය කිරීම සඳහා බලපත්‍ර ගාස්තු පහත සඳහන් ආකාරයට වන්නේය.
දිනකට 1,000 0

27. වෙන්දේසිකරුවන් හා තැරැව්කරුවන්ගේ ආඥාපනත යටතේ යම් පුද්ගලයෙකු තැරැව්කරුවෙකු හෝ වෙන්දේසි කරුවෙකු වශයෙන් අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියා කරන්නේ නම් ඒ සඳහා වාර්ෂිකව පහත සඳහන් ගාස්තු ගෙවා බලපත්‍රයක් ලබාගත යුතුය.

වෙන්දේසිකරුවෙකු	රු. 1,000 0
තැරැව්කරුවෙකු	රු. 1,000 0

28. අලවතුගොඩ ප්‍රාදේශීය සභා ක්‍රීඩා පිටියට ගාස්තු අයකිරීම

මුදල් අයකරන සංදර්ශන සඳහා	රු. 3,000 0
වෙනත්	රු. 1,500 0

29. ගව ජීවදානය සඳහා දැනට එක් ගවයෙක් සඳහා රු. 600 0

30. වරිපනම් උධෘත නිකුත් කිරීම වෙනුවෙන් ගාස්තු අය කිරීම

1. දේපල ලේඛන සෙවීමේ ගාස්තු (වර්ෂයකට)	රු. 40 0
2. පිටපත් කිරීමේ ගාස්තු (එක් පිටුවකට)	රු. 20 0
3. උධෘත පරීක්ෂා කිරීමේ ගාස්තු	රු. 15 0

31. කසල ගාස්තු අය කිරීම :

අනු. අංකය	*ව්‍යාපාරයේ ස්වභාවය*	*දිනකට කි. ග්‍රෑ. 1-5 දක්වා එකතු වන්නේ නම් මසකට අය විය යුතු ගාස්තුව*	*දිනකට කි. ග්‍රෑ. 6-10 දක්වා එකතු වන්නේ නම් මසකට අය විය යුතු ගාස්තුව*	*දිනකට කි. ග්‍රෑ. 11-19 දක්වා එකතු වන්නේ නම් මසකට අය විය යුතු ගාස්තුව*	*දිනකට කි. ග්‍රෑ. 20-29 දක්වා එකතු වන්නේ නම් මසකට අය විය යුතු ගාස්තුව*	*දිනකට කි. ග්‍රෑ. 30-39 දක්වා එකතු වන්නේ නම් මසකට අය විය යුතු ගාස්තුව*	*දිනකට කි. ග්‍රෑ. 40 වැඩි වන්නේ නම් මසකට අය විය යුතු ගාස්තුව*
1.	හෝටල්	250 0	750 0	1,500 0	2,500 0	3,500 0	5,000 0
2.	එළවළු/පලතුරු	250 0	750 0	1,000 0	1,500 0	2,000 0	2,000 0
3.	සුපර් මාකට්	500 0	1,000 0	1,500 0	1,750 0	2,000 0	1,500 0
4.	තේ, සිල්ලර කඩ සාප්පු	250 0	750 0	1,000 0	1,300 0	1,700 0	1,500 0
5.	කර්මාන්ත ශාලා	500 0	1,000 0	1,500 0	2,000 0	2,200 0	1,500 0
6.	පදික වෙළෙඳාම	100 0	200 0	300 0	500 0	1,000 0	1,200 0

අනු. අංකය	ව්‍යාපාරයේ ස්වභාවය	දිනකට කි. ග්‍රෑ. 1-5 දක්වා එකතු වන්නේ නම් මසකට අය විය යුතු ගාස්තුව	දිනකට කි. ග්‍රෑ. 6-10 දක්වා එකතු වන්නේ නම් මසකට අය විය යුතු ගාස්තුව	දිනකට කි. ග්‍රෑ. 11-19 දක්වා එකතු වන්නේ නම් මසකට අය විය යුතු ගාස්තුව	දිනකට කි. ග්‍රෑ. 20-29 දක්වා එකතු වන්නේ නම් මසකට අය විය යුතු ගාස්තුව	දිනකට කි. ග්‍රෑ. 30-39 දක්වා එකතු වන්නේ නම් මසකට අය විය යුතු ගාස්තුව	දිනකට කි. ග්‍රෑ. 40 වැඩි වන්නේ නම් මසකට අය විය යුතු ගාස්තුව
7.	දුරකතන අලෙවිසැල් සහ දුරකතන ඇමතුම් ලබා දෙන ස්ථාන	500 0	750 0	1,000 0	1,500 0	1,750 0	1,500 0
8.	කාර්යාල හා මූල්‍ය ආයතන	500 0	750 0	1,000 0	1,500 0	1,750 0	1,500 0
9.	ආරෝග්‍ය ශාලා වෛද්‍ය මධ්‍යස්ථාන වෛද්‍ය පර්යේෂණාගාර (ආසාදිත ද්‍රව්‍ය හැර)	500 0	750 0	1,000 0	1,250 0	1,500 0	1,500 0

32. කසල දාහකය සඳහා නොදිරන කසල ලබාගැනීම - රාජ්‍ය ආයතන සඳහා කි. ග්‍රෑ 1 කට 30 0
පෞද්ගලික ආයතන සඳහා කි. ග්‍රෑ 1 කට 35 0

12 - 373/7

අකුරණ ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

අකුරණ ප්‍රාදේශීය සභාව විසින් 2021 නොවැම්බර් මස 24 වැනි දින පවත්වන ලද රැස්වීමේදී තීරණ අංක ඉ.1.8 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත් වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකු මා විසින්, එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2022 වර්ෂය සඳහා වන මෙම බද්ද අකුරණ ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

අයි. එම්. ඉස්තිහාර්,
සභාපති,
අකුරණ ප්‍රාදේශීය සභාව,
අලවතුගොඩ.

2021 වර්ෂයේ නොවැම්බර් මස 25 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2022 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම

තැනැත්තෙකු මත ම, එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමට අකුරණ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

		I වැනි තීරුව	*II වැනි තීරුව* රු. ශත
(1)	(i)	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජීන් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
	(ii)	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා	
		(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
		(ආ) වෙළෙඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
	(iii)	සෑම කරත්තයක් සඳහා	20 0
	(iv)	සෑම අත්කරත්තයක් සඳහා	10 0
	(v)	සෑම රික්ෂෝවක් සඳහා	7 50
	(vi)	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටලුවෙකු සඳහා	15 0
	(vii)	සෑම ඇතෙකු සඳහා	50 0

(2) විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළෙඳ කාර්ය සඳහා නොයොදවන අත්කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

12 - 373/8

අකුරණ ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු අය කිරීම

අකුරණ ප්‍රාදේශීය සභාව විසින් 2021 නොවැම්බර් මස 24 වැනි දින පවත්වන ලද රැස්වීමේදී තීරණ අංක ඉ.1.9 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇතුළත වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජකයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයෙන් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1% ක සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජකයා විසින් අකුරණ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ බලතල ප්‍රකාරව 154 (01) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් දැනුම් දෙමි.

අයි. එම්. ඉස්තිහාර්,
සභාපති,
අකුරණ ප්‍රාදේශීය සභාව,
අලවතුගොඩ.

2021 වර්ෂයේ නොවැම්බර් මස 25 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12 - 373/9

අකුරණ ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා කුලී රථ වාහන හා නවතා තැබීමේ ස්ථාන ලියාපදිංචි කිරීම

අකුරණ ප්‍රාදේශීය සභාව විසින් 2021 නොවැම්බර් මස 24 වැනි දින පවත්වන ලද රැස්වීමේදී තීරණ අංක ඉ.1.10 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුලී රථ වාහන නවතා තැබීම සඳහා 2022 වර්ෂය සඳහා වන මෙම බද්ද අකුරණ ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

අයි. එම්. ඉස්තිහාර්,
සභාපති,
අකුරණ ප්‍රාදේශීය සභාව,
අලවතුගොඩ.

2021 වර්ෂයේ නොවැම්බර් මස 25 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාව යටතේ අකුරණ ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂය තුළදි කුලී රථ වාහන නවතා තැබීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තියේ (1) වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වන වගන්තිය සහ හත්වන උප වගන්තියේ 'උ' ඡේදය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පහත I වැනි තීරුවේ සඳහන් එක් එක් කුලී රථ වාහනයක් වෙනුවෙන් එම II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත ප්‍රමාණයක කුලී රථ නවතා තැබීමේ ගාස්තුවක් අය කිරීමට අකුරණ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

අනු අංකය	*I වැනි තීරුව* *කුලී රථ වාහනය*	*II වැනි තීරුව* *ගාස්තු ප්‍රමාණයට වර්ෂයකට* *රු. ශත*
01	ලොරියක් සඳහා	5,000 0
02	වෑන් රථයක් සඳහා	5,000 0
03	ත්‍රිරෝද රථයක් සඳහා	3,300 0
04	එන්ජින් ධාරිතාව 1000ට අඩු බට්ටා ලොරි රථයක් සඳහා	3,500 0
05	කාරයක් සඳහා	6,000 0
06	ත්‍රිරෝද රථ නැවතුම්පොලට නව ත්‍රිරෝද රථයක් ලියාපදිංචි කිරීම සඳහා	27,500 0

12 - 373/10

අකුරණ ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

අකුරණ ප්‍රාදේශීය සභාව විසින් 2021 නොවැම්බර් මස 24 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක ඉ.1.11 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

අයි. එම්. ඉස්තිහාර්,
සභාපති,
අකුරණ ප්‍රාදේශීය සභාව,
අලවතුගොඩ.

2021 වර්ෂයේ නොවැම්බර් මස 25 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වන වගන්තියේ (1) වන උප වගන්තිය අනුව ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර අකුරණ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර *නැනහොත්* නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක -

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්, හෝ

(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක, හෝ

(ඇ) යම් ඉඩමක ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ආවරණය වී ඇති ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් හැර සෙසු ඉඩම් කොටස් වගා කටයුතු සඳහා හෝ වෙනත් ඵලදායී කටයුත්තකට යොදාගෙන නොමැති විට එසේ ඵලදායී ලෙස යොදා ගෙන නොමැති කොටසද මෙම බද්දට යටත් වේ.

එකී, ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකෙන ඉඩම් මත 2022 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ, භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට 01 (1%) ක වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2022 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර අකුරණ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට විධාන කළ යුතු යයි යෝජනා කරන්නීය.

12 - 373/11

අකුරණ ප්‍රාදේශීය සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 වැනි අධිකාරය)

අකුරණ ප්‍රාදේශීය සභාව විසින් 2021 නොවැම්බර් මස 24 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක ඉ.1.12 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙහි පහත සඳහන් අය විසින් උපලේඛනයේ සඳහන් කර ඇති ස්ථානයන්හි 2022 වර්ෂයට ගෝ සාතකාගාරයක් හා එළු සාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර අයදුම්පත්‍ර මා වෙත ඉදිරිපත් කර ඇති බවත්, ඒ සඳහා එම බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි හෝ ජීවත්වන අයෙක් හෝ අයවළුන් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතුන් පදනම් කරගෙනද යන්න පිළිබඳව විස්තර ලිඛිතව පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* (ආ) කොටසේ පළවූ දා සිට දින 14 ක් ඇතුළත මා වෙත දන්වා එවිය යුතු බව, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳව ආඥාපනතේ 272 වැනි අධිකාරයේ 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

අයි. එම්. ඉස්තිහාර්,
සභාපති,
අකුරණ ප්‍රාදේශීය සභාව,
අලවතුගොඩ.

2021 වර්ෂයේ නොවැම්බර් මස 25 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

අනු. අංකය	ඉල්ලුම්කරුගේ නම	ගව සාතකාගාරයක් හා එළු සාතකාගාරයා පවත්වාගෙන යන ලිපිනය
1.	එස්. එම්. සියාම් මොහොමඩ්	අංකඃ 253/1, පන්ගොල්ලාමඩ, අකුරණ.

12-373/12

ත්‍රිකුණාමලය නගර හා කඩවත් උප්පුවේලි ප්‍රාදේශීය සභාව

2022 වසර සඳහා වරිපනම් බදු පැනවීම

2022 වසර සඳහා වූ වරිපනම් බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) හා (2) වැනි උපවගන්ති මගින් ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති බලතල අනුව නගර හා කඩවත් උප්පුවෙලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටා ඇති සියලුම ප්‍රදේශයන් සංවර්ධනය වූ ප්‍රදේශ බවට 690/3 අංක දරන හා 1991.11.26 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශය පත්කිරීම අනුව නගර හා කඩවත් උප්පුවේලි ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පිහිටා ඇති ගෘහස්ථ, ගොඩනැගිලි, ඉඩම් සහ වාසස්ථාන යනාදි නිශ්චල දේපළ සඳහා වාර්ෂික වටිනාකමින් 6% බද්දක් අය කරන බවත් ඉහත සඳහන් පනත ප්‍රකාරව 135 වැනි වගන්තිය යටතේ නියම කරනු ලබන වරිපනම් බදුවලින් නිදහස් කරන බවත් අංක 1018 දරන 2021.06.15 වැනි දිනැති මාසික සභා රැස්වීම් වාරයේ දී සම්මත කරන ලද තීරණයට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

තවද, අදාළ තක්සේරු බදු කාර්තුව අවසන් වීමට පෙර ගෙවීම් කළ යුතු බවත්,

ඒ සමගම අදාල පනතේ 134 වගන්තියේ 7 වැනි උපවගන්තිය අනුව වාර්ෂික බද්ද පහත සඳහන් පරිදි මුළුමනින් ගෙවීම් කරන්නේනම් ඒ සඳහා වට්ටම් ලබාදෙන බව දන්වා සිටිනු ලැබේ.

(අ) 2022.01.31 වැනි දිනට හෝ ඊට ප්‍රථම එම වර්ෂය සඳහා වූ වාර්ෂික වරිපනම් බදු සියල්ල ගෙවීම් කරන්නේ නම් එම වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් 10% ක වට්ටමක් ද,

(ආ) එම වරිපනම් බද්ද වාරික වශයෙන් ගෙවීම් කරන අවස්ථාවක අදාළ කාර්තුවේ පළමු මස තුළ ගෙවීම් කළහොත් එසේ ගෙවීම් කරන වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් 5% ක වට්ටමක් ද, බදු ගෙවන්නා වෙත ලබා දෙන බවත්,

(ඇ) එම පනතේ 161 වැනි වගන්තිය අනුව අදාල බදු මුදල නොගෙවන්නේනම් එම පුද්ගලයින්ගෙන් හිස් බිම් හා නිවාස ස්ථාන සම්බන්ධයෙන් අයවිය යුතු වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් 15% ක්ද, හිස් බිම් හා නිවාස ස්ථාන නොවන දේපළ සම්බන්ධයෙන් අයවිය යුතු වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් 20% ක යම් බලපත්‍ර ගාස්තුවක් අයකරනු ලැබේ.

ආර්. ඒ. ටී. එස්. ඩී. රත්නායක,
සභාපති,
නගර හා කඩවත් ප්‍රාදේශීය සභාව,
උප්පුවේලි,
ත්‍රිකුණාමලය.

2021.06.15 වැනි දින,
නගර හා කඩවත් ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-291/1

ත්‍රිකුණාමලය නගර හා කඩවත් උප්පුවේලි ප්‍රාදේශීය සභාව

2022 වසර සඳහා වාහන හා සතුන් මත බදු අයකිරීම.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය හා එම පනතේ 148 වැනි වගන්තියේ 4 වැනි උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති බලතල අනුව 4 වැනි උපලේඛනයේ පනවා ඇති පරිදි නගර හා කඩවත් උප්පුවේලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පහත සඳහන් කර ඇති උපලේඛනය අනුව කිසියම් වාහනයක් හෝ සතෙකු වෙත 2022 වසර සඳහා ගාස්තු නියම කර අය

කරන බවත් අදාල ගාස්තු ගෙවීම් කර බලපත්‍රයක් 2022 මාර්තු මස 31 වැනි දිනට පෙර ලබා ගත යුතු බව අංක 1018 දරන 2021.06.15 වැනි දිනැති මාසික සභා රැස්වීම් වාරයේදී සම්මත කරන ලද තීරණයට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

ආර්. ඒ. ටී. එස්. ඩී. රත්නායක,
සභාපති,
නගර හා කඩවත් ප්‍රාදේශීය සභාව,
උප්පුවෙලි,
ත්‍රිකුණාමලය.

2021.06.15 වැනි දින,
නගර හා කඩවත් ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

	රු. ශත
මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් පාපැදි, කරත්තයක්, ජීන් රික්ෂෝවක්, පාපැදියක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
සෑම පාපැදියක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකලයක් හෝ කරත්තයක් සඳහා	
(අ) වෙළඳ කාර්ය සඳහා යොදවන්නේ නම්	18 0
(ආ) වෙළඳ කාර්ය නොවන කාර්ය සඳහා යොදවන්නේ නම්	4 0
සෑම කරත්තයක් සඳහා	20 0
සෑම අත්කරත්තයක් සඳහා	10 0
සෑම රික්ෂෝවක් සඳහා	7 0
සෑම අශ්වයෙකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා	15 0
සෑම ඇතෙකු සඳහා	50 0

ඒ සමඟ පාපැදියක් සඳහා රුපියල් 16 0 ක් සහ අනෙකුත් ඒවා සඳහා රුපියල් 10 0 ක් අයදුම් පත්‍ර ගාස්තු වශයෙන් අයකරනු ලැබේ.
විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන විල්බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කරනු ලැබේ.
මෙම උපලේඛනයේ "වෙළඳ කාර්යය" යන්නට විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12-291/2

ත්‍රිකුණාමලය නගර හා කඩවත් උප්පුවෙලි ප්‍රාදේශීය සභාව

2022 වසර සඳහා සේවා ගාස්තු හා අනෙකුත් ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් ලබා දී ඇති බලතල අනුව නගර හා කඩවත් උප්පුවෙලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2022 වසර සඳහා මහජනතාවගේ සේවාවන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති බලතල ප්‍රකාරව 2022 වසර සඳහා සේවා ගාස්තු සහ අනෙකුත් ගාස්තු නියම කර අය කරන බව අංක 1018 දරන 2021.06.15 වැනි දිනැති මාසික සභා රැස්වීම් වාරයේදී සම්මත කරන ලද තීරණයට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

ආර්. ඒ. ටී. එස්. ඩී. රත්නායක,
සභාපති,
නගර හා කඩවත් ප්‍රාදේශීය සභාව,
උප්පුවෙලි,
ත්‍රිකුණාමලය.

2021.06.15 වැනි දින,
නගර හා කඩවත් ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

සහතික පත් නිකුත් කිරීම සඳහා පහත සඳහන් ගාස්තු අය කරනු ලැබේ :

උපලේඛනය

		රු. ශත
1)	නොපවරා ගැනීමේ සහතික සඳහා වූ ගාස්තු	300 0
2)	වීථි රේඛා සහතික සඳහා වූ ගාස්තු	500 0
3)	නිළධාරි තැන්පතු (වීථි රේඛා සහතික)	200 0
4)	ගොඩනැගිලි අයදුම්පත් ගාස්තු	400 0
5)	වෙළඳ බලපත්‍ර සහතිකය	500 0
6)	දේපළ අයිතිය නම වෙනස් කිරීමේ අයදුම්පත් ගාස්තුව	200 0
7)	ඡායා පිටපත් සහතික කිරීම සඳහා වූ ගාස්තු	100 0
8)	මහජන පුස්තකාල ගාස්තු -	
	a) පුස්තකාල සාමාජික අයදුම්පත් ගාස්තුව	20 0
	b) පුස්තකාල සාමාජික තැන්පත් මුදල	200 0
	c) වාර්ෂික සාමාජිකත්වය අළුත් කිරීම	50 0
	d) පුස්තකාල පොත් ප්‍රමාද ගාස්තුව (දිනකට)	2 0
	e) වාර්ෂික සාමාජිකත්වය අළුත් කිරීමේ අයදුම්පත	20 0
9)	ගවයකු ඝාතනය කිරීම සඳහා වූ ගාස්තුව (උත්සව අවස්ථා සඳහා පමණක්)	500 0

12-291/3

ත්‍රිකුණාමලය නගර හා කඩවත් උප්පුවෙලි ප්‍රාදේශීය සභාව

2022 වසර සඳහා ජාතික පාරිසරික සංරක්ෂණ පනත යටතේ කරනු ලබන දැන්වීම

1988 අංක 56 දරන සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එම පනතේ 23(අ) වැනි වගන්තිය යටතේ මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති විසින් මෙම සභාවට පවරා දී ඇති බලතල අනුව මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වනු ලබන මධ්‍යම පාරිසරික අධිකාරිය විසින් සඳහන් කරන ලද කර්මාන්ත සඳහා එම අධිකාරියේ නීති රෙගුලාසිවලට අනුව වසර 03කට වලංගු බලපත්‍රයක් නිකුත් කිරීමටත් ඒ සඳහා වූ ගාස්තු ආයෝජනය කළ මුදලට අනුව පරීක්ෂණ ගාස්තු පහත සඳහන් උපලේඛනය අනුව 2022 වසර සඳහා අයකරන බවත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ අය කරනු ලබන වෙළඳ බලපත්‍ර ගාස්තු සඳහා කිසිදු බලපෑමක් නොකරන බව අංක 1018 දරන 2021.06.15 වැනි දිනැති මාසික සභා රැස්වීම් වාරයේදී සම්මත කරන ලද තීරණයට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

ආර්. ඒ. ටී. එස්. ඩී. රත්නායක,
සභාපති,
නගර හා කඩවත් ප්‍රාදේශීය සභාව,
උප්පුවෙලි,
ත්‍රිකුණාමලය.

2021.06.15 වැනි දින,
නගර හා කඩවත් ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

1) වසර 03 ක් සඳහා බලපත්‍ර ගාස්තු - රු. 4000.00
2) ආයෝජනය කළ මුදල මත ගෙවීම් කළ යුතු විස්තර -

අනු අංකය	ආයෝජනය කළ මුදල (රු.)	පරීක්ෂණ ගාස්තු (රු.)
01.	250,000 හෝ ඊට අඩු	3,000 0
02.	250,001 - 500,000	3,750 0
03.	500,001 - 1,000,000	5,000 0
04.	1,000,000 ට වැඩි	10,000 0

12-291/4

ත්‍රිකුණාමලය නගර හා කඩවත් උප්පුවෙලි ප්‍රාදේශීය සභාව

2022 වසර සඳහා ත්‍රීරෝද රථ ගාල් ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122, 126 වගන්තියේ vii(ඌ) වැනි උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති බලතල අනුව නගර හා කඩවත් උප්පුවෙලි ප්‍රාදේශීය සභාව විසින් පහත සඳහන් ස්ථාන ත්‍රීරෝද රථ නැවතුම් පොළ වශයෙන් වෙන්කර ඇති බවත් පහත සඳහන් රථ ගාලේ නතර කරන ත්‍රීරෝද රථයක් ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් වසරකට රු. 600.00 ක් අයකරන බවත් 2022 මාර්තු මස 31 වැනි දිනට පෙර ලියාපදිංචි කළ යුතු බව අංක 1018 දරන 2021.06.15 වැනි දිනැති මාසික සභා රැස්වීම් වාරයේදී සම්මත කරන ලද තීරණයට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

ආර්. ඒ. ටී. එස්. ඩී. රත්නායක,
සභාපති,
නගර හා කඩවත් ප්‍රාදේශීය සභාව,
උප්පුවෙලි,
ත්‍රිකුණාමලය.

2021.06.15 වැනි දින,
නගර හා කඩවත් ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01. ත්‍රීරෝද රථ ගාල පිළිබඳ විස්තර

01. නිලාවෙලි පාරේ UNHCR කඳවුර ඉදිරිපිට
02. පාලයියුත්තු කුඩ මෑණියන් හන්දිය
03. අනුරාධපුර හන්දිය, භාරදිපුරම්
04. සෙල්වනායගපුරම් පාසැල් වීදි හන්දිය
05. 4 කණුව හන්දිය
06. වේලාංකන්නි හන්දිය, ආන්දම්කුලම
07. වෙල්ලමනල් හන්දිය
08. ප්‍රීමා හන්දිය
09. ටී. ටී. ඒ. හන්දිය
10. ධාන්‍යගම හන්දිය
11. චීනවරාය දුම්රිය පොල අසල
12. වෙල්ලමනල් කින්නියා මෙඟොඩ තොට

13. ඇලස්තෝට්ටම් පාර හන්දිය
14. 3 කණුව හන්දිය
15. ආනන්දපුරි වෛරවර් කෝවිල අසල
16. අභයපුර වටරවුම (උදයන් කිරි නිශ්පාදන මධ්‍යස්ථානය අසළ)
17. ආන්දම්කුලම හන්දිය
18. සෙල්වනායගපුරම් වෛද්‍ය ශාලාව ඉදිරිපිට
19. කන්නියා පාර වරෝදයනගර් හන්දිය
20. ඉරයිරක්ක දේවාලය අසල - නිලාවෙලි පාර
21. වෛරවර් කෝවිල අසල - නිලාවෙලි පාර
22. අනුරාධපුර හන්දිය (Down Town අසල)
23. ආත්තිමෝට්ටයි පාසැල් හන්දිය
24. ඉළුප්පයිකුලම් හන්දිය
25. සාම්බල්තිවු පාලම හන්දිය
26. වල්ලුවර් පාර හන්දිය (සෙල්වනායගපුරම්)
27. නාහම්මාල් දේවාල හන්දිය - ඇලස්තෝට්ටම්
28. 5 කණුව
29. 6 කණුව
30. ධාන්‍යගම - 02
31. ලිංගනගර් - මුරුගන් කෝවිල අසල
32. ආන්දම්කුලම නාවික හමුදා කදවුර ඉදිරිපිට
33. 4 1/2 කණුව මිරිස්ස වංගුව හන්දිය
34. කප්පල්තුරේ පිවිසුම් හන්දිය
35. නුවර පාර මහ මුස්ලිම් පල්ලිය අසල
36. නඩේසර් කෝවිල අසල
37. මංගායුත්තු පිළියඩ් කන්නගි නැවතුම්පොළ
38. ආන්දම්කුළම අශෝක මාවත
39. සුමේධංකරපුර සමගි ත්‍රීරෝද රථ නැවතුම්පොළ
40. නුවර පාර නිර්මලකාන්ත් සිනමාහල හන්දිය නැවතුම්පොළ
41. නුවර පාර මැලේසියන් වඩු මඩුව ඉදිරිපිට ඇති නැවතුම්පොළ
42. කෝනේසපුරි විශ්ව විද්‍යාලීය හන්දිය නැවතුම්පොළ

02. නගර කඩවත් ප්‍රාදේශීය සභා උප්පුවෙලි බලප්‍රදේශයට අයත් ගොවිපළ පාරේ පිහිටා ඇති මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ඉදිරිපිට නවතා තබන වාහන සඳහා 392 අංක දරන 2019.07.09 වැනි දිනැති මාසික සභා තීරණ අනුව පහත සඳහන් රථ වාහන සඳහා නැවතුම් ගාස්තු අය කිරීමට තීරණය කර ඇත.

විස්තරය	*රු. ශත*
යතුරු පැදියක් සඳහා	20 0
ත්‍රීරෝද රථයක් සඳහා	30 0
වෑන්, කාර් රථයක් සඳහා	50 0

03. කන්නියා උණු දිය ලිං ප්‍රදේශයේ නවතා තබනු ලබන වාහන සඳහා දිනකට හෝ කොටසකට පහත සඳහන් ගාස්තු 2022 වසර සඳහා අය කරනු ලැබේ.

විස්තරය	*රු. ශත*
යතුරු පැදියක් සඳහා	20 0
ත්‍රීරෝද රථයක් සඳහා	30 0
වෑන්, කාර් රථයක් සඳහා	50 0
බස්, ලොරි රථයක් සඳහා	100 0

04. චීනවරාය මිට්ටුයි සිමෙන්ති හා ප්‍රීමා පිටි කර්මාන්ත ශාලා පිහිටා ඇති ප්‍රදේශයේ නවතා තබන හෝ භාණ්ඩ ටොන් 10 ක් ප්‍රවාහනය කරන ලොරියක් සඳහා දිනකට හෝ කොටසකට රු. 25 0 ක්ද, ටොන් 10 කට වැඩි වන අවස්ථාවක රු. 50 0 ක්ද, අය කරනු ලැබේ.

12-291/5

ත්‍රිකුණාමලය නගර හා කඩවත් උප්පුවෙලි ප්‍රාදේශීය සභාව

2022 වසර නියමිත ස්ථානයක් නොමැතිව ජංගම වෙළඳාමේ නිරත වන ව්‍යාපාරිකයන් සඳහා වූ ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තියේ(1) වැනි උපවගන්තිය සහ එම පනතේ 126 වගන්තියේ (x) වැනි උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති බලතල අනුව 1998.08.23 වැනි දිනැති 520/7 අංක දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* IV (ආ) වැනි කොටසේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් පළකළ සම්මත අතුරු ව්‍යවස්ථාවේ අංක 28 වැනි වගන්තිය අනුව නගර හා කඩවත් උප්පුවෙලි ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ ජංගම ව්‍යාපාරයේ නිරතවන ව්‍යාපාරිකයන් සඳහා පහත සඳහන් උපලේඛනයට අනුව 2022.01.01 දින සිට ගාස්තු අය කරන බව අංක 1018 දරන 2021.06.15 වැනි දිනැති මාසික මහා සභා රැස්වීම් වාරයේදී සම්මත කරන ලද තීරණයන්ට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

ආර්. ඒ. ටී. එස්. ඩී. රත්නායක,
සභාපති,
නගර හා කඩවත් ප්‍රාදේශීය සභාව,
උප්පුවෙලි,
ත්‍රිකුණාමලය.

2021.06.15 වැනි දින,
නගර හා කඩවත් ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

	ව්‍යාපාරයේ ස්වභාවය	*රු. ශත*
1)	දිනකට ලොරි මඟින් බිත්තර, පොල්, එළවළු, අයිස්ක්‍රීම්, පාන්, කෙසෙල්, ඉරිඟු වැනි ව්‍යාපාරයේ නිරත වන ව්‍යාපාරිකයන් සඳහා	50 0
2)	අත් කරත්ත, තල්ලු කරන කරත්ත ආදිය මඟින් සෞඛ්‍යයට හිතකර ආහාර පාන විකිණීම සඳහා (වසරකට)	150 0
3)	රථ වාහන මඟින් කිරි වෙළඳාම් කිරීම සඳහා වසරකට	500 0
4)	ව්‍යාපාරික අරමුණ සඳහා ප්‍රවේශ වන වාහන ගාස්තු (දිනකට)	50 0

12-291/6

ත්‍රිකුණාමලය නගර හා කඩවත් උප්පුවෙලි ප්‍රාදේශීය සභාව

2022 වසර සඳහා දැන්වීම් ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව වෙත ලබා දී ඇති බලතල ප්‍රකාරව 2019.06.21 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේදී සම්මත කළ 357 අංක දරන තීරණය නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාර විසින් සම්මත කර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 අංක දරන vii (ඊ) වැනි උපවගන්තිය යටතේ සහ 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමඟ කියවන ලද ප්‍රාදේශීය සභා පනතේ 123

වැනි වගන්තිය ප්‍රකාවර නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාර විසින් අනුමත කර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2166/18 අංක දරන 2020.03.12 දිනැති *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළකල දැන්වීම් අනුව දැන්වීම් ගාස්තු 2022 ජනවාරි මස 01 වැනි දින සිට අය කරන බව අංක 1018 දරන 2021.06.15 වැනි දිනැති මාසික සභා රැස්වීම් වාරයේදී සම්මත කරන ලද තීරණයට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

ආර්. ඒ. ටී. එස්. ඩී. රත්නායක,
සභාපති,
නගර හා කඩවත් ප්‍රාදේශීය සභාව,
උප්පුවෙලි,
ත්‍රිකුණාමලය.

2021.06.15 වැනි දින,
නගර හා කඩවත් ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-291/7

ත්‍රිකුණාමලය නගර හා කඩවත් උප්පුවෙලි ප්‍රාදේශීය සභාව

2022 වසර සඳහා 1% බද්ද අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව වෙත ලබා දී ඇති බලතල ප්‍රකාරව, නගර හා කඩවත් උප්පුවෙලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් ස්ථානයක්, හෝටලයක්, ආපන ශාලාවක් හෝ නවාතැන් පොළක් ලෙස භාවිතා කරන අවස්ථාවක එය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ අරමුණු සඳහා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදංචි වී අනුමැතිය ලත්,

1) හෝටලයක්
2) ආපන ශාලාවක්
3) නවාතැනක්

යනාදිය මඟින් පෙරාතුවම වූ අවුරුද්දේ ආදායමින් 1% ක් ප්‍රාදේශීය සභාවට බදු වශයෙන් ගෙවීම් කළ යුතු බව 2018.11.13 වැනි දිනැති අංක 87 දරන මාසික සභා රැස්වීම් වාරයේ සම්මත කරන ලද තීරණය අනුවත් එම මුළු ආදායම් වාර්ථාව ලියාපදිංචි කළ විගණන ආයතනයෙන් සහතික කළ විගණන වාර්ථාව සමඟ ඉදිරිපත් කළ යුතු බව අංක 1018 දරන 2021.06.15 වැනි දිනැති මාසික සභා රැස්වීම් වාරයේදී සම්මත කරන ලද තීරණයට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

ආර්. ඒ. ටී. එස්. ඩී. රත්නායක,
සභාපති,
නගර හා කඩවත් ප්‍රාදේශීය සභාව,
උප්පුවෙලි,
ත්‍රිකුණාමලය.

2021.06.15 වැනි දින,
නගර හා කඩවත් ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-291/8

ත්‍රිකුණාමලය නගර හා කඩවත් උප්පුවෙලි ප්‍රාදේශීය සභාව

2022 වසර සඳහා ගොඩනැගිලි අනුමැතිය සඳහා ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 21 හා 78 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව වෙත ලබා දී ඇති බලතල ප්‍රකාරව, 1988.08.23 වැනි දිනැති අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ IV(ආ) කොටසේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කළ සම්මත අතුරු ව්‍යවස්ථා 08 වැනි වගන්තිය හා අංක 690/3 දරන 1991.11.26 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* නගර හා කඩවත් උප්පුවෙලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සංවර්ධනය වූ ප්‍රදේශ බවට පත්කිරීම අනුව,

නගර හා කඩවත් උප්පුවෙලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2022 වසරේ ඉදිකරනු ලබන ගොඩනැගිලි, ඉඩම් අනු බෙදීම්, ඉඩම් ඒකාබද්ධ කිරීම, අනුකූලතා සහතික නිකුත් කිරීම හා වෙනත් සංවර්ධන කටයුතු සඳහා 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරියේ (සංශෝධිත) පනතේ 08 වැනි වගන්තිය සමඟ කියවිය යුතු ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරියේ 21 වගන්තිය යටතේ නාගරික සංවර්ධන හා නිවාස ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් සකස් කළ අංක 2235/54 දරන 2021.07.08 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* I වැනි කොටසේ I වැනි ඡේදය (සාමාන්‍ය) යටතේ ප්‍රකාශවට පත්කිරීම අනුව 2022 වසරේ ගාස්තු අයකරන බවත් සියළු ඉදිකිරීම් කටයුතු සඳහා ගොඩනැගිලි අයදුම්පත ඉදිරිපත්කර අනුමැතිය ලබාගතයුතු බවත් එසේ අනුමැතියකින් තොරව ඉදිකරනු ලබන ඉදිකිරීම් සඳහා නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගන්නා බවත් ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු හෝ සංවර්ධන කටයුතු හෝ අවසන් වූ පසු අනුකූලතා සහතිකය ලබා ගත යුතු බව අංක 1018 දරන 2021.06.15 වැනි දිනැති මාසික සභා රැස්වීම් වාරයේදී සම්මත කරන ලද තීරණයන්ට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

ආර්. ඒ. ටී. එස්. ඩී. රත්නායක,
සභාපති,
නගර හා කඩවත් ප්‍රාදේශීය සභාව,
උප්පුවෙලි,
ත්‍රිකුණාමලය.

2021.06.15 වැනි දින,
නගර හා කඩවත් ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-291/9

ත්‍රිකුණාමලය නගර හා කඩවත් උප්පුවෙලි ප්‍රාදේශීය සභාව

2022 වසර සඳහා සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත

ත්‍රිකුණාමලය නගර හා කඩවත් උප්පුවෙලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වැනි අධිකාරය) (4) වැනි වගන්තිය ප්‍රකාරව 2022 වසර සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් එක් සුනඛයෙකු සඳහාම රු. 5 0 ක් අයකරන බව අංක 1018 දරන 2021.06.15 වැනි දිනැති මාසික සභා රැස්වීම් වාරයේදී සම්මත කරන ලද තීරණයට අනුව මින් දැනුම් දෙනු ලැබේ. එම අයකිරීම් 2022 මාර්තු මස 31 වැනි දිනට පෙර ගෙවීම් කළ යුතු බව මින් දන්වා සිටිමි.

ආර්. ඒ. ටී. එස්. ඩී. රත්නායක,
සභාපති,
නගර හා කඩවත් ප්‍රාදේශීය සභාව,
උප්පුවෙලි,
ත්‍රිකුණාමලය.

2021.06.15 වැනි දින,
නගර හා කඩවත් ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-291/10

ත්‍රිකුණාමලය නගර හා කඩවත් උප්පුවෙලි ප්‍රාදේශීය සභාව

2022 වසර සඳහා අයාලේ ගැවසෙන සතුන් තහනම් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 66 වැනි වගන්තියේ (1), (2), (3), (4) වැනි අංක දරන උපවගන්ති යටතේ ලබා දී ඇති බලතල අනුව ත්‍රිකුණාමලය නගර හා කඩවත් උප්පුවෙලි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල මහා මාර්ගවල, අතුරු මාර්ගවල හා පොදු ස්ථානවල අයාලේ ගැවසෙන එළුවන්, ගවයින් ප්‍රාදේශීය සභාව විසින් අත්පත් කර ඒ සඳහා සකස් කළ පොදු ස්ථානයක ආරක්ෂා කර පහත සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි 2022.01.01 වැනි දින සිට ගාස්තු අයකරන බව අංක 1018 දරන 2021.06.15 වැනි දිනැති මාසික සභා රැස්වීම් වාරයේදී කරන ලද තීරණයට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

ආර්. ඒ. ටී. එස්. ඩී. රත්නායක,
සභාපති,
නගර හා කඩවත් ප්‍රාදේශීය සභාව,
උප්පුවෙලි,
ත්‍රිකුණාමලය.

2021.06.15 වැනි දින,
නගර හා කඩවත් ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

		රු. ශත
1)	සතෙකු ඇල්ලීම සඳහා වූ ගාස්තු	1,500 0
2)	සතෙකු නඩත්තු කිරීමේ ගාස්තු	500 0
3)	පැය 24ක් තුළදී නැවත සතාව නිදහස් නොකරන අවස්ථාවේදී (අතිරේක සෑම දිනයක් සඳහාම)	500 0

එසේ අල්ලා ගන්නා ලද සතුන් සඳහා ඉහත කී ගාස්තු ගෙවා නිදහස් කිරීමට අපොහොසත් වන සතුන් දින 10 කින් අනතුරුව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ඒ මගින් ලැබෙන මුදල් ප්‍රාදේශීය සභා අරමුදලට බැර කරනු ලැබේ.

12-291/11

ත්‍රිකුණාමලය නගර හා කඩවත් උප්පුවෙලි ප්‍රාදේශීය සභාව

2022 වසර සඳහා ගඩොල්, වැලි, බොරළු පස් ප්‍රවාහනය කරන වාහන සඳහා වූ මාර්ග නඩත්තු ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 70 වැනි වගන්තියේ (1), (2) වැනි උප වගන්තිය අනුව ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති බලතල අනුව නගර හා කඩවත් උප්පුවෙලි ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ පහත සඳහන් අවශ්‍යතා සඳහා භාවිතා කරන වාහන වෙනුවෙන් පහත සඳහන් උපලේඛනය අනුව 2022.01.01 වැනි දින සිට ගාස්තු අය කරන බව අංක 1018 දරන 2021.06.15 වැනි දිනැති මාසික සභා රැස්වීම් වාරයේදී සම්මත කරන ලද තීරණයට අනුව මින් දැනුම් දෙන ලැබේ.

ආර්. ඒ. ටී. එස්. ඩී. රත්නායක,
සභාපති,
නගර හා කඩවත් ප්‍රාදේශීය සභාව,
උප්පුවෙලි,
ත්‍රිකුණාමලය.

2021.06.15 වැනි දින,
නගර හා කඩවත් ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

විස්තරය	රු. ශත
බොරළු පස් කියුබයක් සඳහා	50 0
වැලි කියුබයක් සඳහා	50 0
කළු ගල් කියුබයක් සඳහා	50 0
බොරළු පස් කැණීමේ මාර්ග භාවිතා කිරීම සඳහා තැන්පත් මුදල	100,000 0

බොරළු පස් කියුබ් 100ක් ඉක්මවන විටක නැවත අනුමැතිය ලබා ගත යුතුය.

12-291/12

ත්‍රිකුණාමලය නගර හා කඩවත් උප්පුවෙලි ප්‍රාදේශීය සභාව

2022 වසර සඳහා ඉඩම් විකිණීම මත බදු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) උප වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව ලබාදී ඇති බලතල ප්‍රකාර නගර හා කඩවත් උප්පුවෙලි ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුල පිහිටි යම් ඉඩමක් වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1% බද්දක් උප්පුවෙලි ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බව අංක 1018 දරන 2021.06.15 වැනි දිනැති මාසික සභා රැස්වීම් වාරයේදී සම්මත කරන ලද තීරණයට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

ආර්. ඒ. ටී. එස්. ඩී. රත්නායක,
සභාපති,
නගර හා කඩවත් ප්‍රාදේශීය සභාව,
උප්පුවෙලි,
ත්‍රිකුණාමලය.

2021.06.15 වැනි දින,
නගර හා කඩවත් ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-291/13

ත්‍රිකුණාමලය නගර හා කඩවත් උප්පුවෙලි ප්‍රාදේශීය සභාව

2022 වසර සඳහා සභාව සතු යන්ත්‍ර සූත්‍ර / උපකරණ කුලියට ලබා දීම සඳහා වූ ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 126(ix)(ආ) වැනි උප වගන්තිය අනුව ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති බලතල අනුව පහත සඳහන් අවශ්‍යතාව මත මහජනතාවගේ සේවාවන් ඉටු කිරීම සඳහා මල අපද්‍රව්‍ය බැහැර කිරීමේ වාහනය/ යන්ත්‍ර සූත්‍ර/ උපකරණ/ ගොඩනැගිලි කුළියට ලබාදීම/ කසල බැහැර කිරීම යනාදිය සඳහා පහත සඳහන් උපලේඛනය අනුව ගාස්තු 2022.01.01 වැනි දින සිට අය කරන බව අංක 1018 දරන 2021.06.15 වැනි දිනැති මාසික සභා රැස්වීම් වාරයේදී සම්මත කරන ලද තීරණයට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

ආර්. ඒ. ටී. එස්. ඩී. රත්නායක,
සභාපති,
නගර හා කඩවත් ප්‍රාදේශීය සභාව,
උප්පුවෙලි,
ත්‍රිකුණාමලය.

2021.06.15 වැනි දින,
නගර හා කඩවත් ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

පාරිසරික සංරක්ෂණය කිරීම සඳහා කුණු කසල බැහැර කිරීම.

අංක	විස්තර	ප්‍රාදේශීය සභාවේ වාහන රු. ශත	පෞද්ගලික වාහන රු. ශත
01.	කියුබයක් සඳහා	3,000 0	1,500 0
02.	වරායේදී නැව් අපද්‍රව්‍යයන් බැහැර කිරීම සඳහා වූ ගාස්තු - ට්‍රැක්ටර් රථයක් සඳහා	4,500 0	2,5000
03.	වරායේදී නැව් අපද්‍රව්‍යයන් බැහැර කිරීම සඳහා වූ ගාස්තු - ටිපරයක් කියුබ් 2.5 සඳහා	8,000 0	5,000 0

වාහන කුලියට ලබා දීම - I

01.	ICB (බැකෝ ලෝඩරය)	යාන්ත්‍රික පැයකට වාහනය ක්‍රියාකරු සහ ඉන්ධන සහිතව (යෑමට හා ඒමට)	3,000 0
02.	Tipper	එක් දිනකට යාන්ත්‍රික පැයකට වාහන ක්‍රියාකරු සහ ඉන්ධන සහිතව (පැය 08කට) කිලෝමීටරයට ඉන්ධන හා ක්‍රියාකරු සහිතව	9,500 0 95 0
03.	ට්‍රැක්ටර් රථය	යාන්ත්‍රික පැයකට වාහන ක්‍රියාකරු සහ ඉන්ධන සහිතව පැයකට (යෑමට හා ඒමට)	600 0
		එක් දිනකට ඉන්ධන හා ක්‍රියාකරු සහිතව (පැයකට 08කට)	4,700 0

වාහන කුලියට ලබා දීම - II

අංක	වාහන	දිනකට කුලිය		
		සභා බල ප්‍රදේශය තුළ රුපි.	සභා බල ප්‍රදේශය තුළ නොවන රුපි.	දිනකට තැන්පත් මුදල (රුපි.)
01.	ගල් රෝල (ටොන් 10) ඉන්ධන හා ප්‍රවාහන ගාස්තු රහිතව (Road Roller)	10,500 0	11,000 0	11,000 0
02.	අත්රෝල (ටොන් 2) (Hand Roller) (With Vibrating) ඉන්ධන හා ප්‍රවාහන ගාස්තු රහිතව	4,000 0	4,500 0	4,500 0
03.	ජල බවුසරය ජලය සහිතව (Water Browser with water), (6000 L)	6,500 0	7,500 0	7,500 0
04.	ජල බවුසරය ජලය සහිතව (Water Browser with water), (3000 L) ප්‍රවාහනය සමඟ	3,000 0	4,000 0	-
05.	a) ජල බවුසරය නවතා තැබීම (Water Browser Idling) b) ජල බවුසරය පමණක් ජලය රහිතව (ප්‍රවාහන ගාස්තු නොමැතිව) c) ජල බවුසරය ජලය සහිතව එක් වරකට (නොනවතා) (Water Browser with water per Load without Idling)	1,500 0 1,500 0 1,500 0	2,000 0 2,000 0 2,000 0	- - -
06.	ප්ලේට් කොම්බැක්ටර් ක්‍රියාකරු සමඟ ඉන්ධන රහිතව (Plate Compactor with Operator)	2,500 0	3,000 0	3,000 0

ගලි ඇමීටරය Gully Bows		ලොට් එකක් සඳහා (Per Load) එක් වරක් සඳහා			
		සභා බල ප්‍රදේශය තුළ (රුපි.) Inside		සභා බල ප්‍රදේශය තුළ නොවන (රුපි.)Outside	
		3000 L	6000 L	3000 L	6000 L
01.	පාසල් හා ආගමික ස්ථාන (School and Religious Centre)	3,000 0	4,000 0	4,000 0	5,000 0

02.	ගෘහස්ථ (Residential)	3,250 0	5,000 0	4,250 0	6,000 0
03.	රාජ්‍ය ආයතන, බැංකු, රාජ්‍ය නොවන ආයතන, පෞද්ගලික ආයතන (Government Department, Bank, N.G.O, Private Sectors)	7,000 0	9,000 0	8,000 0	10,000 0

සභා ශාලාව කුලියට ලබා දීම

ශාලාව	ශබ්ද විකාශන යන්ත්‍ර සහ ක්‍රියාකරු සහිතව (රුපි.)	ශබ්ද විකාශන යන්ත්‍ර සහ ක්‍රියාකරු රහිතව (රුපි.)	තැන්පත් මුදල (රුපි.)
රාජ්‍ය නොවන ආයතන	12,500 0	10,000 0	5,000 0
රාජ්‍ය ආයතන	15,000 0	12,500 0	-
අධ්‍යාපනික උත්සව සඳහා	3,500 0	3,000 0	3,000 0
ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පොදු ස්ථාන කුලියට ලබා දීම	ව්‍යාපාරික කටයුත්තක් සඳහා (එක් දිනකට) 1,000 0	ව්‍යාපාරික නොවන කටයුත්තක් සඳහා (එක් දිනකට) 750 0	-

උපකරණ කුලියට ලබා දීම

01	Concrete Mixer (Desel)	With Operator and without Transport & Fule (Per Day)	7,500 0
02	Concrete Mixer (Desel)	With Operator and without Transport & Fule (Per Day)	6,000 0
03	Poker Vibrator (Petrol/Desel)	With Operator and without Transport & Fule (Per Day)	4,000 0
04	Poker Vibrator (Petrol/Desel)	With Operator and without Transport & Fule (Per Day)	2,500 0
05	Poker Vibrator (Electric)	With Operator & Transport (Per Day)	3,000 0
06	Poker Vibrator	With Operator & Transport (Per Day)	1,500 0
07	Steel Box bar or 'C' Puriling	50mm x 150mm x 6000mm (One number per day)	300 0
08	Disinfection for one unit with Transport	(With the Trincomalee Town & Gravets Limit)	4,000 0

12-291/14

ත්‍රිකුණාමලය නගර හා කඩවත් උප්පුවේලි ප්‍රාදේශීය සභාව

2022 වසර සඳහා ව්‍යාපාර බදු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති බලතල ප්‍රකාරව මෙම පනතේ විධිවිධානය අනුව හෝ එකී පනත යටතේ සාදනු ලැබූ යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් අවශ්‍ය වන්නා වූ හෝ එම පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීමට අවශ්‍ය නොවන්නා වූ හෝ ඉහතකී පනතේ 152 (1) වැනි උප වගන්තිය යටතේ සඳහන් කරන I උපලේඛනයේ සඳහන් යම් වෙළඳ ව්‍යාපාරයක් නගර හා කඩවත් උප්පුවෙලි ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ 2022 වසරේ පවත්වාගෙන යන ව්‍යාපාරයන් සඳහා එම ව්‍යාපාරයේ 2021 වසර සඳහා වූ ආදායම් අනුව පහතින් සඳහන් II උපලේඛනයේ දක්වා ඇති පරිදි ඇති 2022 වසරේ මාර්තු මස 31 වැනි දිනට පෙර නගර හා කඩවත් උප්පුවෙලි ප්‍රාදේශීය සභාවට

ව්‍යාපාර බදු ගෙවීම් කර බලපත්‍ර ලබා ගත යුතු බව අංක 1018 දරන 2021.06.15 වැනි දිනැති මාසික සභා රැස්වීම් වාරයේදී සම්මත කරන ලද තීරණයට අනුව මින් දැනුම් දෙනු ලැබේ.

ආර්. ඒ. ටී. එස්. ඩී. රත්නායක,
සභාපති,
නගර හා කඩවත් ප්‍රාදේශීය සභාව,
උප්පුවෙලි,
ත්‍රිකුණාමලය.

2021.06.15 වැනි දින,
නගර හා කඩවත් ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

1) සම්ප්‍රේෂණ කුළුණක් පවත්වාගෙන යාම
2) පාසල් උපකරණ, පොත්පත්, ලිපිද්‍රව්‍ය එක්රැස් කිරීම හා විකිණීම
3) මත්පැන් හා විදේශීය මත්පැන් අලෙවිය
4) ඖෂධ විකිණීම (ෆාමසි)
5) ආයුර්වේද ඖෂධ වර්ග විකිණීම
6) ඇස් කණ්නාඩි විකිණීම
7) විද්‍යුත් උපකරණ විකිණීම
8) ත්‍යාග භාණ්ඩ විකිණීම
9) සිල්ලර හා තොග වෙළඳාම
10) ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිය
11) ප්ලාස්ටික් හා ඇලුමිනියම් භාණ්ඩ විකිණීම
12) බටහිර බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම
13) කොමිෂ්කරුවන්
14) වෙන්දේසිකරුවන්, දැන්වීම්කරුවන්
15) කොන්ත්‍රාත්කරුවන්
16) විදේශීය ඒජන්ත මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
17) උකස් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
18) පෞද්ගලික අධ්‍යාපන ආයතන
19) බැංකු හා මූල්‍ය ආයතන
20) රක්ෂණ සමාගම
21) කාබනික පොහොර හා කෘෂි රසායනික ද්‍රව්‍ය අලෙවිය
22) පාවහන් අලෙවිය
23) නිමි ඇඳුම් අලෙවිය
24) විඩියෝ පට අලෙවි සැල හා ඡායාරූප ගන්නා ස්ථානය
25) ටයර්, ටියුබ් නිෂ්පාදනය හා අලෙවිය
26) සැපයුම්කරුවන්
27) විදේශ සේවා ආයතනයක් පවත්වාගෙන යාම
28) නිතිඥ සේවා ආයතනයක් පවත්වාගෙන යාම
29) වාහන අමතර කොටස් විකිණීම
30) ඉන්ධන ගබඩා කිරීම හා අලෙවිය
31) තොග වෙළඳාම
32) වානේ භාණ්ඩ අලෙවිය
33) පිත්තල කර්මාණ්තයක් පවත්වාගෙන යාම

34) ස්වර්ණාභරණ වෙළඳසැල්
35) පරණ පුවත්පත් එකතු කර අලෙවිය
36) දේපළ හා ඉඩම් සංවර්ධන ව්‍යාපෘති
37) භාණ්ඩ බෙදාහැරීම
38) වාහන අලෙවිකරුවන්
39) සුපිරි වෙළඳ සැල් පවත්වාගෙන යාම
40) මැණික් විකිණීම
41) මෝටර් රථ විකිණීම
42) යතුරු පැදි අලෙවිය
43) යතුරු පැදි අමතර කොටස් අලෙවිය
44) මසුන් ඇති කිරීම හා විකිණීම
45) රසායනාගාර සේවා, රුධිර සාම්පල් එකතු කිරීම
46) විවිධ ආයතනවලට කොන්ත්‍රාත් පදනම මත සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම (විදුලි/ජල/ගල්වල)
47) පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
48) කේබල් සම්බන්ධතා සැපයුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම (සන්නිවේදන)
49) දැන්වීම් සේවා ආයතනයක් පවත්වාගෙන යාම
50) සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදනය හා විකිණීම
51) හම් භාණ්ඩ නිෂ්පාදනය හා විකිණීම
52) විදේශීය ගමන් සේවා මධ්‍යස්ථාන
53) ඉඩම්, නිවස් අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
54) වාහන අලංකාර කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (Modification)
55) රියදුරු පුහුණු පාසලක් පවත්වාගෙන යාම
56) සන්නිවේදන ස්ථානයක් පවත්වාගෙන යාම
57) ග්‍රාමීය බැංකුවක් පවත්වාගෙන යාම
58) මංගල්‍ය හා අවමංගල්‍ය භාණ්ඩ නිෂ්පාදනය හා කුලියට දීම
59) දුරකථන අළුත්වැඩියාව හා අලෙවිය
60) ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දීම
61) ගෘහ නිර්මාණ සැලසුම් ශිල්පී සේවාවන් පවත්වාගෙන යාම
62) ඉන්ධන පිරවුම්හල්
63) උත්සව භාණ්ඩ කුලියට දීම
64) විසිතුරු පැළ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
65) වාහන අලුත්වැඩියාව හා අලෙවිය
66) කුෂන් වැඩපළක් පවත්වාගෙන යාම
67) රථවාහන සඳහා අමතර කොටස් විකිණීම
68) යකඩ එකතු කිරීමේ හා අලෙවි කිරීම
69) ගුවන් විදුලි, රූපවාහිනී සඳහා අමතර කොටස් විකිණීම
70) ගුවන් විදුලි යන්ත්‍ර, රූපවාහිනී හා මහන මැෂින් විකිණුම් ස්ථානයක් පවත්වාගෙන යාම
71) ත්‍රීරෝද රථ අමතර කොටස් විකිණීම
72) වෛද්‍ය සේවා ස්ථානයක් පවත්වාගෙන යාම
73) වාහන අලෙවිය හා අලුත්වැඩියාව
74) මෙට්ට නිෂ්පාදන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
75) පුවත්පත් විකිණීම හා බෙදා හැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
76) ඔරලෝසු විකුණුම් ස්ථානයක් පවත්වාගෙන යාම
77) විසිතුරු භාණ්ඩ විකිණීම
78) යකඩ බට විකිණීම

79) ඇඹරුම් හලක් පවත්වාගෙන යාම
80) කොන්ක්‍රීට් කණු නිෂ්පාදනය හා විකිණීම
81) බාල්දි හා භාණ්ඩ නිෂ්පාදනය හා විකිණීම
82) සන්නිවේදන භාණ්ඩ විකුණුම් ස්ථානයක් පවත්වාගෙන යාම
83) ධීවර ඔරු තබා ගැනීම
84) සංචාරක ප්‍රදේශවල බෝට්ටු සේවා පවත්වාගෙන යාම
85) යාන්ත්‍රික ධීවර ඔරු විකිණීම
86) ඉස්සන් ඇති කිරීමේ ගොවි පොළක් කිරීම
87) මාළු වාඩි පවත්වාගෙන යාම
88) වී, සහල් සහ පොහොර තොග වෙළඳාම
89) සැහැල්ලු බීම වර්ග තොග වෙළඳාම
90) අයිස් වාඩියක් පවත්වාගෙන යාම
91) ගඩොල් නිෂ්පාදනය හා අලෙවිය
92) උළු නිෂ්පාදනය හා විකිණීම
93) කොන්ක්‍රීට් භාණ්ඩ හා බ්ලොක් ගල් නිෂ්පාදනය හා අලෙවිය
94) රෙදි කඩයක් පවත්වාගෙන යාම
95) පානීය ජලය නිෂ්පාදනය හා විකිණීම
96) ලුණු ලේවායන් පවත්වාගෙන යාම
97) කොප්පරා නිෂ්පාදනය හා අලෙවිය
98) පපඩම් නිෂ්පාදනය හා විකිණීම
99) තල් හකුරු නිෂ්පාදනය හා විකිණීම
100) දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම
101) ගල් වලක් පවත්වාගෙන යාම
102) කේබල් පහසුකම් සපයන සේවා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම (රූපවාහිනී)
103) ආනයන හා අපනයන භාණ්ඩ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
104) පෞද්ගලික පෙර පාසල් පවත්වාගෙන යාම
105) භාණ්ඩ හා සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
106) රා රැස්කිරීම හා විකිණීම
107) වාහන සෝදන ස්ථානයක් පවත්වාගෙන යාම
108) දෛනික පදනම මත කුලියට ලබාදෙන නිකේත
109) අයිස් ක්‍රීම් හා සිසිල් බීම නිෂ්පාදනය හා අලෙවිය
110) කුකුල් ගොවිපොළක් පවත්වාගෙන යාම
52. යකඩ හා වානේ ගෘහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
53. රථවාහන ආදියේ විදුලි උපකරණ අලුත්වැඩියා කරන ස්ථානයක්
54. බිම් මල් (හතු) නිෂ්පාදනය
55. ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම
56. මෝටර් රථ අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
57. මල් පෝච්චි නිෂ්පාදනය කිරීම හා විකිණීම
58. හැලි වලං නිෂ්පාදනය කිරීම හා විකිණීම
59. ඇඟලුම් නිෂ්පාදනය/ටේලර් සාප්පු
60. තිරරෙදි, මදුරු දැල් විකිණීමේ ස්ථානයක්
61. පිගන් විකිණීම
62. නෙස්කැෆේ මැෂින් යන්ත්‍ර බදුදීම
63. රියැදුරු පුහුණු පාසැලක් පවත්වාගෙන යාම
64. උපදේශන සහ විදේශීය සංචාර සංවිධානයක් පවත්වාගෙන යාම
65. කුලී පදනම මත වාහන ලබාදීමේ ස්ථානයක්
66. ගුවන් ටිකට් පත් අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක්
67. ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
68. බතික් කර්මාන්තයක් පවත්වාගෙන යාම
69. සම්ප්‍රේෂණ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
70. පෙර පාසලක්, දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
71. බැංකුවක් පවත්වාගෙන යාම
72. රක්ෂා සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
73. ලයිට් සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
74. ගෘහ නිර්මාණ සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
75. වාස්තු විද්‍යා සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
76. ප්‍රචාරක කටයුතු කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම
77. ඇස් කණ්නාඩි සාප්පුවක් පවත්වාගෙන යාම
78. තිරරෙදි, මදුරුදැල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
79. පශු වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
80. තොග වශයෙන් විකිණීම සඳහා නරක්වනසුලු කෑම වර්ග ආහාර ද්‍රව්‍ය
81. අලුත් ලෝහ හෝ පරණ ලෝහ ලඟ තබා ගැනීම
82. බටහිර වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම

83. වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම
84. සත්ත්ව සායනයක් පවත්වාගෙන යාම
85. කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
86. ඇලුමිනියම්, ප්ලාස්ටික් භාණ්ඩ
87. පාවිච්චිකළ ඇඳුම් ගබඩා කිරීම
88. පාවිච්චි කරන ලද පත්තර හෝ කඩදාසි තබා ගැනීම
89. කෘෂි රසායන ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක්
90. සන්නිවේදන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
91. කායවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
92. තීන්ත අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක්
93. පෞද්ගලික අධ්‍යාපන ආයතනක් පවත්වාගෙන යාම
94. විගණනයෙන් විගණකාධිකාරී සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
95. ලොතරැයි නියෝජිත ආයතනයක්
96. රේස් බුකියක් පවත්වාගෙන යාම
97. නියෝජිත තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම
98. පින්තූර රාමු කිරීම හා වීදුරු රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
99. රබර්, කුරුඳු මිලට ගන්නා ස්ථනායක් පවත්වාගෙන යාම
100. රැකියා නියෝජිත ස්ථානයක් පවත්වාගෙන යාම
101. උකස් බඩු ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම
102. සංගීත භාණ්ඩ හෝ ක්‍රීඩා භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
103. වැහිපීලි, අමානෝ තහඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
104. වාහන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
105. දේපළ තක්සේරුකරණය හා ව්‍යාපාර උපදේශන සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
106. කෘෂි උපකරණ නිෂ්පාදනය හා විකිණීම
107. වාහන ප්‍රින්ටඩ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
108. කබොක් ගල්, බොරළු හෝ කළුගල් ලබා ගැනීමේ ගල්වලක් පවත්වාගෙන යාම
109. කළුගල් කැණීමේ හෝ කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
110. දුරකථන සම්ප්‍රේෂණ කුළුණක් පවත්වාගෙන යාම
111. ඇඟලුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
112. අභ්‍යාස පොත් නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම
113. සූර්ය පැනල සවිකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
114. ලිහිසිතෙල් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

12 - 133/5

මාතර ප්‍රාදේශීය සභාව

සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු පැනවීම - 2022 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, මාතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත් කර ඇති සීමාව ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදි කිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක -

(අ) ඒ ඉඩමෙහි කිසිම ගොඩනැගිල්ලක් ඉදිකර නොමැති නම් හෝ,
(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට වෙන්කර නොමැති විටක හෝ
(ඇ) ඒ ඉඩමෙහි ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය හෝ වගා කිරීමට යටත් බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 60% ට වඩා අඩු වන්නේ නම් එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2022 වර්ෂය සඳහා ඒ

එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන බිම් අගයෙන් 2% බද්දක් පැනවීමටත්, මාතර ප්‍රාදේශීය සභාව විසින් 2021 අගෝස්තු මස 05 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේදී තීරණ අංක 05:01:04 (vi) යටතේ ඒකමතිකව සහා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද මෙම බද්ද 2022 ජුනි මස 30 වැනි දිනට පෙර මාතර ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. කේ. විමල් ප්‍රියජනක,
සභාපති,
මාතර ප්‍රාදේශීය සභාව.

2021 අගෝස්තු මස 05 වැනි දින,
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මාතර ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර මාතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ නිත්‍ය හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(අ) ඒ ඉඩමෙහි කිසිම ගොඩනැගිල්ලක් ඉදිකර නොමැති නම් හෝ,
(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට වෙන්කර නොමැති විටක හෝ
(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය හෝ වගා කිරීමට යටත් බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 60% ට වඩා අඩු වන්නේ නම්

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2022 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන බිම් අගයෙන් 2% බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2022 වර්ෂයේ ජුනි මස 30 වැනි දිනට පෙර මාතර ප්‍රාදේශීය සභාව වෙත ගෙවනු ලැබිය යුතු යැයි මාතර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12 - 133/6

මාතර ප්‍රාදේශීය සභාව

සභාව සතු භූමි මත තාවකාලික බදු පැනවීම - 2022 වර්ෂය

මාතර ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ අගෝස්තු මස 05 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 05:01:04(vii) යටතේ පහත දැක්වෙන යෝජනාව සහා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. කේ. විමල් ප්‍රියජනක,
සභාපති,
මාතර ප්‍රාදේශීය සභාව.

2021 අගෝස්තු මස 05 වැනි දින,
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

විශේෂ අවස්ථා සඳහා තාවකාලික වෙළෙඳ සල්වලින් දිනකට මාතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛනය පරිදි 2022 වර්ෂයට බදු අය කිරීමට මාතර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

	රු. ශත
01. වර්ග අඩි 01 සිට 05 දක්වා	5 00
02. වර්ග අඩි 06 සිට වැඩිවන සෑම වර්ග අඩියක් දක්වාම	7 00
03. ජංගම වෙළඳ ව්‍යාපාර සඳහා	25 00
04. ජංගම වෙළඳ වාහන (නැවතුම් රථ)	20 00
05. ත්‍රිවිල් රථයක් සඳහා	10 00

12 - 133/7

මාතර ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ආදාහනාගාර ගාස්තු අයකිරීම

මාතර ප්‍රාදේශීය සභාව විසින් 2021 අගෝස්තු මස 05 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 05:01:04 (viii) යටතේ පහත දැක්වෙන යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. කේ. විමල් ප්‍රියජනක,
සභාපති,
මාතර ප්‍රාදේශීය සභාව.

2021 අගෝස්තු මස 05 වැනි දින,
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

2022 වර්ෂය සඳහා පහත උපලේඛනයේ සඳහන් පරිදි ආදාහනාගාර ගාස්තු අයකළ යුතු යැයි මාතර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය,

උපලේඛනය

		රු. ශත
01.	මාතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ආදාහනයක් සඳහා	රු. 5,000 0
02.	බල ප්‍රදේශයෙන් පිටත ආදාහනයක් සඳහා	රු. 6,000 0
03.	අළු තැන්පත් කිරීම සඳහා (2’ x 2’)	රු. 2,500 0
04.	භූමදානය සඳහා	රු. 200 0

12 - 133/8

මාතර ප්‍රාදේශීය සභාව

සේවා සඳහා ගාස්තු අය කිරීම - 2022 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 (1) වැනි වගන්තිය ප්‍රකාරව මාතර ප්‍රදේශීය සභා බල ප්‍රදේශය තුළ 2022 වර්ෂයට සේවා සැපයීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2022.01.01 වැනි දින සිට පනවා අය කිරීමට 2021 අගෝස්තු මස 05

වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 05:01:04 (ix) යටතේ සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. කේ. විමල් ප්‍රියජනක,
සභාපති,
මාතර ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 05 වැනි දින,
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 (1) වැනි වගන්තිය ප්‍රකාරව 2022 වර්ෂය සඳහා මාතර ප්‍රාදේශීය සභාවට පහත සඳහන් සේවාවන් සඳහා ගාස්තුවක් ගෙවිය යුතු බවට මාතර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

01.	ගොඩනැගිලි අයදුම් පත්‍ර	රු. 400 0
02.	ඉඩම් අනුබෙදුම් අයදුම්පත්‍ර ගාස්තු	රු. 200 0
03.	වරිපනම් ඔප්පු සාරාංශ	රු. 250 0
04.	වීථි රේඛා සහ නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීම	රු. 400.00 මාසයක් ඇතුළත නිකුත් කිරීම 25% මාස 02 ක් ඇතුළත 50%/මාස 03 පසු සම්පූර්ණ ගාස්තු
05.	පරිසර බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු	රු. 4,000 0 + රජයේ බදු
06.	ප්‍රාදේශීය සභාව සතු බිම් බදු දීම, වෙළෙඳ කාර්යක් සඳහා වර්ග අඩි 01 ක් සඳහා	රු. 5 0
07.	අනතුරුදායක ගස් පරීක්ෂා කිරීම සඳහා අයදුම්පත්‍ර ගාස්තු	
	• කොස්ගස් 01 ක් සඳහා	රු. 750 0
	• වෙනත් ඕනෑම ගසක් සඳහා	රු. 500 0
08.	ජල නල එලීම සඳහා මාර්ග පළුදු කිරීමේදී වර්ග මීටර් 01 ක් සඳහා	
	• කොන්ක්‍රීට් පාරක් සඳහා	රු. 2,200 0
	• තාර පාරක් සඳහා	රු. 1,600 0
	• කාපට් පාරක් සඳහා	රු. 7,420 0
	• කුට්ටිගල් පාරක් සඳහා	රු. 2,200 0
09.	පුස්තකාල සාමාජිකත්වය ලබා ගැනීමේ අයදුම්පත්‍ර ගාස්තු	රු. 50 0
10.	පුස්තකාල දඩ දිනකට	රු. 2 0
11.	බැකෝ රථය කුලියට දීම (පැයකට) (දිස්ත්‍රික් මිල කමිටුවේ අනුමත මිල ගණන් මත වෙනස් විය හැක.)	රු. 2,100 0

12.	මාර්ග තලනය කුළියට දීම	
	• සභා බල ප්‍රදේශය තුළ (දිනකට)	රු. 8,000 0
	• සභා බල ප්‍රදේශයෙන් පිටත (දිනකට)	රු. 8,500 0
13.	ට්‍රැක්ටර් රථ කුළියට දීම (දිනකට) (දිස්ත්‍රික් මිල කමිටුවේ අනුමත මිල ගණන් මත වෙනස් විය හැක)	රු. 5,500 0
14.	ට්‍රක් ජල බවුසරය කුළියට දීම (දිනකට) (දිස්ත්‍රික් මිල කමිටුවේ අනුමත මිල ගණන් මත වෙනස් විය හැක)	රු. 6,500 0
15.	ට්‍රැක්ටර් ජල බවුසරය කුළියට දීම (දිනකට) (දිස්ත්‍රික් මිල කමිටුවේ අනුමත මිල ගණන් මත වෙනස් විය හැක) සභා බල ප්‍රදේශයෙන් පිටත වැඩිවන සෑම කි.මී. සඳහාම)	රු. 4,000 0 රු. 35 0
16.	කර්මාන්ත ගිවිසුම් පිටපතක්	රු. 200 0
17.	වරිපනම් බදු සඳහා සහතික නිකුත් කිරීමට	රු. 210 0
18.	වරිපනම් නාම සංශෝධනය සඳහා	රු. 100 0
19.	ජල සහතික ගාස්තු (අනුමත ගොඩනැගිලි)	රු. 110 0
20.	ජල සහතික ගාස්තු (අනුමත නොවූ ගොඩනැගිලි)	රු. 260 0
21.	ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ (NBRO) අයදුම්පත්‍ර ගාස්තුව	රු. 25 0
22.	ගොඩනැගිලි බලපත්‍රය වසරකින් කාලය දීර්ඝ කිරීමේ ගාස්තුව	රු. 300 0
23.	වරිපනම් ලේඛනවල උධෘත ලබාදීමේදී එක් වරිපනම් අංකයක් සඳහා	රු. 300 0
24.	ලේඛනාගාරයක් ගොනු පිටපත් සෙවීමේ ගාස්තු එක් අයිතමයක් සඳහා	150 0
25.	ප්‍රාදේශීය සභා සංස්ථාපනය කිරීමට පෙර ඉදිකිරීමක් බවට ලිපියක් ලබාදීම	210 0

12 - 133/9

මාතර ප්‍රාදේශීය සභාව

මාතර ප්‍රාදේශීය සභාව සඳහා 2022 වර්ෂයට කසල ශෝධන ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය සහ 126 (ix) ආ වගන්ති ප්‍රකාරව ලැබී ඇති බලතල ප්‍රකාර මාතර ප්‍රාදේශීය සභාව විසින් 2007.11.30 වැනි දින සම්මත කරගත් 1988.08.23 වැනි දින 520/7 පොදු අතුරු ව්‍යවස්ථාවේ (09) වරිපනම් අය නොකරන ස්ථානයක පදිංචිකරුවකු/ව්‍යාපාරියෙකු වෙනුවෙන් පහත සඳහන් පරිදි කසල ශෝධන සේවා ගාස්තුවක් මාතර ප්‍රාදේශීය සභාව විසින් 2015 ජනවාරි මස සිට මාසිකව අය කරනු ලබන බව 2013.09.26 වැනි දින තීරණ අංක 13:1:X යටතේ සභාව විසින් ඒකමතිකව සභා සම්මත කර ඇති බැවින් ඒ අනුව 2022 වර්ෂය සඳහා ද කසල ශෝධන ගාස්තු අයකල යුතු යැයි 2021 අගෝස්තු

මස 05 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ තීරණ අංක 05:01:04(XIII) යටතේ ඒකමතිකව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. කේ. විමල් ප්‍රියජනක,
සභාපති,
මාතර ප්‍රාදේශීය සභාව.

2021 අගෝස්තු මස 05 වැනි දින,
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සහ 126 (IX) ආ වගන්ති ප්‍රකාරව ලැබී ඇති බලතල ප්‍රකාර මාතර ප්‍රාදේශීය සභාව විසින් 2007.11.30 වැනි දින සම්මත කරගත් 1988.08.23 වැනි දින 520/7 පොදු අතුරු ව්‍යවස්ථාවේ (09) වරිපනම් අය නොකරන ස්ථානයක පදිංචිකරුවකු/ව්‍යාපාරියෙකු වෙනුවෙන් පහත සඳහන් පරිදි කසල ශෝධන සේවා ගාස්තුවක් මාතර ප්‍රාදේශීය සභාව විසින් 2015 ජනවාරි මස සිට මාසිකව අය කරනු ලබන බව 2013.09.26 වැනි දින තීරණ අංක 13:1:X යටතේ සභාව විසින් ඒකමතිකව සභා සම්මත කර ඇති බැවින් ඒ අනුව 2022 වර්ෂය සඳහා ද කසල ශෝධන ගාස්තු අයකල යුතු යැයි මාතර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

මසකට අයකරනු ලබන ගාස්තු	*රු.*	
පුද්ගලික ඇගළුම් හල්/වෙළෙඳ ව්‍යාපාර	- රු. 2,000.00	- රු. 7,000.00
පළතුරු හා බාබර් සාප්පු/එළවළු	- රු. 600.00	- රු. 1,500.00
වෙනත් ව්‍යාපාර	- රු. 300.00	- රු. 500.00

12 - 133/10

මාතර ප්‍රාදේශීය සභාව

ගාස්තු අය කිරීම - 2022 වර්ෂය

1988 අංක 56 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව බලපත්‍ර ගාස්තුව හා ප්‍රාදේශීය සභා පනතේ 49(7) වගන්තිය ප්‍රකාරව නොපවරා ගැනීමේ පරීක්ෂණ ගාස්තු ද නිවාස හා නගර සංවර්ධන ආඥාපනතට අනුව හා ගෘහ හා නගර නිර්මාණ ආඥාපනත යටතේ පැවරී ඇති බලතල අනුව පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2022 වර්ෂයට පනවා අයකළ යුතු යැයි 2021.08.05 වැනි දින තීරණ අංක 5:1:4 (X) යටතේ සභාව විසින් ඒකමතිකව සභා සම්මත කළ බවත්, මෙයින් දැනුම් දෙනු ලැබේ.

එච්. කේ. විමල් ප්‍රියජනක,
සභාපති,
මාතර ප්‍රාදේශීය සභාව.

2021 අගෝස්තු මස 05 වැනි දින,
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

උපලේඛනය

සංවර්ධන කාර්යයේ ස්වභාවය	*භාවිතා කළයුතු ආකෘති පත්‍රය*	*අයකළ යුතු ගාස්තු*	
(i.) සංවර්ධන අවසර පත්‍ර නිකුත් කිරීම (ii.) ඉඩම් අනු කොටස්වලට බෙදීම	"අ"	පෙරසැරි ගාස්තු : i. බිම් කට්ටිය ප්‍රමාණය	එක් එක් බිම් කට්ටියකට අයකළ යුතු මුදල (මාර්ග කාණු හා පොදු බිම් කොටස් හැර)
		* ච.මී. 150 - 300 අතර	රු. 500 00
		* ච.මී. 301 - 600 අතර	රු. 400 00
		* ච.මී. 601 - 900 අතර	රු. 300 00
		* ච.මී. 900 ට වැඩි	රු. 200 00

(iii.) ගොඩනැගිලි ඉදිකිරීම / පවත්නා ගොඩනැගිලිවලට අලුතින් කොටසක් එකතු කිරීම / නැවත ඉදිකිරීම	"ආ"	ii. ගෙබිමේ විශාලත්වය	පදිංචිය සඳහා	වාණිජ හෝ වෙනත් භාවිත
			රු. ශත	රු. ශත
		45 ට අඩු	500 0	1,000 0
		45-90	1,500 0	2,000 0
		91-180	2,500 0	3,000 0
		181-270	3,500 0	4,000 0
		271-450	4,500 0	6,000 0
		451-675	5,500 0	8,000 0
		676-900	6,500 0	10,000 0
		901-1225	7,500 0	12,000 0
		1225 ට වැඩි	7,500 0	12,000 0
			ච.මී. 1226 ඉක්මවීමෙන් පසු සෑම ච.මී. 90 ක් සඳහාම රු. 1,000 බැගින්	ච.මී. 1126 ඉක්මවීමෙන් පසු සෑම ච.මී. 90 ක් සඳහාම රු. 1,250 බැගින්

(iv.) මායිම් තාප්ප / ආරක්ෂක බැමි ඉදිකිරීම	iii. නේවාසික දික් මීටර් 1 ක් සඳහා ගාස්තුව	වාණිජ හා වෙනත් වර්ග දික් මීටර් 1 ක් සඳහා
• ගොඩනැගිලි සීමාවෙන් පිටත	රු. 300 0	රු. 400 0
• ගොඩනැගිලි සීමාව තුළ	රු. 500 0	රු. 600 0

(v.) ඉඩම් / කුඹුරු ගොඩකිරීම — iv. ච.මී. 150 ට අඩු රු. 1,500. 00 ක් සහ එයට වැඩි සෑම ච.මී. 150 කට රු. 1,000 0 බැගින්

(vi.) දුරකථන කුළුණු / ඇන්ටනා කුළුණ මීටර් ඉදි කිරීම — v. උස මීටර් 5-20 දක්වා රු. 20,000 0 ක් සහ වැඩි වන සෑම එකකටම රු. 100 0 බැගින්

(vi.) විශේෂ ව්‍යාපෘති සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම	vi. රුපියල් මිලියන 5 කට රු. 5,000 සහ වැඩි වන සෑම රුපියල් මිලියන එකකට රු. 100 බැගින්	
	පෙරසැරි ගාස්තු :	
	i. ගෙබිම් ප්‍රමාණය (වර්ග මීටර්)	රු. ශත
	45 ට අඩු	500 0
	45-90	1,000 0
	91-180	1,250 0
	181-270	1,500 0
	271-450	1,750 0
	451-675	2,000 0
	676-900	2,250 0
	900 ට වැඩි	වර්ග මීටර් 901 ට වැඩිවන එක් එක් වර්ග මීටර් 90 සඳහා රු. 500 බැගින්

3. මූලික සැලසුම් නිරාකරණ අනුමැතිය "ඇ"

		පෙරසැරි ගාස්තු :	
(i.) ඉඩම් අනුබෙදුම් සඳහා		i. වර්ග මීටර් 1000 ට අඩු ඉඩම් සඳහා	රු. 2,000
		වර්ග මීටර් 1001-5000 දක්වා	රු. 5,000
		වර්ග මීටර් 5001-10000 දක්වා	රු. 10,000
		10000 සිට වැඩි වන සෑම වර්ග මීටර් 1000 කටම රු. 1,000 බැගින්	
(ii.) ගොඩනැගිලි ඉදිකිරීම / අලුතින් එකතු කිරීම / නැවත ඉදිකිරීම	i	නේවාසික	වාණිජ හා වෙනත්
	ii	රු. 2,000	රු. 5,000
(iii.) මායිම් තාප්ප/ආරක්ෂක බැමි ඉදිකිරීම		රු. 1,500	රු. 3,000
		ච.මී. 150 ට අඩු ඉඩම් සඳහා	රු. 2,500
		ච.මී. 151 සිට 300 දක්වා	රු. 5,000
		ච.මී. 301 ට වැඩිවන සෑම ච.මී. 150 කටම	රු. 3,000 බැගින්
(iv.) ඉඩම්/කුඹුරු ගොඩකිරීම සඳහා		උස මීටර් 5-20 දක්වා	රු. 20,000
		උස මීටර් 20 ට වැඩි සෑම මීටර් 01 ක් සඳහාම රු. 100 බැගින්	
(v.) දුරකතන/විදුලි සංදේශ කුළුණු			
(vi.) විශේෂ සංවර්ධන ව්‍යාපෘති		කුඩා පරිමාණ රු. මිලියන 5 ට අඩු වන ව්‍යාපෘති	රු. 10,000
		මධ්‍යම පරිමාණ රු. මිලියන 5-50 අතර ව්‍යාපෘති	රු. 50,000
		මහා පරිමාණ රුපියල් මිලියන 50 ට වැඩි ව්‍යාපෘති	රු. 150,000

4. අනුකූලතා සහතික නිකුත් කිරීම (සෑම ඉදිකිරීමක් / සංවර්ධනයක් සඳහාම අනුකූලතා සහතිකය ලබා ගත යුතුය)	අනුකූලතා සහතිකය ප්‍රදානය කිරීමේ ගාස්තු
(i.) ඉඩම් අනුබෙදුම්	i. පළමු බිම් කොටසකට රු. 1,000 ක් සහ ඊට වැඩිවන සෑම බිම් කට්ටියකටම රු. 500 බැගින්
(ii.) නේවාසික ඉදිකිරීම්	ii. ව.මී. 300 ට අඩු රු. 3,000 සහ ඊට වැඩිවන සෑම ව.මී. 1 කට රු. 10 බැගින්
වාණිජ හා වෙනත් ඉදිකිරීම්	ව.මී. 100 ට අඩු රු. 3,000 ක් සහ ඊට වැඩිවන සෑම ව.මී. 1 කටම රු. 20 බැගින්
(iii.) මායිම් තාප්ප/ආරක්ෂක බැමි ඉදිකිරීම	iii. පළමු දික් මීටර 100 සඳහා රු. 1,000 ක් සහ ඊට වැඩිවන සෑම මීටර් 1කටම රු. 10 බැගින්
(iv.) ඉඩම්/කුඹුරු ඉඩම් ගොඩකිරීම	iv. ව.මී. 150 ට අඩු රු. 3,000 ක් සහ ඊට වැඩිවන සෑම ව.මී. 1 කට රු. 20 බැගින්
(v.) දුරකථන/ විදුලි සංදේශ කුළුණු	v. උස මීටර් 5 සිට 20 දක්වා රු. 2,000 සහ ඊට වැඩිවන සෑම මීටර් 1 කට රු. 100 බැගින්
(vi.) විශේෂ ව්‍යාපෘති	vi. කුඩා පරිමාණ සඳහා රු. 5,000 මධ්‍යම පරිමාණ සඳහා රු. 10,000 මහා පරිමාණ සඳහා රු. 20,000
5. මෝටර් රථ වාහන නවතා තැබීමේ ස්ථාන (නා.සං.අධිකාරි නියෝග යටතේ සංවර්ධන ස්ථානය තුළ නියමකර ඇති නමුත් සපයා නැති එක් මෝටර් රථයක් නවතා තබන ස්ථාන සඳහා සේවා ගාස්තු)	
	සැහැල්ලු වාහන හා කාර් රු. 500,000 ලොරි රු. 1,000,000
(i.) කොළඹ මහ නගර සභාව	කන්ටේනර් ඇතුළු විශාල වාහන රු. 2,500,000
(ii.) වෙනත් මහ නගර සභාව	සියළුම වාහන සඳහා රු. 500,000
(iii.) නගර සභා ප්‍රාදේශීය සභාව	සියළුම වාහන සඳහා රු. 250,000
6. ආවරණ අනුමැතිය ලබාදීම	ආවරණ අනුමැතිය දීම සඳහා ගාස්තු :
(i.) නිසි බලපත්‍රයක් නොමැතිව ඉඩම් අනුබෙදුම් කිරීම	එක් එක් බිම් කොටස සඳහා රු. 750 ක ගාස්තුවක්
(ii.) නිසි සංවර්ධන බලපත්‍රයකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම / කොටසක් එකතු කිරීම / නැවත ඉදිකිරීම	නේවාසික වර්ග මීටර් ව.මී. 1ක් සඳහා ගාස්තු වාණිජ හා වෙනත් ව. මී. 1 ක් සඳහා ගාස්තු

ඉදිකිරීමේ අදියර :

• අත්තිකාරම් වැඩ පමණක් (කයිරු මට්ටම) සම්පූර්ණකොට ඇතිවිට	රු. 200	රු. 500
• වහල මට්ටම දක්වා (වහලය රහිතව) ඉදිකොට ඇති විට	රු. 300	රු. 1,000
• වහලය ඇතුළුව ඉදිකොට ඇති විට	රු. 400	රු. 1,500
• සම්පූර්ණයෙන් ඉදිකොට ඇති විට	රු. 500	රු. 2,000
(iii.) මායිම් තාප්ප/ආරක්ෂිත බැම්ම ඉදිකිරීම	රු. 400	රු. 400
(iv.) ඉඩම් / කුඹුරු ගොඩකිරීම සඳහා	සෑම වර්ග මීටර් 150 කට රු. 5,000 බැගින්	
(v.) දුරකතන/විදුලි සංදේශ කුළුණු	උස සෑම මීටර් 5 කට රු. 10,000 බැගින්	
(vi.) විශේෂ සංවර්ධන ව්‍යාපෘති	සෑම මිලියන 5කටම රු. 5,000 බැගින්	
vii. අනුකූලතා සහතිකය නොමැතිව පදිංචිවීම / භාවිතා කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම	එක් දිනකට රු. 50 බැගින්	

12 - 133/11

මාතර ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම් හා දෘෂ්‍ය පරිසර හා වෙනත් බදු පැනවීම - 2022 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126(xxx) වන වගන්තිය ප්‍රකාර අමාත්‍යවරයා විසින් 1988.08.23 හා අංක 520/7 දරන *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත්කරන ලද 2008.12.05 දින අංක 1579 ගැසට් නිවේදනය මගින් මාතර ප්‍රාදේශීය සභාව විසින් වැළඳ ගනු ලැබූ 39 ප්‍රචාරක දැන්වීම් හා දෘෂ්‍ය පරිසර අතුරු ව්‍යවස්ථාවේ 3 (උ) ප්‍රකාරව පහත උපලේඛන සඳහන් පරිදි ගාස්තු 2022.01.01 වැනි දින සිට අය කළ යුතු යැයි මාතර ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ අගෝස්තු මස 05 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ තීරණ අංක 05:01:04 (XI) යටතේ ඒකමතිකව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. කේ. විමල් ප්‍රියජනක,
සභාපති,
මාතර ප්‍රාදේශීය සභාව.

2021 අගෝස්තු මස 05 වැනි දින,
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 (xxx) වගන්තිය ප්‍රකාර අමාත්‍යවරයා විසින් 1988.08.23 හා අංක 520/7 දරන *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද 2008.12.05 වැනි දින අංක 1579 *ගැසට් නිවේදනය* මගින් මාතර ප්‍රාදේශීය සභාව විසින් වැළඳ ගනු ලැබූ 39 ප්‍රචාරක දැන්වීම් හා දෘෂ්‍ය පරිසර අතුරු ව්‍යවස්ථාවේ

3 (උ) ප්‍රකාරව පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තු 2022.01.01 වැනි දින සිට අයකළ යුතුයැයි මාතර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

01. වෙළඳ ප්‍රචාරක දැන්වීම් පුවරුවක් සඳහා වසර තුළ වර්ග අඩියකට	රු. 75.00 ක් ද
02. බැනර් ප්‍රදර්ශනය සඳහා දිනකට හෝ උපරිම මාසයක කාල සීමාවකට වර්ග අඩියකට	රු. 50.00 ක් ද
03. වෙනත් ප්‍රචාරක දැන්වීම් පුවරුවක් සඳහා	රු. 25.00 ක් ද

12 - 133/12

මාතර ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත යටතේ සේවා ගාස්තු අය කිරීම

මාතර ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ අගෝස්තු මස 05 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 05:01:04 (XII) යටතේ පහත දැක්වෙන යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. කේ. විමල් ප්‍රියජනක,
සභාපති,
මාතර ප්‍රාදේශීය සභාව.

2021 අගෝස්තු මස 05 වැනි දින,
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත යටතේ 2022 වර්ෂය සඳහා තොරතුරු සැපයීමේදී පහත සඳහන් පරිදි ගාස්තු අයකිරීමට මාතර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

01.	A4 ප්‍රමාණයේ ඡායා පිටපත් තනි පැත්තට දෙපැත්තට (ඡායා පිටපත් 04 ක් දක්වා ගාස්තු අය නොකෙරේ)	රු. 02 00 රු. 04 00
02.	A4 ප්‍රමාණයේ මුද්‍රිත පිටපත් තනි පැත්තට දෙපැත්තට (මුද්‍රිත පිටපත් 04 ක් දක්වා ගාස්තු අය නොකෙරේ)	රු. 04 00 රු. 08 00
03.	A3 සහ ලීගල් ප්‍රමාණයේ පිටපත් තනි පැත්තට දෙපැත්ත	රු. 04 00 රු. 08 00
04.	විද්‍යුත් උපාංග පුරවැසියා සපයන විට 1 ක් සඳහා ආයතනය විසින් සපයන විට සත්‍ය වියදම් අය කෙරේ.	රු. 20 00
05.	ලියවිල්ලක් හෝ ඉදිකිරීමක් පරීක්ෂාවට ඉල්ලන්නේ නම් පැය 1 ක් සඳහා (පැය 1 කට වැඩි කාලයක් නම් පළමු පැය නොමිලේ)	රු. 50 00
06.	සාම්පල් පරීක්ෂාවට සත්‍ය වියදම අය කරනු ලැබේ.	

මෙම ගාස්තු ආදායම් ගිණුම්වල විවිධ ලැබීම් ශීර්ෂයන්ට බැර කරන අතර ප්‍රතිපූර්ණ කිරීමේ විවිධ ශීර්ෂයන්ට හර කරනු ලැබේ.

12 - 133/13

ලුණුගල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බද්ද පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 23 වැනි දින පැවති සභා රැස්වීමේ දී යෝජනා අංක 05/1/1/I යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සී. ජගත් චන්ද්‍ර දලුකොටුව,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 30 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තියේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2022 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබාගන්නා සෑම තැනැත්තෙකුම එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනේ නිරූපිත බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින 30 සම්පූර්ණ වූ වහාම 2022 වර්ෂය සඳහා මෙම බද්ද ලුණුගල ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට යෝජනා කරමි.

(2) විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත්කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

උපලේඛනය

		I වැනි තීරය	*II වැනි තීරය*
			රු. ශත
(1)	01.	මෝටර් රථයක්, මෝටර් ට්‍රයි කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, රික්ෂෝවක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
	02.	සෑම බයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා :	
		(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
		(ආ) වෙළෙඳ කාර්යයක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
	03.	සෑම කරත්තයක් සඳහා	20 0
	04.	සෑම අත්කරත්තයක් සඳහා	10 0
	05.	සෑම රික්ෂෝවක් සඳහා	7 50
	06.	සෑම අශ්වයෙකු, පෝනියෙකු, කොටළුවෙකු සඳහා	15 0
	07.	සෑම ඇතෙකු සඳහා	50 0
	10.	පා පැදියක් සඳහා (තහඩුව සමග)	4 0
		(තහඩු වියදම් සඳහා රු. 50 ක මුදලක් අය කරනු ලැබේ.)	

ලුණුගල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාවේ 2021 සැප්තැම්බර් මස 23 වැනි දින පැවති මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 05/1/1/II යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද 2022 මාර්තු මස 31 වැනි දිනට පෙර ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

සී. ජගත් චන්ද්‍ර දලුකොටුව,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 18 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ බලපත්‍රයක් හෝ පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හෝ වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2022 වර්ෂයේ දී කර ගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම එකී ව්‍යාපාරයේ 2021 වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමට බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2022 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ලුණුගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට යෝජනා කරමි."

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*
බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය	*ගෙවිය යුතු බද්ද රු . ශත*
01. රු.6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
02. රු.6,000 ඉක්මවන නමුත් රු.12,000 නොඉක්මවන විට	90 0
03. රු.12,000 ඉක්මවන නමුත් රු.18,750 0 නොඉක්මවන විට	180 0
04. රු.18,750 ඉක්මවන නමුත් රු.75,000 නොඉක්මවන විට	360 0
05. රු.75,000 ඉක්මවන නමුත් රු.1,50,000 නොඉක්මවන විට	1,200 0
06. රු.1,50,000 ඉක්මන වන විට	3,000 0

12- 395/2

ලුණුගල ප්‍රාදේශීය සභාව

ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට අදාළ සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ 2022 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාවේ 2021 සැප්තැම්බර් මස 23 වැනි දින පැවති මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 05/1/1/III යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා 2022 වර්ෂයේ දී ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් මතම ගාස්තුවක් අයකරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

සී. ජගත් චන්ද්‍ර දලුකොටුව,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 30 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂය තුළ දී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු 149 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත වාර්ෂික වටිනාකම පදනම්ව බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්, පවත්වාගෙන යන ව්‍යාපාර සඳහා 2022 මාර්තු 31 ට පෙර බලපත්‍ර ලබාගත යුතු බවත්,

එසේම, තවදුරටත් එවැනි යම් ස්ථානයක හෝටලයක්, ආපන ශාලාවක් හෝ නවාතැන්පලක කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන්නේ ද 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා එම හෝටලය, ආපනශාලාව හෝ නවාතැන්පල ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තාවූ ද අවස්ථාවක 2022 වර්ෂයට අයකරන බලපත්‍ර ගාස්තු 2021 වර්ෂයේ ඒ හෝටලයේ, ආපනශාලාවේ හෝ නවාතැන්පලේ ආදායමින් සියයට එකක් (1%) විය යුතු බවටත්, එම ගාස්තුව නියම කිරීම සඳහා හෝටලයේ, ආපනශාලාවේ හෝ නවාතැන්පලේ ගත වූ වර්ෂයේ සම්පූර්ණ ආදායම් විස්තරයක් අයිතිකරු, කළමනාකරු හෝ බලයලත් අයෙකු විසින් ලුණුගල ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු බවටත් යෝජනා කරමි.''

පළමු උපලේඛනය

I වැනි තීරය		II වැනි තීරය ස්ථානයේ වාර්ෂික වටිනාකම		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
පීඩාකාරී ව්‍යාපාර :				
01.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	බත්, තේ සහ කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	කොණ්ඩා සැකසීමේ සැලුන් හල් සහ බාබර් සාප්පු	500 0	750 0	1,000 0
04.	මස් කඩ පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	කිරි පට්ටි හා කිරි වෙළඳාම	500 0	750 0	1,000 0
06.	උකස් ලියාපදිංචි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	සිසිල් බීම කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
09.	ගව ගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	පොදු වෙළඳ සැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ආහාර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

I වැනි තීරය		*II වැනි තීරය ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
12.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	සංචාරක වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	පෞද්ගලික වෙළෙඳපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	අවමංගල්‍ය සේවා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	ලැගුම් නිවාස හා නවාතැන්පලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
අප්‍රසන්න ව්‍යාපාර :				
1.	මිණිරන් සුද්ද කිරීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
2.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0
3.	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
4.	සත්ත්ව පාලන (මස්, කිරි, හෝ බිත්තර සඳහා) සතුන් ඇති කිරීමේ ස්ථාන පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ කිලෝග්‍රෑම් 50 ට වඩා ගබඩා කිරීම	500 0	750 0	1,000 0
6.	රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටි තබා ගැනීම	500 0	750 0	1,000 0
7.	පශු වෛද්‍ය ගිලන් හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
8.	තොග වශයෙන් විකිණීම සඳහා නරක්වනසුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබාගැනීම	500 0	750 0	1,000 0
9.	සම් විකිණීමට තබාගැනීම	500 0	750 0	1,000 0
10.	කරවල, මාළු, ජාඩි කිලෝ 100 ට වඩා වැඩි ප්‍රමාණයක් තබාගැනීම	500 0	750 0	1,000 0
11.	මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම	500 0	750 0	1,000 0
12.	පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම	500 0	750 0	1,000 0
13.	දුම්කොළ වේලීම	500 0	750 0	1,000 0
14.	සත්ත්ව ආහාර නිපදවීම	500 0	750 0	1,000 0
15.	පුන්නක්කු නිපදවීම	500 0	750 0	1,000 0
16.	සත්ත්ව මාංශ හෝ ලේ පැසවීම	500 0	750 0	1,000 0
17.	සබන් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
18.	සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	500 0	750 0	1,000 0
19.	ට්‍රන්ක් පෙට්ටි සෑදීම	500 0	750 0	1,000 0
20.	අළුත් ලෝහ හෝ පරණ ලෝහ තබාගැනීම	500 0	750 0	1,000 0
21.	ලෝහ සුන්බුන් තබා ගැනීම	500 0	750 0	1,000 0
22.	ගෘහ භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
23.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
24.	වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	සිරප් හෝ පළතුරු බීම නිපදවීම	500 0	750 0	1,000 0
26.	රසකැවිලි නිපදවීම	500 0	750 0	1,000 0
27.	පොල් ලෙලි නිපදවීම හෝ පල් කිරීම	500 0	750 0	1,000 0
28.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
29.	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
30.	රා එකතු කිරීම	500 0	750 0	1,000 0
31.	විනාකිරි නිපදවීම	500 0	750 0	1,000 0
32.	දැව ඉරීම	500 0	750 0	1,000 0

අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*I වැනි තීරය*	*II වැනි තීරය ස්ථානයේ වාර්ෂික වටිනාකම*	
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
33.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම	500 0	750 0	1,000 0
34.	සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0
35.	කෙඳි සායම් නිපදවීම	500 0	750 0	1,000 0
36.	සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
37.	පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
38.	කෝපි , ධාන්‍ය වර්ග පිටි කිරීම	500 0	750 0	1,000 0
39.	බේකින් පවුඩර් නිපදවීම	500 0	750 0	1,000 0
40.	ගෑස් මැන්ටල් නිපදවීම	500 0	750 0	1,000 0
41.	කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
42.	පොටි නිපදවීම	500 0	750 0	1,000 0
43.	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
44.	ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
45.	රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
46.	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
47.	සුවඳ විලවුන් නිපදවීම	500 0	750 0	1,000 0
48.	පාසල් රටහුණු නිපදවීම	500 0	750 0	1,000 0
49.	ටයර් හෝ ටියුබ් නිපදවීම	500 0	750 0	1,000 0
50.	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
51.	ටයර් ටියුබ් වොල්කනයිස් කිරීම	500 0	750 0	1,000 0
52.	සිමෙන්ති නිපදවීම	500 0	750 0	1,000 0
53.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් නිපදවීම	500 0	750 0	1,000 0
54.	වැලි කඩදාසි නිපදවීම	500 0	750 0	1,000 0
55.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
56.	ගඩොල් පිළිස්සීම	500 0	750 0	1,000 0
57.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
58.	අම්ල නිෂ්පාදනය කිරීම හෝ නැවත පිරවීම	500 0	750 0	1,000 0
59.	උළු නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
60.	පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදුකර විකිණීම	500 0	750 0	1,000 0
61.	යන්ත්‍රානුසාරයෙන් බ්ලොක් ගල් නිපදවීම	500 0	750 0	1,000 0
62.	නිමි ඇඳුම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
63.	කුකුළු වෙළෙඳ සලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
64.	විෂබීජනාශක නිපදවීම	500 0	750 0	1,000 0
65.	ටයර්/ටියුබ් අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
66.	සපත්තු/බෑග්/සම්/භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
67.	දුම්කොළ යොදා කරන සිගරට්, බීඩි, සුරුට්ටු නිපදවීම	500 0	750 0	1,000 0

දෙවන උපලේඛනය

අන්තරාදායක ව්‍යාපාර :

අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*I වැනි තීරය*	*II වැනි තීරය ස්ථානයේ වාර්ෂික වටිනාකම*	
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	කළුගල් තැනීම හෝ කැඩීම	500 0	750 0	1,000 0
2.	සිසිල් බීම නිෂ්පාදනය	500 0	750 0	1,000 0
3.	අයිස් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
4.	එළවළු තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
5.	පොල්තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
6.	ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
7.	මෙතිලේට් ස්පිරිතු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
8.	තේ පෙට්ටි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
9.	කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිෂ්පාදනය	500 0	750 0	1,000 0
10.	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
11.	පිදුරු තබාගැනීම	500 0	750 0	1,000 0
12.	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
13.	ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
14.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
15.	හිරිගල් හෝ හුණු ගල් කැණීම	500 0	750 0	1,000 0
16.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	හිස්ගෝනි හෝ හිස් බෝතල් එකතු කිරීම	500 0	750 0	1,000 0
18.	පාපැදි හෝ යතුරුපැදි අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
19.	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබා ගැනීම	500 0	750 0	1,000 0
20.	විසිතුරු පින්තාරු කිරීම	500 0	750 0	1,000 0
21.	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
22.	ලෝහ සංස්කාරක කර්මාන්ත ආයුධ	500 0	750 0	1,000 0
23.	වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

තුන්වැනි උපලේඛනය

පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර :

1.	තලාතු මිනිරන් ශුද්ධ කිරීම	500 0	750 0	1,000 0
2.	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු, එනසල් හෝ කෙඳි වර්ග සකස් කිරීම	500 0	750 0	1,000 0
3.	ඩ්‍රයික්ලීන් කිරීම	500 0	750 0	1,000 0
4.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
5.	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
6.	තෙල් හෝ සත්ත්ව මේද නිපදවීම	500 0	750 0	1,000 0
7.	හුණුගල් හෝ හිරිගල් නිපදවීම	500 0	750 0	1,000 0
8.	ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤු නිපදවීම	500 0	750 0	1,000 0
9.	මෝර තෙල් සකස් කිරීම	500 0	750 0	1,000 0

I වැනි තීරය		*II වැනි තීරය ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
10.	බෝට්ටු තැනීම	500 0	750 0	1,000 0
11.	බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
12.	ලෝහ වර්ග පෑස්සීම	500 0	750 0	1,000 0
13.	මෝටර් වාහන අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
14.	මෝටර් වාහන සේවා කිරීම	500 0	750 0	1,000 0
15.	යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම	500 0	750 0	1,000 0
16.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	මෝටර් වාහන බොඩි තැනීම	500 0	750 0	1,000 0
19.	කෘමි නාශක, දිලීර නාශක, පැලෑටි හෝ පලිබෝධ නාශක නිපදවීම	500 0	750 0	1,000 0
20.	විෂබීජ නාශක නිපදවීම	500 0	750 0	1,000 0
21.	මදුරු දඟර නිපදවීම	500 0	750 0	1,000 0
22.	දැව ආරක්ෂණ නිපදවීම	500 0	750 0	1,000 0
23.	ගල්තාර, හෝ බිටුමන්මය ද්‍රව්‍ය නිපදවීම	500 0	750 0	1,000 0
24.	වීදුරු භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
25.	වීදුරු කැඩපත් නිපදවීම	500 0	750 0	1,000 0
26.	යකඩ තහඩු ගැල්වනයිස් කිරීම	500 0	750 0	1,000 0
27.	පාස්සන ඊයම් නිපදවීම	500 0	750 0	1,000 0
28.	ඇලුමිණියම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
29.	කටු කම්බි නිපදවීම	500 0	750 0	1,000 0
30.	කම්බි ඇණ නිපදවීම	500 0	750 0	1,000 0
31.	කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි (රිබන්) නිපදවීම	500 0	750 0	1,000 0
32.	බෙලෙක් බඳුන්, වානේ පීප්ප, හෝ කාබනික ටැංකි නිපදවීම	500 0	750 0	1,000 0
33.	ජී. අයි. බාල්දි නිපදවීම	500 0	750 0	1,000 0
34.	වායුසමීකරණ යන්ත්‍ර, ශීතකරණ, හෝ අධි ශීතකරණ නිපදවීම	500 0	750 0	1,000 0
35.	වායුසමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
36.	බ්‍රේක් ලයිනර්, ක්ලච් ලයිනර් නිපදවීම	500 0	750 0	1,000 0
37.	යන්ත්‍රෝපකරණ නිපදවීම	500 0	750 0	1,000 0
38.	විදුලි භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
39.	රබර් මිශ්‍රිත කෙඳි නිපදවීම	500 0	750 0	1,000 0
40.	සංචායන බැටරි නිපදවීම	500 0	750 0	1,000 0
41.	ට්‍රැක්ටර් රථ එකලස් කිරීම	500 0	750 0	1,000 0
42.	රේඩියේටර් නිපදවීම	500 0	750 0	1,000 0
43.	ඉලෙක්ට්‍රොනික් උපකරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
44.	වියළි කෝෂ බැටරි නිපදවීම	500 0	750 0	1,000 0
45.	වී මෝල්	500 0	750 0	1,000 0
46.	මිනී පෙට්ටි නිපදවීම	500 0	750 0	1,000 0
47.	දුරකථන නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
48.	විද්‍යුත් උපකරණ අලුත්වැඩියාව හෝ එකලස් කිරීම	500 0	750 0	1,000 0
49.	පරිගණක හෝ තොරතුරු තාක්ෂණ උපකරණ එකලස් කිරීම හෝ අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
50.	කරදිය මසුන් අලෙවි කිරීම (සංචාරක)	500 0	750 0	1,000 0
51.	මිරිදිය මසුන් අලෙවි කිරීම (සංචාරක)	500 0	750 0	1,000 0
52.	පක්ෂීන් ඇති කිරීම සහ මස් අලෙවිය	500 0	750 0	1,000 0
53.	ඌරු කොටුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

ලුණුගල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 23 වැනි දින පැවති මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 05/1/1/IVයටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද ඒ කර්මාන්ත බද්ද, වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

සී. ජගත් චන්ද්‍ර දලුකොටුව,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 30 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2022 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවත්, යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරය		*II වැනි තීරය ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01	කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02	මැටි බඳුන් නිපදවීම සහ අලෙවිය	500 0	750 0	1,000 0
03	පාවහන් සෑදීම සහ අලෙවි කිරීම	500 0	750 0	1,000 0
04	වානේ ගෘහ භාණ්ඩ සෑදීම	500 0	750 0	1,000 0
05	ගඩොල් පෝරණු පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06	බ්ලොක් ගල් කර්මාන්තය පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07	ඉදල්, කොහු, පාපිසි නිපදවීම	500 0	750 0	1,000 0

ලුණුගල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 23 වැනි දින පැවති මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 05/1/1/V යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සී. ජගත් චන්ද්‍ර දලුකොටුව,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 30 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1952 අංක 06 දරන පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා පනත යටතේ ඌව පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ සාදන ලද එකී 2013.06.28 වැනි දින අංක 1816/43 දරන ගැසට් පත්‍රය පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාව යටතේ යම්කිසි තැනැත්තෙකු විසින් යම් වීදියකට, පාරකට, ඇලකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි කිසියම් දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමේ දී අවසර පත්‍රයක් සඳහා එකී අතුරු ව්‍යවස්ථා පනතේ (3) වන වගන්තියේ (උ) ඡේදයේ විධිවිධානයන්ට අනුකූලව පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තුවක් 2022 වර්ෂයේ දී ලුණුගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

	ප්‍රචාරක දැන්වීම් විස්තරය	*රු. ශත*
1.	ප්‍රචාරක වෙළඳ දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කිරීම සඳහා කිසියම් ස්ථානයක සවිකිරීමේදී එක් හතරැස් අඩියකට	100 0
2.	යම් තැනැත්තෙකු විසින්, උසුලාගෙන යනු ලබන හෝ ගමන් කරන වාහනයකට සවිකර ඇති හෝ මහජනතාවට දැන ගැනීමට හැකි වන පරිදි යම් තැනකට සවිකර තබන ප්‍රචාරක දැන්වීමක් හෝ බැනරයක් සඳහා හතරැස් අඩියකට,	
	මසකට	30 0
	වර්ෂයකට	40 0
3.	බිත්තියක හෝ තාප්පයක, පුවරුවක, ලෑල්ලක හෝ ආධාරකයක් මගින් ප්‍රදර්ශනය කරන ස්ථිර ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට (සෑම වසරකම ගෙවිය යුතුය.)	40 0

12 - 395/5

ලුණුගල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට විදුලි සංදේශ කුළුණු සඳහා ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 23 වැනි දින පැවති මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 05/1/1/VI යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සී. ජගත් චන්ද්‍ර දලුකොටුව,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 30 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

උපලේඛනය

දුරකතන කුළුණු/ ඇන්ටනා කුළුණු ඉදිකිරීම සඳහා පෙරසැරි ගාස්තු

		රු. ශත
උස මීටර් 05 සිට 20 දක්වා	-	2,00,000 0
උස මීටර් 20 සිට 40 දක්වා	-	3,00,000 0
උස මීටර් 40 සිට 50 දක්වා	-	4,00,000 0
වැඩිවන සෑම මීටර් 01ක් සඳහාම	-	10,000 0 බැගින් අයවිය යුතුය.

දුරකතන කුළුණු / ඇන්ටනා කුළුණු ඉදිකිරීම හේතුවෙන් වැසෙන මුළු බිම් ප්‍රමාණය සඳහා මිනින්දෝරු සැලැස්ම අනුමත කිරීමේ පෙරසැරි ගාස්තුව රු. 2,250 0 ක මුදලක් අය කිරීමට යෝජනා කරමි.

12 - 395/6

ලුණුගල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 23 වැනි දින පැවති මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 05/1/1/VII යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 වන දිනවලින් අවසන් වන කාර්තු වශයෙන් ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

සී. ජගත් චන්ද්‍ර දලුකොටුව,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 30 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ලුණුගල ප්‍රදේශය තුළ පිහිටියාවූ ද, ඉහත කී පනතේ 135 වැනි වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ,

(අ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන් ම, එකී ඉඩම සෑම හෙක්ටයාරයක්ම මත 2022 වර්ෂය සඳහා රුපියල් 10 0 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ආ) ඉහත කී පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ (*iv*) (ආ) කොටසේ 1989 පෙබරවාරි මස 03 දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කර ඇති හෙයින්, හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත 2022 වර්ෂය සඳහා රුපියල් 50 0 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට, සහ

(*ඇ*) ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උප වගන්තියේ විධිවිධාන යටතේ 2022 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු වශයෙන් ගෙවිය යුතු වේ.

(*ඈ*) 2022 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2022 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 වැනි දිනවලින් අවසන්වන කාර්තු වශයෙන් ගෙවීමට විධාන කළ යුතු යැයි යෝජනා කරමි.''

12 - 395/7

ලුණුගල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා වරිපනම් සහ බදු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 23 වැනි දින පැවති මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 05/1/1/VIII යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද වරිපනම් ගාස්තු මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු වශයෙන් ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

සී. ජගත් චන්ද්‍ර දලුකොටුව,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 30 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභාවේ දී ය.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය අනුව බදුල්ල දිස්ත්‍රික් සහකාර පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය අනුව ලුණුගල ප්‍රාදේශීය සභාව *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද දියුණු කළ ප්‍රදේශය ඇතුළත ඇති සියලු නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම් හා ගෙපත්වල 2021 වර්ෂයේ පිළිගෙන ක්‍රියාත්මක කරනු ලැබූ වාර්ෂික වටිනාකම් 146 (1) වගන්තියේ බලතල ප්‍රකාරව 2020 නව තක්සේරු කිරීම 2022 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සෑම නිශ්චල දේපළක වාර්ෂික වටිනාකමින් සියයට 3.5% ක වරිපනමක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, සහ

ඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනෙන් අවසන් වන කාර්තුවලට අදාළ වාරික වශයෙන් ගෙවිය යුතු බවට විධානය කිරීමටත්,

2022 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2022 ජනවාරි මස 31 වැනි දිනට පෙර ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට 10% ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට පෙරාතුව ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) ක වට්ටමක් ද ගෙවීමට යෝජනා කරමි.

12 - 395/8

ලුණුගල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 23 වැනි දින පැවති මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 05/I/I/IX යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සී. ජගත් චන්ද්‍ර දලුකොටුව,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 30 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2022 වර්ෂයේ දී පහත උපලේඛනයේ සඳහන් පරිදි 2022 වර්ෂයේ දී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද පනවා අය කිරීමටත්, එකී බද්ද 2022 මාර්තු මස 31 වැනි දිනට ගෙවිය යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර *නැනහොත්* නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

I. ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්, හෝ

II. ඒ ඉඩම් ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යට වී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය දෙකට තුනට (2ට 3ට) වඩා අඩු වන්නේ නම්,

III. ඒ ඉඩම් විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති වන විටක, හෝ

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකෙන ඉඩම් මත 2021 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට එකක (1%) වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2022 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ගෙවිය යුතු බවට යෝජනා කරමි.

12 - 395/9

ලුණුගල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා අයාලේ යන ගවයින් හා සතුන් අල්ලා ගැනීමේ ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 23 වැනි දින පැවති මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 05/I/I/X යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සී. ජගත්චන්ද්‍ර දලුකොටුව,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 30 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 66 වන වගන්තිය ප්‍රකාරව ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සියලුම පොදු මාර්ගවල හෝ පොදු ස්ථාන හා ඒ අවට යම් කරත්තයක බැඳ ඇත්නම් මිස දිගේලි කර අයාලේ යමින් සිට හෝ සැරිසරන ගවයින්, මීගවයින්, එළුවන්, ආදී සතුන් ඇල්ලීමටත් ඒසේ අල්ලා ගනු ලබන සතුන් ගාල් කිරීමටත්, එසේ ගාල් කරනු ලබන සතුන් නිදහස් කිරීම සඳහා පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2022 වර්ෂයේ අය කිරීමටත් සහ අයාලයේ යන සතුන් දින 10ක් තුළ අයිතිකරුවන් තම සතුන් නිදහස් කර නොගතහොත් එම කාලයට පසුව එකී සතුන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා අදළ ගාස්තු සහ වෙන්දේසි කිරීමේ වියදම් අය කිරීමටත් එසේ අය කරන මුදලින් 50% ක් ඇල්ලීමට බලය පවරන ලද පුද්ගලයන්ට ගෙවීමටත්, යෝජනා කරමි.

	රු. ශත
01. ගවයින් හෝ මී ගවයින් ඇල්ලීමට (එක් සතෙකුට)	1,000 0
02. එළුවන් ඇල්ලීමට (එක් සතෙකුට)	500 0
03. ගවයින් ආරක්ෂා කිරීමේ ගාස්තු/එක් දිනකට එක් සතෙකුට	500 0
04. එළුවන් ආරක්ෂා කිරීමේ ගාස්තු/එක් දිනකට එක් සතෙකුට	300 0
05. ගවයින් නඩත්තු කිරීමේ ගාස්තු එක් දිනකට එක් සතෙකුට	500 0
06. එළුවන් නඩත්තු කිරීමේ ගාස්තු එක් දිනකට එක් සතෙකුට	300 0

12 - 395/10

ලුණුගල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා අයදුම්පත්‍ර ගාස්තු හා වෙනත් ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 23 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 05/1/I/XI යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සී. ජගත් චන්ද්‍ර දලුකොටුව,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 30 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

2022.01.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් පරිදි අයදුම්පත්‍ර හා වෙනත් ගාස්තු පනවා අය කිරීමට යෝජනා කරමි.

උපලේඛනය

අයදුම්පත්‍ර ගාස්තු හා වෙනත් ගාස්තු - 2022 වර්ෂය

අයදුම්පත්‍ර ගාස්තු	*රු. ශත*
01. වීථි රේඛා සහතික ගාස්තු	1,250 0
02. ජල අයදුම්පත් ගාස්තු	100 0
03. ගොඩනැගිලි අයදුම්පත් ගාස්තු	250 0
04. පුස්තකාල අයදුම්පත් ගාස්තු	10 0
05. කට්ටි සැලසුම් අනුමත කිරීමේ අයදුම්පත්‍ර ගාස්තු	100 0

		රු. ශත
06.	වරිපනම් නම් වෙනස් කිරීමේ පෝරම ගාස්තු	150 0
07.	වරිපනම් සහතික නිකුත් කිරීමේ ගාස්තු	250 0
08.	ගොඩනැගිලි පර්යේෂණයට යැවිය යුතු පෝරම ගාස්තු	25 0
09.	පරිසර බලපත්‍ර පෝරම ගාස්තු	150 0
10.	පුස්තකාල සාමාජික ඇප තැන්පත් ගාස්තු	100 0
11.	ප්‍රාදේශීය සභා පෙර පාසලකට ළමුන් ඇතුළත් කිරීමේ ගාස්තුව	500 0
12.	අනුකූලතා සහතිකයක් නිකුත් කිරීම	1,000 0
13.	බැකෝ ලෝඩරය ලබාදීම (පැයකට රියදුරු සහිතව) ඉන්ධන රහිතව කුලියට දීම	3,000 0
14.	බැකෝ ලෝඩරය ලබාදීම (පැයකට රියදුරු සහිතව) ඉන්ධන සහිතව කුලියට දීම	3,850 0
15.	ක්‍රීඩා පිටිය දිනකට කුලියට දීම	1,500 0
16.	බස්නැවතුම්පළ අසල දිනකට කුලියට දීම	1,500 0
17.	තහඩු එකක් දිනකට කුලියට දීම	10 0
18.	හට් එකක් කුලියට ලබාදීම	500 0
19.	විධායක පුටු කුලියට ලබාදීම	25 0
20.	ජී. අයි. බට එකක් කුලියට ලබාදීම	50 0
21.	ප්ලාස්ටික් පුටු එකක් කුලියට දීම	10 0

2022.01.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අයදුම්පත්‍ර හා වෙනත් ගාස්තු පනවා අය කිරීමට තීරණය කර ඇති බව යෝජනා කරමි.

(බැකෝ ලෝඩර් යන්ත්‍රය කුලියට දීමේ දී නගර සීමාව තුළ ගමන් ගන්නා කාලයට අය නොකරන අතර, නගර සීමාවෙන් පිටත සේවා ස්ථාන වෙත ගමන් කිරීමේ දී පමණක් ගණන් ගනු ලැබේ.)

12 - 395/11

ලුණුගල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 23 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 1/05/I/I/XII යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සී. ජගත් චන්ද්‍ර දලුකොටුව,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 30 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තියේ (I) වැනි උපවගන්තිය ප්‍රකාරව, ලුණුගල ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුනියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයෙන් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් 1% කට (සියයට එකක්) සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරුගේ නියෝජිතයා විසින් 2022 වර්ෂය සඳහා ලුණුගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට යෝජනා කරමි.

12-223/12

ලුණුගල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා බහුකාර්යය ගොඩනැඟිල්ල වෙනුවෙන් ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 23 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 05/I/I/XIII යටතේ පහත දැක්වෙන යෝජනා සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සී. ජගත් චන්ද්‍ර දලුකොටුව,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 30 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1952 අංක 06 දරන පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා පනත යටතේ ඌව පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ සාදන ලද සම්මන්ත්‍රණ ශාලා අතුරු ව්‍යවස්ථාවට අනුකූලව පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2022 වර්ෂය සඳහා අය කිරීමට යෝජනා කරමි.

උපලේඛනය

		රු. ශත
01.	බහුකාර්ය ගොඩනැගිල්ල එක් දිනකට කුලියට ලබාදීම	25,000 0
02.	බහුකාර්ය ගොඩනැගිල්ල එක් දිනකට ලබාදීම වෙනුවෙන් අයකරන තැන්පත් මුදල	10,000 0
03.	කුඩ එකක් සඳහා දිනකට අය කිරීම	250 0
04.	කෙටි රැස්වීමක් සඳහා පැයකට	1,000 0
05.	කුඩයක් සහිත ප්ලාස්ටික් මේස එකක් සඳහා දිනකට අය කිරීම (පුටු 100 හා මේස 20 ලබා දෙනු ඇත.)	250 0

12 - 395/13

ලුණුගල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ඉඩම්, ගොඩනැගිලි අයදුම්පත් අනුමත කිරීමේ ගාස්තු පැනවීම

ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 23 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 05/I/I/XIV යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සී. ජගත් චන්ද්‍ර දලුකොටුව,
සභාපති,
ලුණුගල ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 30 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සමග කියවිය යුතු නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ ප්‍රාදේශීය සභාව සතු පැවරී ඇති බලතල ප්‍රකාරව සහ 1952 අංක 06 දරන පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා පනත යටතේ ඌව පළාත් සම්මත අතුරු ව්‍යවස්ථාව යටතේ ගොඩනැගිලි තැනීම සහ වැඩ කටයුතු අතුරු ව්‍යවස්ථාවට අනුව පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2022 වර්ෂයට අයකළ යුතු බව යෝජනා කරමි.

උපලේඛනය

		රු. ශත
01.	ගොඩනැගිලි සැලසුමක් අනුමත කිරීමේ ගාස්තු (වර්ග අඩියකට)	1 0
02.	කට්ටි සැලසුම් අනුමත කිරීමේ අයදුම්පත්‍ර ගාස්තු	100 0
03.	අනුකූලතා සහතිකයක් නිකුත් කිරීම	1,000 0

12 - 395/14

ලුණුගල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා නිවාස ඉදි කිරීම සඳහා භූමි ප්‍රමාණය නිශ්චය කිරීමේ ගාස්තු පැනවීම

03.	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	මෝටර් වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	ගෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
10.	වීදුරු භාණ්ඩ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
11.	ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	වෑල්ඩින් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	ලියවන පට්ටලයක් භාවිත කරමින් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	පැට්‍රෝල්, ඩීසල්, තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	වායු සමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
16.	විදුලි උපකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12 - 348/1

ගල්නෑව ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

ගල්නෑව ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 14 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී සභා තීරණ අංක 104/2021 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
ගල්නෑව ප්‍රාදේශීය සභාව.

2021 ක් වූ සැප්තැම්බර් මස 14 වැනි දින,
ගල්නෑව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාර, ගල්නෑව ප්‍රාදේශීය සභා බලප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ II වන තීරුවේ ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අයකළයුතු බවත් එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු එකී කර්මාන්ත බද්ද 2022වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ගල්නෑව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
අනු. අංකය	*කර්මාන්තය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන නමුත් රු.1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	සෙරෙප්පු නිපදවීම	500 0	750 0	1,000 0
2.	කොප්පරා නිපදවීම, සකස් කිරීම	500 0	750 0	1,000 0
3.	කබොක්, කළුගල් බොරළු හෑරීම,	500 0	750 0	1,000 0
4.	යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් නිපදවීම සඳහා	500 0	750 0	1,000 0
5.	කොහු නිපදවීම හෝ ගබඩා කිරීම සඳහා	500 0	750 0	1,000 0
6.	තේ කොළ පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	කුකුළන් ආදී සතුන් සඳහා සාප්පුවක් හෝ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	බෑග් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
9.	බැටරි චාජ් කිරීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
10.	ටයර්, ටියුබ් වෝල්කනයිස් කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ඉලෙක්ට්‍රොනික තරාදි, මුදල් යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	ජුකී මැෂින් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	කෘෂි උපකරණ නිෂ්පදනය	500 0	750 0	1,000 0
15.	දේශීය අත්කම් භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
16.	කොහු, ඉදල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
17.	මදුරු දූල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
18.	විදුලි භාණ්ඩ හෝ ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	ගඩොල් කර්මාන්තය	500 0	750 0	1,000 0
21.	පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	සෙල්ලම් බඩු නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	වතුර බෝතල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
24.	මල් පැළ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

I වන තීරුව		*II jන තීරුව*		
		පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
අනු. අංකය	*කර්මාන්තය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන නමුත් රු.1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
25.	මැටි භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
26.	බිම් මල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
27.	පොරි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
28.	හඳුන්කූරු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
29.	සහල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
30.	ඉහත උපලේඛනයේ වර්ග නොකළ බදු මුදල් අයකිරීමට සුදුසු වෙනත් ව්‍යාපාර	500 0	750 0	1,000 0

12 - 348/2

ගල්නෑව ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම

ගල්නෑව ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 14 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී සභා තීරණ අංක 105/2021 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
ගල්නෑව ප්‍රාදේශීය සභාව.

2021 ක් වූ සැප්තැම්බර් මස 14 වැනි දින,
ගල්නෑව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ගල්නෑව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාග ැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ යම් ව්‍යාපාරයක් ගල්නෑව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2022 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණය අනුව ව්‍යාපාර බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අයකිරීමටත් බද්දට යටත් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2022 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I වැනි තීරුව 2021 වර්ෂයේ දී ආදායම	*II* වැනි තීරුව රු. ශත
1. රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
2. රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
3. රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
4. රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
5. රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
6. රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක	3,000 0

12 - 348/3

ගල්නෑව ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට කසළ ගාස්තු පැනවීම

ගල්නෑව ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 14 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී සභා තීරණ අංක 106/2021 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
ගල්නෑව ප්‍රාදේශීය සභාව.

2021 ක් වූ සැප්තැම්බර් මස 14 වැනි දින,
ගල්නෑව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ බලතල ප්‍රකාර, 1988.08.23 වැනි දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) පළාත් පාලන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ගරු පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා විසින් අනුමත කර ප්‍රකාශයට පත්කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 09 වැනි අතුරු ව්‍යවස්ථාව අනුව ගල්නෑව, බුල්නෑව, නෑගම නගර සීමාවන් ඇතුළත පිහිටි නිවාස හා වෙළෙඳසැල්වලින් මසකට රු. 150 බැගින් කසළ ගාස්තුවක් හා හෙළ බොදුගම, මිදෙල්ලෑව, කලංකුට්ටිය, හුරීගස්වැව ගම්මානයේ පිහිටි නිවාස හා වෙළෙඳසැල්වලින් මසකට රු. 100 බැගින් කසළ ගාස්තුවක් 2022 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවට ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12 - 348/4

ගල්නෑව ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රචාරක දැන්වීම් ගාස්තු පැනවීම

ගල්නෑව ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 14 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී සභා තීරණ අංක 107/2021 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද මෙම බද්ද 2022 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ගල්නෑව ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
ගල්නෑව ප්‍රාදේශීය සභාව.

2021 ක් වූ සැප්තැම්බර් මස 14 වැනි දින,
ගල්නෑව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළාත් පාලන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ගරු පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා අනුමත කර ප්‍රකාශයට පත් කර ඇති අතුරු ව්‍යවස්ථාවේ 39 වන කොටසේ ප්‍රකාර ප්‍රචාරක දැන්වීම්/ දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකා,ර ගල්නෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට/ පාරකට/ ඇළකට/ මුහුදට හෝ අහසට පෙනෙන පරිදි වර්ග අඩියකට නොඅඩු දැන්වීමක් හෝ ඉදිකිරීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2022 වර්ෂයට පනවා අයකළ යුතු බවට ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

අනු අංකය	*විස්තරය*	*මුදල රු. ශත*
1.	බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන (චිත්‍රපට දර්ශන ප්‍රචාරක දැන්වීම් හැර) ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා - සෑම වර්ග අඩියකටම	50 0
2.	ලෑල්ලක් හෝ ආධාරකයක් බැනරයක් මගින් සම්බන්ධ කර ප්‍රදර්ශනය කරනු ලබන (චිත්‍රපට දර්ශන ප්‍රචාරක දැන්වීම් හැර) ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා - සෑම වර්ග අඩියකටම	25 0
3.	චිත්‍රපට දැන්වීම් ප්‍රචාරය සඳහා ප්‍රදර්ශනය කරන දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකටම	15 0
4.	බිත්තියක හෝ පුවරුවක හෝ ලෑල්ලක් හෝ ආධාරකයක් මගින් ප්‍රදර්ශනය කරන ප්‍රදීපන ප්‍රචාරක දැන්වීමක් සඳහා - සෑම වර්ග අඩියකටම	20 0

12 - 348/5

ගල්නෑව ප්‍රාදේශීය සභාව

වෙනත් ගාස්තු පැනවීම - 2022 වර්ෂය

ගල්නෑව ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 14 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී සභා තීරණ අංක 108/2021 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
ගල්නෑව ප්‍රාදේශීය සභාව.

2021 ක් වූ සැප්තැම්බර් මස 14 වැනි දින,
ගල්නෑව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය යටතේ ගල්නෑව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, ගල්නෑව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2022 වර්ෂයේ දී පහත උපලේඛනයේ සඳහන් පරිදි බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවට ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

අනු. අංකය	විස්තරය	රු. ශත
1.	වීටී රේඛා හා නොපවරාගැනීමේ සහතිකයක් ලබාදීම සඳහා	750 0
2.	පාරිසරික බලපත්‍ර අයදුම්පතක් සඳහා	200 0
3.	වාහන හා සත්ත්ව බදු වෙනුවෙන් ගාස්තු	6 0
4.	පාරිසරික බලපත්‍ර ගාස්තු (2000 අංක 53 දරන ජාතික පාරිසරික නව සංශෝධිත පනත අනුව අංක 152/16 දරන *ගැසට්* පත්‍රයේ පිටුවේ කර්යයන්ට අදාළව)	4,000 0
5.	බලපත්‍රයක් පිට ඝාතනය කරනු ලබන එළුවෙකු සඳහා	25 0
6.	පාරිසරික බලපත්‍රයක් අලුත්කිරීමේ අයදුම්පතක් සඳහා ගාස්තුව	100 0
7.	ගිවිසුම්පත් ගාස්තුව (කර්මාන්ත)	500 0
8.	දීර්ඝකාලීන බදු බලපත්‍ර එකඟතා ලිපියක් නිකුත් කිරීම සඳහා	500 0
9.	අනු බෙදුමක් සඳහා කට්ටියකට	100 0
10.	මිණුම්දෝරු සැළැස්මක් අනුමත කිරීම සඳහා	500 0
11.	අනුකූලතා සහතිකයක් සඳහා	500 0
12.	සැළසුම් අනුමත කිරීම සඳහා - ගෘහ - වර්ග අඩියකට	1 0
	සැළසුම් අනුමත කිරීම සඳහා - ව්‍යාපාරික - වර්ග අඩියකට	2 0
13.	සැළසුමේ කාර්යය දීර්ඝ කිරීම වසරකට - නේවාසික	100 0
	සැළසුමේ කාර්යය දීර්ඝ කිරීම වසරකට - වාණිජ	150 0
14.	ගොඩනැගිලි අයදුම්පත් - නේවාසික	200 0
	ගොඩනැගිලි අයදුම්පත් - ව්‍යාපාරික	250 0
15.	අනුකූලතා සහතික පෝරමයකට	500 0
16.	පුස්තකාල සාමාජික ගාස්තු - පාසල් ළමුන්	50 0
	පුස්තකාල සාමාජික ගාස්තු - පාසල් නොයන අය	100 0
17.	සුසාන භූමියක මෘත දේහයක් තැන්පත් කිරීම සඳහා - වර්ග අඩියකට	50 0
	භූමදාන කිරීම සඳහා	250 0
18.	මාර්ග පළුදු කිරීම - තාර පාරක් සඳහා	3.000 0
	මාර්ග පළුදු කිරීම - බොරළු පාරක් සඳහා	1,500 0
19.	ගල්නෑව ප්‍රාදේශීය සභාව සතු හිස් ඉඩම්වල උත්සව කටයුතු හා ප්‍රවර්ධන වැඩසටහන් හෝ වෙනත් කටයුතු සඳහා කුළියට දීම, එක් දිනකට රු. 1,000 බැගින් දින් 03ක් සඳහා (වැඩිවන සෑම දිනකටම රු. 200 බැගින් අය කෙරේ)	3,000 0
20.	කිසියම් ආගමික උත්සවයක් සඳහා ගවයෙකු ඝාතනය කිරීම සඳහා අවසර පත්‍රය	500 0
21.	JCB යන්ත්‍රය මීටර් පැයකට කුළියට දීමට (ආරම්භක ස්ථානයේ සිට වැඩ නිමවන තෙක් පැයකට)	3,500 0
22.	අඩි 75 ට්‍රේලරය සමග ට්‍රැක්ටරය දිනකට කුළියට දීමට	6,000 0
23.	අඩි 90 ට්‍රේලරය සමග ට්‍රැක්ටරය දිනකට කුළියට දීමට	6,500 0
24.	ලීටර් 3000 බවුසරය සමග ට්‍රැක්ටරය දිනකට කුළියට දීමට	7,000 0
25.	ලීටර් 6000 ලොරි බවුසරය දිනකට කුළියට දීම	10,000 0
26.	ලීටර් 3000 බවුසරය සමහ ට්‍රැක්ටරය එක් වරකට (කි.මී. 5ක් ඇතුළත) වැඩිවන සෑම කිලෝමීටරයකටම රු. 80 බැගින් අය කරනු ලැබේ.	1,500 0
27.	ලීටර් 6000 ලොරි බවුසරය සමහ ට්‍රැක්ටරය එක් වරකට (කි.මී. 5ක් ඇතුළත) වැඩිවන සෑම කිලෝමීටරයකටම රු. 80 බැගින් අය කරනු ලැබේ	2,000 0

අනු අංකය	විස්තරය	රු. ශත
28.	ඩම්ප් ට්‍රක් රථය දිනකට කුලියට දීමට	15,000 0
29.	ගලි බවුසරය ලබා දීම	
	● එක ගලියක් සඳහා	4,000 0
	● ප්‍රවාහන ගාස්තු කිලෝ මීටරයකට	150 0
	● J.C.B. යන්ත්‍රයෙන් වලක් කපා ගැනීම සඳහා	2,000 0
30.	ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ තණ කොළ කැපීම සඳහා දිනකට	5,000 0
31.	පොදු කටයුතු සඳහා සභාව සතු වාහන ලබාදීමේ දී අයකළ යුතු ගාස්තුවෙන් අඩක් අය කිරීම	5,000 0
32.	ජල නළ එලීම් කටයුතු සිදු කරන අවස්ථාවල දී, නිවාස නොමැති ජල නල එලීමට යෝජිත මාර්ග සඳහා නොමිලේ සේවාව සැපයීම	

12 - 348/6

ගල්නෑව ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

ගල්නෑව ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 14 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී සභා තීරණ අංක 109/2021 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
ගල්නෑව ප්‍රාදේශීය සභාව.

2021 ක් වූ සැප්තැම්බර් මස 14 වැනි දින,
ගල්නෑව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය යටතේ ගල්නෑව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, ගල්නෑව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2022 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයෙහි තබාගන්නා සෑම තැනැත්තෙකුගෙන් ම එහි II වැනි තීරුවේ නිරූපිත බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවට ප්‍රාදේශීය සභාව යෝජන කරන්නී ය.

උපලේඛනය

අනු අංකය	විස්තරය	රු. ශත
1.	මෝටර් රථයක්, මෝටර් ට්‍රයිසිකලයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක් කරත්තයක්, ජීන් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවූ සෑම වාහනයක් සඳහා ම	25 0
2.	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා	
	(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
	(ආ) වෙළෙඳ කාර්යයක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
3.	සෑම කරත්තයක් සඳහා	20 0
4.	සෑම අත් කරත්තයක් සඳහා	10 0
5.	සෑම රික්ෂෝවක් සඳහා	7 0
6.	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	14 0
7.	සෑම ඇතෙකු සඳහා	50 0

12 - 348/7

ගල්නෑව ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට අදාළව ජල ගාස්තු පැනවීම

ගල්නෑව ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 14 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී සභා තීරණ අංක 110/2021 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
ගල්නෑව ප්‍රාදේශීය සභාව.

2021 ක් වූ සැප්තැම්බර් මස 14 වැනි දින,
ගල්නෑව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වන වගන්තිය යටතේ ගල්නෑව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, ගල්නෑව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මුස්නව, නාමල්ගමුව, කන්දේගම යන ජල ව්‍යාපෘති සඳහා 2022 වර්ෂයේ දී පහත උපලේඛනයේ සඳහන් පරිදි ජල ගාස්තු පනවා අයකළ යුතු බවට ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

ගල්නෑව ප්‍රාදේශීය සභාව - ජල ගාස්තු අය කිරීම
(මුස්නව, නාමල්ගමුව, කන්දේගම ජල ව්‍යාපෘති)

* ගෘහස්ථ, පෙර පාසැල් සඳහා ජල ගාස්තු අය කිරීම

ගෘහ ඒකකයක් සඳහා ස්ථාවර ගාස්තු - රු. 100 0

ඒකක (සිට)	ඒකක (දක්වා)	ඒකකයක් සඳහා අයකිරීම (රු. ශත)
0	10	10 0
11	20	14 0
21	30	22 0
31	40	32 0
41	50	82 0
50 ට වැඩි ඒකකයක් සඳහා		102 0

*** ව්‍යාපාර ජල ගාස්තු අය කිරීම (ජලය මූලාශ්‍ර කර ගනිමින් ක්‍රියාත්මක කරනු ලබන කර්මාන්ත)**

උදාහරණ - වාහන සර්විස් කරනු ලබන ස්ථාන/ජල පිරිපහදු කරමින් අලෙවි කරනු ලබන ස්ථාන ආදිය

ස්ථාවර ගාස්තු - රු. 200

ඒකක (සිට)	*ඒකක (දක්වා)*	*ඒකකයක් සඳහා අයකිරීම (රු. ශත)*
0	10	40 0
11	20	40 0
21	30	40 0
31	40	60 0
41	50	60 0
50 ට වැඩි ඒකකයක් සඳහා		80 0

*** රජයේ පාසල් හා ආගමික ස්ථාන සඳහා ජල ගාස්තු අය කිරීම**

රජයේ පාසල් සඳහා ස්ථාවර ගාස්තු - රු. 250 0
ආගමික ස්ථානයක් සඳහා ස්ථාවර ගාස්තු - රු. 60.00

ඒකක (සිට)	*ඒකක (දක්වා)*	*ඒකකයක් සඳහා අයකිරීම (රු. ශත)*
0	10	10 0
11	20	14 0
21	30	20 0
31	40	30 0
41	50	40 0
51	60	50 0
61 ට වැඩි ඒකකයක් සඳහා		80 0

*** රජයේ රෝහල් සඳහා ජල ගාස්තු අය කිරීම**

ස්ථාවර ගාස්තු - රු. 250 0

ඒකක (සිට)	*ඒකක (දක්වා)*	*ඒකකයක් සඳහා අයකිරීම (රු. ශත)*
0	10	25 0
11	20	30 0
21	30	40 0
31	40	50 0
41	50	60 0
51 ට වැඩි ඒකකයක් සඳහා		80 0

- ජල ඉල්ලුම්පත් ගාස්තුව රු. 100 0 ක් අය කෙරේ.
- ජල සම්බන්ධතා ගාස්තුව රු. 12,000 0 ක් අය කෙරේ.
- අනවසර ජල සැපයුමක් පවත්වාගෙන යන ස්ථානයක් සඳහා රු. 7,500 0 ක දඩ මුදලක් අය කෙරේ.
- විසන්ධි කරන ලද ජල සැපයුම් ලබා දීමේදී නැවත සන්ධි කිරීමේ ගාස්තුව රු. 2000 0 ක් අය කෙරේ.
- ජල ගාස්තු නොගෙවීම නිසා මෙම සභාව විසින් කරන ලද විසන්ධි කිරීමක් නැවත සන්ධි කිරීමේ දී ඉහත සන්ධි කිරීමේ ගාස්තුවට අමතරව රු. 500 0 ක දඩ මුදලක් අය කෙරේ.
- ජල නල පද්ධතියට අලාභ හානි කිරීම හා ජලය අපතේ හැරීම සිදු කරනු ලැබුවහොත් ඒ සඳහා අලාභය අය කරගෙන රු. 1,000 0 ක දඩ මුදලක් අය කෙරේ.

12 - 348/8

ගල්නෑව ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට අදාළව කොම්පෝස්ට් පොහොර අලෙවිය

ගල්නෑව ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 14 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී සභා තීරණ අංක 111/2021 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
ගල්නෑව ප්‍රාදේශීය සභාව.

2021 ක් වූ සැප්තැම්බර් මස 14 වැනි දින,
ගල්නෑව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

බර ප්‍රමාණය	*මුදල*
	රු. ශත
1kg	15 0
5kg	150 0
10kg	100 0
25kg	200 0
50kg	400 0

12 - 348/9

ගල්නෑව ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට අදාළව ජලය විකිණීම

ගල්නෑව ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 14 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී සභා තීරණ අංක 112/2021 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
ගල්නෑව ප්‍රාදේශීය සභාව.

2021 ක් වූ සැප්තැම්බර් මස 14 වැනි දින,
ගල්නෑව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

විස්තරය	රු. ශත
ගල්නෑව Ro පද්ධතිය මගින් පිරිපහදු කළ ජලය ලීටර් 1	1 0

12 - 348/10

ගල්නෑව ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට අදළව ශ්‍රවණාගාරය කුළියට දීම

ගල්නෑව ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 14 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී සභා තීරණ අංක 113/2021යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
ගල්නෑව ප්‍රාදේශීය සභාව.

2021 ක් වූ සැප්තැම්බර් මස 14 වැනි දින,
ගල්නෑව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

අනු අංකය	කාරණය	මුදල රු. ශත
ශ්‍රවණාගාර ශාලාව දිනකට වෙන් කිරීම		
1	සාමාන්‍ය රැස්වීමක් සඳහා	4,000 0
2	උත්සව කටයුත්තක් සඳහා	4,000 0
3	ශබ්ද විකාශන යන්ත්‍රය සඳහා	2,500 0
4	මංගල උත්සව සඳහා	15,000 0
5	ටිකට්පත් අලෙවි කර සිදුකරනු ලබන ප්‍රසංග සඳහා	15,000 0

12 - 348/11

තවලම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

තවලම ප්‍රාදේශීය සභාවේ 2021.10.21 පැවති මාසික මහ සභා රැස්වීමේ දී සභා තීරණ අංක 5/I/i/(a) යටතේ පහත තීරණය සභා සම්මත වූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බන්දුල විජේසේකර,
සභාපති,
තවලම ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 12 වැනි දින,
තවලම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ -

(අ) 1 වැනි උපවගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාරව තවලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙහි උපලේඛනයේ පළමුවන කොටසේ නිරූපිත යම් ව්‍යාපාරයක් 2022 වර්ෂයේ දී පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තෙකු මත, එකී ව්‍යාපාරයේ 2021 වර්ෂයේ ආදායම දෙවන කොටසේ (I) වැනි තීරයේ නිරූපිත යම් සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක (II) වැනි තීරයේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණ අනුව වූ බද්දක් පනවා අය කිරීමට ;

සහ

(ආ) (3) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත් සෑම තැනැත්තෙකු විසින් යථෝක්ත බද්ද 2022 අප්‍රේල් මස 01 වැනි දිනට ප්‍රථම ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි නියම කිරීමට තවලම ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන්නීය.

ඒ අනුව තවලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ව්‍යාපාර බද්දට යටත් සෑම තැනැත්තෙකුම, එකී ව්‍යාපාර බද්ද 2022 අප්‍රේල් මස 01 වැනි දිනට පෙර තවලම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

උපලේඛනය

I වන කොටස

ව්‍යාපාර :

1. සිල්ලර වෙළෙඳසැලක් පැවැත්වීම
2. රෙදිපිළි හෝ නිමි ඇඳුම් අලෙවිසැලක් පැවැත්වීම
3. සාප්පු බඩු අලෙවිසැලක් පැවැත්වීම
4. පාවහන් අලෙවිසැලක් පැවැත්වීම
5. සන්නිවේදන මධ්‍යස්ථානයක් පැවැත්වීම
6. වර්ණ රසායනාගාරයක් පැවැත්වීම
7. ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීමේ ව්‍යාපාරයක් පැවැත්වීම
8. තීන්ත, සායම් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පැවැත්වීම
9. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පැවැත්වීම
10. පෙර පාසල්, දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පැවැත්වීම
11. පරිගණක පුහුණු පාඨමාලාවක් පැවැත්වීම
12. පරිගණක මෘදුකාංග සංවර්ධන මධ්‍යස්ථානයක් පැවැත්වීම
13. රියැදුරු පුහුණුව සපයන ආයතනයක් පැවැත්වීම
14. සමුපකාර සමිති, සිල්ලර කඩ (ප්‍රාදේශික) පැවැත්වීම
15. බටහිර වෛද්‍ය මධ්‍යස්ථානයක් පැවැත්වීම
16. ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයක් පැවැත්වීම
17. මූල්‍ය ආයතනයක් පැවැත්වීම
18. රක්ෂණ සේවා සපයන ස්ථානයක් පැවැත්වීම
19. ලීසිං සේවා සපයන ස්ථානයක් පැවැත්වීම
20. පෞද්ගලික රෝහලක් පැවැත්වීම
21. ස්වර්ණාභරණ විකිණීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම

22. පරිගණක උපාංග විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
23. ලී බඩු විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
24. ප්‍රචාරක කටයුතු කිරීමේ ආයතනයක් පැවැත්වීම
25. උත්සව භාණ්ඩ කුලියට දීමේ ආයතනයක් පැවැත්වීම
26. ඇස් කණ්නාඩි සාප්පුවක් පැවැත්වීම
27. ලොතරැයි නියෝජිත ආයතනයක් පැවැත්වීම
28. පිඟන් මැටි ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීම
29. රේස් බුකියක් පැවැත්වීම
30. පින්තූර රාමු කිරීම හා වීදුරු කැපීමේ ස්ථානයක් පැවැත්වීම
31. වී මිලදී ගැනීමේ ස්ථානයක් පැවැත්වීම
32. සන්නිවේදන සේවා සැපයීමේ ආයතනයක් පැවැත්වීම
33. ජංගම දුරකතන අලෙවි කිරීමේ ස්ථානයක් පැවැත්වීම
34. රැකියා නියෝජිත ආයතනයක් පැවැත්වීම
35. වීඩියෝ පට, සංයුක්ත තැටි විකිණීම හෝ කුලියට දීමේ ස්ථානයක් පැවැත්වීම
36. ලිපි ද්‍රව්‍ය හෝ පොත් සාප්පුවක් පැවැත්වීම
37. ලී බඩු වෙළෙඳසැලක් පැවැත්වීම
38. පුවත්පත් විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
39. සංගීත භාණ්ඩ හෝ ක්‍රීඩා භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
40. ගබඩාවක් ලෙස කුලියට දෙන ස්ථානයක් පැවැත්වීම
41. විදුලි උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පැවැත්වීම
42. තොග වශයෙන් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
43. සිමෙන්ති විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
44. ප්‍රසිද්ධ සමාගම්වල භාණ්ඩ බෙදා හැරීමේ යෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
45. වාහන අලෙවි කිරීමේ ස්ථානයක් පැවැත්වීම
46. යතුරු පැදි, ත්‍රීරෝද රථ අලෙවි කිරීමේ ස්ථානයක් පැවැත්වීම
47. බුලත්, පුවක් විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
48. සුපිරි වෙළෙඳසැලක් (ෆුඩ්සිටියක්) පවත්වාගෙන යාම
49. සත්ත්ව ආහාර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
50. දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන විකිණීමේ නියෝජිත ආයතනයක් පැවැත්වීම
51. භාවිතා කරන ලද වාහන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
52. භාවිතා කරන ලද මෝටර් සයිකල් විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
53. වෛද්‍යවරුන් හා රෝගීන් මුණගස්වන ආයතනයක් (චැනල් සෙන්ටර්) පවත්වාගෙන යාම
54. විදුලි උපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
55. තේ දළු එකතු කිරීමේ ස්ථානයක් පැවැත්වීම
56. වාහන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
57. බලයලත් අරක්කු හා රට බීම විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
58. බටහිර ඖෂධ විකිණීමේ ස්ථානයක් පැවැත්වීම (ෆාමසි)
59. කුළු බඩු එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
60. වාහන දුම් පරීක්ෂා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
61. ඉන්ධන පිරවුම් හලක් පවත්වාගෙන යාම
62. ජංගම වෙළෙඳ වාහනයක් හෝ ජංගම වෙළෙඳ සැලක් පවත්වාගෙන යාම
63. තේ කම්හලක් පැවැත්වීම
64. ගෑස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
65. පරණ ලෝහ එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
66. එළවළු, පලතුරු විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
67. තොග වශයෙන් භාණ්ඩ ගබඩා කර විකිණීම (ගල්, වැලි, ගඩොල්, සිමෙන්ති, පොහොර.....)
68. පැළ තවානක් පවත්වාගෙන යාම හා විසිතුරු පැළ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
69. කායවර්ධන පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
70. යන්ත්‍රෝපකරණ හා මෝටර් රථ කුළියට දීම
71. දුරකථන සම්ප්‍රේෂණ කුළුණු පවත්වාගෙන යාම

11 වැනි කොටස

I වැනි තීරය *2021 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම*	*II වැනි තීරය* *රු. ශත*
1. රු. 6,000 0 නොඉක්මවූ අවස්ථාවක	කිසිවක් නැත
2. රු. 6,000 0 ඉක්මවන එහෙත් රු. 12,000 0 නොඉක්මවන අවස්ථාවක	90 0
3. රු. 12,000 0 ඉක්මවන එහෙත් රු. 18,750 0 නොඉක්මවන අවස්ථාවක	180 0
4. රු. 18,750 0 0 ඉක්මවන එහෙත් රු. 50,000 0 නොඉක්මවන අවස්ථාවක	360 0
5. රු. 50,000 0 ඉක්මවන එහෙත් රු. 75,000 0 නොඉක්මවන අවස්ථාවක	750 0
6. රු. 75,000 0 ඉක්මවන එහෙත් රු. 150,000 0 නොඉක්මවන අවස්ථාවක	1,200 0
7. රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක	3,000 0

12-169/ 1

තවලම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා වෙළෙඳ බලපත්‍ර ගාස්තු පැනවීම

තවලම ප්‍රාදේශීය සභාවේ 2021.10.21 පැවති මාසික මහ සභා රැස්වීමේ දී සභා තීරණ අංක 5/I/i/(b) යටතේ පහත තීරණය සභා සම්මත වූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බන්දුල විජේසේකර,
සභාපති,
තවලම ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 12 වැනි දින,
තවලම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වන වගන්තියේ (1) උපවගන්තියේ (ආ) ඡේදයෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, තවලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙහි උපලේඛනයේ I වැනි තීරයේ නිරූපිත යම් කර්මාන්තයක් 2022 වර්ෂයේ දී කරගෙන යාම සඳහා නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් මත එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම II වැනි තීරයේ නිරූපිත යම් සීමාවන් ඇතුළත වන අවස්ථාවක අනුරූප සටහනේ සඳහන් අනුප්‍රමාණ අනුව වූ බලපත්‍ර ගාස්තුවක් පනවා අයකළ යුතු යැයි තවලම ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන්නීය.

ඒ අනුව තවලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වෙළෙඳ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර/කර්මාන්ත විසින් 2022 වර්ෂය සඳහා පනවන ලද වෙළෙඳ බලපත්‍ර ගාස්තු 2022 අප්‍රේල් මස 01 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවා වෙළෙඳ බලපත්‍රය ලබාගන්නා ලෙස වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

උපලේඛනය

I වැනි තීරය *කර්මාන්තය*	*II වැනි තීරය* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
	රු. 750 0 දක්වා	*රු. 750 0 ට වැඩි එහෙත් රු. 1,500 0 ට නොවැඩි*	*රු. 1,500 0 ට වැඩි*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
1. ලැගුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2. හෝටල්	500 0	750 0	1,000 0

	I වැනි තීරය *කර්මාන්තය*	*II වැනි තීරය* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 0 දක්වා	*රු. 750 0 ට වැඩි එහෙත් රු. 1,500 0 ට නොවැඩි*	*රු. 1,500 0 ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
3.	බත් කඩ ආපනශාලා සහ තේ හෝ කෝපි කඩ	500 0	750 0	1,000 0
4.	බේකරි	500 0	750 0	1,000 0
5.	කිරි පට්ටි හා කිරි වෙළෙඳාම	500 0	750 0	1,000 0
6.	මාළු විකිණීම	500 0	750 0	1,000 0
7.	මස් විකිණීම	500 0	750 0	1,000 0
8.	අයිස් කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
9.	සිසිල් බීම කර්මාන්තශාලා	500 0	750 0	1,000 0
10.	සංචාරක වෙළෙඳාම	500 0	750 0	1,000 0
11.	ලොන්ඩරි	500 0	750 0	1,000 0
12.	ගවගාල්	500 0	750 0	1,000 0
13.	ඝාතක මඩු	500 0	750 0	1,000 0
14.	කොණ්ඩා සැකසීමේ සැලුන් සහ බාබර් සාප්පු	500 0	750 0	1,000 0
15.	කර්මාන්තශාලා	500 0	750 0	1,000 0
16.	අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන	500 0	750 0	1,000 0
17.	ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හා ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා කිරීම	500 0	750 0	1,000 0

සැ. යු. - සංචාරක මණ්ඩලයේ අනුමත හෝටල්, ආපනශාලා සහ ලැගුම්හල් පෙර වර්ෂයේ ලැබීම්වලින් 1%ක බලපත්‍ර ගාස්තුවක් ගෙවිය යුතු ය.

අප්‍රසන්න :

1.	යෝගට් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
2.	කුකුළු ගොවිපළ	500 0	750 0	1,000 0
3.	අයිස්ක්‍රීම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
4.	රස කැවිලි නිෂ්පාදනය	500 0	750 0	1,000 0
5.	වාහන සර්විස් කිරීම	500 0	750 0	1,000 0
6.	කිරි ආහාර නිෂ්පාදිත ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	සත්ත්ව ගොවිපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අන්තරාදායක :

1.	කෘෂි රසායන ද්‍රව්‍ය ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	ඇසිඩ් වර්ග නිෂ්පාදනය හා වෙළෙඳාම	500 0	750 0	1,000 0
3.	ෆයිබර් ග්ලාස් නිපදවීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

ප්‍රසන්න හා අන්තරාදායක :

1.	පොහොර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	සිප්පි ඇඹරුම්හලක් හා රසායනික ද්‍රව්‍ය නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	බැටරි චාර්ජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

තවලම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

තවලම ප්‍රාදේශීය සභාවේ 2021.10.21 පැවති මාසික මහ සභා රැස්වීමේදී සභා තීරණ අංක 5/I/i/(c) යටතේ පහත තීරණය සභා සම්මත වූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බන්දුල විජේසේකර,
සභාපති,
තවලම ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 12 වැනි දින,
තවලම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව,

(අ) තවලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2022 වර්ෂයේදී පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ I වැනි තීරයේ නිරූපිත යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම එම උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණ අනුව වූ කර්මාන්ත බද්දක් 2022 වර්ෂයේ දී පනවා අය කිරීමට,

(ආ) 2021 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින පැවති යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යථෝක්ත බද්ද 2022 අප්‍රේල් මස (01) පළවන දිනට ප්‍රථම කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධාන කිරීමට,

(ඇ) 2022 වර්ෂයේ දී ආරම්භ කරනු ලබන යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යථෝක්ත බද්ද කර්මාන්තය ආරම්භ කර මාස 03ක් ඇතුළත කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධාන කිරීමට තවලම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

I වැනි තීරය		*II වැනි තීරය*		
කර්මාන්ත		*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 දක්වා	*රු. 750 ට වැඩි එහෙත් රු. 1,500 ට නොවැඩි*	*රු. 1,500 ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	ඇඳුම් මැසීම	700 0	750 0	1,000 0
2.	සිමෙන්ති ගඩොල්, බීරලු,මල් පෝච්චි, කොන්ක්‍රීට් සිලින්ඩර් හෝ සිමෙන්ති ආශ්‍රිත වූ කිසියම් භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	ඩිජිටල් තාක්ෂණයෙන් මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	කුෂන් වැඩ පළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	බීරළු ලී කැටයම් වැඩපළවල්	500 0	750 0	1,000 0
6.	ඉදල්, පාපිසි, කොහු ආශ්‍රිත නිෂ්පාදන	500 0	750 0	1,000 0
7.	පොල්තෙල් මෝලක්	500 0	750 0	1,000 0
8.	ස්වර්ණාභරණ නිපදවීම	500 0	750 0	1,000 0
9.	පාවහන් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
10.	ඡායාරූපශාලා	500 0	750 0	1,000 0
11.	හුණු හා ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I වැනි තීරය	*II වැනි තීරය*		
	කර්මාන්ත	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 දක්වා	*රු. 750 ට වැඩි එහෙත් රු. 1,500 ට නොවැඩි*	*රු. 1,500 ට වැඩි*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
13.	බලවේග තේ කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	උක්මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	කොහු මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	තේ කොළ, කුළු බඩු පැකට් කර විකිණීම	500 0	750 0	1,000 0
17.	වී මෝල්	500 0	750 0	1,000 0
18.	ත්‍රීරෝද රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	යතුරුපැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	පාපැදි, යතුරුපැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	දේශීය බෙහෙත් වර්ග නිෂ්පාදිත ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	මෝටර් රථ යතුරුපැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	ටයර්, ටියුබ් යතුරුපැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	ඇඟලුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	ගල් වලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	යන්ත්‍රානුසාරයෙන් කැටගල් සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	වෙල්ඩින් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	ගෘහ භාණ්ඩ, විසිතුරු භාණ්ඩ ආදි නිෂ්පාදන	500 0	750 0	1,000 0
31.	කූඩ, වට්ටි වැනි වේවැල් බට ආශ්‍රිත නිෂ්පාදන	500 0	750 0	1,000 0
32.	ඉලෙක්ට්‍රිකල් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	කෘෂි ආම්පන්න නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	ගරාජ්	500 0	750 0	1,000 0
35.	ලී මෝලක්	500 0	750 0	1,000 0
36.	යන්ත්‍රානුසාරයෙන් කළුගල් ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	වායුසමීකරණ, ශීතකරණ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
38.	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39.	වඩු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	බෑග් මැසීම	500 0	750 0	1,000 0
42.	වීදුරු ආශ්‍රිත නිෂ්පාදන	500 0	750 0	1,000 0

තවලම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු පැනවීම

තවලම ප්‍රාදේශීය සභාවේ 2021.10.21 පැවති මාසික මහ සභා රැස්වීමේදී සභා තීරණ අංක 5/I/i/(d) යටතේ පහත තීරණය සභා සම්මත වූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බන්දුල විජේසේකර,
සභාපති,
තවලම ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 12 වැනි දින,
තවලම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල හා 1988.08.23 වැනි දිනැති අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සම්මත අතුරු ව්‍යවස්ථා 39 වැනි කොටසින් ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව තවලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් වීදියකට, පාරකට, ඇළකට, වැවකට මුහුදකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන පරිදි ගාස්තුවක් පනවා අයකළ යුතු යැයි තවලම ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන ලදී.

උපලේඛනය

1. තාවකාලික (මසකට අඩු දැන්වීම්/බැනර්) ප්‍රචාරක දැන්වීම් සඳහා	-	වර්ග අඩියට රු. 35 0
2. මසකට වැඩි (ස්ථිර ප්‍රචාරක දැන්වීම්) ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා	-	වර්ග අඩියට රු. 75 0

12-169/ 4

තවලම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

තවලම ප්‍රාදේශීය සභාවේ 2021.10.21 පැවති මාසික මහ සභා රැස්වීමේදී සභා තීරණ අංක 5/I/i/(e) යටතේ පහත තීරණය සභා සම්මත වූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බන්දුල විජේසේකර,
සභාපති,
තවලම ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 12 වැනි දින,
තවලම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය සහ 4 වැනි උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර තවලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2022 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු මත ම, එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අයකිරීමට තවලම ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන්නීය.

ඒ අනුව තවලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙම බද්දට යටත්වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තකුම විසින් 2022 වර්ෂය සඳහා වන මෙම බද්ද තවලම ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව* රු. ශත
01 (i) මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජීන් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
(ii) සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා -	
(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
(ආ) වෙළෙඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
(iii) සෑම කරත්තයක් සඳහා	20 0
(iv) සෑම අත් කරත්තයක් සඳහා ම	10 0
(v) සෑම රික්ෂෝවක් සඳහා ම	7 50
(vi) සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා ම	15 0
(vii) සෑම ඇතෙකු සඳහා ම	50 0

02. විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත්කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

12-169/ 5

තවලම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම

තවලම ප්‍රාදේශීය සභාවේ 2021.10.21 පැවති මාසික මහ සභා රැස්වීමේදී සභා තීරණ අංක 5/I/i/(f) යටතේ පහත තීරණය සභා සම්මත වූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බන්දුල විජේසේකර,
සභාපති,
තවලම ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 12 වැනි දින,
තවලම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

(267 වැනි අධිකාරිය වන) විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (1) වැනි උපවගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාර තවලම ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාව ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වන ලද (තත් ආඥාපනතේ විස්තරකර ඇති) විනෝද කටයුත්තකට ඇතුළු වීම සඳහා කරන ලද ගෙවීම්වලින් 10% වූ බද්දක් මෙම යෝජනාව *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දින සිට පනවා අයකළ යුතු යැයි තවලම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12-169/ 6

තවලම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට යන්ත්‍රෝපකරණ කුලියට දීමේ ගාස්තු හා ආදාහනාගාර සේවා ගාස්තු අයකිරීම

තවලම ප්‍රාදේශීය සභාවේ 2021.10.21 පැවති මාසික මහා සභා රැස්වීමේදී සභා තීරණ අංක 5/I/i/(g) යටතේ පහත තීරණය සභා සම්මත වූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බන්දුල විජේසේකර,
සභාපති,
තවලම ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 12 වැනි දින,
තවලම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තවලම ප්‍රාදේශීය සභාව සතු යන්ත්‍රෝපකරණ හා ආදහනාගාර සේවා ගාස්තු පහත පරිදි අයකිරීමට තවලම ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන්නී ය.

		රු. ශත
1.	බැකෝ ලෝඩරය - ඉන්ධන සපයා පැයකට	2,300 0
2.	ඝන අඩි 75 ට්‍රේලරය සහිත ට්‍රැක්ටරය දිනකට (පැය 8)	4,500 0
	2.1 ඝණ අඩි 75 ට්‍රේලරය සහිත ට්‍රැක්ටරය පැය 8 කට වඩා වැඩිවන සෑම පැයකටම	540 0
3.	කියුබ් 2.5 ටිපර් රථය ඉන්ධන සපයා දිනකට (පැය 8)	10,500 0
	3.1 කියුබ් 2.5 ටිපර් රථය පැය 8 ට වැඩි වැඩිවන සෑම පැයකටම	1,000 0
4.	ට්‍රැක්ටර් බවුසරය කි. මී. 10 ක සීමාව තුළ ප්‍රවාහනය කිරීම සඳහා	
	4.1 ජල බවුසරය ජලය ප්‍රවාහනය කර නැවත පැමිණීම	2,800 0
	4.2 ජල බවුසරය රඳවා තබාගෙන ජලය ලබාගැනීම	3,000 0
	4.3 කි. මී. 10 ට වඩා වැඩි වන සෑම කි. මී. 1ක් සඳහා ම අයකිරීම	35 0
5.	ට්‍රක් බවුසරය කි. මී. 10 ක සීමාව තුළ ප්‍රවාහනය කිරීම සඳහා	10,500 0
	5.1 කි. මී. 10 ට වඩා වැඩි වන සෑම කි. මී. 1ක් සඳහාම අයකිරීම	50 0
6.	5 KVA පෙට්‍රල් ජෙනරේටරය ඉන්ධන රහිතව දිනකට	1,000 0
7.	මල්ටිමීඩියා යන්ත්‍රය තිරය සහිතව (පැය 8)	5,000 0
	7. 1 මල්ටිමීඩියා යන්ත්‍රය තිරය සහිතව (තැන්පතු)	5,000 0
8.	මල්ටිමීඩියා යන්ත්‍රය තිරය රහිතව (පැය 8)	4,000 0
	8. 1 මල්ටිමීඩියා යන්ත්‍රය තිරය රහිතව (තැන්පතු)	5,000 0
9.	මල්ටිමීඩියා යන්ත්‍රය තිරය පමණක් (පැය 8)	1,000 0
	9.1 මල්ටිමීඩියා යන්ත්‍රය තිරය පමණක් (තැන්පතු)	1,200 0
10.	ඇම්ප් එක (500 W) සහිත බෆල් 02 (500 W) (පැය 08)	2,500 0
	10. 1 ඇම්ප් එක (500 W) සහිත බෆල් 02 (500 W) (තැන්පතු)	2,500 0
11.	බෆල් 02 පමණක් (500 W) (පැය (08)	2,000 0
	11.1 බෆල් 02 පමණක් (500 W) (තැන්පතු)	2,000 0
12.	ඇම්ප් එක පමණක් (500 W) (පැය 8)	1,000 0
	12.1 ඇම්ප් එක පමණක් (තැන්පතු)	2,000 0
13.	ප්‍රාදේශීය සභාව සතු ක්‍රීඩාංගන කුලියට දීම	2,000 0

		රු. ශත
14.	2,000L ජල ටැංකි කුලියට දීම දිනකට (ජලය රහිතව)	500 0
15.	පුටු 200ක් සහිත සම්මන්ත්‍රණ ශාලාව කුලියට දීම (පැය 8)	8,000 0
	15.1 ඇප තැන්පතුව	4,000 0
16.	ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තුව	
	ව්‍යාපාරික ස්ථානයක් සඳහා	400 0
	පදිංචි ස්ථානයක් සඳහා	200 0
17.	අනතුරුදායක ගස් කැපීමේ අයදුම්පත්‍ර ගාස්තු	500 0
18.	වීථිරේඛා සහ නොපවරා ගැනීමේ සහතික ගාස්තු	750 0
19.	පුස්තකාල සාමාජික අයදුම්පත්‍ර ගාස්තු	50 0
	කොන්ක්‍රීට් පරීක්ෂණ අච්චුවක් කුලියට ලබා දීමේ ගාස්තු	500 0
20.	I. ජලය තුළ ගිල්වා ක්‍රියා කරන ලද පොම්පය (අඟල් 2) දිනකට ගාස්තුව (දින 1-10 දක්වා)	2,500 0
	II. ජලය තුළ ගිල්වා ක්‍රියාකරන ජල පොම්පය (අඟල් 2) දිනකට ගාස්තුව (දින 10ට වැඩි)	2,000 0

ආදහනාගාර සඳහා සේවා ගාස්තු අයකිරීම :

1. තවලම හා නෙළුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල ආදාහන සඳහා	6,000 0
2. තවලම හා නෙළුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවලින් පිටත ආදාහන සඳහා	6,500 0

12-169/ 7

තවලම ප්‍රාදේශීය සභාව

කසළ සඳහා ගාස්තු පැනවීම - 2022 වර්ෂය

තවලම ප්‍රාදේශීය සභාවේ 2021.10.21 පැවති මාසික මහා සභා රැස්වීමේදී සභා තීරණ අංක 5/I/i/(h) යටතේ පහත තීරණය සභා සම්මත වූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බන්දුල විජේසේකර,
සභාපති,
තවලම ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 12 වැනි දින,
තවලම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සහ 126 IX (ආ) වගන්තිය ප්‍රකාරව, ලැබී ඇති බලතල මත තවලම ප්‍රාදේශීය සභාව විසින් 2015.07.17 දිනැති අංක 1924 දරන ගැසට් පත්‍රය මගින් 1988.08.23 දින 520/07 පොදු අතුරු ව්‍යවස්ථාවේ (9) අනුව කසළ ශෝධන සේවා මගින් සේවය සලසනු ලබන යම් ස්ථානයක පදිංචිකරුවකු/ව්‍යාපාරිකයෙකු වෙනුවෙන් පහත සඳහන් පරිදි කසළ ශෝධන සේවා ගාස්තු 2022 ජනවාරි 01 සිට මාස් පතා අය කිරීමට තවලම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

1. එළවළු වෙළෙඳ සැලක් සඳහා	රු.	1,000 0	-	රු.	1,500 0
2. පළතුරු වෙළෙඳ සැලක් සඳහා	රු.	800 0	-	රු.	1,000 0
3. හෝටලයක් සඳහා	රු.	1,000 0	-	රු.	1,500 0
4. බාබර් සාප්පුවක් සඳහා	රු.	800 0	-	රු.	1,000 0
5. වෙනත් ස්ථාන සඳහා	රු.	200 0	-	රු.	800 0

12-169/ 8

තවලම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

තවලම ප්‍රාදේශීය සභාවේ 2021.10.21 පැවති මාසික මහා සභා රැස්වීමේදී සභා තීරණ අංක 5/I/i/(i) යටතේ පහත තීරණය සභා සම්මත වූ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

බන්දුල විජේසේකර,
සභාපති,
තවලම ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 12 වැනි දින,
තවලම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ -

(අ) 146 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, තවලම ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පිහිටි අක්කර බද්දට යටත් සෑම ඉඩමක 2021 වර්ෂයේදී බලාත්මක වූ සත්‍යාක්ෂණය 2022 වර්ෂයේ සත්‍යාක්ෂණය ලෙස පිළිගැනීමට,

(ආ) 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, එකී උපවගන්තියේ පළමු අතුරු විධානය යටතේ 1989.03.10 දිනැති *ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයකින් අක්කර බද්ද නියම කිරීමේ සහ අය කිරීමේ කාර්යය සඳහා පළාත් පාලන අමාත්‍යවරයා විසින් විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශයේ පිහිටි හෙක්ටයාර් එකකට නොඅඩු එහෙත් හෙක්ටයාර් පහකට අඩු සෑම ඉඩමක් මත රුපියල් පනහක (රු. 50 0) අනු ප්‍රමාණය අනුව වූ අක්කර බද්දක් සහ හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි සෑම ඉඩමක සෑම හෙක්ටයාරයක් මත රුපියල් දහය (රු. 10 0) බැගින් වූ අක්කර බද්දක් 2022 වර්ෂයේ දී පනවා අයකිරීමට, සහ

(ඇ) 134 වැනි වගන්තියේ (6) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, යථෝක්ත බද්ද 2022 වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික 04කින් ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙස බද්දට යටත් සෑම තැනැත්තෙකුටම විධාන කිරීමට ද,

(ඈ) 134 වැනි වගන්තියේ (7) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, වර්ෂයට අදාළ බදු මුදල වර්ෂයේ ජනවාරි මස 31 දිනට පෙර බදු මුදල් ගෙවනු ලබන පාරිභෝගිකයන්ට 10%ක වට්ටමක් ද, ඒ අක්කර බද්ද වාරිකව ගෙවන අවස්ථාවක නම් ඒ අක්කර බද්දේ අයවිය යුතු කාල සීමා කිරීම පළමුවන මාසය ඇතුළත ගෙවුවහොත් එම වාරිකයේ ප්‍රමාණයෙන් 5% ක වට්ටම් මුදලක් ගෙවීමට තවලම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12-169/ 9

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා පෙරසැරි ගාස්තු අයකිරීම

මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 23 වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී තීරණ අංක 5.1.11.1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩම් කොටස් කිරීම, අලුතින් තාප්ප ඉදි කිරීම, අලුතින් ගොඩනැගිලි ඉදිකිරීම, පවත්නා ගොඩනැගිලි අලුත්වැඩියාව සහ අනුකූලතා සහතික නිකුත් කිරීම වැනි කාර්යයන්හිදී පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2022 වර්ෂය සඳහා පනවා අයකිරීමට තීරණය කරන ලද බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. චමින්ද පුෂ්ප කුමාර,
සභාපති,
මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 23 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1915 අංක 15 දරන නිවාස හා නාගරික සංවර්ධන ආඥාපනතේ 06 වැනි වගන්තිය ප්‍රකාරව මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩම් කොටස් කිරීම, අලුතින් තාප්ප ඉදිකිරීම, අලුතින් ගොඩනැගිලි ඉදිකිරීම, පවත්නා ගොඩනැගිලි අලුත්වැඩියාව සහ අනුකූලතා සහතික නිකුත් කිරීම සඳහා ගාස්තු පනවා අය කිරීමට මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

ඉඩම් කොටස් කිරීමේ පෙරසැරි ගාස්තු :

බිම් කට්ටියක වර්ග ප්‍රමාණය	පර්චස් ප්‍රමාණය	එක් බිම් කට්ටියකට අයකළ මුදල (රු.) (මාර්ග කාණු හා පොදු බිම් කොටස් හැර) රු. ශත
ව.මී. 150 - 300	5.93 - 11.86	700 0
ව.මී. 301 - 600	11.87 - 23.72	560 0
ව.මී. 601 - 900	23.73 - 35.58	420.60
ව.මී. 900 ට වැඩි	35.59 ට වැඩි	280 0

ගොඩනැගිලි පෙරසැරි ගාස්තු :

ගෙබිම් ප්‍රමාණය වර්ග අඩි	නේවාසික රු. ශත	වාණිජ රු. ශත
185 ට අඩු	700 0	1,400 0
485 - 970	1,400 0	2,100 0
970 - 1,940	2,100 0	2,800 0
1,940 - 2,910	2,800 0	4,200 0
2,910 - 4,842	4,200 0	6,300 0
4,842 - 7,263	5,570 0	8,350 0
7,263 - 9,684	6,960 0	10,450 0
9,684 - 13,181	8,350 0	13,920 0
13,181 ට වැඩි	9,750 0	13,920 0
13,182 ඉක්මවීමෙන් පසු සෑම වර්ග අඩි 969 ටම	700 0	1,365 0

පොදු කරුණු :

1. ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ඉල්ලුම් පත්‍රයක් සඳහා රු. 335 0,
2. ඉඩම් කොටස් කිරීමේ ඉල්ලුම් පත්‍රයක් සඳහා රු. 335 0,
3. වීථිරේඛා ඉල්ලුම් පත්‍රයක් සඳහා රු. 132 0,
4. වීථිරේඛා සහතිකයක් නිකුත් කිරීම සඳහා 610 0,
5. සංවර්ධන බලපත්‍රවල කාලය දීර්ඝ කිරීම සහ රු. 145 0 ක අවමයකට යටත්ව මුලින් අය කළ පෙරසැරි ගාස්තුවෙන් 25%ක්,
6. භාවිතය වෙනස් කිරීමට රු. 145 0 ක අවමයකට යටත්ව අය කළ ගාස්තු අතර වෙනස, මෙම වෙනස අඩුවන අවස්ථාවලදී රු. 145 0 ක අවමයක් ගෙවිය යුතුය.,
7. ඉඩම් අනුබෙදුම - පළමු බිම් කොටසකට රු. 1,400 0 ක් සහ ඊට වැඩිවන සෑම බිම් කට්ටියකටම රු. 700 0 ක්,
8. නේවාසික ඉදිකිරීම් ව.මී. 300 ට අඩු රු. 4,175 0 ක් සහ ඊට වැඩිවන සෑම ව.මී. 1 ට රු. 15 0 ක්,
9. වාණිජ හා වෙනත් ව.මී. 100 ට අඩු රු. 4,175 ක් සහ ඊට වැඩිවන සෑම ව.මී. 1 ට රු. 15 0 ක්.
10. අනුකූලතා සහතිකයක් නිකුත් කිරීම සඳහා රු. 3,000

12-134/1

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු පැනවීම

මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 23 වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී තීරණ අංක 5.1.11.2 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ ඔහුගේ සේවකයෙකු හෝ අනු නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයෙන් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් සියයට එකක (1%) සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයන් හෝ අනුගාමිකයන් විසින් මඩුල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. චමින්ද පුෂ්ප කුමාර,
සභාපති,
මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 23 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය ප්‍රකාරව මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ ඔහුගේ සේවකයෙකු හෝ අනු නියෝජිතයකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයෙන් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් සියයට එකකට (1%) සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයන් හෝ අනුගාමිකයන් විසින් මඩුල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12-134/2

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 23 වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී තීරණ අංක 5.1.11.3 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත් වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකුම විසින්, එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින 30 ක් සම්පූර්ණ වූ වහාම 2022 වර්ෂය සඳහා වන මෙම බද්ද මඩුල්ල ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. චමින්ද පුෂ්ප කුමාර,
සභාපති,
මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 23 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය හා V වන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2022 වර්ෂයේ දී පහත උපලේඛනයෙහි I වැනි තීරුවෙහි සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමට මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I වැනි තීරය	*II වැනි තීරය*
	රු. ශක
මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක් ජීන් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම	25 0
(අ) වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
(ආ) වෙළඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	04 0
සෑම කරත්තයක් සඳහා	20 0
සෑම පාපැදියක් සඳහා	10 0
සෑම අත්කරත්තයක් සඳහා	10 0
සෑම රික්ෂෝවක් සඳහා	7 0
සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
සෑම ඇතෙකු සඳහා	50 0

02. රෝදවල විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යයන් සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීම්වලින් නිදහස් කෙරේ.

12-134/3

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් පිළිබඳ ගාස්තු පැනවීම

මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 23 වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී තීරණ අංක 5.1.11.4 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් වීදියකට, පාරකට, ඇලකට හෝ අහසට පෙනෙන පරිදි ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීමක් හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමට තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද එම ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශන ගාස්තුව එකී ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට දින තුනකට (03) පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවිය යුතු බවත්, එසේ නොකරන්නේ නම් ප්‍රදර්ශනය කරන ලද ප්‍රචාරක දැන්වීම ඉවත් කිරීමට සිදුවන බවත්, වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. චමින්ද පුෂ්ප කුමාර,
සභාපති,
මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 23 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක : 122, 126 වැනි වගන්ති ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව හා 1988.08.23 වැනි දින අංක 520/07 දරන පළාත් පාලන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත්කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවල 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්/ දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව 2013.06.28 දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ *ගැසට්*පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ අතුරු ව්‍යවස්ථා විධිවිධාන ප්‍රකාරව මඩුල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇලකට, අහසට පෙනෙන පරිදි ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීමක් හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2022 වර්ෂය සඳහා පනවා අයකර ගැනීමට මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

විස්තරය	*රු. ශ.*
ස්ථිර ප්‍රචාරක දැන්වීමක් සඳහා බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන විට වර්ග අඩියකට හෝ ඉන් කොටසක් සඳහා	100 0
තාවකාලික ප්‍රචාරක දැන්වීමක් සඳහා බැනරයක් වශයෙන් ප්‍රදර්ශනය කරනු ලබන විට වර්ග අඩියකට හෝ ඉන් කොටසකට :	
මසකට (වර්ග අඩියකට)	80 0
මාස තුනකට (වර්ග අඩියකට)	90 0
මාස හයකට (වර්ග අඩියකට)	100 0
චිත්‍රපට පෙන්වීම සම්බන්ධ එක් ප්‍රචාරක දැන්වීමක් හෝ වෙනත් ප්‍රචාරක බැනරයක් සඳහා වර්ග අඩියකට හෝ ඉන් කොටසකට :	
මසකට (වර්ග අඩියකට)	80 0
මාස තුනකට (වර්ග අඩියකට)	90 0
මාස හයකට (වර්ග අඩියකට)	100 0

12-134/4

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 23 වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී තීරණ අංක 5.1.11.5 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද ව්‍යාපාර බද්ද 2022 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත්, වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. චමින්ද පුෂ්ප කුමාර,
සභාපති,
මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 23 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2022 වර්ෂය තුළ දී පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එකී ව්‍යාපාර බද්දට යටත් සෑම තැනැත්තෙක්ම එකී ව්‍යාපාර බද්ද 2022 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර මඩුල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I වැනි තීරුව *බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය*	*II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශ.*
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නැත
රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
රු. 75,000 ඉක්මවන නමුත් රු. 150,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
රු. 150,000 ඉක්මවන විට	3,000 0

ව්‍යාපාර බදු යටතට ගැනෙන ව්‍යාපාර :

01. කොන්ත්‍රාත්කරුවන්
02. මුදල් ණයට දෙන්නන් (රජයේ හා පෞද්ගලික)
03. මුදල් ආයෝජකයින් (බැංකු)
04. වෙන්දේසිකරුවන් හා තැරැව්කරුවන්
05. විදුලි බලයෙන් ක්‍රියා කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
06. ලොතරැයි ටිකට් නියෝජිතවරුන්
07. පුද්ගලික බස් රථ නියෝජිතවරුන්
08. කුලී රථ අයිතිකරුවන්
09. රැකියා ඒජන්තවරුන්
10. කොමිස් ඒජන්තවරුන්
11. ප්‍රචාරක නියෝජිතවරුන්
12. මෝටර් රථ වාහන අලෙවිකරුවන්
13. මැණික් වෙළෙන්දන්
14. බැංකු හෝ රක්ෂණ නියෝජිතවරුන්
15. ඉන්ධන පිරවුම්හල් නියෝජිතවරුන්
16. සැපයුම්කරුවන් (හුණු ගල්, කළු ගල්)
17. උකස් බඩු ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම
18. අනෙකුත් ව්‍යාපාර නියෝජිතවරුන්
19. ලිහිසි තෙල් නියෝජිතවරුන්
20. තාවකාලික අලෙවි ප්‍රවර්ධන කටයුතු
21. ක්‍රීඩා සමාජ පවත්වාගෙන යාම
22. රියැදුරු පුහුණු ආයතනයක් පවත්වාගෙන යාම
23. පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
24. පෞද්ගලික තැපැල් හලක් පවත්වාගෙන යාම
25. මත්පැන් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
26. පරිගණක පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
27. ගිණුම් සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම

28. සන්නිවේදන සේවා සපයන ආයතනවල නියෝජිතවරුන්
29. මෙම වගන්තිය යටතේ ව්‍යාපාර බදු ගෙවිය යුතු බවට මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලබන ඇතැම් සීමිත සමාගම්
30. සම්ප්‍රේෂණ කුළුණු
31. යන්ත්‍රෝපකරණ කුලී පදනම මත ලබාදීම
32. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදාහැරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
33. යන්ත්‍රානුසාරයෙන් නිෂ්පාදනය කරන හඳුන්කුරු අලෙවි කරන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
34. රසායනාගාරයක් පවත්වාගෙන යාම
35. විශ්‍රාමශාලා පවත්වාගෙන යාම
36. කාමර පහසුකම් ලබාදීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
37. වැලි, ගඩොල් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
38. වානිජමය වැලි කැනීම් ස්ථානයක් පවත්වාගෙන යාම
39. ගෘහ නිර්මාණ හා උද්‍යාන ශිල්පී ආයතනයක් පවත්වාගෙන යාම
40. පුද්ගලික අධ්‍යාපන පංති පවත්වන්නෙකු
41. වාහන දුම් පරීක්ෂා කිරීමේ ජංගම ස්ථානයක් පවත්වාගෙන යන්නෙකු
42. හාඩ්වෙයාර් එකක් පවත්වාගෙන යන්නෙකු
43. පැල තවාන්
44. වාහන අමතර කොටස් අලෙවිය
45. උපදේශන සේවා සැපයීමේ ආයතනයක් පවත්වාගෙන යාම
46. පිරිසිදු කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
47. දෙස් විදෙස් රැකියා ඒජන්සියක් පවත්වාගෙන යාම

12-134/5

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 23 වැනි දින වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේදී තීරණ අංක 5.1.11.6 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද ඒ කර්මාන්ත බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත්, වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. චමින්ද පුෂ්ප කුමාර,
සභාපති,
මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 23 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන කර්මාන්තය එකී පනතේ හෝ ඒ පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නොවන්නා වූ යම් කර්මාන්තයක් හෝ වෙළෙඳාමක් වෙනුවෙන් ඒ කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ විෂයාංග ගත සීමාවක් ඇතුළත පවතින අවස්ථාවක අය කරනු ලබන බද්ද II වැනි තීරුවේ අනුරූප සටහනෙහි දක්වා ඇති මුදල් ප්‍රමාණයට සමාන මුදලක් කර්මාන්ත *නැතහොත්* වෙළෙඳාම් බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් සෑම තැනැත්තෙක්ම 2022 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර එකී බද්ද මඩුල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I වැනි තීරුව *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*	*II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශත*
(1) රු. 750 නොඉක්මවන අවස්ථාවක	500 0
(2) රු. 750 ඉක්මවන නමුත් රු. 1500 නොඉක්මවන විට	750 0
(3) රු. 1500 ඉක්මවන විට	1,000 0

අනු. අංකය	*I වැනි තීරුව* *ව්‍යාපාරයේ ස්වභාවය*	*වාර්ෂික වටිනාකම රු. 750 ට නොවැඩි අවස්ථාවක* *රු. ශත*	*II වැනි තීරුව* *වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා* *රු. ශත*	*වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි* *රු. ශත*
01.	සාප්පු බඩු වෙළෙඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	ලී බඩු වෙළෙඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	ගෘහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක්, වෙළෙඳසලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	ගොඩනැගිලි උපකරණ හා යකඩ බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	පිඟන් බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	ධාන්‍ය මිලදී ගැනීම හා විකිණීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	මහන මැෂින් අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	විදුලි උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	පරිගණක උපාංග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	වාහන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	යතුරුපැදි හා පා පැදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	මසා නිමකළ ඇඳුම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	පත්තර, සඟරා, පාසල් උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	බුලත් පුවක් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	සිමෙන්ති ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	තැඹිලි හා කුරුම්බා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	ඉංග්‍රීසි බෙහෙත් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (ෆාර්මසි)	500 0	750 0	1,000 0
23.	බීඩි, සුරුට්ටු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24.	හඳුන්කූරු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	විසිතුරු මැටි බඳුන් අලෙවි සලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	ශබ්ද විකාශන යන්ත්‍ර කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	කොහු හෝ කෙඳිවලින් භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
28.	දුරකථන ඇමතුම් සේවා සපයන ස්ථානයක් (කොමියුනිකේෂන්) සඳහා	500 0	750 0	1,000 0
29.	අඟුරු සඳහා දැව පොල්කටු දැවීම හෝ අඟුරු ගබඩා කිරීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
30.	ටයර් හෝ ටියුබ් වෝල්කනයිස් කරන ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0

අනු. අංකය	I වැනි තීරුව ව්‍යාපාරයේ ස්වභාවය	වාර්ෂික වටිනාකම රු. 750 ට නොවැඩි අවස්ථාවක රු. ශත	II වැනි තීරුව වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශත	වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි රු. ශත
31.	විදුලි උපකරණ නව නිපැයුම් (LED බල්බ)	500 0	750 0	1,000 0
32.	කොට්ට පුළුන්, කපු පුළුන් විකිණීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
33.	වියළි කෝෂ, බැටරි නිපදවීමේ ස්ථානයක් සඳහා	500 0	750 0	1,000 0
34.	ශරීර සුවතා ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35.	තලාතු මිනිරන් වේලීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36.	බෝල මේස ක්‍රීඩා කරන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	නොතාරිස් කාර්යාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	පොල් ලී අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39.	බීරළු කපන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	දුම්කොළ ගබඩා කිරීමේ ව්‍යාපාර ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	රබර් දුම් ගැසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	රබර් මුද්‍රා කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
43.	ජ්‍යෝතිෂ්‍ය කාර්යාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
44.	සිමෙන්ති, බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	පාවහන් විකිණීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46.	කොන්ක්‍රීට් හා මැටි පයිප්ප හෝ භාණ්ඩ නිෂ්පාදනය කර ගබඩා කර තැබීම	500 0	750 0	1,000 0
47.	ගුවන්විදුලි, රූපවාහිනී යන්ත්‍ර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
48.	ගුවන්විදුලි, රූපවාහිනී යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
49.	මැණික්ගල් කැපීම - ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
50.	සිගරට් තොග වෙළෙඳ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
51.	ලොතරැයි ටිකට්පත් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
52.	දන්ත චිකිත්සාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
53.	වෙළෙඳ ප්‍රචාරක දැන්වීම් සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
54.	ටයර් ටියුබ් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
55.	දැව විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
56.	ගීත පටිගත කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
57.	මනාලියන් හැඩගැන්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
58.	උත්සව ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
59.	පිත්තල භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
60.	ලොරි බොඩි සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
61.	කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
62.	ගෙවතු පිරිසිදු කිරීමේ/අලංකරණය කිරීමේ සේවා සපයන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
63.	පැල තවානක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
64.	කොන්ක්‍රීට් පෙරසවි භාණ්ඩ අලෙවිය හා නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
65.	උත්සව භාණ්ඩ කුලියට ලබාදීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
66.	යකඩ තලන කම්හල්	500 0	750 0	1,000 0
67.	පූජා භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 23 වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී තීරණ අංක 5.1.11.7 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍රයක් ලබා ගත යුතු මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සෑම කර්මාන්තයක්ම පවත්වාගෙන යාමේ ස්ථානය වෙනුවෙන් 2022 වර්ෂය සඳහා මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන වලංගු බලපත්‍රයක් ලබාගත යුතු බවත්, එසේ ලබාගත් වලංගු බලපත්‍රයක් නොමැතිව යම් කර්මාන්තයක් පවත්වාගෙන යාම වරදක් බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ. එවැනි යම් කර්මාන්තයක් පවත්වාගෙන යනු ලබන එක් එක් ස්ථානය වෙනුවෙන් 2022 වර්ෂයට මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම මත ගාස්තුවක් මඩුල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

ඩී. එම්. චමින්ද පුෂ්ප කුමාර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මඩුල්ල

2021 සැප්තැම්බර් මස 23 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමඟ කියවිය යුතු 149 වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි මෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්තය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තා වූද වන අවස්ථාවක ඉහත 2 වන කොටසේ කුමක් සඳහන්ව තිබුණද ඒ හෝටලය හෝ ආපනශාලාව හෝ නවාතැන්පල හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා සභාපති/ලේකම්වරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගෙවිය යුතු ගාස්තුව ඒ හෝටලයේ හෝ ආපනශාලාවේ හෝ නවාතැන්පොලෙහි හෝ 2021 වර්ෂය තුළ ලැබීම්වලින් සියයට එකක් (1%ක්) විය යුතු බවට මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I වැනි තීරුව වාර්ෂික වටිනාකම	*II* වැනි තීරුව ගෙවිය යුතු බද්ද රු. ශ.
(1) රු. 750 0 නොඉක්මවන අවස්ථාවක	500 0
(2) රු. 750 0 ඉක්මවන නමුත් රු. 1500 0 නොඉක්මවන විට	750 0
(3) රු. 1500 0 ඉක්මවන විට	1,000 0

(01) ලැගුම් නිවාස
(02) හෝටල්
(03) බත් කඩ, ආපන ශාලා සහ තේ හෝ කෝපි කඩ
(04) බේකරි
(05) ආහාර විකිණීම
(06) මාළු විකිණීම
(07) මස් විකිණීම
(08) සිසිල් බීම කර්මාන්ත ශාලා
(09) ලොන්ඩරි
(10) සංචාරක වෙළෙන්දෝ

(11) සාතක මඩු
(12) කොණ්ඩ සැකසීමේ සැලුන් හල් සහ බාබර් සාප්පු
(13) අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන
(14) පීඩාකාරී හෝ අන්තරායදායක ව්‍යාපාර
(15) පොදු හෝ පෞද්ගලික වෙළෙඳපොළවල්

පීඩාකාරී ව්‍යාපාර :

1. මිණිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම
2. පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබාගැනීම
3. සම් පදම් කිරීම
4. සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා) සතුන් ඇති කරන ස්ථාන පවත්වාගෙන යාම
5. උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ කිලෝග්‍රෑම් 50 ට වඩා ගබඩා කිරීම
6. රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටී තබාගැනීම
7. පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම
8. තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග ගබඩා කොට තබා ගැනීම
9. සම් විකිණීමට තබා ගැනීම
10. කරවල, මාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 100 ට වඩා වැඩි ප්‍රමාණයක් තබා ගැනීම
11. මාළු හෝ මස් ජාඩි දැමීම, හෝ වේලීම හෝ අයිස් දැමීම
12. පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම
13. දුම්කොළ වියළීම
14. සත්ත්ව ආහාර නිපදවීම
15. සබන් නිෂ්පාදනය
16. අළුත් ලෝහ හෝ පරණ ලෝහ තබාගැනීම
17. ලෝහ සුන්බුන් තබාගැනීම
18. ගෘහ භාණ්ඩ නිපදවීම
19. වේවැල් භාණ්ඩ නිපදවීම
20. වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම
21. සිරප් හෝ පළතුරු බීම නිපදවීම
22. රස කැවිලි නිපදවීම
23. පොල් ලෙලි නිපදවීම හෝ (පල් කිරීම)
24. බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)
25. දත් බුරුසු නිපදවීම
26. රා එකතු කිරීම
27. විනාකිරි නිපදවීම
28. දැව ඉරීම
29. පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම
30. සෝඩා නිපදවීම
31. කෙඳි සායම් කිරීම
32. සම් භාණ්ඩ නිපදවීම
33. පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම
34. කෝපි, ධාන්‍ය වර්ග පිටි කිරීම
35. බේකින් පවුඩර් නිපදවීම
36. කපුරු නිපදවීම
37. පොටි නිපදවීම
38. ඉටිපන්දම් නිපදවීම
39. ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම
40. රෙදි සෝදන ද්‍රව්‍ය නිපදවීම
41. ලාකඩ නිපදවීම
42. සුවඳ විලවුන් නිපදවීම
43. පාසල් රටහුණු නිපදවීම
44. ටයර් හෝ ටියුබ් නිපදවීම
45. ටයර් ටියුබ් වොල්කනයිසින් කිරීම
46. සිමෙන්ති නිපදවීම
47. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටස් භාණ්ඩ නිපදවීම
48. වැලි කඩදාසි නිපදවීම
49. ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම

50. ගඩොල් පිළිස්සීම
51. යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම
52. අළු නිෂ්පාදනය
53. පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයක් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම
54. නිමි ඇඳුම් නිෂ්පාදනය කිරීම
55. කුකුළු වෙළෙඳසලක් පවත්වාගෙන යාම
56. විෂබීජනාශක නිපදවීම
57. ටයර් ටියුබ් අලුත්වැඩියා කිරීම
58. සපත්තු/ බෑග්/ සම්භාණ්ඩ නිෂ්පාදනය
59. දුම්කොළ යොදා කරන සිගරට්, බීඩි, සුරුට්ටු නිපදවීම

අන්තරායදායක ව්‍යාපාර :

1. කළුගල් කැනීම හෝ කැඩීම
2. අයිස් නිෂ්පාදනය
3. එළවළු තෙල් නිෂ්පාදනය
4. පොල්තෙල් නිෂ්පාදනය
5. ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම
6. කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිෂ්පාදනය
7. කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිපදවීම
8. පිදුරු තබා ගැනීම
9. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම
10. ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අළුත්වැඩියාව
11. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම
12. හිරිගල් හෝ හුණුගල් කැඩීම
13. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පවත්වාගෙන යාම
14. හිස් ගෝනි හෝ හිස් බෝතල් තබාගැනීම
15. පාපැදි හෝ යතුරුපැදි අළුත්වැඩියා කිරීම
16. පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබාගැනීම
17. ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම
18. ලෝහ සංස්කාරක කර්මාන්ත ආයුධ (යන්ත්‍රෝපකරණ, ආයුධ, උපකරණ නිපදවීම)
19. වැල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම

පීඩාකාරී හා අන්තරායදායක ව්‍යාපාර :

1. තලාතු මිනිරන් ශුද්ධ කිරීම
2. රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු එනසාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම
3. ඩ්‍රයි ක්ලීන් කිරීම
4. රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම
5. විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම
6. තෙල් හෝ සත්ත්ව මේද නිපදවීම
7. හුණු ගල් හෝ හිරි ගල් නිපදවීම
8. ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිපදවීම
9. බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීම
10. ලෝහ වර්ග පෑස්සීම
11. මෝටර් වාහන අලුත්වැඩියාව
12. මෝටර් වාහන සේවා කිරීම
13. යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම
14. වාත්තු මඩුවක් පවත්වාගෙන යාම
15. බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම
16. මෝටර් වාහන බෝඩ් තැනීම
17. කෘමිනාශක, දිලීරනාශක, පැළෑටි හෝ පළිබෝධනාශක නිපදවීම
18. විශබීජනාශක නිපදවීම
19. මදුරු දඟර නිපදවීම

20. දැව ආරක්ෂණ නිපදවීම
21. ගල් තාර හෝ බිටුමන්මය ද්‍රව්‍ය නිපදවීම
22. වීදුරු භාණ්ඩ නිපදවීම
23. යකඩ තහඩු ගැල්වනයිස් කිරීම
24. පාස්සන ඊයම් නිපදවීම
25. ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම
26. කටු කම්බි නිපදවීම
27. කම්බි ඇණ නිපදවීම
28. කාබන් කඩදාසි හෝ යතුරුලියන පටි (රිබන්) නිපදවීම
29. බෙලෙක් බඳුන්, වානේ රීප්ප හෝ කාබනික ටැංකි නිපදවීම
30. ජී.අයි.බාල්දි නිපදවීම
31. වායුසමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ නිපදවීම
32. වායුසමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ අළුත්වැඩියා කිරීම
33. බ්‍රේක් ලයිනර් ක්ලච් ලයිනර් නිපදවීම
34. යන්ත්‍රෝපකරණ නිපදවීම
35. විදුලි භාණ්ඩ නිපදවීම
36. රබර් මිශ්‍ර කෙඳි නිපදවීම
37. සංචායන බැටරි නිපදවීම
38. ට්‍රැක්ටර් රථ එකලස් කිරීම
39. රේඩියේටර් නිපදවීම
40. ඉලෙක්ට්‍රොනික් උපකරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම
41. වියළි කෝෂ බැටරි නිපදවීම
42. වී මෝල්
43. මිනී පෙට්ටි තැනීම
44. දුරකථන නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම
45. විද්‍යුත් උපකරණ අලුත්වැඩියාව හෝ එකලස් කිරීම
46. පරිගණක හෝ තොරතුරු තාක්ෂණ උපකරණ එකලස් කිරීම හෝ අලුත්වැඩියාව
47. උක් ඇඹරුම්හල්

12-134/7

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා සභාව සතු දේපළ කුලියට දීමේ දී ගාස්තු අය කිරීම

මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 23 වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී තීරණ අංක 5.1.11.8 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

මඩුල්ල ප්‍රාදේශීය සභාව සතු ඉඩමක්, ගොඩනැගිල්ලක්, හෝ වාහනයක් කුලියට දීමේ දී පහත උපලේඛනවල සඳහන් ගාස්තුවක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමට තීරණය කරන ලද බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. චමින්ද පුෂ්ප කුමාර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මඩුල්ල.

2021 සැප්තැම්බර් මස 23 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් ඉඩමක්, ගොඩනැගිල්ලක්, හෝ වාහනයක් පහත උපලේඛන 01 හි I වැනි තීරුවේ සඳහන් යම් කටයුත්තක් සඳහා කුලියට ගැනීමේදී එහි අනුරූපි සටහනේ II වැනි තීරුවේ සඳහන් කුලිය 2022 වර්ෂය සඳහා පනවා අයකිරීමටත්, II වැනි උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් යම් කටයුත්තක් සඳහා ඊට අනුරූපි II වැනි තීරුවේ සඳහන් ගාස්තු පනවා අයකිරීමටත්, III වැනි උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් යම් කටයුත්තක් සඳහා එහි II වැනි තීරුවේ අනුරූපි සටහනේ දක්වා ඇති ගාස්තු පනවා අය කිරීමටත් මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

01. උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*
	රු. ශත
පොළ භූමිය දවසකට කුලියට දීම	
දිනකට	5,000 0
දින භාගයකට	2,500 0
රැස්වීම් ශාලාව දවසකට කුලියට දීම	
දිනකට	1,000 0
දින භාගයකට	500 0
ශ්‍රවනාගාරය දවසකට කුලියට දීම	
දිනකට	5,000 0
දින භාගයකට	2,500 0
ක්‍රීඩාංගනය ව්‍යාපාර හා විනෝද කටයුතු සඳහා කුලියට දීම	
දිනකට	5,000 0
දින භාගයකට	2,500 0
ළමා උද්‍යානයේ පසුබිම් ඡායාරූප ගැනීම (උත්සව කටයුතු) සඳහා අයකිරීම	2,000 0

02. උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*
	රු. ශත
රථ වාහන හා යන්ත්‍ර සූත්‍ර	
01. බැකෝ ලෝඩර් යන්ත්‍රය	3,000 0
වානිජමය කටයුතු සඳහා යොදා ගැනීමේදී (පැයකට)	2,800 0
සෙසු කටයුතු වලදී පැයකට	
02. මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය (පැයකට)	4,000 0
03. ලොරි ජල බවුසර් එකක් (6000 L)	5,000 0
(5 Km ට වඩාවැඩිවන සෑම 01 Km කට)	(50 0)
04. ට්‍රැක්ටර් ජල බවුසර් එකක් (3000 L)	3,000 0
(5 Km ට වඩා වැඩිවන සෑම 01 Km කට)	(50 0)
05. ට්‍රැක්ටර් ජල බවුසර් 1/2	1,500 0
(5 Km ට වඩා වැඩිවන සෑම 01 Km කට)	(50 0)
06. හිස් ජල බවුසරය (පැරණි) දිනකට	1,000 0
07. ට්‍රැක්ටර් රථය	
දිනකට	4,500 0
පැය 1ට	750 0
08. ටිපර් රථය දිනකට	
(i) දිනකට	10,000 0
(ii) දින භාගයකට	5,000 0
(iii) පැය දෙකක් සඳහා	2,500 0
(iv) අවම ගාස්තුව (පැයක් සඳහා)	1,250 0
09. ටිපර් රථය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත යොදා ගැනීම	
(i) දිනක් සඳහා (පෙ. ව. 8.30 සිට ප. ව. 4.30 දක්වා)	10,000 0
	රු. ශත

(ii) දින භාගයක් සඳහා (පෙ.ව. 8.30 සිට ප. ව. 12.30 දක්වා) 5,000 0
(iii) පෙ. ව. 8.30 සිට මධ්‍යම රාත්‍රිය දක්වා 20,000 0
හෝ

(i) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත කි. මී. 100 තෙක් ගමන් ගන්නා සෑම කි. මී. 1ක් සඳහා රු. 100 0 බැගින් අය කරන අතර ඒ සඳහා දිනක කුලිය ලෙස 10,000 0 ක් එකතු කරනු ලැබේ.

(ii) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත කි.මී. 100න් පරිභාහිරව යන සෑම කි. මී. 1ක් සඳහා රු. 50 0 බැගින් අයකර දිනක කුලිය රු. 20,000 ක් අය කරනු ලැබේ.

10. මික්ස්චර් යන්ත්‍රය (දිනකට) රු. 4,500 0
11. වැකර් යන්ත්‍රය (දිනකට) රු. 4,500 0

03. උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*
	රු. ශත
වෙනත් සේවා	
01. මඩුල්ල ප්‍රාදේශීය සභාව සතු හට් එක ලබා දීම (දිනකට)	200 0
02. මඩුල්ල ප්‍රාදේශීය සභාව සතු පුටු කුලියට ලබා දීම (එක් පුටුවක් සඳහා)	5 0
03. මඩුල්ල ප්‍රාදේශීය සභාව සතු කොඩි හා කොඩි කණු ලබා දීම	
කොඩියක් (දිනකට)	10 0
කොඩි කණුවක් (දිනකට)	10 0
04. ළමා උද්‍යානයේ ඇතුල්වීමේ ගාස්තුව (අවු. 06 ට වැඩි අය සඳහා)	
වයස අවු. 6-18 අතර	20 0
වයස අවු. 18ට වැඩි	40 0
05. පොළ තරාදිය යෙදවීමේ කිරුම් ගාස්තුව (බර 10 kg ට වැඩි වන විට)	10 0
06. භාවිතයෙන් බැහැර කරන ලද පුවත්පත් කි. ග්‍රෑ 1	30 0

12-134/8

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා නැණසල මධ්‍යස්ථානවල දඩ හා ගාස්තු අයකිරීම

මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 23 වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී තීරණ අංක 5.1.11.9 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව මඩුල්ල ප්‍රදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන නැණසල මධ්‍යස්ථානවල සේවාලාභීන් වෙනුවෙන් සලසා ඇති පහසුකම් සඳහා වැය වන ගාස්තු පියවීම සඳහා පහත සඳහන් උපලේඛනය අදාළ ගාස්තු 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමට තීරණය කරන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. චමින්ද පුෂ්ප කුමාර,
සභාපති,
මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 23 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් මහජන පුස්තකාල තුළ පවත්වාගෙන යනු ලබන නැණසල මධ්‍යස්ථානවල සේවාලාභීන් වෙනුවෙන් සලසා ඇති පරිගණක යන්ත්‍ර හා ඡායා පිටපත් යන්ත්‍ර නඩත්තු හා මෙහෙයුම් වෙනුවෙන් වැයවන ගාස්තු පියවීම පිණිස 2022 වර්ෂය සඳහා පහත සඳහන් උපලේඛනයට අදාළ ගාස්තු පැනවීමට මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

අනු. අංකය	*ලබාදෙනු ලබන සේවාව*	*මුදල රු. ශත*
01.	අන්තර්ජාල පහසුකම් (පැය 1 සඳහා)	100 0
02.	ඡායා පිටපත්	
	තනිපැත්ත	4 0
	දෙපැත්ත	5 0
03.	මුද්‍රණය කිරීම	
	තනිපැත්ත	
	A4	15 0
	Legal	25 0
	A3	30 0
	දෙපැත්ත	
	A4	25 0
	Legal	30 0
	A3	40 0
04.	සකස් කර මුද්‍රණය කිරීම	
	තනිපැත්ත	50 0
	දෙපැත්ත	100 0
05.	සාමාජික මුදල (පාසල්, වැඩිහිටි)	100 0
06.	සාමාජිකත්වය අලුත් කිරීම (මසකට)	100 0
07.	පාඨමාලා ගාස්තු (මාස 06)	6,000 0

12-134/9

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා දෛනික මාළු වෙළෙඳාම් සිදු කරන ස්ථානවලින් ගාස්තු අයකිරීම

මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 23 වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී තීරණ අංක 5.1.11.10 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. චමින්ද පුෂ්ප කුමාර,
සභාපති,
මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 23 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

2016.12.09 වැනි දින අංක 1997 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ*පළකර වැළඳ ගන්නා ලද ඌව පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.06.28 වැනි දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළ කරන ලද්දා වූ මාළු විකිණීම පිළිබඳ 20 වැනි සම්මත අතුරු ව්‍යවස්ථාවේ නියමයන් හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි

වගන්තියේ (IX) වන උපවගන්තියේ (ඒ) ඡේදයෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යතුරු පැදි, ත්‍රීරෝද රථ හෝ ලොරි රථ මගින් දෛනික මාළු වෙළෙඳාම් සිදු කරන වෙළෙන්දන්ගෙන් පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් යම් කටයුත්තක් සම්බන්ධයෙන් එහි අනුරූපී සටහනේ II වැනි තීරුවේ සඳහන් ගාස්තු 2022 වර්ෂය සඳහා පනවා අයකිරීමට මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය 1

I වැනි තීරුව	*II වැනි තීරුව* රු. ශත
මාළු වෙළෙඳාම් කරන යතුරු පැදියකින් හෝ ස්ථානයකින් දිනකට	200 0
ලොරි රථයකින් හෝ වෙනත් වාහනයකින් දිනකට	300 0

12-134/10

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා සංචාරක වෙළෙඳාම් සිදුකරන ස්ථානවලින් ගාස්තු අයකිරීම

මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 23 වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී තීරණ අංක 5.1.11.11 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. චමින්ද පුෂ්ප කුමාර,
සභාපති,
මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 23 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

2016.12.09 වැනි දින අංක 1997 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකර වැළඳ ගන්නා ලද ඌව පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.06.28 වැනි දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV(ඇ) කොටසේ පළ කරන ලද්ද වූ සංචාරක වෙළෙඳාම පිළිබඳ 23 වැනි අතුරු ව්‍යවස්ථාවේ නියමයන් හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ 1 වන උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංචාරක වෙළෙඳාම් සිදු කරන වෙළෙන්දන්ගෙන් හා ස්ථානවලින්, පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් යම් කටයුත්තක් සම්බන්ධයෙන් එහි අනුරූපී සටහනේ II වැනි තීරුවේ සඳහන් ගාස්තු 2022 වර්ෂය සඳහා පැනවීමට මූල්‍ය හා ප්‍රතිපත්ති කමිටුවේ දී තීරණය කරන ලදී. නමුත් ස්වයං රැකියාවක් ලෙස ආබාධිත අය විසින් වෙළෙඳාම් කටයුතු සිදු කරන අවස්ථාවල දී ඔවුන්ගේ ලිඛිත ඉල්ලීමක් මත මෙම ගාස්තු අය කිරීම නිදහස් කළ හැකි බවද මඩුල්ල ප්‍රාදේශීය සභාව තීරණය කරන්නීය.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව* රු. ශත
කුඩා පරිමාණ සංචාරක ව්‍යාපාරයකින් දිනකට (යතුරු පැදියකින්, පා පැදියකින් හෝ ත්‍රීරෝද රථයකින්)	50 0
මහා පරිමාණ සංචාරක වෙළෙඳාමක් සඳහා දිනකට (ලොරි රථයකින් හෝ වෙනත් වාහනයකින්)	100 0
තාවකාලික සංචාරක වෙළඳාම් සිදු කරන ස්ථානයකින්	200 0

12-134/11

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා වැලි, පස්, ගල් ප්‍රවාහනයේ දී ගාස්තු අයකිරීම

මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 23 වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී තීරණ අංක 5.1.11.12 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. චමින්ද පුෂ්ප කුමාර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මඩුල්ල.

2021 සැප්තැම්බර් මස 23 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

2016.12.09 වැනි දින අංක 1997 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළකර වැළඳ ගන්නා ලද ඌව පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.06.28 වැනි දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV(ඇ) කොටසේ පළ කරන ලද්දා වූ අංක 07 දරන මාර්ගවල ගමන් කරන වාහනවල බර හා වේග සීමා කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව හා අංක 8 දරන පාරවල් හා මංමාවත්වල බාධක, අවහිර කිරීම් හා අලාභහානි වැළැක්වීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා මගින් සලසා ඇති ප්‍රතිපාදන සැලකිල්ලට ගනිමින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැනීම් කාර්යංශයෙන් නිකුත් කර ඇති බලපත්‍රයෙහි සඳහන් කියුබ් ප්‍රමාණය අනුව එක් කියුබ් 1 කින් රු. 150 0 ක මුදලක් අය කිරීමට මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12-134/12

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා පාරිසරික නිර්දේශ ලබාදීමේ දී ගාස්තු අයකිරීම

මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 23 වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී තීරණ අංක 5.1.11.13 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. චමින්ද පුෂ්ප කුමාර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මඩුල්ල.

2021 සැප්තැම්බර් මස 23 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.
-

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ 1 වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, වානිජමය කටයුත්තක් උදෙසා වැලි කැනීම් බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය පාරිසරික නිර්දේශ ලබාදීමේ දී පරීක්ෂණ ගාස්තු වශයෙන් රු. 1000 0 ක මුදලක් අයකිරීමට මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12-134/13

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ත්‍රීරෝද රථවලින් ගාස්තු අයකිරීම

මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 23 වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී තීරණ අංක 5.1.11.14 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. චමින්ද පුෂ්ප කුමාර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මඩුල්ල.

2021 සැප්තැම්බර් මස 23 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.
-

යෝජනාව

2016.12.09 වැනි දින අංක 1997 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකර වැළඳ ගන්නා ලද ඌව පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.06.28 වැනි දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළ කරන ලද්දා වූ අංක 08 දරන පාරවල් හා මංමාවත්වල බාධක අවහිර කිරීම් හා අලාභහානි වැලැක්වීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා මගින් සලසා ඇති බලතල ප්‍රකාරව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 34 වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, මඩුල්ල ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යනු ලබන ත්‍රීවීල් රථාංගනයක පවතින ත්‍රීරෝද රථයකින් වාර්ෂිකව රු. 1,200 ක මුදලක් අය කිරීමට මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12-134/14

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා දැව ප්‍රවාහනය කිරීමේ දී ගාස්තු අයකිරීම

මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 23 වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී තීරණ අංක 5.1.11.15 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. චමින්ද පුෂ්ප කුමාර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මඩුල්ල.

2021 සැප්තැම්බර් මස 23 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

2016.12.09 වැනි දින අංක 1997 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකර වැළඳ ගන්නා ලද ඌව පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.06.28 වැනි දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළ කරන ලද්ද වූ අංක 07 දරන මාර්ගවල ගමන් කරන වාහනවල බර හා වේග සීමා කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව හා අංක 8 දරන පාරවල් හා මංමාවත්වල බාධක, අවහිර කිරීම් හා අලාභහානි වැළැක්වීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා මගින් සලසා ඇති බලතල ප්‍රකාරව, මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දැව ප්‍රවාහනය කිරීමේ දී ප්‍රාදේශීය අතුරු මාර්ග භාවිතා කරන්නේ නම් දැව ලොරි ලෝඩ් එකකින් රු. 5,000.00 ක මුදලක් ගාස්තු වශයෙන් අය කිරීමට මඩුල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12-134/15

මඩුල්ල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ජල ගාස්තු අය කිරීම

මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 23 වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී තීරණ අංක 5.1.11.16 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. චමින්ද පුෂ්ප කුමාර,
සභාපති,
මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 23 වැනි දින,
මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

2016.12.09 වැනි දින අංක 1997 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකර වැළඳ ගන්නා ලද 1989 අංක 32 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වගන්තියේ 1 වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ 1 වන උප වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව, ඌව පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.01.22 වැනි දින අංක 1794/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දා වූ ප්‍රජාමූල සංවිධාන කළමනාකරණය කරනු ලබන ග්‍රාමීය ජල සම්පාදන ක්‍රම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාවේ නියමයන් හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වගන්තියේ XIII උප වගන්තියේ (ඔ) ඡේදයෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව, මඩුල්ල ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ ගෘහස්ථ ජල සැපයුම් සඳහා අය කරන ගාස්තු උපලේඛන 1 හි ද වාණිජ ජල සැපයුම් සඳහා අයකරන ගාස්තු උපලේඛන 2 හි ද ජල ව්‍යාපෘති සම්බන්ධ මූලික තොරතුරු උපලේඛන 3 හි ද පහත පරිදි දක්වා ඇත.

උපලේඛන I

මුදල	ඒකකය	ඒකකයක මිල	මුළු මුදල
ගෘහස්ථ			
10	1	10	160
	2	20	170
	3	30	180
	4	40	190
	5	50	200
15	6	65	215
	7	80	230
	8	95	245
	9	110	260
	10	125	275
30	11	150	305
	12	185	335
	13	215	365
	14	245	395
	15	275	425
40	16	315	465
	17	355	505
	18	395	545
	19	435	585
	20	475	625

	21	535	685
	22	595	745
	23	655	805
	24	715	865
	25	775	925
	26	835	985
	27	895	1045
	28	955	1105
50	29	1015	1165
	30	1075	1225
	31	1135	1285
	32	1195	1345
	33	1255	1405
	34	1315	1465
	35	1375	1525
	36	1435	1585
	37	1505	1645
	45	1975	2125
	46	2035	2185
	47	2095	2245
	48	2155	2305
	49	2215	2365
	50	2275	2425
	51	2335	2485
	52	2395	2545
	53	2455	2605
	54	2515	2665
60	55	2575	2725
	56	2635	2785
	57	2695	2845
	58	2755	2905
	59	2815	2965
	60	2875	3025
	61	2935	3085
	62	2995	3145
	63	3055	3205
	64	3115	3265
	65	3175	3325

උපලේඛන 2			
මුදල	ඒකකය	ඒකකයක මිල	මුළු මුදල
වාණිජ			
	1	15	215
	2	30	230
	3	45	245
	4	60	260
	5	75	275
15	6	95	295
	7	115	315
	8	135	335
	9	155	355
	10	175	375
30	11	210	410
	12	245	445
	13	280	480
	14	315	515
	15	350	550
40	16	400	600
	17	450	650
	18	500	700
	19	550	750
	20	600	800
50	21	670	870
	22	740	940
	23	810	1010
	24	880	1080
	25	950	1150
	26	1020	1220
	27	1090	1290
	28	1160	1360
	29	1230	1430
	30	1300	1500
	31	1370	1570
	32	1440	1640
	33	1510	1710
	34	1580	1780
	35	1650	1850
	36	1720	1920
	37	1790	1990
60	45	1860	2060
	46	1930	2130
	47	2000	2200
	48	2070	2270
	49	2140	2340
	50	2210	2410

උපලේඛනය 3

ජල ව්‍යාපෘතියේ නම	ස්ථාවර තැන්පත් ගාස්තුව රු. ශ.	ගෘහස්ථ අනිවාර්ය ගාස්තුව රු. ශ.	වාණිජ අනිවාර්ය ගාස්තුව රු. ශ .	දඩ මුදල රු. ශ.
මකුල්ල	16,000 0	150 0	200 0	1%
කහගොල්ල	15,000 0	150 0		1%
හැකිරිල්ල	15,000 0	150 0		1%

12-134/16

දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය හා 149 වන වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර 20-21 ඔක්තෝබර් මස 21 දින පවත්වන ලද දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා මාසික මහා සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

කේ. වී. ඩී. ටී. විශ්ව ශාන්ත,
සභාපති,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 26 වැනි දින,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව.

ඉහත කී යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය හා 149 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2022 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2022 වර්ෂය සඳහා නියම විය යුතු බවටද,

තවද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පලක් වන විටදී ඊට අදාළ බලපත්‍ර ලබා දීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2021 වර්ෂයේ ලැබීම්වලින් 1%ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2022 වර්ෂය සඳහා නියම කළ යුතු බව යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව*		
බලය දෙනු ලබන කාර්යය		*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ට ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාව*	*රු. 1,500 ඉක්මවන අවස්ථාව*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩා කර තැබීම	500 0	750 0	1,000 0
02.	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
03.	සම් විකිණීම	500 0	750 0	1,000 0
04.	සත්ත්ව පාලනය (මස් හෝ බිත්තර)	500 0	750 0	1,000 0
05.	ඡායාරූප ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
06.	පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
07.	විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
08.	කරවල, ලුණු මාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 150 කට වඩා තබා ගැනීම	500 0	750 0	1,000 0
09.	පොල් කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
10.	දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වා ගැනීම	500 0	750 0	1,000 0
11.	සත්ත්ව ආහාර නිපදවීම හෝ සත්ත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
12.	පුන්නක්කු නිපදවීම හෝ කිලෝ ග්‍රෑම් 200 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
13.	සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
14.	සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	500 0	750 0	1,000 0
15.	අළුත් හෝ පරණ ලෝහ ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
16.	ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වා ගැනීම	500 0	750 0	1,000 0
17.	ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
18.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
19.	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
20.	සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
21.	රස කැවිලි වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
22.	පොල්ලෙලි පෙඟවීම (හෝ පල් කිරීම)	500 0	750 0	1,000 0
23.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
24.	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
25.	රා එකතු කිරීම	500 0	750 0	1,000 0
26.	විනාකිරි නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
27.	යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පවත්වා ගැනීම	500 0	750 0	1,000 0
28.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
29.	සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0
30.	සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
31.	පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
32.	මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග මාංශ භෝග, කුළුබඩු හෝ කිරිපිටි ඇඹරීම සඳහා අඹරුම්හලක් පවත්වා ගැනීම	500 0	750 0	1,000 0
33.	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
34.	කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
35.	ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් නිපදවීම	500 0	750 0	1,000 0
36.	රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
	බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ට ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාව*	*රු. 1,500 ඉක්මවන අවස්ථාව*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
37.	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
38.	සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වා ගැනීම	500 0	750 0	1,000 0
39.	පාසල් රටහුණු නිපදවීම	500 0	750 0	1,000 0
40.	ටයර් හෝ ටියුබ් 50කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
41.	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
42.	ටයර් ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වා ගැනීම	500 0	750 0	1,000 0
43.	සිමෙන්ති කිලෝග්‍රෑම් 1000 වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
44.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
45.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
46.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
47.	පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
48.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම	500 0	750 0	1,000 0
49.	ධාන්‍ය හෝ මාංශභෝග කිලෝ ග්‍රෑම් 250 කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0

අන්තරාදායක ව්‍යාපාර :

01.	තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝග්‍රෑම් 750 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
02.	මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
03.	මුද්‍රණාලයක් පවත්වා ගැනීම	500 0	750 0	1,000 0
04.	කුකුළන් 100 ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුළු ගාලක් හෝ කුකුළු කොටුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	එළුවන්, ඌරන් 10ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	ගඩොල් හෝ උළු ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
07.	දර ගබඩාවක් පවත්වාගැනීම	500 0	750 0	1,000 0
08.	කළුගල් කැඩීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්	500 0	750 0	1,000 0
09.	සිසිල් බීම නිෂ්පාදන හෝ සිසිල් බීම බෝතල් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
10.	අයිස්ක්‍රීම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
11.	පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
12.	ගිනි පෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
13.	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
14.	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
15.	ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
16.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම			

I වන තීරුව		*II වන තීරුව*		
බලය දෙනු ලබන කාර්යය		*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ට ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාව*	*රු. 1,500 ඉක්මවන අවස්ථාව*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
17.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හල් පැවැත්වීම	500 0	750 0	1,000 0
18.	හිස් ගෝනි හෝ බෝතල් ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0
19.	පා පැදි හෝ යතුරු පැදි අළුත්වැඩියා කිරීමේ වැඩපොළක් පවත්වාගැනීම	500 0	750 0	1,000 0
20.	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
21.	විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පවත්වා ගැනීම	500 0	750 0	1,000 0
22.	ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම හෝ නිපදවීම	500 0	750 0	1,000 0
23.	පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
24.	ශීතකළ මස් හෝ මාළු ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0
25.	දැව ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0

පීඩාකාරී හා අන්තරාදයක ව්‍යාපාර

01.	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු, එනසාල් හෝ කෙඳි කිරීම	500 0	750 0	1,000 0
02.	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
03.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
04.	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම, සකස් කිරීම හෝ අලුහුණු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
06.	බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගැනීම	500 0	750 0	1,000 0
07.	මෝටර් වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ගෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම	500 0	750 0	1,000 0
13.	වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
14.	ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	කිලෝග්‍රෑම් 150 ට වැඩියෙන් තේ කුඩු ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0
16.	වෑල්ඩින් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	ලියවන පට්ටලයක් භාවිත කරමින් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	පැට්‍රල්, ඩීසල්, තෙල් හෝ වෙනත් ඛණිජ තෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
20.	වායු සමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
21.	විදුලි කර්මාන්ත වැඩපොළක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අලුත්වැඩියා කිරීමේ වැඩ පොළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

I වැනි තීරුව	*II වැනි තීරුව*		
බලය දෙනු ලබන කාර්යය	*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
	රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ට ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාව*	*රු. 1,500 ඉක්මවන අවස්ථාව*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
වෙනත් ව්‍යාපාර			
01. බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02. හෝටලයක් හෝ ලැගුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03. භෝජන ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04. මාළු විකිණීම	500 0	750 0	1,000 0
05. මස් විකිණීම	500 0	750 0	1,000 0
06. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07. තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08. ශීතකරන ලද ආහාර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09. බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

12-321/1

දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර 2021 ඔක්තෝබර් මස 21 වැනි දින පවත්වන ලද දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා මාසික මහ සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

කේ. වී. ඩී. ටී. විශ්ව ශාන්ත,
සභාපති,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 26 වැනි දින,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූපිත සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2022 වර්ෂය සඳහා නියම අය කළ යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව*		
කර්මාන්තය		*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ට ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාව*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
03.	මෙට්ට නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
04.	බීඩි හෝ සුරුට්ටු එතීම	500 0	750 0	1,000 0
05.	පිංතූර රාමු කිරීම	500 0	750 0	1,000 0
06.	ගමන් මළු නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
07.	කලාත්මක භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
08.	ඔරලෝසු අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
09.	ගුවන්විදුලි, රූපවාහිනී අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0

12-321/2

දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර 2021 ඔක්තෝබර් මස 21 වැනි දින පවත්වන ලද දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා මාසික මහා සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

කේ. වී. ඩී. ටී. විශ්ව ශාන්ත,
සභාපති,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 26 වැනි දින,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එම පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2022 වර්ෂයේදී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2021 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II වැනි තීරුවේ අනුරූපිත සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2022 වර්ෂය සඳහා නියම අය කළ යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*
2021 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම	*රු. ශත*
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක	3,000 0

12-321/3

දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ විධිවිධාන යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර 2021 ඔක්තෝබර් මස 21 වැනි දින පවත්වන ලද දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා මාසික මහා සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

කේ. වී. ඩී. ටී. විශ්ව ශාන්ත,
සභාපති,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 26 වැනි දින,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව ඇතුළත පිහිටියා වූ ද ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ හෙක්ටයාර් එකක් මත 2022 වර්ෂය සඳහා රු. 10.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අයකළ යුතු බවට යෝජනා කරමි.

තව ද, 2022 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික අක්කර බද්ද දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික අක්කර බද්ද 2022 වර්ෂයෙහි ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික අක්කර බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ III වැනි තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ අක්කර බදු මුදල දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක් කාර්තුවකට අදාළ මුදලින් 5% ක වට්ටමක් ද දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවටත් යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරුව *කාර්තුව*		*II වැනි තීරුව* *ගෙවිය යුතු දිනය*	*III වැනි තීරුව* *5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමු කාර්තුව	-	මාර්තු මස 31 වැනි දිනට පෙර	2022.01.31
දෙවන කාර්තුව	-	ජූනි මස 30 වැනි දිනට පෙර	2022.04.30
තුන්වන කාර්තුව	-	සැප්තැම්බර් මස 30 වැනි දිනට පෙර	2022.07.31
හතරවන කාර්තුව	-	දෙසැම්බර් 31වැනි දිනට පෙර	2022.10.31

12-321/4

දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය හා 148 වැනි වගන්තියේ විධිවිධාන යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර 2021 ඔක්තෝබර් මස 21 වැනි දින පවත්වන ලද දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා මාසික මහා සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

කේ. වී. ඩී. ටී. විශ්ව ශාන්ත,
සභාපති,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 26 වැනි දින,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය හා 148 වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පහත උපලේඛනයෙහි දැක්වෙන ආකාරයට වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් දෙඩන්ඩගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2022 වර්ෂයට අදාළව නියම කර අය කිරීමට යෝජනා කරමි.

	රු. ශත
මෝටර් රථයක්, මෝටර් ට්‍රයි කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජීන් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක්ම සඳහා	25 0
සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා	
(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
(ආ) වෙළෙඳ කාර්යයක් සඳහා නොවන කාර්යයකට යොදවන්නේ නම්	4 0
සෑම කරත්තයක් සඳහා	20 0
සෑම අත්කරත්තයක් සඳහා	10 0
සෑම රික්ෂෝවක් සඳහා	7 50
සෑම අශ්වයෙකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා	15 0
සෑම ඇතකු සඳහා	50 0

විශ්කම්භය අගල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල් බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළෙඳ කාර්යය සඳහා නොයොදවන අත්කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

දක්වා ඇති උපලේඛනයේ "වෙළෙඳ කාර්යය" යන්නට විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත *නැතහොත්* මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12-321/5

දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට අදාළව සේවා සැපයීම වෙනුවෙන් ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (XIV) වන වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර 2021 ඔක්තෝබර් මස 21 වැනි දින පවත්වන ලද දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා මාසික මහා සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

කේ. වී. ඩී. ටී. විශ්ව ශාන්ත,
සභාපති,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 26 වැනි දින,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව.

ඉහත කී යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(XIV) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016.02.23 දිනැති 1999 අංක දරන *ගැසට් පත්‍රය* ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2015.12.28 වන දිනැති 1947/6 අංක දරන *ගැසට් පත්‍රයේ* පල කරන ලද බස්නාහිර පළාතේ, පළාත් සභාව විසින් සම්මත කරන ලද අතුරු ව්‍යවස්ථාවේ සේවා සඳහා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2022 වර්ෂයට අදාළව සේවා සැපයීම වෙනුවෙන් පහත ගාස්තු අය කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

01. *ඉල්ලුම්පත් නිකුත් කිරීම :*

ඉල්ලුම්පත	*ගාස්තුව රු. ශත*
සභාව මගින් පවත්වාගෙන යනු ලබන පෙර පාසල් සඳහා ඇතුළත්වීමේ ඉල්ලුම්පත්‍රය	100 0
සභාව මගින් පවත්වාගෙන යන පුස්තකාල නව සාමාජිකත්වය සඳහා ඉල්ලුම්පත්‍රය	100 0
සභාව මගින් පවත්වාගෙන යන පුස්තකාල නව සාමාජිකත්වය අලුත්කිරීම සඳහා ඉල්ලුම්පත්‍රය	50 0
වරිපනම් ලේඛනයේ උධෘත ලබා ගැනීම සඳහා ඉල්ලම්පත්‍රය	100 0
අනතුරුදායක ගස් ඉවත් කිරීමට අදාළ අයදුම්පත්‍රය	500 0
වරිපනම් ලේඛනයේ නම සංශෝධනය කිරීම සඳහා ඉල්ලුම්පත්‍රය	100 0

2. *සහතිකපත් සඳහා ගාස්තුව :*

සහතික වර්ගය	*ගාස්තුව රු. ශත*
1. වීථිරේඛා සහතික	500 0
2. නොපවරාගැනීමේ සහතිකය	500 0
3. වරිපනම් ලේඛන ආශ්‍රයෙන් හිමිකම් පිළිබඳ සහතික	400 0
4. වරිපනම් ලේඛනවල උධෘත සනාථ කිරීමේ සහතික	100 0
5. නිකුත් කරන ලද තක්සේරු නිවේදන සහතික කරන ලද පිටපත	50 0

දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට අදාළව සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර 2021 ඔක්තෝබර් මස 21 වැනි දින පවත්වන ලද දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා මාසික මහා සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

කේ. වී. ඩී. ටී. විශ්ව ශාන්ත,
සභාපති,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 26 වැනි දින,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තිය ප්‍රකාරව දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් සඳහා එම ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට 2 වන බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත් එම බද්දේ කාර්යය සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 (1) (ආ) ඡේදය යටතේ වන සමානුපාතය වශයෙන් එම ඉඩමේ ගොඩනැගිලිවලින් ආවරණය වූ බිම් ප්‍රමාණය සහ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර අනුපාතය 3:5 විය යුතු බවටත් යෝජනා කරමි.

12-321/7

දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර 2021 ඔක්තෝබර් මස 21 වැනි දින පවත්වන ලද දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා මාසික මහා සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

කේ. වී. ඩී. ටී. විශ්ව ශාන්ත,
සභාපති,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 26 වැනි දින,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ දෙඩන්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006.09.08 වැනි දිනැති *ගැසට් පත්‍රය* යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශයක් යැයි ප්‍රකාශයට පත් කර ඇත්තාවූ ප්‍රදේශ ඇතුළත පිහිටියාවූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2021 වර්ෂයේ තක්සේරුව 2022 වර්ෂය සඳහා වන තක්සේරුව ලෙස සම්මත කළ යුතු බවටත් එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් සියයට පහක (5%) වාර්ෂික වරිපනම් බද්දක් නියම කළ යුතු බවට යෝජනා කරමි.

තවද, 2022 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත් එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2022 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ III වැනි තීරුවේ නිරූපත දිනයට පෙර අදළ වරිපනම් බදු මුදල දෙඩන්ගොඩ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවට අදල මුදලින් සියයට පහක (5%)ක වට්ටමක්ද දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවටත් යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරුව *කාර්තුව*	*II වැනි තීරුව* *ගෙවිය යුතු දිනය*	*III වැනි තීරුව* *5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
1 කාර්තුව	2022 මාර්තු මස 31 වන දිනට පෙර	2022.01.31
2 කාර්තුව	2022 ජූනි මස 30 වැනි දිනට පෙර	2022.04.30
3 කාර්තුව	2022 සැප්තැම්බර් මස 30 වැනි දිනට පෙර	2022.07.31
4 කාර්තුව	2022 දෙසැම්බර් මස 31 වැනි දිනට පෙර	2022.10.31

12-321/8

දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට අදාළව ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රචාරක දැන්වීම් ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (VII) (ඊ) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර 2021 ඔක්තෝබර් මස 21 වැනි දින පවත්වන ලද දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා මාසික මහා සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

කේ. වී. ඩී. ටී. විශ්ව ශාන්ත,
සභාපති,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 26 වැනි දින,
දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (VII) (ඊ) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016.12.23 දිනැති 1999 අංක දරන *ගැසට් පත්‍රය* ප්‍රකාරව දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව වැළඳ ගන්නා ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2015.12.28 වැනි දිනැති 1947/6 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද බස්නාහිර පළාතේ, පළාත් සභාව විසින් සම්මත කරන ලද අතුරු ව්‍යවස්ථාවේ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා 2022 වර්ෂයට අදාළව ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් පහත ගාස්තු නියම කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අනු අංකය	*ප්‍රචාරුවේ ස්වභාවය*	*වර්ග මීටර් ප්‍රමාණය*	*ගාස්තුව රුපියල්*		
			මාස 03 ට අඩු	*මාස 03 හෝ 06 අතර*	*වසරක්*
01	කිසියම් බිත්තියක හෝ තාප්පයක ප්‍රචාරනය කරනු ලබන ප්‍රචාරක දැන්වීමක්	1 ට අඩු	250	350	500
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
02	රෙදි, ඩිජිටල් බැනර් සඳහා	3 ට අඩු	250	350	500
2022 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

මහව ප්‍රාදේශීය සභාව විසින් 2021 සැප්තැම්බර් මස 28 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 06/2021/46/105/04 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා අක්කර බද්ද මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදීම සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2022 වර්ෂයේ ජනවාරි මස 31 ට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

එච්. පියසේන,
සභාපති,
මහව ප්‍රාදේශීය සභාව.

2021 ඔක්තෝබර් මස 14 වැනි දින,
මහව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

2022 වර්ෂය සඳහා අක්කර බදු පැනවීමේ යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2021 වර්ෂයේ දී බලාත්මක කරන ලද සත්‍යාක්ෂණය කිරීම 2022 වර්ෂය සඳහා ද පිළිගැනීමටත්, එකී පනතේ 134 වන වගන්තියේ (3) වන උපලේඛනයෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියාවූ ද ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා ද ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ,

(අ) හෙක්ටයාර් 05 හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන් ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් ම මත 2022 වර්ෂය සඳහා රුපියල් 10/- (දහය) බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ආ) ඉහත කී පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් අතුරු විධානය යටතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) වැනි කොටසේ 1989.03.10 දිනැති ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර ඇති හෙයින්, හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත 2022 වර්ෂය සඳහා රු. 50/- (පනහක්) බැගින් වන වාර්ෂික අමතර බද්දක් පනවා අය කිරීමටත්,

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උප වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කළ යුතු යැයි ද මහව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

2022 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2022 ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද ඒ එක්

එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) ක වට්ටමක් ද, දෙනු ලබන බවට මහව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12-279/5

මහව ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

මහව ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 28 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 06/2021/46/105/04 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ. ඒ අනුව මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත් වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකුම විසින් එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින 30ක් සම්පූර්ණ වූ වහාම 2022 වර්ෂය සඳහා වන මෙම බද්ද මහව ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බව ද, වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. පියසේන,
සභාපති,
මහව ප්‍රාදේශීය සභාව.

2021 ඔක්තෝබර් මස 14 වැනි දින,
මහව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

2022 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම සඳහා වූ යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය හා (04) වැනි උපලේඛනවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2022 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මත ම එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එකී බලපත්‍ර ගාස්තුව මහව ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවන ලෙස සභාවේ ලේකම්වරයා විසින් නිවේදනය කරන දින සිට දින 07ක් ඇතුළත ගෙවිය යුතු බවටත් මහව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

අනු. අංකය		*I වැනි තීරුව*	*II වැනි තීරුව* ගෙවිය යුතු බද්ද රු. ශත
01.	I	මෝටර් රථයක්, මෝටර් ට්‍රයි කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජීන් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
	II	සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකලයක්, කරත්තයක්, හෝ බයිසිකල් කරත්තයක් සඳහා -	
		(අ) වෙළෙඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම්	18 0
		(ආ) වෙළෙඳ නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම්	4 0

අනු. අංකය	I වැනි තීරුව	II වැනි තීරුව ගෙවිය යුතු බද්ද රු. ශත
III	සෑම කරත්තයක් සඳහා	20 0
IV	සෑම අත්කරත්තයක් සඳහා	10 0
V	සෑම රික්ෂෝවක් සඳහා	7 50
VI	සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවකු සඳහා	15 0
VII	සෑම ඇතෙකු සඳහා	50 0

02.විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

03.ඉහත සඳහන් වෙළෙඳ කාර්යය යන්නට විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළෙඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12-279/6

මහව ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා සපයනු ලබන සේවාවන් වෙනුවෙන් ගාස්තු පැනවීම

මහව ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 28 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 6/2021/46/105/04 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. පියසේන,
සභාපති,
මහව ප්‍රාදේශීය සභාව.

2021 ඔක්තෝබර් මස 14 වැනි දින,
මහව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

2022 වර්ෂය සඳහා සපයනු ලබන සේවාවන් වෙනුවෙන් ගාස්තු පැනවීම සඳහා වූ යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවකින් හෝ වෙනයම් නීතියකින් පැනවී ඇති බලතල අනුව මෙහි පහත සඳහන් එක් එක් කාර්යය සඳහා එය ඉදිරියෙන් දක්වා ඇති ගාස්තු ප්‍රමාණයන් 2022 වර්ෂයේ දී ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

	රු. ශත
01. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
02. කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම	1,000 0
03. පුස්තකාල සාමාජිකත්වය ලබා ගැනීම	-

	සාමාජික ගාස්තුව රු. ශත	සාමාජිකත්වය අලුත් කිරීම රු. ශත
වැඩිහිටියන් සඳහා	60 0	45 0
ළමුන් සඳහා	40 0	30 0

04. ජල සැපයුම් අයදුම්පත්‍ර නිකුත් කිරීම	50 0
05. පුස්තකාල අයදුම්පත්‍ර ගාස්තු	10 0
06. වරිපනම් තක්සේරු ලේඛනයේ නම වෙනස් කිරීම	50 0
07. ප්‍රසිද්ධ රැගුම් බලපත්‍ර - සංදර්ශන සඳහා දිනකට	1,000 0
08. ක්‍රීඩා පිටිය කුලියට දීම - එක් දිනකට :	
I. දිගන ක්‍රීඩා පිටිය සඳහා	
සංගීත සංදර්ශනයක් හෝ වෙනත් විනෝද කටයුත්තක් සඳහා දිනකට	10,000 0
වෙනත් කාර්යයන් සඳහා දිනකට	5,000 0
II. දළදාගම ක්‍රීඩා පිටිය සඳහා	
සංගීත සංදර්ශනයක් හෝ වෙනත් විනෝද කටයුත්තක් සඳහා දිනකට	10,000 0
වෙනත් කාර්යයන් සඳහා දිනකට	2,000 0
III. අනෙකුත් ක්‍රීඩාපිටි සඳහා	
සංගීත සංදර්ශනයන් සඳහා දිනකට	5,000 0
වෙනත් කාර්යයන් සඳහා දිනකට	2,000 0
IV. පොදු වෙළෙඳපළ භූමිය සඳහා දිනකට	5,000 0
V. තාවකාලික වෙළෙඳ කුටි සඳහා මසකට හෝ ඊට අඩු කාලයක් සඳහා	3,000 0
09. පරිසර බලපත්‍ර සඳහා ඉල්ලුම් පත්‍ර ගාස්තු	100 0
10. පරිසර බලපත්‍ර සඳහා අලුත් කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තු	50 0
11. සහතික පිටපත් නිකුත් කිරීම හා ඉල්ලීම් මත ලිපි නිකුත් කිරීම සඳහා	
එක් පිටපතකට හෝ එක් ලිපියකට	100 0
12. අලෙවි ප්‍රවර්ධන කාර්යයන් සඳහා ගාස්තු අය කිරීම - දිනකට	2,000 0
13. ජල සැපයුම් ප්‍රතිසන්ධි ගාස්තු	400 0
14. ජල බවුසරය මගින් ජලය ලබාදීමේ දී අය කරනු ලබන ගාස්තු	
I. පානීය ජලය සැපයීමේ දී යාමට හා ඒමට කි. මී. 2.5 ක දුරක් වන විට	1,200 0
ඊට වැඩි වන කි. මී. 1 හෝ ඉන් කොටසකට	50 0

	රු. ශත
බවුසරය නතර කර තබන්නේ නම් පැය 12ක දිනක් සඳහා	6,000 0
II. වෙනත් කාර්යයන් සඳහා ජලය ප්‍රවාහනය (මාර්ග සකස් කිරීමේ කටයුතු සඳහා බොරළු තැලීම, ABC තැලීම)	
පැය 4ක් හෝ ඊට පසු කාලයක් සඳහා	3,000 0
පැය 8 ක දිනක් සඳහා	6,000 0
15. විටී රේඛා සහතික නිකුත් කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තුව	100 0
16. පිඹුරු අනුමත කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තුව	100 0
17. ගොඩනැගිලි අනුමත කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තුව	500 0

18. ගොඩනැගිලි ඉදිකිරීම/ පවත්නා ගොඩනැගිලිවලට අලුතින් කොටසක් එකතු කිරීම/ නැවත ඉදිකිරීම (නාගරික නොවන බල ප්‍රදේශ) අයකළ යුතු පෙරසැරි ගාස්තුව

ගෙබිමේ විශාලත්වය වර්ග මීටර්වලින්	*පදිංචිය සඳහා රු.*	*වානිජ හෝ වෙනත් රු.*
45 ට අඩු	500 0	1,000 0
45 - 90	1,000 0	1,500 0
91 - 180	2,000 0	2,500 0
181 - 270	3,000 0	3,500 0
271 - 450	4,000 0	5,500 0
451 - 675	5,000 0	7,500 0
676 - 900	6,000 0	9,500 0
901 - 1,225	7,000 0	11,500 0
1,225 ඉක්මවන විට සෑම වර්ග මීටර් 90 ක් සඳහා අත්තිකාරම් මුදලක් ගෙවීම	750 0 බැගින්	1,000 0 බැගින්

19.මායිම් තාප්ප/ආරක්ෂක බැම් ඉදිකිරීම සඳහා අය කළයුතු ගාස්තු (නාගරික නොවන බල ප්‍රදේශ)

විස්තරය	*නේවාසික දික් මීටර් 1 ක් සඳහා රු. ශත*	*වානිජ හා වෙනත් දික් මීටර් 1 ක් සඳහා රු. ශත*
ගොඩනැගිලි සීමාවෙන් පිටත	200 0	300 0
ගොඩනැගිලි සීමාව තුළ	400 0	500 0

20. ඉඩම්/කුඹුරු/පහත් බිම් ගොඩ කිරීම සඳහා අය කිරීම (නාගරික නොවන බල ප්‍රදේශ)
    - ව. මී. 150 ට අඩු රු. 1,250 සහ එයට වැඩි සෑම ව.මී. 150 කට රු. 750.00 බැගින්

21. දුරකථන කුළුණු/ ඇන්ටනා කුළුණු ඉදිකිරීම සඳහා අය කිරීම (නාගරික නොවන බල ප්‍රදේශ)
    - උස මීටර් 5 - 20 දක්වා රු. 25,000 ක් සහ වැඩි වන සෑම මීටර් 01 කට රු. 100.00 බැගින් හා සංවර්ධන ආධාර ලෙස රු. 2,00,000 බැගින් වන මුදලක්

22. විශේෂ ව්‍යාපෘති සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම සඳහා අය කිරීම (නාගරික නොවන බල ප්‍රදේශ)
    - රුපියල් මිලියන 05 කට රුපියල් 4,000 සහ වැඩිවන සෑම රුපියල් මිලියන 1 කට රු. 75.00 බැගින්

23. අනුකූලතා ප්‍රදානය කිරීමේ ගාස්තු (නාගරික නොවන බල ප්‍රදේශ)

    - නේවාසික ඉදිකිරීම් :
      ව. මීටර් 300 ට අඩු රු. 2,500 සහ ඊට මායිම් වන සෑම ව. මී. 1 ටම රු. 10 බැගින්
    - වානිජ ඉදිකිරීම :
      ව. මී. 1,000 ට අඩු රු. 2,500 සහ ඊට වැඩිවන සෑම ව. මී. 1 ටම රු. 15 බැගින්
    - මායිම් තාප්ප/ආරක්ෂක බැමි ඉදිකිරීම :
      පළමු දික් මීටර් 100 සඳහා රු. 750ක් සහ ඊට වැඩිවන සෑම මීටර් 1 ටම රු. 10 බැගින්
    - දුරකථන විදුලි සංදේශ කුළුණු :
      උස මීටර් 5 -20 දක්වා රු. 1,500 සහ ඊට වැඩි වන සෑම මීටර් 01 ටම රු. 75 බැගින්

24. I. නිසි සංවර්ධන බලපත්‍රයකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම/කොටස් එකතු කිරීම/නැවත ඉදිකිරීම (නාගරික නොවන බල ප්‍රදේශ)

විස්තරය	*නේවාසික වර්ග අඩි 01 රු.*	*ව්‍යාපාරික වර්ග අඩි 01 රු.*
අත්තිවාරම මට්ටම දක්වා	2	4
බිත්ති මට්ටම දක්වා	3	6
සම්පූර්ණ ඉදිකිරීම	4	10
මායිම් තාප්ප/ආරක්ෂක බැමි ඉදිකිරීම	5	10

II. ඉඩම්/කුඹුරු ගොඩ කිරීම :

සෑම වර්ග මීටර් 150 ටම රු. 5,000 බැගින්

III. දුරකථන/විදුලි සංදේශ කුළුණු :

සෑම උස මීටර් 05 ටම රු. 10,000 බැගින්

25. අනුකූලතා සහතිකය නොමැතිව පදිංචි වීම/ භාවිත කිරීම හෝ ප්‍රයෝජන ගැනීම සඳහා අය කිරීම් (නාගරික නොවන බල ප්‍රදේශ) එක් දිනකට රු. 25 0 බැගින්

26. ගොඩනැගිලි අයදුම්පත්‍ර කාලය දීර්ඝ කිරීම සඳහා අය කිරීම (නාගරික නොවන බල ප්‍රදේශ) එක් වර්ෂයකට රු. 500 බැගින්

	රු. ශ.
27. වීථි රේඛා අනුමත කිරීම	600 0
තැන්පත්	100 0
පිඹුරු අනුමත කිරීම එක් කැබැල්ලකට	250 0

28. ප්‍රචාරක දැන්වීම් හෝ බැනර් ප්‍රදර්ශනය කිරීම :

(i)	මාස 03කට අඩු බැනරයක් හෝ බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කිරීම කරනු ලබන ප්‍රචාරක දැන්වීමකට වර්ග අඩි 01 ට	30 00
(ii)	මාස 03කට වැඩි, මාස 06කට අඩු බැනරයක් හෝ බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කිරීම - වර්ග අඩි 01කට	40 0
(iii)	මාස 06කට වැඩි අවුරුද්දකට අඩු බැනරයක් හෝ බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කිරීම - වර්ග අඩි 01කට	50 0

29. නගර ශාලාවේ ගාස්තු අයකිරීම :

I. මංගල උත්සවයක් වෙනුවෙන් (එක් දිනක් සඳහා)

දිවා කාලය සඳහා	රු. 30,000 0
රාත්‍රිකාලය සඳහා	රු. 35,000 0

II. අලෙවි ප්‍රවර්ධන වැඩ සටහනක් හෝ විනෝදාත්මක කටයුත්තක් පැවැත්වීම සඳහා (සංගීත සංදර්ශන, චිත්‍රපට පෙන්වීම, වේදිකා නාට්‍ය) එක් දිනක් හෝ ඉන් කොටසකට රු. 10,000 0

එක් පුද්ගලයෙකු හෝ එක් ආයතනයක් විසින් එකවර දින තුනකට වැඩි දින ගණනක් නගර ශාලාව වෙන්කරයි නම්, මුල් දින තුන සඳහා රු. 10,000 බැගිනුත්, වැඩිවන සෑම දිනක් සඳහාම දිනකට රු. 5,000 බැගින් අය කෙරේ.

III. අධ්‍යාපනික, සම්මන්ත්‍රණ, දේශන වැනි වැඩසටහනක් සඳහා (එක් දිනක් හෝ ඉන් කොටසක් සඳහා) රු. 5,000 0

30. ත්‍රිරෝද රථ නැවතුම් ස්ථානය සඳහා ත්‍රිරෝද රථ ගාස්තුව (වාර්ෂික) රු. 1,000 0

31. ආදාහනාගාරය සඳහා ගාස්තු අය කිරීම :

- බල ප්‍රදේශය තුළ පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට රු. 8,000 0
- බල ප්‍රදේශය පිට පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට රු. 9,000 0
- ඉපලෝගම කොට්ඨාසයේ පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට රු. 7,000 0

32. ප්‍රාදේශීය සභාව සතු යන්ත්‍ර කුලියට දීමේ දී අයකරනු ලබන ගාස්තු :

යන්ත්‍රය	*ඉන්ධන සහිතව පැය 01ක් සඳහා අයකරන මුදල* රු.	*ගෙවිය යුතු අවම පැය ගණන*
මෝටර් ග්‍රේඩරය	4,410 0	6
බැකෝ යන්ත්‍රය	3,000 0	6
මාර්ග තලනය	3,000 0	4
කියුබ් 3 ටිපර් රථය	දිනකට 13,250 0	8
තණකොල කපන ට්‍රැක්ටරය		
• රාජ්‍ය අංශය	6,000 0	8
• පෞද්ගලික අංශය	8,000.00	

(මහව සභාව විසින් වරින් වර සිදුකරනු ලබන ගාස්තු සංශෝධනයන්ට අනුව ඉහත ගාස්තු වෙනස් විය හැක.)

33. මහව බස්නැවතුම්පොල ගාස්තු අයකිරීම :

බස්නැවතුම්පොලට ඇතුළත් වන සෑම මගී බස් රථයකින්ම දිනකට	රු. 50 0

34. කොඩිකණු හා ප්ලාස්ටික් පුටු ලබා දීම

• කොඩි කණු 01 ක් එක් දිනක් සඳහා	රු. 10 0
• පුටු 01ක් එක් දිනක් සඳහා	රු. 5 0

12-279/7

මහව ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

මහව ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 28 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 06/2021/46/105/04 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2021 වර්ෂය සඳහා පනවන ලද ඒ සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. පියසේන,
සභාපති,
මහව ප්‍රාදේශීය සභාව.

2021 ඔක්තෝබර් මස 14 වැනි දින,
මහව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්, හෝ
(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටෙක, හෝ
(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 60% (සියයට හැටට) වඩා අඩු වන්නේ නම්,

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2022 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට 1% (සියයට එකක) වාර්ෂික බද්දක් පැනවීමටත් එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2022 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර මහව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට විධාන කළ යුතු යැයි මහව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12-279/8

හෝමාගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියෙන් හෝමාගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2021 වර්ෂයේ නොවැම්බර් මස 16 වැනි දින පවත්වන ලද හෝමාගම ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

සම්පත් චමින්ද ජයසිංහ,
සභාපති,
හෝමාගම ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 22 වැනි දින,
හෝමාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 (1) වැනි උපවගන්තියෙන් හෝමාගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1026 හා 1998.04.30 දිනැති ගැසට් පත්‍රයේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත්කර ඇත්තා වූ ප්‍රදේශ ඇතුළත පිහිටියා වූ සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා,

1. හෝමාගම කලාපයේ උපලේඛන අංක 01 සඳහන් කොට්ඨාස සඳහා 2021 වර්ෂය සඳහා වූ තක්සේරුව 2022 වර්ෂයේ තක්සේරුව ලෙස සම්මත කළ යුතු බවටත්,
2. හෝමාගම කලාපයේ උපලේඛන අංක 02 සඳහන් කොට්ඨාස සඳහා 2021 වර්ෂය සඳහා වූ තක්සේරුව 2022 වර්ෂයේ තක්සේරුව ලෙස සම්මත කළ යුතු බවටත්,
3. වෑතර කලාපය උපලේඛන අංක 03 සඳහන් කොට්ඨාස සඳහා 2018 වර්ෂය සඳහා වූ තක්සේරුව 2022 වර්ෂයේ තක්සේරුව ලෙස සම්මත කළ යුතු බවටත්,

එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපල මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් 7% ක වාර්ෂික වරිපනම් බද්දක් නියම කළ යුතු බවට යෝජනා කරමි.

තවද, 2022 වර්ෂයෙහි උපලේඛන අංක 4 හි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද හෝමාගම ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2022 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දිනට හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදළ වරිපනම් බදු මුදල හෝමාගම ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක් කාර්තුවකට අදාළ මුදලින් 5% වට්ටමක් ද හෝමාගම ප්‍රාදේශීය සභාව ලබාදිය යුතු බවටත් යෝජනා කරමි.

උලලේඛන අංක 01

අංකය	කොට්ඨාස පාර
01	අතුරුගිරිය පාර (වම) අතුරුගිරිය පාර 02 පටුමග වටරවුම පාර දකුණ වටරවුම පාර 01 පටුමග (දකුණ) වටරවුම පාර 02 පටමුග (වම) කොළඹ පාර (දකුණ)

අංකය	කොට්ඨාස පාර
01	01 වැනි හරස් පාර (දකුණ) 02 වැනි හරස් පාර (දකුණ) 03 වැනි හරස් පාර (දකුණ) 04 වැනි හරස් පාර (දකුණ) දර්ශන පාර (වම) දේවාල පාර (දකුණ) ගලවිල පාර (දකුණ) ගලවිල පාර 04 පටුමග (වය මාවත) දකුණ ගැමුණු මාවත (වම) හබන්හේනවත්ත 05 වැනි පටුමග (සැනසුම් මාවත වම) රෝහල පාර (වම) පිංකෙත පාර 03 පටුමග (වම) සමන් මාවත (වම) දුම්රියපළ පාර (වම) වලව්ව පාර (වම)
02	කොළඹ පාර (වම) දුටුගැමුණු මාවත (වම) කටුවාන පාර (දකුණ) මාගම්මන පාර (වම) නියදගල පාර (වම) ප්‍රගති මාවත (වම) තිස්ස මාවත (දකුණ) විදර්ශනා මාවත (වම) විදර්ශනා මාවත 04 වැනි පටුමග (වම) විදර්ශනා මාවත 05 වැනි පටුමග (වම)
03	අවිස්සාවේල්ල පාර (වම) වටරවුම් පාර (ප්‍රගති මාවත වම) කටුවාන කර්මාන්ත පුර වටරවුම් පාර (වම) කටුවාන කර්මාන්තපුර ඇතුළත වටරවුම් පාර (වම) කටුවාන පාර (වම) කැන්දලන්ද 01 පටුමග (වම) කැන්දලන්ද 02 පටුමග (වම) මොරගහහේන පාර (දකුණ) පිටිපන පාර (වම)

අංකය	කොට්ඨාස පාර
03	දුම්රියපොල පාර (දකුණ) දුම්රියපොල පාර 01 පටුමග (වම) උඩුවන පාර (වම)
04	අලව්ව විමාන පාර (වම) අතුරුගිරිය පාර (දකුණ) ගොඩගම ඃ බොරැල්ල පාර (වම) පළමු පටුමග (ගොඩගම - බොරැල්ල පාර වම) මැද මාවත (වම) නාරන්ගහදෙණිය පාර (වම) තනායම් පාර (වම) සමාජවාදී මාවත (දකුණ) සමූපකාර මාවත (වම) දෙවන පටුමග (බෝධිරාජ මාවත) වම වැකන්ද පාර (වම)
05	අඩගහනගල පාර අවිස්සාවේල්ල පාර (දකුණ) අවිස්සාවේල්ල 01 පටුමග (වම) අවිස්සාවේල්ල 02 පටුමග (වම) ඇඹුල්ගම පටුමග (වම) ඇඹුල්ගම පාර (වම) අඩගහණගල පාර (වම) ගොඩගම - බොරැල්ල පාර (වම) කෙරවලමුල්ල පාර (වම) මැදමණ්ඩිය පාර (වම) පැළැදගොඩ පාර (වම)
06	අවිස්සාවේල්ල පාර (වම) අවිස්සාවේල්ල පාර 01 වන පටුමග (වම) බොරැල්ල පාර (වම) මීගොඩ පාර (වම) මුඩක්කුව පාර (වම) මුඩක්කුව පටුමග (වම) මුඩක්කුව පටුමග (වම) දුම්රියපළ පාර - ගොඩගම (වම)
07	ගබඩාවත්ත 01 වැනි පටුමත (වම) ගබඩාවත්ත 02 වැනි පටුමත (වම)

උපලේඛනය
අංක 02

අංකය	කොට්ඨාස පාර
07	ගබඩාවත්ත 03 වැනි පටුමග (වම) මහින්ද මාවත (වම) මොරගහහේන පාර (වම) මොරගහහේන පාර 01 පටුමග (වම) මොරගහහේන පාර 02 පටුමග (වම) මොරගහහේන පාර 03 පටුමග (වම) මොරගහහේන පාර 04 පටුමග (මායා මාවත) (වම) මොරගහහේන පාර 05 පටුමග (වම) මොරගහහේන පාර 06 පටුමග (වම) ප්‍රීතිකා මාවත (වම) සුජාතා මාවත (වම) පැල්පොලවත්ත පාර (දකුණ) පැල්පොලවත්ත පාර 01 පටුමග (දකුණ) පැල්පොලවත්ත පාර 02 පටුමග (දකුණ) පැල්පොලවත්ත පාර 04 පටුමග (සමාධි මාවත) (වම) පැල්පොලවත්ත පාර 05 පටුමග (මෙත්මල් මාවත) (දකුණ) පැල්පොලවත්ත පාර 06 පටුමග (දකුණ) පැල්පොලවත්ත පාර 07 පටුමග (දකුණ) පැල්පොලවත්ත පාර 08 පටුමග (දකුණ) පැල්පොලවත්ත පාර 09 පටුමග (දකුණ)
08 A	ආටිගල පාර අවිස්සාවේල්ල කොළඹ පාර මාදුලාව පාර පුස්තකාල පාර කදනවත්ත පාර ලියන්වල මීගොඩ පාර පාදුක්ක ගොඩගම පාර
අංකය	කොට්ඨාස පාර
8	අදිරිගොඩ පාර අග්ගොන වත්ත පාර අමරසිරි කාරියවසම් මාවත (කුරුඳුවත්ත පාර) දඹගොල්ල වත්ත පාර දාම්පේ - අක්කර විස්ස පාර දාම්පේ පාර දෙහිගහවිට පාර දෙනිය පාර දේවාල පාර එකමුතු මාවත (පුවක්වත්ත පාර) ගල්කන්ද පාර

අංකය	කොට්ඨාස පාර
08	ගලපොත පාර ගලපොත පාර (පුවක්වත්ත පාර) ගොඩහේන පාර ගොරකගහලන්ද පාර හෙට්ටිගොඩ පාර ජම්බලගහවත්ත පාර කළුවැල්දෙණිය වීදිය කනත්ත පාර කෝන්ගහවිල පාර කුරුඳුවත්ත පාර (පුවක්වත්ත පාර) මෛත්‍රිදාස මාවත මොරගහහේන පාර නාගහවත්ත පාර පාදුක්ක පාර පෙරේරා මාවත (ගම්මැද්ද පාර) පිටිපන - දාම්පේ පාර (මාහේනවත්ත) පුවක්වත්ත - හෙට්ටිගොඩ හරස් පාර පුවක්වත්ත පාර සහන උයන පාර සමගි මාවත (පුවක්වත්ත පාර) ස්ටෙප්හෙන් මාවත වෛද්‍ය මාවත
09	හිරිපිටිය පාර පරණ නියදගල පාර
10	දොලේ කඩේ - මාගම්මන පාර හොරණ පාර
11	අතපත්තු මාවත ඩී ඒ සුදසිංහ මාවත ගල්දොල පාර හෙරලිගහවිල පාර ජනසවි මාවත කෘෂි මාවත කෘෂි මාවත පළමු පටුමග කුරුඳුවත්ත පාර මහින්ද මාවත මාවත්ගම කනන්ත පාර

අංකය	කොට්ඨාස පාර
11	මාවත්ගම පටුමග මාවත්ගම පාර මොරගහහේන පාර ප්‍රසන්නපුර පාර ප්‍රිතිකා මාවත පූජ්‍ය ගුණරත්න හිමි මාවත උඩුවන පන්සල හංදිය පාර
12	අඹහේන පාර ආරච්චිගොඩ පාර දළුගල මාවත දෙල්ගහවත්ත පාර ගොවිජනපදය පාර එච් පී ටී කැකුණගහවත්ත පාර මහණකන්ද පාර මූණමලේවත්ත පාර මොරගහහේන පාර ප්‍රිය මාවත රාවන්දොළහේන පාර රෝසගහවත්ත පාර සර්වෝදය මාවත සෙනෙවිරත්න මාවත සෙත්සර මාවත සිංහ අරන පාර (පාසල් පටුමග) සිරි ජිනරතන මාවත උඩුවන - පංසල හංදිය පාර උඩුවන පංසල පාර වෙද මාවත වෙදගේවත්ත මාවත
13	දංවත්ත පාර දෙල්ගහකන්ද පාර ඇටඹගහලන්ද පාර ගොවිජනපදය පාර කොස්වත්ත - ගොවිජනපදය පාර මොරගහහේන පාර පිටිපන දකුණ දක්ෂිණාරාමය පංසල පාර

අංකය	කොට්ඨාස පාර
13	පොරිකෙහෙන පාර රාවන්දොලහේන පාර සිරි ජිනරතන මාවත
	උපලේඛනය අංක 03
01	1 වැනි පටුමග, සරනතිස්ස මාවත 3 වැනි පටුමග, පාසල් මාවත දෙහිගහවත්ත පාර දියකඩ පාර හොරණ පාර ජය මාවත (යකකු හිරකරපු මාවත) මහේෂ් උයන මිනුවන්විල පාර පාසල් මාවත සම්බෝධි මාවත ශ්‍රී සරණතිස්ස මාවත (පරණ හොරණ පාර) තේවත්ත පාර
02	අම්බලන්ගොඩ පාර බදුවිලවත්ත පාර දියකඳ පාර හෙරලියාවල පාර හොරණ පාර ලියනගේ මාවත පාලගම - දියකඩ පාර පාලගම වීදියගොඩ ශ්‍රී විජයානන්දරාම පාර තොටුපළ පාර උඩුවගේ වත්ත පාර උඳුරුගොඩ පාර වෙලකුඹුර පාර වෑතර පරණ පාර 1 වැනි පටුමග පිළියන්දල - කොට්ටාව පාර 2 වැනි පටුමග පිළියන්දල - කොට්ටාව පාර 3 වැනි පටුමග පිළියන්දල - කොට්ටාව පාර 4 වැනි පටුමග පිළියන්දල - කොට්ටාව පාර 5 වැනි පටුමග පිළියන්දල - කොට්ටාව පාර

අංකය	කොට්ඨාස පාර
03	6 වැනි පටුමග පිළියන්දල - කොට්ටාව පාර 7 වැනි පටුමග පිළියන්දල - කොට්ටාව පාර 8 වැනි පටුමග පිළියන්දල - කොට්ටාව පාර 9 වැනි පටුමග පිළියන්දල - කොට්ටාව පාර ඇල්හේන පාර අළුත් මාවත ඇල්විටිගල මාවත අරලිය මාවත ආසිරි මාවත බන්කු වත්ත පාර ඩී එස් සී අත්තනායක මාවත දහම් මාවත දික්හේන වත්ත දියත උයන පාර ජනසවි මාවත කුඩාමාදුව - හොන්නන්තර පාර ලේක්විව් 1 වටරවුම් පාර මැද මාවත නිදහස් මාවත පිළියන්දල කොට්ටාව පාර පොකුණ පාර පුබුදු මාවත සමන් මාවත සැනසුම් පෙදෙස පාසල් පටුමග සෙත්සිරි පෙදෙස සුචරිත මාවත සුමග මාවත උඩුවපිටියවත්ත පාර යෝධ මාවත
04	දෙණිය පන්සල පාර ගඩුබා දූව පාර ගල්වල දෙණිය පාර කිතුල්හේන පාර මැල්වත්ත 2 පටුමග මැල්වත්ත 3 පටුමග මැල්වත්ත 4 පටුමග

අංකය	කොට්ඨාස පාර
04	මැල්වත්ත 5 පටුමග මැල්වත්ත 6 පටුමග මැල්වත්ත 7 පටුමග මැල්වත්ත මැද මාවත නාමල් උයන පාර පොල්ගස්ඕවිට පාර පුබුදු මාවත සාම මාවත සමනළ පෙදෙස සම්බෝධි වත්ත පාර උඩසිරි මාවත වාසනා වත්ත

05	10 වැනි පටුමග මත්තෙගොඩ නිවාස සංකීර්ණය 1 වැනි පටුමග, හෙට්ටිආරච්චි මාවත 1 වැනි පටුමග මත්තෙගොඩ නිවාස සංකීර්ණ පාර 1 වැනි වන පටුමග, සල්ගස් මාවත 2 වැනි පටුමග, හෙට්ටිආරච්චි මාවත 2 වැනි පටුමග මත්තෙගොඩ නිවාස සංකීර්ණ පාර 2 වැනි පටුමග, සල්ගස් මාවත 2 වැනි පටුමග, හෙට්ටිආරච්චි මාවත 3 වැනි පටුමග මත්තෙගොඩ නිවාස සංකීර්ණය 3 වැනි පටුමග, සල්ගස් මාවත 4 වැනි පටුමග මත්තෙගොඩ නිවාස සංකීර්ණ පාර 4 වැනි පටුමග, හෙට්ටිආරච්චි මාවත 4 වැනි පටුමග, සල්ගස් මාවත 5 වැනි පටුමග හෙට්ටිආරච්චි මාවත 5 වැනි පටුමග මත්තෙගොඩ නිවාස සංකීර්ණ පාර 5 වැනි පටුමග, සල්ගස් මාවත 6 වැනි පටුමග, හෙට්ටිආරච්චි මාවත 6 වැනි පටුමග, මත්තෙගොඩ නිවාස සංකීර්ණ පාර 6 වැනි පටුමග, සල්ගස් මාවත 7 වැනි පටුමග හෙට්ටිආරච්චි මාවත 7 වැනි පටුමග මත්තෙගොඩ නිවාස සංකීර්ණ පාර 8 වැනි පටුමග, හෙට්ටිආරච්චි මාවත 8 වැනි පටුමග මත්තෙගොඩ නිවාස සංකීර්ණ පාර

අංකය	කොට්ඨාස පාර
05	9 වැනි පටුමග, හෙට්ටිආරච්චි මාවත 9 වැනි පටුමග මත්තෙගොඩ නිවාස සංකීර්ණ පාර අරලිය උයන අරලිය උයන 1 වැනි පටුමග ආසිරි උයන හෙට්ටිආරච්චි මාවත මත්තෙගොඩ නදුන් උයන මත්තේගොඩ නිවාස සංකීර්ණ හරස් පාර මත්තේගොඩ නිවාස සංකීර්ණ පාර පින්ක් රෝඩ් ප්‍රසන්න උයන රණවිරු රෝහණ මාවත සදුන්පුර සල්ගස් මාවත සල්මල් පෙදෙස
06	අරලිය පෙදෙස ආසිරි මාවත ආවාස පාර බටපඳුර වත්ත පාර දෙහිකුඹුර පාර ගෝල්ඩන් මෙඩෝස් හොරණ පාර ජාලියගම නිවාස 1 පටුමග කිරිගම්පමුණුව පාර නලීන් ප්‍රිය මාවත පාසල් මාවත රණවිරු ප්‍රේමසිරි මාවත සමගි මාවත ශ්‍රී සරණංකර (ඒ) ස්වර්ණ පෙදෙස වෙල මැද පාර ශ්‍රී සරණංකර පාර
07	1 වැනි පටුමග කහතුඩුව (එල්) 4 වැනි පටුමග ශ්‍රී ගුණානන්ද මාවත කැප්ටන් නලීන් 1 වැනි පටුමග වතුරී උයන දියගම සමගී

අංකය	කොට්ඨාස පාර
07	ධර්මාලංකාර මාවත දියගම කොට්ටාව පාර දියගම පාර දියගම සමගි මාවත දොඹගහවත්ත පාර එඩ්වින් කොතලාවල මාවත ගමගේ මාවත හල්වක්කඩ පාර හත්ලහගොඩ පාර ජයවර්ධන පාර කහතුඩුව ජම්බුගස් පාර කිරිවත්තුඩුව පාර මුණසිංහගම වත්ත පාර නිදහස් මාවත පිස්කල් වත්ත පාර ප්‍රගති මාවත රණවිරු ආනන්ද රත්නසිරි මාවත සිරිමල් පෙදෙස සෝමාලංකාර මාවත ශ්‍රී ගුණානන්ද මාවත සුමන මාවත උස්වත්ත මාවත වෙදගේවත්ත (සුමුදු පෙදෙස)
08	2 වැනි පටුමග බටහේන බටහේන පාර ක්‍රවුන්ට් ක්‍රසන්ට් ගෝනවල පාර හකුරුදෙණිය කිරිවත්තුඩුව හකුරුදෙණිය සත්සර මාවත කම්මල්වත්ත පාර කිරිවත්තුඩුව පාර කොස්වත්ත පාර මිල්ලගහවත්ත පාර මූණමලේ වත්ත පාර පැපොලගහහේන පාර පාසල් මාවත ප්‍රගති මාවත

අංකය	කොට්ඨාස පාර
08	රීගල් රේන්ජ් පාර රීගල් රේන්ජ් 1 වැනි පටුමග රීගල් රේන්ජ් 2 වැනි පටුමග රීගල් රේන්ජ් 3 වැනි පටුමග රීගල් රේන්ජ් 4 වැනි පටුමග රීගල් රේන්ජ් 5 වැනි පටුමග රීගල් රේන්ජ් 6 වැනි පටුමග රීගල් රේන්ජ් 7 වැනි පටුමග රීගල් රේන්ජ් 8 වැනි පටුමග රීගල් රේන්ජ් මාවත සුරම්‍ය මාවත පන්සල පාර විවේකාරාම පාර
	වෙදගේවත්ත පාර
09	6 වැනි පටුමග කිතුල්වල බන්කන් වත්ත පාර ගල්කන්ද පාර ගම්මාන පාර කිරිවත්තුඩුව පාර කිතුලවිල පාර පුබුදු උයන 1 වැනි පටුමග තලගලවත්ත පාර තුඩුව වත්ත පාර උපාලී අබේසිංහ මාවත
10	10 වැනි පටුමග සිටි ඔෆ් ලයින් 11 වැනි පටුමග සිටි ඔෆ් ලයින් 13 වැනි පටුමග සිටි ඔෆ් ලයින් 1 වැනි පටුමග සිටි ඔෆ් ලයින් 1 වැනි පටුමග ප්‍රගති උයන 2 වැනි පටුමග සිටි ඔෆ් ලයින් 2 වැනි පටුමග කහතුඩුව 2 වැනි පටුමග ප්‍රගති උයන
	3 වැනි පටුමග සිටි ඔෆ් ලයින් 3 වැනි පටුමග ප්‍රගති උයන 4 වැනි පටුමග සිටි ඔෆ් ලයින් 5 වැනි පටුමග සිටි ඔෆ් ලයින්

අංකය	කොට්ඨාස පාර
10	6 වන පටුමග සිටි ඔෆ් ලයින් 7 වන පටුමග සිටි ඔෆ් ලයින් 8 වන පටුමග සිටි ඔෆ් ලයින් 9 වන පටුමග සිටි ඔෆ් ලයින් කැප්ටන් ගයාල් මහේෂ් මාවත මැදපාර සිටි ඔෆ් ලයින් වටරවුම් පාර සිටි ඔෆ් ලයින් ප්‍රධාන පාර හිමගිරි ප්‍රගති මාවත හොරණ පාර ජය පෙදෙස ජයගත් මාවත කහතුඩුව ජම්බුගස්මුල්ල පාර කිරිබේරිය ගොඩැල්ල පාර නිසල උයන ප්‍රගති මාවත ප්‍රගති උයන ප්‍රගති මාවත ප්‍රගතිපුර 2 වැනි පටුමග ප්‍රගතිපුර අළුත් පාර ප්‍රියංකර පෙදෙස රම්‍ය උයන ප්‍රගති මාවත රූබන් අමරතුංග මාවත සිතිමිණ ප්‍රගති මාවත විල්ෆ්‍රඩ් සේනානායක මාවත

උපලේඛනය අංක 04

I වැනි තීරය *කාර්තුව*	*II වැනි තීරය* *ගෙවිය යුතු දිනය*	*III වැනි තීරය* *5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමු කාර්තුව	2022.03.31	2022.01.31
දෙවන කාර්තුව	2022.06.30	2022.04.30
තෙවන කාර්තුව	2022.09.30	2022.07.31
සිව්වන කාර්තුව	2022.12.31	2022.10.31

12-246/1

හෝමාගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට අදාළව වෙළෙඳ බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු 147 වැනි වගන්තියෙන් හෝමාගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2021 නොවැම්බර් මස 16 වැනි දින පවත්වන ලද හෝමාගම ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

සම්පත් චමින්ද ජයසිංහ,
සභාපති,
හෝමාගම ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 22 වැනි දින,
හෝමාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ කියවිය යුතු 147 වැනි වගන්තිය හා 149 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2022 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2022 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පළක් වන විට දී, ඊට අදාළ බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2021 වර්ෂයේ ලැබීම්වලින් 1% ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2022 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් යෝජනා කරමි.

උපලේඛන

I වැනි තීරුව	*II වැනි තීරුව*		
	පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
බලය දෙනු ලබන කාර්යය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු, 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
1. හෝටල් හා ලැගුම්හල්	500 0	750 0	1,000 0
2. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන	500 0	750 0	1,000 0
3. භෝජන ශාලා	500 0	750 0	1,000 0
4. බේකරි	500 0	750 0	1,000 0
5. කිරි පට්ටි හා කිරි වෙළෙඳාම	500 0	750 0	1,000 0
6. ආහාර විකිණීම	500 0	750 0	1,000 0
7. මාළු විකිණීම	500 0	750 0	1,000 0
8. මස් විකිණීම	500 0	750 0	1,000 0
9. අයිස් කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
10. සිසිල්බීම කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
11. ලොන්ඩරියක්	500 0	750 0	1,000 0
12. සංචාරක වෙළෙඳාම	500 0	750 0	1,000 0
13. ගව ගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14. සාතක මඩු	500 0	750 0	1,000 0
15. කොණ්ඩා සැකසීමේ සැලුන්හල් සහ බාබර් සාප්පු	500 0	750 0	1,000 0

I වැනි තීරුව	*II වැනි තීරුව*		
	පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
බලය දෙනු ලබන කාර්යය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු, 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
පීඩාකාරී ව්‍යාපාර :			
1. පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හා ගබඩාකිරීම	500 0	750 0	1,000 0
2. සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
3. සම් විකිණීම	500 0	750 0	1,000 0
4. සත්ත්ව පාලනය	500 0	750 0	1,000 0
5. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6. පශු වෛද්‍ය ගිලන්හල	500 0	750 0	1,000 0
7. විකිණීම සඳහා නරක්වනසුලු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තැබීම	500 0	750 0	1,000 0
8. කරවල, ලුණු මාළු හෝ ජාඩි කි. ග්‍රෑ. 150 ට වැඩි ප්‍රමාණයක් තබාගැනීම	500 0	750 0	1,000 0
9. පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩාකර තැබීම	500 0	750 0	1,000 0
10. දුම්කොළ සකස් කිරීම හෝ ගබඩාකිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
11. සත්ත්ව ආහාර නිෂ්පාදනය කිරීම හෝ සත්ත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
12. පුන්නක්කු නිපදවීම හෝ කිලෝග්‍රෑම් 200ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
13. සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
14. සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබාගැනීම	500 0	750 0	1,000 0
15. අලුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0
16. ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩාකිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
17. ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0
18. වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
19. වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
20. සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
21. රසකැවිලි වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
22. පොල්ලෙලි පෙඟවීම (හෝ පල්කිරීම)	500 0	750 0	1,000 0
23. බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
24. දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
25. රා එකතු කිරීම	500 0	750 0	1,000 0
26. විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
27. යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
28. පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
29. සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0
30. සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
31. පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
32. මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාංශභෝග, කුළුබඩු හෝ කිරිපිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
33. ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
34. ලියන තීන්ත, අච්චු තීන්ත, හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
35. රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
		පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
	බලය දෙනු ලබන කාර්යය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු, 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
36.	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
37.	සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
38.	පාසල් රටහුණු නිපදවීම	500 0	750 0	1,000 0
39.	ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
40.	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
41.	ටයර්, ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
42.	සිමෙන්ති කිලෝ ග්‍රෑම් 1000ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
43.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
44.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
45.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
46.	පොහොර හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
47.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිපදවීම	500 0	750 0	1,000 0
48.	ධාන්‍ය හෝ මාංශභෝග කිලෝග්‍රෑම් 250ට වැඩි ප්‍රමාණයක් ගබඩාකිරීම	500 0	750 0	1,000 0
අන්තරායදායක ව්‍යාපාර :				
1.	තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
2.	මුද්‍රණාලයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
3.	කුකුළන් 100ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුළු ගාලක් හෝ කුකුළු කොටුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
4.	එළුවන්, ඌරන් 10ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
5.	ගඩොල් හෝ උළු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
6.	දර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
7.	කළුගල් කැණීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්	500 0	750 0	1,000 0
8.	සිසිල්බීම නිෂ්පාදනය හෝ සිසිල්බීම බෝතල් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩාකිරීම	500 0	750 0	1,000 0
9.	අයිස්ක්‍රීම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
10.	පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300ට වැඩි ප්‍රමාණයක් ගබඩාකිරීම	500 0	750 0	1,000 0
11.	ගිනිපෙට්ටි නිෂ්පාදන හෝ දුසිම් 100ට වැඩි ප්‍රමාණයක්	500 0	750 0	1,000 0
12.	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩාකිරීම	500 0	750 0	1,000 0
13.	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
14.	ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
15.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
16.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හල් පැවැත්වීම	500 0	750 0	1,000 0
17.	හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
18.	පාපැදි හෝ යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
19.	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0
20.	විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
21.	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤු ගබඩාකිරීම හෝ නිපදවීම	500 0	750 0	1,000 0

I වැනි තීරුව	*II වැනි තීරුව*		
	පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
බලය දෙනු ලබන කාර්යය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු, 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
22. පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50කට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
23. ශීතකළ මස් හෝ මාළු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
24. දූව ගබඩා කිරීම	500 0	750 0	1,000 0
පීඩාකාරී හා අන්තරායදායක ව්‍යාපාර :			
1. රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු එනසාල් හෝ කෙඳි කිරීම	500 0	750 0	1,000 0
2. ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
3. රෙදි මුද්‍රණ කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
4. විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5. හුණුගල් හෝ කිරිගල් පිළිස්සීම, සකස් කිරීම හෝ අලුහුණු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
6. බැටරි විද්‍යුත් ආරෝපනය කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
7. මෝටර් වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
8. මෝටර් වාහන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9. වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10. බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11. ගෑස් සිලින්ඩර් ගබඩාකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12. ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම	500 0	750 0	1,000 0
13. වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
14. ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
15. කිලෝග්‍රෑම් 150ට වැඩියෙන් තේ කුඩු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
16. වෑල්ඩින් සඳහා ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
17. ලියවන පට්ටලයක් භාවිත කරමින් වැඩපළක් පැවැත්වීම	500 0	750 0	1,000 0
18. පැට්‍රල්, ඩීසල්, තෙල් හෝ වෙනත් යම් ඛණිජතෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19. කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩාකිරීම	500 0	750 0	1,000 0
20. වායු සමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
21. විදුලි කර්මාන්ත වැඩපලක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22. කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0

හෝමාගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියෙන් හෝමාගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2021 වර්ෂයේ නොවැම්බර් මස 16 දින පවත්වන ලද හෝමාගම ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

සම්පත් චමින්ද ජයසිංහ,
සභාපති,
හෝමාගම ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 22 වැනි දින,
හෝමාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි උපවගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝමාගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් හෝමාගම ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2022 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරයේ 2021 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2022 වර්ෂය සඳහා නියම විය යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

	I වැනි තීරුව *2021 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම*	*II වැනි තීරුව* *රු. ශත*
01.	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නැත
02.	රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
03.	රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
04.	රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
05.	රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
06.	රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

12-246/3

හෝමාගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට අදාළව කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තියෙන් හෝමාගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2021 වර්ෂයේ නොවැම්බර් මස 16 දින පවත්වන ලද හෝමාගම ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

සම්පත් චමින්ද ජයසිංහ,
සභාපති,
හෝමාගම ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 22 වැනි දින,
හෝමාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බව යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව* පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම		
අනු. අංකය	*බලය දෙනු ලබන කාර්යය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	අභ්‍යාස පොත් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
02.	හඳුන්කුරු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
03.	කොහු, ඉදල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
04.	ඔරලෝසු අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
05.	ලීවලින් කැටයම් කිරීම/විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
06.	සෙල්ලම් බඩු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
07.	කෘත්‍රිම මල් සැකසීම	500 0	750 0	1,000 0
08.	ඇඳුම් මැසීම (ටේලර් ෂොප්)	500 0	750 0	1,000 0
09.	රබර් මුද්‍රා නිෂ්පාදනය	500 0	750 0	1,000 0
10.	ගෝස් කැබලි/බැන්ඩේජ් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
11.	ජුකී මැෂින් අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
12.	කඩදාසි බෑග්, ලියුම් කවර නිෂ්පාදනය	500 0	750 0	1,000 0
13.	ඉලෙක්ට්‍රොනික් තරාදි, මුදල් යන්ත්‍ර අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
14.	කුෂන් වැඩපල	500 0	750 0	1,000 0
15.	ඉන්ජෙක්ටර් පොම්ප අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
16.	දැන්වීම් ප්‍රචාරක කටයුතු, නාම පුවරු හා පදක්කම් සැකසීම	500 0	750 0	1,000 0

12-246/4

හෝමාගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා වාහන හා සත්ව බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තියෙන් හෝමාගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2021 වර්ෂයේ නොවැම්බර් මස 16 වැනි දින පවත්වන ලද හෝමාගම ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

සම්පත් චමින්ද ජයසිංහ,
සභාපති,
හෝමාගම ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 22 වැනි දින,
හෝමාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 හා 148 වැනි වගන්තිවල විධිවිධාන ප්‍රකාරව පහත උපලේඛනයෙහි දැක්වෙන ආකාරයට වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2022 වර්ෂයට අදාළව නියම කර අය කිරීමට යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරුව *විස්තරය*	*II වැනි තීරුව* *රු. ශත*
මෝටර් රථයක්, මෝටර් ට්‍රයිසිකලයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජීන් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම	25 0
සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහාම:	
(අ) වෙළෙඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම්	18 0
(ආ) වෙළෙඳ කාර්යයන් නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම්	4 0
සෑම කරත්තයක් සඳහා	20 0
සෑම අත් කරත්තයක් සඳහා	10 0
සෑම රික්ෂෝවක් සඳහා	7 50
සෑම අශ්වයෙකු හෝ පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
සෑම ඇතෙකු සඳහාම	50 0

12-246/5

හෝමාගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව අනුව ගාස්තු පැනවීම

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) තුන්වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ විෂයභාර අමාත්‍යවරයා විසින් සම්පාදිත අතුරු ව්‍යවස්ථා මාලාවේ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව 2021 වර්ෂයේ නොවැම්බර් මස 16 දින පවත්වන ලද හෝමාගම ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

සම්පත් චමින්ද ජයසිංහ,
සභාපති,
හෝමාගම ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 22 වැනි දින,
හෝමාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවන වගන්තිය යටතේ බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන

විෂයභාර අමාත්‍යවරයා විසින් සම්පාදිත හා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ තුන්වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව බස්නාහිර පළාත් සභාව විසින් අනුමත කළ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අංක 1947/6 හා 2015.12.28 *දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය* හා අංක 1976/21 හා 2016.07.20 *දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (සංශෝධිත) පළකරන ලද්දා වූ ද, 2016.07.21 වන දින, තීරණ අංක 5114 මගින් හෝමාගම ප්‍රාදේශීය සභාව විසින් වැළඳගත් හා ඒ බව අංක 1986 හා 2016.09.23 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ නිවේදනය කර ඇති, අතුරු ව්‍යවස්ථා මාලාවේ ප්‍රචාරක දැන්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අදාළව හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීථියකට, පාරකට, ඇළකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පළමු උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තුවක් හා දෙවන උපලේඛනයේ සඳහන් පරිදි ඉල්ලුම්පත්‍ර සඳහා ගාස්තුවක් 2022 වර්ෂය සඳහා පැනවීමට යෝජනා කරමි.

පළමු උපලේඛනය

අනු. අංකය	*පුවරුවේ ස්වභාවය*	*වර්ග මීටර් ප්‍රමාණය*	*ගාස්තුව (රුපියල්)*		
			මාස 03ට අඩු *රු.ශත.*	*මාස 03 හෝ මාස 6 අතර* *රු.ශත.*	*වසරක්* *රු.ශත.*
01	කිසියම් බිත්තියක හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	1ට අඩු	250 0	350 0	500 0
		1ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 0 බැගින්		
02	රෙදි, ඩිජිටල් බැනර් සඳහා	3ට අඩු	250 0	350 0	500 0
		3ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.200 0 බැගින්		
03	තහඩු හෝ දූව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	500 0	750 0	1000 0
		1ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.300 0 බැගින්		
04	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	500 0	750 0	1000 0
		1ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.300 0 බැගින්		
05	ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	රු. 250 0	රු. 350 0	රු. 500 0
		1ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.200 0 බැගින්		
06	ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	රු. 250 0	රු. 350 0	රු. 500 0
		1ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.200 0 බැගින්		
07	විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1ට අඩු	රු. 750 0	රු. 850 0	රු. 1000 0
		1ට වැඩි	1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.500 0 බැගින්		

දෙවන උපලේඛනය

විස්තරය	*ගාස්තුව*
ප්‍රචාරක දැන්වීම් ඉල්ලුම්පත්‍රය	රු. 100 0

12-246/6

හෝමාගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනත යටතේ බලපත්‍ර ගාස්තු නියම කිරීම

ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ (176 අධිකාරය) 3 වන වගන්තියෙන් හෝමාගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2021 වර්ෂයේ නොවැම්බර් මස 16 වැනි දින පවත්වන ලද හෝමාගම ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

සම්පත් චමින්ද ජයසිංහ,
සභාපති,
හෝමාගම ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 22 වැනි දින,
හෝමාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනතේ (176 වැනි අධිකාරය) 3 වැනි වගන්තිය ප්‍රකාරව කරනු ලබන රඟ දැක්වීමක් වෙනුවෙන් පහත සඳහන් ආකාරයට බලපත්‍ර ගාස්තුවක් 2022 වර්ෂයට පනවා අයකළ යුතු බවට යෝජනා කරමි:

		රු. ශත
1.	එක් දිනක් සඳහා බලපත්‍ර ගාස්තුව	200 0
2.	සතියක් සඳහා බලපත්‍ර ගාස්තුව	500 0
3.	මාස තුනක් සඳහා බලපත්‍ර ගාස්තුව	750 0
4.	වර්ෂයක් සඳහා බලපත්‍ර ගාස්තුව	1,000 0

12-246/7

හෝමාගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා අයදුම්පත්‍ර හා සහතික පත්‍ර ගාස්තු පැනවීම

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ තුන්වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ විෂයභාර අමාත්‍යවරයා විසින් සම්පාදිත අතුරු

ව්‍යවස්ථා මාලාවේ සේවා සඳහා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව 2021 නොවැම්බර් මස 16 වැනි දින පවත්වන ලද හෝමාගම ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

සම්පත් චමින්ද ජයසිංහ,
සභාපති,
හෝමාගම ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 22 වැනි දින,
හෝමාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවන වගන්තිය යටතේ බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයයභාර අමාත්‍යවරයා විසින් සම්පාදිත හා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ තුන්වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව බස්නාහිර පළාත් සභාව විසින් අනුමත කළ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අංක 1947/6 හා 2015.12.28 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* හා අංක 1976/21 හා 2016.07.20 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (සංශෝධිත) පළකරන ලද්ද වූ ද, 2016.07.21 වැනි දින, තීරණ අංක 5114 මගින් හෝමාගම ප්‍රාදේශීය සභාව විසින් වැළඳගත් හා ඒ බව අංක 1986 හා 2016.09.23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ නිවේදනය කර ඇති, අතුරු ව්‍යවස්ථා මාලාවේ සේවා සඳහා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අදාළව පහත පළමු උපලේඛනයේ සඳහන් පරිදි අයදුම්පත්‍ර ගාස්තුවක් හා දෙවන උපලේඛනයේ සඳහන් පරිදි සහතිකපත්‍ර සඳහා ගාස්තුවක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමට යෝජනා කරමි.

පළමු උපලේඛනය

අයදුම්පත්‍රය	*අයදුම්පත්‍ර ගාස්තුව*
	රු. ශත
පෙර පාසල් අයදුම්පත්‍රය	20 0
පුස්තකාල සාමාජිකත්ව අයදුම්පත්‍රය	20 0
වරිපනම් ලේඛනයේ උධෘත ලබාගැනීමේ අයදුම්පත්‍රය	300 0
සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍රය	1,000 0
වීථි රේඛා සහතික ලබාගැනීමේ අයදුම්පත්‍රය නොපවරා ගැනීමේ සහතික ලබාගැනීමේ අයදුම්පත්‍රය	200 0

දෙවන උපලේඛනය

සහතික පත්‍රය	*සහතික පත්‍ර ගාස්තුව*
	රු. ශත
වීථි රේඛා සහතිකය නොපවරා ගැනීමේ සහතික	600 0
වරිපනම් ලේඛන ආශ්‍රයෙන් හිමිකම් පිළිබඳ සහතික	
වරිපනම් ලේඛනයේ උධෘත සනාථ කරන සහතික (වර්ෂයකට)	200 0
නිකුත් කරන ලද තක්සේරු නිවේදන සනාථ කරන සහතික	150 0

හෝමාගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා මෘත ශරීර ආදාහනය කිරීමේ ගාස්තු පැනවීම

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ තුන්වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදිත අතුරු ව්‍යවස්ථා මාලාවේ ආදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව 2021 වර්ෂයේ නොවැම්බර් මස 16 වැනි දින පවත්වන ලද හෝමාගම ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

සම්පත් චමින්ද ජයසිංහ,
සභාපති,
හෝමාගම ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 22 වැනි දින,
හෝමාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවන වගන්තිය යටතේ බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදිත හා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ තුන්වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව බස්නාහිර පළාත් සභාව විසින් අනුමත කළ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අංක 1947/6 හා 2015.12.28 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* හා අංක 1976/21 හා 2016.07.20 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (සංශෝධිත) පළකරන්නා වූ ද, 2016.07.21 වැනි දින, තීරණ අංක 5114 මගින් හෝමාගම ප්‍රාදේශීය සභාව විසින් වැළඳගත් හා ඒ බව අංක 1986 හා 2016.09.23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ නිවේදනය කර ඇති, අතුරු ව්‍යවස්ථා මාලාවේ ආදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අදාළව පහත උපලේඛනයේ සඳහන් ආකාරයට මෘත ශරීර ආදාහනය කිරීමේ ගාස්තුව 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමට යෝජනා කරමි.

උපලේඛනය

	ගාස්තුව
	රු.
බල ප්‍රදේශය තුළ	4,500 0
බල ප්‍රදේශයෙන් පිට	5,500 0

12-246/9

හෝමාගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට අදළව ක්‍රීඩා භූමි පරිහරණය කිරීමේ ගාස්තු පැනවීම

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ තුන්වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදිත අතුරු ව්‍යවස්ථා මාලාවේ ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව 2021 නොවැම්බර් මස 16 වැනි දින පවත්වන ලද හෝමාගම ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

සම්පත් චමින්ද ජයසිංහ,
සභාපති,
හෝමාගම ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 22 වැනි දින,
හෝමාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවන වගන්තිය යටතේ බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදිත හා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ තුන්වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව බස්නාහිර පළාත් සභාව විසින් අනුමත කළ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අංක 1947/6 හා 2015.12.28 වැනි දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* හා අංක 1976/21 හා 2016.07.20 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (සංශෝධිත) පළකරන්නා වූ ද, 2016.07.21 වැනි දින, තීරණ අංක 5114 මගින් හෝමාගම ප්‍රාදේශීය සභාව විසින් වැළඳගත් හා ඒ බව අංක 1986 හා 2016.09.23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ නිවේදනය කර ඇති, අතුරු ව්‍යවස්ථා මාලාවේ ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අදාළව පහත පළමු උපලේඛනයේ සඳහන් ආකාරයට ක්‍රීඩා භූමි පරිහරණය කිරීමට 2022 වර්ෂය සඳහා අයදුම්පත්‍ර ගාස්තුවක් හා තැන්පත් මුදලක් පනවා අය කිරීමටත් දෙවන උපලේඛනය අනුව එක් එක් ක්‍රීඩා භූමි සඳහා දක්වා ඇති කාර්යය අනුව ගාස්තුවක් පනවා අය කිරීමටත් යෝජනා කරමි.

පළමු උපලේඛනය

	මුදල *රු. ශත*
අයදුම්පත්‍ර ගාස්තුව	100 0
තැන්පත් මුදල	10,000 0

දෙවන උපලේඛනය

කාර්යය	*ක්‍රීඩාපිටි ගාස්තුව රුපියල්*			
	හෝමාගම විල්ප්‍රඩ් සේනානායක ක්‍රීඩාපිටිය *රු. ශත*	*ගලවිලවත්ත සී හොක්ස් ක්‍රීඩාපිටිය* *රු. ශත*	*මත්තෙගොඩ නිවාස සංකීර්ණය පොදු කොටස* *රු. ශත*	*හෝමාගම නව බස් නැවතුම්පල භූමිය* *රු. ශත*
වෙළෙඳ (පුද්ගලික)	3,000 0	2.000 0	2,500 0	5,000 0
වෙළෙඳ (රාජ්‍ය)	2,000 0	1,000 0	1,500 0	4,000 0
නත්තල්/අවුරුදු පොළවල් සඳහා	3,000 0	2,000 0	2,500 0	10,000 0
ක්‍රීඩා/සංස්කෘතික උත්සව (පුද්ගලික)	3,000 0	2,000 0	2,500 0	5,000 0
සංගීත සංදර්ශන	5,000 0	3,000 0	5,000 0	10,000 0
වෙනත්	2,000 0	1,000 0	1,500 0	3,000 0

12-246/10

හෝමාගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට අදාළව සැරසිලි විධිමත් කිරීම සඳහා ගාස්තු පැනවීම

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ තුන්වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදිත අතුරු ව්‍යවස්ථා මාලාවේ සැරසිලි විධිමත් කිරීම පිළිබඳ ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව 2021 නොවැම්බර් මස 16 වැනි දින පවත්වන ලද හෝමාගම ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

සම්පත් චමින්ද ජයසිංහ,
සභාපති,
හෝමාගම ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 22 වැනි දින,
හෝමාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

2022 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම් බදු මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 වැනි දින වලින් අවසන්වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික හතරකින් කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2022 ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට (10%) ක වට්ටමක් ද එක් එක් කාර්තුවට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2021 ඔක්තෝබර් මස 12 වැනි දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල ද 2008 වර්ෂයේ වාර්ෂික තක්සේරු වටිනාකම 2022 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව ඉහත කී වාර්ෂික වටිනාකමින්

උපලේඛනය

අංක	දියුණු ගම් ප්‍රදේශය	වරිපනම් ප්‍රතිශතය
1.	රොසිටා නගරය	15%
2.	වූටන් නගරය	15%
3.	පතන නගරය	15%
4.	දෙව්සිරිපුර	15%
5.	වටගොඩ නගරය	10%
6.	බෝගහවත්ත නගරය	10%

2022 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් සහ,

ඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දින වලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් කොටගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12-414/1

කොටගල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

කොටගල ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ ඔක්තෝබර් මස 12 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 05:3 යටතේ පහත දක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද කර්මාන්ත බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2021 ඔක්තෝබර් මස 12 වැනි දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන, පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම මත එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූපිත සටහනේ අනුරූපිත ප්‍රමාණය අනුව කර්මාන්ත බද්දක් 2022 වර්ෂය වෙනුවෙන් පනවා අය කිරීමටත් එම කර්මාන්ත බදු 2022 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

උපලේඛනය

I වැනි තීරුව	II වැනි තීරුව
වාර්ෂික වටිනාකම රු. 750 0 නොඉක්මවන අවස්ථාවක	500 0
වාර්ෂික වටිනාකම රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1500 0 නොඉක්මන අවස්ථාවක	750 0
වාර්ෂික වටිනාකම රු. 1500 0 ඉක්මවන අවස්ථාවක	1,000 0

12-414/2

කොටගල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

කොටගල ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ ඔක්තෝබර් මස 12 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 05:3 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද, ඒ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2021 ඔක්තෝබර් මස 12 වැනි දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ යටතේ සාදන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීමට අවශ්‍ය නොවන්නා වූ වෘත්තියක් නොවන්නාවූ කිසියම් ව්‍යාපාරයක් කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2022 වර්ෂයේ දී කරගෙන යනු ලබන, සෑම තැනැත්තෙකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි, පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක, එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්ද 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2022 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර කොටගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු යැයි කොටගල ප්‍රාදේශීය සභාව විසින් යෝජනා කරන්නීය.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*
2021 වර්ෂය සඳහා ව්‍යාපාරයේ වෘත්තීය ආදායම	*අයකිරීමට තීරණය කළ බද්ද රු. ශත*
(i) රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	නැත
(ii) රු. 6,001 සිට රුපියල් 12,000 දක්වා	90 0
(iii) රු. 12,001 සිට රුපියල් 18,000 දක්වා	180 0
(iv) රු. 18,001 සිට රුපියල් 75,000 දක්වා	360 0
(v) රු. 75,001 සිට රුපියල් 1,50,000 දක්වා	1,200 0
(v) රු. 1,50,000 ට වැඩි	3,000 0

12-414/3

කොටගල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා වාහන හා සතුන් මත බදු පැනවීම

කොටගල ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ ඔක්තෝබර් මස 12 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 05:3 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත් වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකුම විසින්, එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින 30 ක් සම්පූර්ණ වූ වහාම 2022 වර්ෂය සඳහා වන මෙම බද්ද කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2021 ඔක්තෝබර් මස 12 වැනි දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය සහ 4 වන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2022 වර්ෂයේ දී පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකුම මතම එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමට කොටගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I වැනි තීරය	*II වැනි තීරය*
	රු. ශක
මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක් ජීන් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම	25 0
සෑම බයිසිකල් හෝ ට්‍රයිසිකල් හෝ බයිසිකල් කාර්යයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා	
(අ) වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම්	18 0
(ආ) වෙළඳ නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම්	4 0
සෑම කරත්තයක් සඳහා	20 0
සෑම අත්කරත්තයක් සඳහා	10 0
සෑම රික්ෂෝවක් සඳහා	7 50
සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
සෑම ඇතෙකු සඳහා	50 0

විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යයන් සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීම්වලින් නිදහස් කෙරේ.

මෙහි උපලේඛනයේ "වෙළඳ කාර්යය" යන්නට විකිණීම සඳහා හෝ අන් ආකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ යම් ලිඛිත නැතහොත් ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12-414/4

තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර

තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ 2022 වර්ෂය සඳහා පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදයක ව්‍යාපාර, පීඩාකාරි හා අන්තරාදයක ව්‍යාපාර සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

තුම්පනේ ප්‍රාදේශීය සභාවේ 2021 ඔක්තෝබර් මස 21 වැනි දින පැවැති මහ සභා රැස්වීමේ දී තීරණ අංක (ඉ) 1.5.1 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2022 වර්ෂයේ දී තුම්පනේ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම මත ගාස්තුවක් අයකරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. ආර්. බී. සමරකෝන්,
සභාපති,
තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

2021 නොවැම්බර් මස 01 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

තුම්පනේ ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ තුම්පනේ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍ර ලබාගත යුතු යම් කර්මාන්තයක් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන ස්ථාන සඳහා තුම්පනේ ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන සියළුම බලපත්‍ර සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 149 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය හෝ ව්‍යාපාරය වෙනුවෙන් එම උප ලේඛනයේ II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් අයකරගැනීමට සුදුසු බව තුම්පනේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්තය හෝ ව්‍යාපාරය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයන් සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තාවූ ද වන අවස්ථාවක ඒ හෝටලය හෝ ආපන ශාලාව හෝ නවාතැන්පොල හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා සභාපතිවරයා විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් මත ගෙවිය යුතු ගාස්තුව ඒ හෝටලයේ හෝ ආපන ශාලාවේ හෝ නවාතැන්පොලෙහි හෝ පසුගිය වර්ෂයේ ලැබීම් වලින් සියයට එකක් (1%) නොඉක්මවිය යුතු ය.

උපලේඛනය 1

අනු. අංකය	*I වැනි තීරුව* *කර්මාන්තයේ ස්වභාවය*	*II වැනි තීරුව* *ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු.	*රු.*	*රු.*
	පීඩාකාරි ව්‍යාපාර			
01.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩා කර තැබීම	500	750	1,000
02.	සම්පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම හෝ සම් විකිණීම	500	750	1,000
03.	සත්ත්ව පාලනය, (මස්, කිරි හෝ බිත්තර සඳහා)	500	750	1,000
04.	ඡායාරූප ශාලාවක් පැවැත්වීම	500	750	1,000
05.	පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම	500	750	1,000
06.	විකිණීම සඳහා නරක් වන සුලු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම	500	750	1,000

අනු. අංකය	I වැනි තීරුව කර්මාන්තයේ ස්වභාවය	II වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	රු. 1,500 ඉක්මවන අවස්ථාවක
		රු.	රු.	රු.
07.	කරවල, ලුණුවල හෝ ජාඩි කිලෝග්‍රෑම් 150 ට වැඩි ප්‍රමණයක් තබා ගැනීම	500	750	1,000
08.	දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500	750	1,000
09.	සත්ව ආහාර නිපදවීම හෝ සත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම	500	750	1,000
10.	සබන් නිෂ්පාදනය කිරීම	500	750	1,000
11.	අලුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබා ගැනීම	500	750	1,000
12.	ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500	750	1,000
13.	ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබාගැනීම	500	750	1,000
14.	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500	750	1,000
15.	රසකැවිලි වර්ග නිපදවීම	500	750	1,000
16.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500	750	1,000
17.	යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දූව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම	500	750	1,000
18.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම,	500	750	1,000
19.	සම් භාණ්ඩ නිපදවීම	500	750	1,000
20.	පළතුරු මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500	750	1,000
21.	මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග මාංශභෝග කුලු බඩු හෝ පිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම	500	750	1,000
22.	ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500	750	1,000
23.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටොස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500	750	1,000
24.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිපදවීම	500	750	1,000
25.	ධාන්‍ය හෝ මාංශභෝග කිලෝ ග්‍රෑම් 250 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500	750	1,000

උපලේඛනය 2

අන්තරාදයක ව්‍යාපාර

01.	තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝ ග්‍රෑම් 750 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500	750	1,000
02.	මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම	500	750	1,000
03.	මුද්‍රණාලයක් පැවැත්වීම	500	750	1,000
04.	කුකුළන් 50 ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පැවැත්වීම	500	750	1,000
05.	එළුවන්, ඌරන් 10 ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම	500	750	1,000
06.	ගඩොල් හෝ උළු ගබඩාකර තබා ගැනීම	500	750	1,000
07.	දර ගබඩාවක් පැවැත්වීම	500	750	1,000
08.	කළුගල් කැනීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්	500	750	1,000
09.	සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල් බීම බෝතල් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500	750	1,000
10.	අයිස් ක්‍රීම් නිෂ්පාදනය	500	750	1,000
11.	පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300 ට වැඩි ප්‍රමාණයක් ගඩබා කිරීම	500	750	1,000
12.	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500	750	1,000

අනු. අංකය	I වැනි තීරුව කර්මාන්තයේ ස්වභාවය	II වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	රු. 1,500 ඉක්මවන අවස්ථාවක
		රු.	රු.	රු.
13.	ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500	750	1,000
14.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500	750	1,000
15.	යන්ත්‍රානුසාරයෙන් පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම	500	750	1,000
16.	හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩාකර තබා ගැනීම	500	750	1,000
17.	පාපැදි හෝ යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පැවැත්වීම	500	750	1,000
18.	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩාකර තබා ගැනීම	500	750	1,000
19.	ගිනිකෙලි භාණ්ඩ හෝ රතිඤ්ඤු ගබඩා කිරීම හෝ නිපදවීම	500	750	1,000
20.	පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500	750	1,000
21.	ශීතකළ මස් හෝ මාළු ගබඩාකර තබාගැනීම	500	750	1,000
22.	දූව ගබඩා කිරීම	500	750	1,000

උපලේඛන 3

පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර

01.	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරඳමුංගු එනසාල් හෝ ගබඩා කිරීම	500	750	1,000
02.	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500	750	1,000
03.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම	500	750	1,000
04.	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500	750	1,000
05.	හුණුගල් හෝ හිරිගල් පිලිස්සීම, සකස් කිරීම හෝ අලුහණු ගබඩා කිරීම	500	750	1,000
06.	බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500	750	1,000
07.	මෝටර් වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500	750	1,000
08.	මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500	750	1,000
09.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500	750	1,000
10.	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500	750	1,000
11.	ගෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
12.	ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම	500	750	1,000
13.	වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම	500	750	1,000
14.	ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500	750	1,000
15.	කිලෝග්‍රෑම් 100 ට වැඩි ප්‍රමාණයක් තේ කුඩු ගබඩාකර තබා ගැනීම	500	750	1,000
16.	වෑල්ඩින් සඳහා ස්ථානයක් පැවැත්වීම	500	750	1,000
17.	ලියවන පට්ටල් භාවිත කරමින් වැඩපලක් පැවැත්වීම	500	750	1,000
18.	පැට්‍රොල්, ඩීසල්, තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
19.	වායුසමන යන්ත්‍ර ශීතකරණ හෝ අධි ශීතකරණ සේවා කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500	750	1,000
20.	විදුලි කර්මාන්ත වැඩපලක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පත්වාගෙන යාම	500	750	1,000

තුම්පනේ ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා අන්තරාදයක හා පීඩාකාරී ව්‍යාපාර සඳහා බදු පැනවීම

පළමුවන උපලේඛනය

පීඩාකාරී ව්‍යාපාර :

1. පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම
2. සම් පදම් කිරීම
3. සම් විකිණීම
4. සත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)
5. ඡායාරූප ශාලාවක් පැවැත්වීම
6. පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම
7. විකිණීම සඳහා නරකවන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම
8. කරවල, ලුණුමාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 150ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම
9. පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම
10. දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
11. සත්ව ආහාර නිපදවීම හෝ සත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම
12. සබන් නිෂ්පදනය කිරීම
13. අලුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබා ගැනීම
14. ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
15. ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම
16. වේවැල් භාණ්ඩ නිපදවීම
17. වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම
18. රසකැවිලි වර්ග නිපදවීම
19. බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)
20. යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම
21. පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම
22. සම් භාණ්ඩ නිපදවීම
23. පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම
24. මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාංශ භෝග, කුළු බඩු හෝ පිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම
25. ටයර් හෝ ටියුබ් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම
26. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම
27. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිපදවීම
28. ධාන්‍ය හෝ මාංශ භෝග කිලෝග්‍රෑම් 250ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

දෙවන උපලේඛනය

අන්තරාදයක ව්‍යාපාර :

1. තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම
2. මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම
3. මුද්‍රණාලයක් පැවැත්වීම
4. කුකුළන් 50ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පැවැත්වීම
5. එළුවන්, ඌරන් 10ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම
6. ගඩොල් හෝ උළු ගබඩාකර තබාගැනීම
7. දර ගබඩාවක් පැවැත්වීම
8. කළුගල් කැණීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්
9. සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල්බීම බෝතල් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
10. අයිස්ක්‍රීම් නිෂ්පාදනය
11. පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
12. කොහු හෝ වෙනත් කෙඳිවර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම
13. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම
14. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම
15. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම
16. හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩාකර තබා ගැනීම

17. පාපැදි හෝ යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පැවැත්වීම
18. පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩාකර තබා ගැනීම
19. ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤු ගබඩා කිරීම හෝ නිපදවීම
20. පොල්තෙල් හැර වෙනත් එළවලු තෙල් ලීටර් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
21. ශීතකළ මස් හෝ මාළු ගබඩාකර තබා ගැනීම
22. දූව ගබඩා කිරීම

තුන්වන උපලේඛනය

පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර :

1. රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරඳමුංගු, එනසාල් හෝ ගබඩා කිරීම
2. ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම
3. රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම
4. විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පැවැත්වීම
5. හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම, සකස් කිරීම හෝ අලුහුණු ගබඩා කිරීම
6. බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
7. මෝටර් වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
8. මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
9. වාත්තු මඩුවක් පවත්වාගෙන යාම
10. බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම
11. ගෑස් සිලින්ඩර ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
12. ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම
13. වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම
14. ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම
15. කිලෝග්‍රෑම් 100 වැඩියෙන් තේ කුඩු ගබඩාකර තබා ගැනීම
16. වෑල්ඩිං සඳහා ස්ථානයක් පැවැත්වීම
17. ලියවන පට්ටලයක් භාවිතා කරමින් වැඩපලක් පැවැත්වීම
    පැට්‍රොල්, ඩීසල්, තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම
18 වායුසමනය යන්ත්‍ර, ශීතකරන හෝ අධි ශීතකරන සේවා කිරීම හෝ අලුත්වැඩියා කිරීම
19. විදුලි කර්මාන්ත වැඩපලක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම
20. කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම

12 - 487/1

තුම්පනේ ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

තුම්පනේ ප්‍රාදේශීය සභාවේ 2021 ඔක්තෝබර් මස 21 වැනි දින පැවැති මහා සභා රැස්වීමේ දී තීරණ අංක (ඉ) 1.5.2 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද ඒ ඒ කර්මාන්ත බද්ද, 2022 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවට වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. ආර්. බී. සමරකෝන්,
සභාපති,
තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

2021 නොවැම්බර් මස 01 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

''1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II වැනි තීරුවේ, ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2022 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර තුම්පනේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය''.

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව* *කර්මාන්තයේ ස්වභාවය*	*II වැනි තීරුව* *ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු.	*රු.*	*රු.*
01.	හඳුන්කුරු සෑදීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500	750	1,000
02.	ගිනිපෙට්ටි කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500	750	1,000
03.	බිස්කට් නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500	750	1,000
04.	යන්ත්‍රානුසාරයෙන් රසකැවිලි නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
05.	යන්ත්‍රසූත්‍ර භාවිතා නොකර රසකැවිලි නිෂ්පාදනය කරන ස්ථානයක් හෝ ආහාර නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
06.	යෝගට් නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම	500	750	1,000
07.	ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම	500	750	1,000
08.	හුණු පෝරණුවක් පවත්වාගෙන යාම	500	750	1,000
09.	කොන්ක්‍රීට් වැඩපලක් පවත්වාගෙන යාම	500	750	1,000
10.	සම් භාණ්ඩ නිෂ්පාදනය සඳහා වූ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500	750	1,000
11.	කොහු මෙට්ට රබර් කැවූ භාණ්ඩ නිපදවන ආයතනයක් පවත්වාගෙන යාම	500	750	1,000
12.	තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කරන ආයතනයක් පවත්වාගෙන යාම	500	750	1,000
13.	සිසිල් බීම නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
14.	සිවිලින් ලෑලි නිෂ්පදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
15.	සබන් සෑදීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම	500	750	1,000
16.	යන්ත්‍රෝපකරණයෙන් හෝ වෙනත් ක්‍රමයකින් පොල්තෙල් හෝ එළවළු තෙල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
17.	අයිස් නිපදවීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම	500	750	1,000
18.	පාසල් රටහුණු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
19.	ඉටිපන්දම් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
20.	රෙදි සෝදන නිල් නිපදවීම කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
21.	බෙලෙක් භාණ්ඩ නිෂ්පාදන වැඩපොලක් පවත්වාගෙන යාම	500	750	1,000
22.	සුවඳ පුයර නිපදවීම හෝ සුවඳ විලවුන් නිපදවීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000
23.	අභ්‍යාස පොත් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500	750	1,000

තුම්පනේ ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ව්‍යාපාර හා වෘත්තීය බද්ද පැනවීම

තුම්පනේ ප්‍රාදේශීය සභාවේ 2021 ඔක්තෝබර් මස 21 වැනි දින පැවැති මහා සභා රැස්වීමේ දී තීරණ අංක (ඉ) 1.5.3 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද ව්‍යාපාර බද්ද, වෘත්තීය බද්ද 2022 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවට වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. ආර්. බී. සමරකෝන්,
සභාපති,
තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

2021 නොවැම්බර් මස 01 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) හා (3) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ හා වෘත්තියක් නොවන්නාවූ කිසියම් ව්‍යාපාරයක් තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2022 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූපි සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2022 වර්ෂය සඳහා නියමකර අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2022 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට හෝ ඊට පෙර තුම්පනේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය".

දෙවන උපලේඛනය

අනු අංකය	*I වැනි තීරුව*	*II වැනි තීරුව*
	අදාළවන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය	*ගෙවිය යුතු බද්ද රු. ශත*
1	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
2	රු. 6,000 සිට රු. 11,999 දක්වා	90 0
3	රු. 12,000 සිට 18,749 දක්වා	180 0
4	රු. 18,750 සිට රු. 74,999 දක්වා	360 0
5	රු. 75,000 සිට රු. 1,49,999 දක්වා	1,200 0
6	රු. 1,50,000 ඉහළට	3,000 0

තෙවන උපලේඛනය

අනු අංකය	*I වැනි තීරුව*	*II වැනි තීරුව*
	ස්ථානයේ වාර්ෂික වටිනාකම ලැබීම් ප්‍රමාණය	*ගෙවිය යුතු බද්ද රු. ශත*
1	රු. 750 0 නොඉක්මවන අවස්ථාවක	500 0
2	රු. 750 0 ඉක්මවන එහෙත් රු. 1,500 0 නොඉක්මවන අවස්ථාවක	750 0
3	රු. 1,500 0 ඉක්මවන අවස්ථාවක	1000 0

12 - 187/3

තුම්පනේ ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

තුම්පනේ ප්‍රාදේශීය සභාවේ 2021 ඔක්තෝබර් මස 21 වැනි දින පැවැති මහා සභා රැස්වීමේ දී තීරණ අංක (ඉ) 1.5.4 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

1987 අක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය ප්‍රකාරව 2022 වර්ෂය සඳහා පනවන ලද වරිපනම්, මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවට වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2022 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දින හෝ ඊට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහය (10%)ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට පෙරාතුව ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%)ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

එස්. එම්. ආර්. බී. සමරකෝන්,
සභාපති,
තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

2021 නොවැම්බර් මස 01 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත ලැබී ඇති බලතල ප්‍රකාර තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශවල පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2016 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වාර්ෂික තක්සේරු වටිනාකම් 2022 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී තක්සේරුව මත ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ වැනි උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර එකී දේපල මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමෙන් පහත සඳහන් කොට්ඨාසයන් සඳහා අනුරූපිත ප්‍රතිශතයන්,

I. ගලගෙදර කොට්ඨාසයේ

රඹුක්කන පාර
පෙතිගෙවෙල පාර
පොහොලියද්ද පාර
විද්‍යාල පාර
වැත්තෑව පාර
කුරුණෑගල පාර
කුරුණෑගල හරස් පාර
උසාවිය පාර
නුවර පාර

අක්කරේ පාර
මාඋස්සාව පාර
නිදහස් පටුමග
විහාරතැන්න පාර
ගොඩලියද්ද පාර
කොහිලඇල්ල පාර
මල්පොලයාය පාර
මැදගොඩ පාර

II. අරඹේකඩේ කොට්ඨාසයේ :

කටුගස්තොට පාර
කුරුණෑගල පාර
බොක්කාවල පාර
හෑදෙනිය මැදවල පාර

III. හතරලියද්ද කොට්ඨාසයේ :

නුවර පාර
රඹුක්කන පාර
සංඝරාජපුර පාර

2022 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උප වගන්තියේ විධිවිධාන යටතේ 2022 වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් (4) ගෙවීමට විධාන කිරීමටත් තුම්පනේ ප්‍රාදේශීය සභාව යෝජනා කරමි.

12 - 187/4

තුම්පනේ ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා වෙනත් ගාස්තු පැනවීම

තුම්පනේ ප්‍රාදේශීය සභාවේ 2021 වර්ෂයේ ඔක්තෝබර් මස 21 වැනි දින පැවැති මහා සභා රැස්වීමේ දී තීරණ අංක (ඉ) 1.5.5 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. ආර්. බී. සමරකෝන්,
සභාපති,
තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

2021 නොවැම්බර් මස 01 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

2022 වර්ෂය සඳහා පහත උපලේඛනයේ සඳහන් සේවාවන් සැපයීම වෙනුවෙන් ඊට අනුරූපිත තීරුවේ සඳහන් ගාස්තු පනවා අයකිරීමට යෝජනා කරමි.

	රු. ශත
01. පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු :	
(i) නව ව්‍යාපාරයක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ඉල්ලුම්පත් ගාස්තු	500 0
(ii) පරිසර ආරක්ෂණ බලපත්‍ර අළුත් කිරීමේ ඉල්ලුම්පත් ගාස්තු	500 0
පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු පරිසර අධිකාරී පනත අනුව අය කෙරේ.	
02. නොපවරා ගැනීමේ සහ වීරිරේඛා සහතිකයක් ලබාදීම සඳහා (මෙම සහතිකය මාස හයක (06) කාලයක් වලංගු වේ)	1,500 0
03. මිනින්දෝරු සැලැස්මක් අනුමත කිරීම සඳහා ගාස්තු/ගොඩනැගිලි සැලැස්මක් අනුමත කිරීම සඳහා ගාස්තු, අනුකූලතා සහතිකයක් නිකුත් කිරීම සඳහා ගාස්තු (නාගරික සංවර්ධන අධිකාරියේ *ගැසට් නිවේදනය* සහ නාගරික සංවර්ධන අධිකාරි පනත අනුව අය කෙරේ.)	
04. ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ඉල්ලුම් පත්‍රයක් සඳහා	500 0
05. මිනින්දෝරු සැලැස්මක් අනුමත කිරීම සඳහා ඉල්ලුම්පත් ගාස්තු	300 0
06. වරිපනම් ලේඛනයේ නම වෙනස් කිරීමේ ඉල්ලුම් පත්‍රයක් සඳහා	300 0
07. අනතුරුදායක ගස් සම්බන්ධ ඉල්ලුම්පතක් සඳහා	300 0
08. ආදාහනාගාර ගාස්තු :	
(i) බල ප්‍රදේශය තුළ පදිංචි අයෙකු සඳහා	9,000 0
(ii) බල ප්‍රදේශයෙන් පිටත අයෙකු සඳහා	10,000 0
09. ඉඩම් කට්ටිකර අලෙවි කිරීමේ ගාස්තු විකුණුම් මිලෙන් 1%ක්	
10. ගලගෙදර සරත් අමුණුගම ක්‍රීඩාංගණය ක්‍රිකට් තරඟ සඳහා ලබාදීමේ ගාස්තු :	
* පාසල් ක්‍රිකට් තරඟයක් සඳහා දිනකට	6,000 0
* රාජ්‍ය ආයතන ක්‍රිකට් තරඟයක් සඳහා දිනකට	7,500 0
* ක්‍රීඩා සමාජ ක්‍රිකට් තරඟයක් සඳහා දිනකට	10,000 0
* වෙනත් පෞද්ගලික ආයතන ක්‍රිකට් තරඟයක් සඳහා දිනකට	12,500 0
11. සරත් අමුණුගම සම්මන්ත්‍රණ ශාලාව කුළී පදනම මත ලබාදීම :	
සම්මන්ත්‍රණයක් හා දේශනයක් සඳහා දිනකට	7,500 0
මංගල උත්සවයක් හෝ වෙනත් (සහතික පත්‍ර ප්‍රදානෝත්සව ආදී) දේශනයක් සඳහා	15,000 0
ආදයම් උත්පාදනය කරන වැඩසටහනක් පැවැත්වීම සඳහා (නාට්‍යයක් ප්‍රදර්ශනය කිරීම වැනි)	10,000 0
12. ගලගෙදර පුරනැඟුම ශාලාව	7,500 0
13. බැකෝ යන්ත්‍රය කුළී පදනම මත ලබාදීම (පැයකට)	2,500 0

		රු. ශත
14.	මෝටර් ග්‍රේඩරය කුළී පදනම මත ලබාදීම (පැයකට)	4,500 0
	* බැකෝ යන්ත්‍රය හා මෝටර් ග්‍රේඩරය ලබා ගැනීමේ දී අවම පැය 3 කට ගෙවිය යුතු යි.	
15.	මාර්ග තලනය කුළී පදනම මත ලබාදීම (දිනකට)	4,000 0

16. සභාව සතු කොඩි කණු හා පුටු ලබාදීම
රාජ්‍ය ආයතන හැර අනෙකුත් උත්සව සඳහා සභාව සතු පුටු හා කොඩි කණු ලබාදීමේ දී පුටුවකට දිනකට රු. 20ක් හා එක් කොඩි කණුවකට දිනකට රු. 20ක මුදලක් අය කෙරේ.

17. කසල ගාස්තු

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වැනි 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.06.28 වැනි දින අංක 1816/ 42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ iv (අ) කොටසේ පල කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 2016.09.15 අංක 1611 දරණ ගැසට් පත්‍රයේ iv (අ) කොටසේ පල කර තුම්පනේ ප්‍රදේශීය සභා බල ප්‍රදේශය සභා බල ප්‍රදේශය තුළ බලාත්මක කරනු ලැබූ ඝන අපද්‍රව්‍ය කළමණාකරණ අතුරු ව්‍යවස්ථාව අනුව පහත උප ලේඛනය අනුව පහත උප ලෙඛනය අනුව කසල ගාස්තු අය කිරීම සිදු කෙරේ.

අනු. අංකය	වර්ගය	දිනකට පරිමාණය (මසකට ගාස්තු)		
		පරිමාණය කි.ග්‍රෑම් 10 අඩු	පරිමාණය කි.ග්‍රෑම් 10-20	පරිමාණය කි.ග්‍රෑම් 20ට වැඩි
1.	සාප්පු කාර්යාලය	300 0	500 0	750 0
2.	හෝටල්	500 0	1,000 0	1,500 0
3.	එළවළු, පළතුරු	500 0	750 0	1,000 0
4.	මාළු, කුකුල් මස්, බිත්තර	500 0	750 0	1,000 0
5.	පදික	300 0	500 0	750 0
6.	කර්මාන්තශාලා	1,000 0	1,500 0	2,000 0
7.	කැණීම්, ඉදිකිරීම් කඩාදැමීම් ට්‍රැක්ටර් ලෝඩ් එකක් සඳහා	3,000 0	-	-
8.	ආරෝග්‍ය ශාලා	1,000 0	1,500 0	2,000 0
9.	වෙනත්	500 0	750 0	1,000 0

		රු. ශත
1.	නව සති පොල සඳහා ගාස්තු (දිනකට)	
	ශාලාව තුළ වෙළඳම් කිරීම - වර්ග අඩි 16ක් සඳහා	300 0
	- වර්ග අඩි 64ක් සඳහා	500 0
	ශාලාවෙන් බැහැර වෙළඳම් කිරීම වර්ග අඩි 25ක් සඳහා	250 0
	- වර්ග අඩි 60 සඳහා	400 0

වර්ග අඩි 100ක් සඳහා	500 0
වෙනත් වාහන තුළ වෙළඳාම් කිරීම	300 0
19. පුස්තකාල ගාස්තු	
වාර්ෂික සාමාජික ගාස්තු	50 0
පොත් ප්‍රමාද ගාස්තු එක් පොතක් සඳහා	5 0
තැන්පතු ගාස්තු	100 0
20. ප්‍රාදේශීය සභා මාර්ගවල දැව, පස්/වැලි ප්‍රවාහනය කරන ලොරි රථ සඳහා බලපත්‍ර ගාස්තුවක් අය කිරීම	1,000 0
21. වැලි කියුබ් එකක් ගොඩදැමීම සඳහා වන ගාස්තුව	1,500 0

12 - 187/5

තුම්පනේ ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සහ දෘශ්‍ය පරිසරය ප්‍රදර්ශන ගාස්තු

තුම්පනේ ප්‍රාදේශීය සභාවේ 2021 ඔක්තෝබර් මස 21 වැනි දින පැවැති මහා සභා රැස්වීමේ දී තීරණ අංක (ඉ) 1.5.6 යටතේ 2022 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සහ දෘෂ්‍ය පරිසරය ප්‍රදර්ශන ගාස්තු පනවා අය කිරීමට තීරණය කළ බවත්, පනවන ලද මෙම ගාස්තුව දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට යටත් පිරිසෙයින් දින 07කට කලින් ප්‍රාදේශීය සභාවේ ලේකම්/සභාපති වෙතින් බලපත්‍රයක් ලබා ගත යුතු බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. ආර්. බී. සමරකෝන්,
සභාපති,
තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

2021 නොවැම්බර් මස 01 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) සභාවට ලැබී ඇති බලතල අනුව හා 1989 අංක 12 දරන පළාත් සභා ආනුශාංගික විධිවිධාන පනතේ 2 (1) වන උපවගන්ති යේ 'ඇ' ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 02 වැනි වගන්තියේ 1 වන උපවගන්තියේ මධ්‍යම පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016.02.23 වැනි දින 1955/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරයේ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ හා මධ්‍යම පළාත් සභාව විසින් අනුමත කර සම්මත අතුරු ව්‍යවස්ථාව 2017.11.30 වැනි දින අංක 2048 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මගින් පිළිගෙන ප්‍රකාශයට පත්කර ඇති අංක 12 දරන ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථා විධිවිධාන අනුව තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ යම් වීදියකට, පාරකට, ඇළකට, දෙළකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් වන පරිදි ගාස්තුවක් 2022 වර්ෂය සඳහා පනවා අයකිරීමට එම ගාස්තුව ගෙවිය යුතු යම් තැනැත්තෙක්/ආයතනය දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට දින හතකට (07) කලින් තුම්පනේ ප්‍රාදේශීය සභාවට ගාස්තු ගෙවා බලපත්‍රයක් ලබාගත යුතු බවට යෝජනා කරන්නී ය.

(මසකට අඩු කාලයක් ප්‍රදර්ශනය කරන දැන්වීම් පුවරු සඳහා තැම්පතු මුදලක් ගෙවිය යුතුයි.)

		රු. ශත
(i)	තහඩුවලින් එක් පැත්තක් සඳහා වසරකට වර්ග අඩි එකක් වෙනුවෙන්	200 0
(ii)	තහඩුවලින් දෙපැත්තක් සඳහා වසරකට වර්ග අඩි එකක් වෙනුවෙන්	300 0
(iii)	ජංගම දුරකථන සම්බන්ධ දැන්වීම් පුවරු වර්ග අඩි එකක් වෙනුවෙන්	125 0
(iv)	කිසියම් ව්‍යාපාරයක වෙළෙඳ නාමයකට අමතරව වෙනත් වෙළෙඳ නිෂ්පාදන ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා වර්ග අඩි එකක් වෙනුවෙන්	50 0
(v)	රෙදි බැනර් සඳහා මාසයක කාලයකට වර්ග අඩි එකක් වෙනුවෙන්	50 0

12 - 187/6

තුම්පනේ ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ජල ගාස්තු අයකිරීම

තුම්පනේ ප්‍රාදේශීය සභාවේ 2021 ඔක්තෝබර් මස 21 වැනි දින පැවැති මහා සභා රැස්වීමේ දී තීරණ අංක (ඉ) 1.5.7 යටතේ 2022 වර්ෂය සඳහා ජල ගාස්තු පනවා අය කිරීමට තීරණය කළ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. ආර්. බී. සමරකෝන්,
සභාපති,
තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

2021 නොවැම්බර් මස 01 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වන වගන්තියෙහි (xiii) (ඈ) ඡේදය යටතේ වූ සම්මත අතුරු ව්‍යවස්ථාවට අනුව 2022 වර්ෂය සඳහා පහත උපලේඛනයේ සඳහන් සේවාවන් සම්බන්ධයෙන් ඊට අනුරූපිත තීරුවේ සඳහන් ජල ගාස්තු පනවා අය කිරීමට තීරණය කරනු ලැබේ.

ජල සම්බන්ධතා ගාස්තු රු. 15,000 - (රු. 2,000ක ආරක්ෂක තැන්පත් මුදල ද ඇතුළත්ව)

	රු. ශත
ස්ථාවර ගාස්තු (ගෘහස්ථ/ආගමික)	100 0
ඒකක 01 සිට 10 දක්වා එක් ඒකකයකට	3 50
ඒකක 11 සිට 20 දක්වා එක් ඒකකයකට	7 50
ඒකක 21 සිට 25 දක්වා එක් ඒකකයකට	10 0
ඒකක 26 සිට 30 දක්වා එක් ඒකකයකට	15 0
ඒකක 31 සිට 35 දක්වා එක් ඒකකයකට	22 0
ඒකක 35ට වැඩි එක් ඒකකයකට	30 0

මීට අමතරව විදුලි බිල අනුව ඉන්ධන ගැලපුම් ගාස්තුවක් අය කෙරේ.

ස්ථාවර තැන්පතු (ව්‍යාපාරික)	150 0
ඒකක 01 සිට 10 දක්වා එක් ඒකකයකට	4 50

	රු. ශත
ඒකක 11 සිට 20 දක්වා එක් ඒකකයකට	8 50
ඒකක 21 සිට 25 දක්වා එක් ඒකකයකට	12 0
ඒකක 26 සිට 30 දක්වා එක් ඒකකයකට	20 0
ඒකක 31 සිට 35 දක්වා එක් ඒකකයකට	25 0
ඒකක 35ට වැඩි එක් ඒකකයකට	35 0
ජල බවුසරය කුළී පදනම මත ලබාදීම (බවුසර් එකක් සඳහා)	3,500 0
යළි ඇමිණීම හා ඉල්ලීම පරිදි ජල සේවය විසන්ධි කිරීමේ ගාස්තු	1,500 0
පාරිභෝගික නම වෙනස් කිරීමේ ගාස්තු	1,000 0
ජල මාපක පරීක්ෂණ ගාස්තුව	750 0
ජල අයදුම්පත් ගාස්තු	300 0

12 - 187/7

තුම්පනේ ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු පැනවීම

තුම්පනේ ප්‍රාදේශීය සභාවේ 2021 ඔක්තෝබර් මස 21 වැනි දින පැවැති මහා සභා රැස්වීමේ දී තීරණ අංක (ඉ) 1.5.8 යටතේ 2021 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බද්දක් පනවා අයකිරීමට තීරණය කළ බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද සංවර්ධනය නොකළ ඉඩම් බද්ද, වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. ආර්. බී. සමරකෝන්,
සභාපති,
තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

2021 නොවැම්බර් මස 01 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (01) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ 153 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල අනුව තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් හෝ
(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත්කර නොමැති විටක හෝ
(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 143 ට වඩා අඩු වන්නේ නම්,

එකී ඉඩම් සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2022 වර්ෂය සඳහා එක් එක් ඉඩමේ, භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට 0.5 (0.5%)ක වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2022 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර තුම්පනේ ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට විධානය කළ යුතු යැයි යෝජනා කරමි.

12 - 187/8

තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර

2022 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

තුම්පනේ ප්‍රාදේශීය සභාවේ 2021 වර්ෂයේ ඔක්තෝබර් මස 21 වැනි දින පැවැති මහා සභා රැස්වීමේ දී තීරණ අංක ඉ 1.5.9 යටතේ 2022 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බද්දක් පනවා අය කිරීමට තීරණය කළ බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත් වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබාගන්නා සෑම තැනැත්තෙකු ම විසින් එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබාගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2022 වර්ෂය සඳහා වන මෙම බද්ද තුම්පනේ ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. ආර්. බී. සමරකෝන්,
සභාපති,
තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

2021 නොවැම්බර් මස 01 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාර තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2022 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබාගන්නා සෑම තැනැත්තෙකු ගෙන්ම එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමට තුම්පනේ ප්‍රාදේශීය සභාව තීරණය කරනු ලැබේ.

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව*	*II වැනි තීරුව* රු. ශත
01.	මෝටර් රථයක්, මෝටර් ත්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක් හෝ ත්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
02.	සෑම බයිසිකලයක් හෝ ත්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා -	
	(අ) වෙළඳ කාර්යය සඳහා යොදවන්නේ නම්	18 0
	(ආ) වෙළඳ කාර්ය නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම්	4 0
03.	සෑම කරත්තයක් සඳහා	20 0
04.	සෑම අත් කරත්තයක් සඳහා	10 0
05.	සෑම රික්ෂෝවක් සඳහා	7 50
06.	සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවෙකු සඳහා	15 0
07.	සෑම ඇතෙකු සඳහා	50 0

02. විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, විල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර

2022 වර්ෂයට කුලී රථ වාහන නවතා තැබීම සඳහා අවසර පත්‍ර ගාස්තු

2011.05.30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1708/10 දරන *ගැසට් පත්‍රයේ* 4(අ) වැනි කොටසේ පළකරන ලද කුලී රථවාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ වගන්ති අනුව කුලී රථවාහන නවතා තැබීම සඳහා මසකට ගාස්තු පැනවීම සඳහා 2021 වර්ෂයේ ඔක්තෝබර් මස 21 වැනි දින පැවැති මහ සභා රැස්වීමේ දී තීරණ අංක ඉ 1.5.10 යටතේ මෙයින් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. ආර්. බී. සමරකෝන්,
සභාපති,
තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

2021 නොවැම්බර් මස 01 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

තුම්පනේ ප්‍රාදේශීය සභාව 2011.05.30 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1708/10 දරන ගැසට් පත්‍රයේ 15(අ) වැනි කොටසේ පළ කරන ලද කුලී රථවාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 03 වැනි වගන්තිය අනුව පහත උපලේඛනයේ සඳහන් කුලී රථවහන නවතා තැබීම සඳහා බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අයකිරීමට යෝජනා කරමි.

උපලේඛනය

අනු. අංකය	*කුලී රථ වර්ගය*	*කාලය*	*ගාස්තුව රු. ශත*
01	ලොරි රථයක් සඳහා	මසකට	100 0
02	වෑන් රථයක් සඳහා	මසකට	100 0
03	ටේලරය සහිත ට්‍රැක්ටරයක් සඳහා	මසකට	100 0
04	අත්ට්‍රැක්ටරයක් සඳහා	මසකට	100 0
05	කාරයක් සඳහා	මසකට	100 0
06	මෝටර් බයිසිකලයක් සඳහා	මසකට	50 0

12 - 187/10

තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර

2022 වර්ෂය සඳහා ත්‍රිරෝද රථ නැවැත්වීමේ ස්ථාන සඳහා ගාස්තු පනවා අය කිරීම

තුම්පනේ ප්‍රාදේශීය සභාවේ 2021 ඔක්තෝබර් මස 21 වැනි දින පැවැති මහ සභා රැස්වීමේ දී තීරණ අංක (ඉ) 1.5.11 යටතේ 2022 වර්ෂය සඳහා ත්‍රිරෝද රථ නැවැත්වීමේ ස්ථාන සඳහා ගාස්තු පනවා අය කිරීමට තීරණය කළ බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. ආර්. බී. සමරකෝන්,
සභාපති,
තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

2021 නොවැම්බර් මස 01 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල අනුව හා 1989 අංක 12 දරන පළාත් සභා අනුශාංගික විධිවිධාන පනතේ 2(1) වන උපවගන්තියේ 'අ' ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 02 වැනි වගන්තියේ 1 වන උපවගන්තියේ මධ්‍යම පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016.02.23 වැනි දින 1955/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකරනු ලැබී හා මධ්‍යම පළාත් සභාව විසින් අනුමත කර සම්මත අතුරු ව්‍යස්ථාව 2017.11.30 වැනි දින අංක 2048 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මගින් පිළිගෙන ප්‍රකාශයට පත්කර ඇති අංක 2 දරන ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා විධිවිධාන අනුව තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ත්‍රීරෝද රථ නවතා තැබීම සඳහා වර්ෂයකට රු. 1,500 0 කා ගාස්තුවක් 2022 වර්ෂය සඳහා පනවා අයකිරීමට යෝජනා කරමි.

2022 වර්ෂය සඳහා ත්‍රීරෝද රථ නැවතුම්පොල ගැසට් කිරීම

අනු අංකය	*ත්‍රීරෝද රථ නැවතුම්පොල*	*උපරිම ලබා දිය හැකි නැවතුම්පොළ ලියාපදිංචි ගණන*
1	ගලගෙදර රෝහල හංදිය	51
2	කවුඩැල්ල ඕපල්ල හංදිය	8
3	කවුඩැල්ල මල්වතුගොඩ හංදිය	7
4	මඩිගේ නව ලංකා බැංකුව අසල	3
5	මඩිගේ පැරණි ලංකා බැංකුව අසල	35
6	වලතැන්න හංදිය	6
7	පෙතිගෙවෙල හංදිය	39
8	10 කණුව	4
9	ගලගෙදර පොලීසිය අසල	26
10	එක්සත් අවමංගල්‍යාධාර ත්‍රීරෝද රථ සංගමය	37
11	ගිරිහාගම හංදිය	10
12	නාරංවල හංදිය	25
13	ගලගෙදර මහා විද්‍යාලය අසල	2
14	උඩුව හංදිය රථගාල	13
15	මැදගොඩ 3 කණුව හංදිය	4
16	අරඹේකඩේ හංදිය	24
17	කුඹුරේගම හංදිය	9
18	දෙවෙලේගනගිරන්දෙනිය මංසන්ධිය	5
19	හතරලියද්ද හංදිය	52

අනු අංකය	තීරෝද රථ නැවතුම්පොල	උපරිම ලබා දිය හැකි නැවතුම්පොළ ලියාපදිංචි ගණන
20	හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අසල	4
21	වැලිගොඩපොල හංදිය	11
22	කොටිකාම්ඹ පහළ	21
23	කොටිකාම්ඹ ඉහළ	14
24	අළුදෙණිය හංදිය	18
25	රංගමුව හංදිය	10
26	කොළුගල අම්බලම අසළ	3
27	දුංකුඹුර හංදිය	26
28	ගොඩතලේ හංදිය	8
29	පල්ලේපොල හංදිය	19
30	මීගස්තැන්න් හංදිය	10
31	මුරුද්දෙණිය රථගාල	4
32	බෝගස්හින්නහංදිය	3
33	එරමුදුයද්දපාලම හංදිය	4
34	දම්පාගොඩහංදිය	7
35	දේදුණුපිටිය ඉහළ	6
36	කැනවිල්පතහංදිය	1
37	එරමුදුලියද්ද බස් නැවතුම්පොළ අසල	6

12 - 187/11

තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර

2022 වර්ෂයට එළ ගව මස් වෙළඳසැලක් පවත්වාගෙන යාමට බලපත්‍ර ලබාදීම

තුම්පනේ ප්‍රාදේශීය සභාවේ 2021 ඔක්තෝබර් මස 21 වැනි දින පැවති මහා සභා රැස්වීමේද තීරණ අංක (ඉ) 1.5.12 යටතේ 1893 අංක 9 දරන ගෝ ඝාතක ආඥාපනත හා සංශෝධන පනත යටතේ එහි අංක 7(1) හි පරිදි එළ හරක් මස් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන

යාම සඳහා පහත සඳහන් අය විසින් 2022 වර්ෂය වෙනුවෙන් බලපත්‍රයක් ලබාගැනීම සඳහා ඉල්ලුම් කර ඇති බව මින් මහජනයාට නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. ආර්. බී. සමරකෝන්,
සභාපති,
තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

2021 නොවැම්බර් මස 01 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

02. එකී ස්ථානයට එබඳු බලපත්‍රයක් නිකුත් කිරීමට විරුද්ධව කරුණු ඉදිරිපත් කරනු කැමති වූ තුම්පනේ ප්‍රාදේශීය සභා බල සීමාව ඇතුළත පදිංචි තැනැත්තන් විසින් එසේ විරුද්ධත්වයට තිබෙන කරුණු පිළිබඳව ලිඛිත ප්‍රකාශයක් පිටපත් දෙකකින් (2) යුක්තව මෙම නිවේදනය ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ දින සිට දින 30 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලබේ. ලිපි එවන විට ලියුම් කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ විරෝධකරු ලෙස සඳහන් කර "සභාපති", තුම්පනේ ප්‍රාදේශීය සභාව, ගලගෙදර වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

එළගව මස් වෙළඳ සැල පවත්වා ගෙන යාමට ඉල්ලුම් කරන ස්ථානයේ විස්තර ඇතුළත් වගුව

අනු අංකය	එළගව මස් වෙළඳ සැල පවත්වාගෙන යාමට ඉල්ලුම්කළ තැනැත්තාගේ නම හා ලිපිනය	එළ ගව මස් ලබා ගන්නා ස්ථානය හා එම අයිතිකරුගේ නම හා ලිපිනය	එළ ගව මස් වෙළඳ සැල පවත්වාගෙන යාමට අදහස් කරන ස්ථානයේ ලිපිනය හා හඳුනා ගැනීමේ විස්තරය	ග්‍රාම නිලධාරි වසම
01	එස්. එම්. රියාස් මයා, අංක 67/1, දෙහිදෙණියමඩිගේ හතරලියද්ද (ජා. හැ. අ. 781261432 V)	එන්. නසීම් මයා, අංක 67, දෙහිදෙණියමඩිගේ, හතරලියද්ද	හතරලියද්ද, කොටිකාම්ඹ මංසන්ධියේ ඇති නයිම් හජ්ජියාර් මාවතේ ජුම්මා පල්ලිය ඉදිරිපිට දෙහිදෙණිය මඩිගේ එළ ගව වෙළඳ සැල	අංක 368 - දෙහිදෙණියමඩිගේ
02	එම්. එස්. එම්. නජීම් මයා, අංක 230/ ඒ, මඩිගේ, ගලගෙදර, (ජා. හැ. අ. 812332996 V)	එම්. එස්. එම්. නජීම් මයා, අංක 230/ ඒ, මඩිගේ, ගලගෙදර	ගලගෙදර මඩිගේ පෙතිගෙවෙල මංසන්ධිය ඉදිරිපිට ඇති අංක 319 දරණ එළගව මස් අලෙවිසැල	ගලගෙදර මඩිගේ දකුණ
03	ඒ. කේ. එම්. රිස්වාන් මයා, බෙට්ටියගොඩ, කහපත්වල (ජා. හැ. අ. 683431796 V)	ඒ. කේ. එම්. රස්වාන් මයා, බෙට්ටියගොඩ, කහපත්වල	9 කණුවේ සිට හතරලියද්ද පාරේ කි. මී. 1/2 ක් පැමිණ බෙට්ටියගොඩ, කහපත්වල එළ ගවමස් වෙළඳ සැල	අංක 380 මීගහහේන දකුණ
04	එම්. එෆ්. එම්. රිෆාක් මයා, අංක 226, නිදහස් පටුමග, මඩිගේ, ගලගෙදර, (ජා. හැ. අ. 721541576 V)	එම්. එෆ්. එම්. රිෆාක් මයා, අංක 226, නිදහස් පටුමග, මඩිගේ, ගලගෙදර	ගලගෙදර මඩිගේ ඉන්ධන පිරවුම්හල අසල ඉදිරිපිට ඇති අංක 367 දරන එළ ගව මස් වෙළඳසැල	අංක 369, ගලගෙද බටහිර

තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර

1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර ලබාදීම - 2022

තුම්පනේ ප්‍රාදේශීය සභාවේ 2021 ඔක්තෝබර් මස 21 වැනි දින පැවති මහා සභා රැස්වීමේදී තීරණ අංක (ඉ)1.5.13 යටතේ1975 අංක 17 දරන සමාජශාලා පනතට අනුව 1980 අංක 14 දරන (සංශෝධන) එකී පනතේ බලපත්‍ර ලබාදීමේ 6 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ දැක්වෙන සමාජ ශාලාව සඳහා 2022 වර්ෂය වෙනුවෙන් බලපත්‍රයක් ලබාගැනීම සඳහා ඉල්ලුම් කර ඇති බව මින් මහජනතාව වෙත නිවේදනය කරනු ලැබේ.

එකී සමාජ ශාලාව අසළ හෝ එකී සමාජ ශාලාව සඳහා අපේක්ෂිත ස්ථාන අසළ හෝ පදිංචි යම් තැනැත්තෙකු එකී සමාජ ශාලාව සඳහා බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවූ දිනයේ සිට දින 30ක් ඇතුළත තම විරෝධතාවයට හේතු ලියවිල්ලකින් දක්වමින් පිටපත් දෙකකින් (2) යුක්තව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ. ලිපි එවන විට ලියුම් කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ විරෝධකරු ලෙස සඳහන් කර සභාපති, තුම්පනේ ප්‍රාදේශීය සභාව, ගලගෙදර වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

එස්. එම්. ආර්. බී. සමරකෝන්,
සභාපති,
තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

2021 නොවැම්බර් මස 01 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය	සමාජ ශාලාවේ සභාපති ද ලේකම්ද, කළමනාකරු ද යන වග	සමාජ ශාලාවේ නම	සමාජශාලාවේ කටයුතු කරගෙන යාමට බලාපොරොත්තුවන ස්ථානය
ජෙරම් කෙනන් ප්‍රනාන්දු මයා රොස්වුඩ්වත්ත, රත්කරව්ව.	සභාපති	මවුන්ට් වීව් සමාජශාලාව	අංක 33, කුරුණෑගල පාර, ගලගෙදර.

තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර

2022 වර්ෂය සඳහා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි ආයතන සඳහා ආදයම මත 1%ක ගාස්තු පැනවීම

තුම්පනේ ප්‍රාදේශීය සභාවේ 2021 වර්ෂයේ ඔක්තෝබර් මස 21 වන දින පැවති මහා සභා රැස්වීමේද තීරණ අංක (ඉ) 1.5.14 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. ආර්. බී. සමරකෝන්,
සභාපති,
තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

2021 නොවැම්බර් මස 01 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තියෙන් පැවරී ඇති බලපත ප්‍රකාරව තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ සඳහන් හෝටලය, ආපන ශාලාව හෝ නවාතැන්පල සඳහා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරනු ලැබ ඇත්තාවූ ද අනුමත කර හෝ පිළිගත්තාවූ අවස්ථාවක එසේ කරනු ලැබූ ගාස්තුව අයකරනු ලැබූ අවුරුද්දට පෙරාතුවම වූ අවුරුද්දේ ආදයමෙන් 1%ක ගාස්තුවක් තුම්පනේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට යෝජනා කරන්නීය.

උපලේඛනය

ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය	*සංචාරක හෝටලයේ සභාපති ද ලේකම් ද, කළමණාකරු ද යන වග*	*සංචාරක හෝටලයේ නම*	*සංචාරක හෝටලයේ කටයුතු කරගෙන යාමට බලාපොරොත්තු වන ස්ථානය*
එන්. ඒ. මුනවීර මයා, අංක 203 කොළඹ වීදිය, මහනුවර	කළමණාකරු	ලකී ටුවරිස්ට් ඉන්න් (පුද්ගලික) සමාගම	නාරංවල, ගලගෙදර

12 - 187/14

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.